දෙව්රදදම්පසඟිනාවන් විසින් විරචිත

# දළදා සිරිත

වැලිවිටියේ පණ්ඩිත සෝරත

නායකස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින්

කළ ශුද්ධියෙන් හා ලියූ විවරණයෙන් ද යුක්තයි

# DALADĀ SIRITA

EDITED AND COMMENTED ON

By

THE VEN. PANDIT WELIVITIYE SORATA

NĀYAKA THERA




කොළඹ

සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

M. D. GUNASENA & CO. LTD.

COLOMBO

2493
1950

# දළදා සිරිත

# ODYSSEY OF THE TOOTH RELIC



To Bhikkhu Gunasiri, Asokārāma, N'Eliya, with Metta, from Bhikkhu Kassapa, Vajirārāma, 22 March 1951

වැලිවිටියේ
පණ්ඩිත
සෝරත නායක ස්වාමීන්ද්‍රයෝ

සීමා සහිත
ඇම්. ඩී. ගුණසේන සහ සමාගම
කොළඹ

Sinhalese literary work belonging to the fourteenth century. It is evident from this attempt of hers that she has spent much time and energy in editing this little book.

5. For convenience, let us call this edition of hers the University Edition (U. E.)

6. Mr. Rajasekera, Notary Public, who had the distinction of editing this text first (1920) was a product of a Pirivena. As it was a pioneer work it is possible that some errors might have been overlooked by him in his text. Therefore such errors are not to his discredit.

7. From a University Edition prepared by one who had the advantage of the research of the earlier editor, a great deal more was to be expected. It is a matter for regret, however, that this University Edition fails to make any fresh contribution to our knowledge and the edition itself is no improvement on that of Mr. Rajasekera.

8. I read the preface to the University Edition with interest after I had perused the text. A critical reading of this text makes one pick out a large number of corrupt readings. It is because of the respect I have for university education that I was led to a wrong impression regarding the frequent recurrence of corrupt readings. I was, at first, reluctant to attribute those errors to the editress, who is a lecturer in our University, where Sinhalese is, perhaps, the chief branch of study.

9. A comparison of this recent edition with the *editio princeps* of Mr. Rajasekera naturally leads us to a much larger question, raised by certain University teachers and their students, who have attempted

to impress upon the public that pirivena education, unlike university education, retards the growth of the innate critical faculties of a student. This view of theirs has been proclaimed from public platforms and in the columns of newspapers; the merits of pirivena education have thus suffered by default and I may, therefore, be excused if I appear to digress slightly from my present purpose to invite the critical reader to make a comparison between the two texts aforementioned and assess for himself the relative merits of pirivena and university education. Comparing the attainments of the two types of students at the time of admission to the two types of institutions, and the facilities afforded to University students and teachers, the amount of public money spent at the University on lavish salaries, extensive libraries, magnificent buildings, luxurious equipment, liberal scholarships, etc., with the meagre assistance given by the Government and the public to the pirivens, it is not surprising that one naturally presumes the standard of education at a University to be much higher than that at a pirivena.

10. It is generally assumed that university education ultimately leads to research studies. On first thought, therefore, I presumed that the learned editress may have deliberately retained these corrupt readings in the text for the benefit of students of an institution for higher studies, with a view to providing for such errors being discovered, criticised and corrected by the students, in accordance with some modern teaching device adopted at the University in regard to the training of research workers. But such a surmise had to be speedily abandoned in view of the following claim she makes for her edition :

"Although this text is small, the energy expended on it has been great without deviating from scientific methods. We did not fail to examine even the minutest differences occurring in the ola manuscripts that were at our disposal. We believe, therefore, that to a great extent, the present version corresponds to the original text." If this has been her intention, there is not the slightest doubt that she has failed in achieving it, as she has, in spite of the energy, she claims to have expended on her work, retained corrupt readings which are productive of meanings remote from what the author intended.

11. The critical methods, elaborated by savants in Europe, are well-known and need not be dwelt upon here. There is no doubt that those methods have been productive of excellent results where they have been applied to the editing of many texts, but when applied with unswerving dogmatic attachment and without due consideration to the circumstances relating to the literary work to which they are being applied, they become utterly impractical, however "scientific" those methods may be. Such application is no more successful than the administration of a scientifically tested drug, without due consideration of the complications of a particular case but merely on the grounds that the drug has been found effective in the treatment of similar cases before.

12. Now, the normally accepted principle among critical scholars is not to admit any reading into the text which is not supported by manuscripts—a very salutary inhibition, indeed. To arrive at an intelligible and satisfactory text of an ancient literary work, by this means, is possible only in those cases where

the text-tradition has been continuous and reliable, where the available manuscripts are numerous and the errors of one group of manuscripts can be corrected by better readings in another. The case, however, is different where the text-tradition is unreliable, the extant manuscripts are few or, even when fairly numerous, are all derived from an archetype which is corrupt.

13. What is possible in such cases, if one were to follow strictly the methods above referred to, is to give a text which is the result of the collation of all available manuscripts, pointing out where the text is corrupt. Such an edition of an old literary work will only be useful in the hands of mature scholars who will rest content without coming to conclusions about the interpretation of individual words or even whole phrases or sentences. However, if put into the hands of immature students, particularly, to be studied for an examination of an elementary nature, it is bound to cause incalculable harm, for the young mind abhors a vacuum. It is infinitely worse when such corrupt readings are presented in editions by those who lay some claim to scholarship, not only without any warning with regard to the occurrence of errors in the texts, but also with the assurance that these texts have been the result of the application of " scientific " methods. Students, teachers as well as examiners, will interpret them according to individual ability and attribute to the author ideas and fancies which he never dreamt of. This may not, of course, be of much moment so far as the passing of examinations is concerned, for if the student, the teacher, and the examiner are all agreed that *kos* (jak fruit) means *pol* (coconut), there

is an end to the matter. If, on the other hand, the aim is to give the student an idea as to what the author actually meant to convey, it is imperative that an editor should adopt all accepted methods available to him, over and above the evidence of the manuscripts, in his attempt to see through the mist of misreadings due to the ignorance or carelessness of many generations of copyists.

14. On these grounds and following the principles laid down in paragraph 30, I have amended, according to my lights, such readings as are obviously corrupt in all the manuscripts, so far as I can gather, from the previous editions. In the production of a standard text the necessity for such amendment is strong even when one has to deal with obscurity of meaning only, arising from the errors of half-educated copyists (e.g. *vesī vä da*[1] for *e sivadā* and *somnasin barinitira*[2] for *somnas-barinitira* etc.) or those of highly educated university editors (e.g. *sayuraṭa*[3] for *sasara-sayuraṭa* and *vīrandam*[4] for *viram dat*, etc.). But when an editor is compelled to promulgate new and startling theories of music (see para. 28) or distort well-established facts of history etc., (see para. 22) in order to defend the infallibility of readings "scientifically" arrived at there is no choice whatever but to amend such absurd errors.

15. Amendation of corrupt readings, without manuscript authority, has been resorted to by scholars whose proficiency in critical methods no

1. U. E. P. 1—L. 14.
2. U. E. P. 2—L. 19. Cf. U. E. 37—L. 14.
3. U. E. P. 27—L. 17.
4. U. E. P. 48—L. 26.

one will dispute. When Professor E. B. Cowell brought out the *editio princeps* of the *Buddha Carita* it became evident to Sanskrit scholars throughout the world that the work of a poet of great calibre had been brought to light. It was also realised that the text as published by Professor Cowell from available manuscripts did scant justice to the poetic genius of Bhadanta Asvaghosa. Reputed scholars, in Europe as well as in India, suggested numerous amendations of corrupt readings, on the same principles as have guided me in my amendations of the present text. All these suggested corrections and many more of his own, have been resorted to by Dr. E. H. Johnston as the notes attached to his text and translation would testify in his edition of the *Buddha Carita*, apart from the first manuscript evidence which he was able to utilise. When the late Sir D. B. Jayatilaka brought out the first part of his edition of *Dhampiyā Aṭuvā Gäṭapada*, an interested reader pointed out corrupt readings, which had escaped the notice of that eminent scholar, and suggested amendations for them. The reputed savant readily accepted them and inserted them in the errata to his work (see introduction to the *Dhampiyā Aṭuvā Gäṭapada*—p. xix).

16. Now let us glance at this University Edition of the *Daḷadā Sirita* and see what are the "scientific" methods that its editress did not transgress or disregard, and how far her edition corresponds to the original text. The footnotes appearing in my edition are readings adopted by earlier editors of this work. The parts inserted within square brackets are necessary supplements not found in other editions.

17. I do not think that it is at all necessary to examine all corrupt readings in this U.E. of the *Daḷadā Sirita*. Let me indicate a few of the more glaring ones. To begin with let me point out the following: (page 16—line 3) *sā̆ kothi grīvādhātūn vahansē pihiṭuvā* (having enshrined the *grīvādhātu* in the pinnacle of the *caitya*). Relics are enshrined in a relic chamber of a "caitya" and not in a pinnacle. Moreover, during the time referred to, the architecture of the *stūpa* had not evolved to include a pinnacle at the top. The *chattra* (umbrella) was the crowning feature. (see *The Stūpa in Ceylon*—pp. 32 and 39). It is, therefore, certain that the author would not have used the word *sā̆ kothi*. The text leaves us in no doubt that the original reading would have been *sā̆ kushi* (in the *caitya*).

18. Consider the phrase on page 17—line 21 of the U. E. *tungu keles ayuru van* meaning thereby " like like high *kailāsa* ". Here the words *ayuru* and *van* have the same meaning " like". This repetition of meaning is out of place and unsuitable. Hence one would naturally regard one of these words as incorrect. The word *keles* means the mountain *kailāsa*. Therefore one might expect a word meaning " mountain " after the word *keles*. There are a number of words in Sinhalese having this meaning. Of these we should select one ending in '*ru*' so that it would rhyme with the words *yaturu van*. The word *äduru*, derived from Sanskrit *adri*, means mountain, and it would be reasonable to assume that the author of the *Daḷadā Sirita* used this word and not any other. Hence the complete text should read as *tungu keles äduru van..............yaturu van.*

19. Another interesting reading appearing in the U. E. (page 22—line 13) is *snānīya vū deviyan*. This expression literally means "gods fit for bathing in". I am sure that the author of the *Daḷadā Sirita* would have laughed at an expression like this. The actual word in the original text might have been another word. The word *sanātana* which means 'eternal' or 'permanent' is often used as an epithet of the gods (see my comments on page 78). I therefore amended the reading to: *sanātana vū deviyan*—(eternal gods).

20. Let us examine the following: (page 37—line 12) *yuhu va gos nuvara visituru uturu vāsal dorin gos maha-mevunāgiri vehera väda* (having advanced quickly and passing through the picturesque northern gate entered *mahamevunāgiri vehera*) Mahamevunā Park is situated in the southern outskirts of the city of Anurādhapura (see my comments on page 89). A person who is in a hurry would not have taken such a devious route to reach his destination. Undoubtedly the king entered the Mahāmēghavana through the southern gate. When one reads the above passage of the U. E., one is reminded of the proverb *parangiya kōṭṭe giyā vageyi* (like the Portuguese going to Kotte). The author would have used a word to mean the southern gate with the ending '*turu*' to rhyme with *visituru*. The word *anuturu*, meaning southern was used by renowned poets like Sri Rāhula of Toṭagamuva (see *Säḷalihinisandesa*—13). The word *anuturu* can be derived from the Sanskrit word *anuttarā* meaning "southern" (see Apte's *Sanskrit-English Dictionary*). Therefore, the word that the author would have used was *anuturu* and not *uturu*.

21. Consider the following : *dumbuḷusumbuḷin* (page 40—line 5). The compound word *dumbuḷusumbuḷin* means from *dumbuḷusumbuḷu*. The word *dumbuḷu* means soot and *sumbuḷu* means inner bark of trees. It may also mean a *cumbaṭa* (a coil used as a pad. *dara-nuua*). There is no sense in speaking of incense being thrown into *dumbuḷu* or *sumbuḷu* and also the fumes of no scent would rise from them. Incense is thrown into vessels containing live embers, and it will cause smoke to rise. Hence, it is very likely that there was in this context a word with such a meaning. This word is most likely *dumaḷosu*. The text should, therefore, read as *dumaḷosu peḷin* and not as *dumbuḷu sumbuḷin* (see my comments on page 93).

22. According to this edition (page 43—line 8) we learn that King Vijaya Bahu I caused *maha-senan̆ga* (a mighty host of people) to come here from the country called Aramaṇa. But according to *Mahā-vansa*, *Pūjāvaliya* etc., it is stated that the great king caused *maha-san̆gana* (Bhikkhus) to come here from Aramaṇa. The error is quite clear.

23. Errors of this type are not rare in both these previous editions.

24. An editor of a text should always pay attention to grammatical rules. Words like *samaharek* (U. E. $5^{5}$), *bhagavat-tema* (U. E. $12^{21}$), *raja-tumek* (U. E. $18^{15}$), *rajjuruvō* ($38^{19}$) and many others in the nominative case are employed without finite verbs. The sentences : *ē raja* ..............*nän̆gūha* ($19^{11-18}$), and *mā*...........*yemi* ($30^{15}$) are types of mistakes that cannot be condoned even in the work of a school boy and it is very uufortunate that such mistakes have entered into the University Edition.

25. A person who edits a book of this type should compare the text with related works in regard to instances where such comparisons are necessary and relevant. *Daḷadā Sirita* is an expanded presentation of *Dāṭhāvansa*. The error *piyavi gamanin* (37[12]) is due to the fact that *Dāṭhāvansa* had not been consulted. According to *Dāṭhāvansa* the king went on foot. Therefore *piyavi gamanin* should read as *piya-gamanin*.

26. The list of Sinhalese kings given in the previous editions of the *Daḷadā Sirita* had not been compared with similar lists appearing in the *Mahāvansa*, *Pūjāvaliya*, etc. Names of no less than nine kings have been left out in the U. E. Certain names are incorrect. *senevi maharaja* (42[10]) ought to be *Senevi Mānāraja*.

27. The word *lovuturu* (4[16]) for *lomituru* is an error which would never be made by one who knows something about Buddhist Doctrines (see my notes on p. 62). The word *lomituru* appears as a footnote in the Rājasekera Edition and also in two ola manuscripts (O : 5, and AA 12) in the Colombo Museum Library. This last reading *lomituru* is not given even as a variant in the U. E.

28. The error *batis* (48[26])–thirty two musical modes (*rāgas*), is due to not referring to works on Indian music according to which there were thirty six modes (see my comments on p. 109). The correct word is *satis*. The knowledge that the musical modes were 36 in number was so common in ancient India (including Ceylon) that Viṣṇusarman credited even an animal with that knowledge (see *Pancatantra* V–53). It is, therefore, a matter for regret

that the learned editress has given cause to students to infer that the author of the *Daḷadā Sirita* was lacking even in such elementary knowledge.

29. The sentence on page 48, beginning with line 19 is full of errors. In the text *niraturu va pudaveses karana lesa sakpañca vaḍḍāru..................pudaveses da........ salasvā*, the word *pudaveses* occurs twice. Hence in my edition I changed the second one to *vädaveses* (kinds of musical instruments). In the same passage the words *manadoḷin*, *igena kära* and *kambili viridu bända* are included in the list of names of musical instruments. They are meaningless in this context. In the index the editress has carelessly split up the expression *sakpañca vaḍḍāru* into *sak* and *pañca vaḍḍāru*. She would not have done this if she had glanced at Dr. Paranavitana's notes in *The Temple of the Tooth in Kandy*. In the sixth chapter of this book, in a footnote occurring on page 34, Dr. Paranavitana states as follows: "The සක්පඤ්ච (sakpañca) is enumerated by Thup S.—P. 180 among kinds of drums along with the උඩැක්කි (uḍäkki)." It is an unpardonable mistake to have split up the word *sakpañca* into *sak* and *pañca* and connected *pañca* with another word *vaḍḍāru* (see my comments p. 104).

30. An editor of ancient literary works should adhere to the following principles: (1) collating of manuscripts, (2) comparing related texts where necessary, (3) considering the meaning, (4) considering the suitability of the meaning, (5) applying the rules of grammar, (6) considering its bearing on other fields of knowledge, (7) paying attention to the language of the period in which the work was written and (8) not deviating from tradition without strong reason.

31. Of the principles above referred to, it is clear from this edition that the University pays attention to the first only, and that too rather carelessly. At times, passages and words, contrary to her claim in her preface, have been left out. Compare my edition—pages and lines—$41^{19}$, $44^{17}$, $49^{4}$, $50^{16}$, etc. with the following pages and lines of the U.E.—$42^{5}$ $44^{9}$, $48^{14}$, $49^{17}$, etc.

32. The index given at the end of the U. E. is not of much use to students. Although the word *cidravanaya* occurs in the index, it cannot be traced in a single extant version of the text. Some words, such as *lovuturu* which occurs in the line 16 of page 4 of the U. E., are not included in the index whereas *astrita* for *āstrita*, *ekninnāda* for *ēkaninnāda*, *sītātapavārana* (Sita's umbrella) for *sitātapavāraṇa* (white umbrella) are included in it.

33. A word may also be said with regard to the variant readings appearing in the footnotes of the U. E. To me it appears that the overloading of the printed text of the U. E. with such readings found in manuscripts as *bhayānakha*[1] for *bhayānaka*, *dhavalādhapatra* and *dhavalādapatra*[2] for *dhavalātapatra*, *aṇāvarana* for *anāvaraṇa* etc. serves as little purpose as if I had enlarged the present text by the inclusion of readings such as *ambara tura*[3] (the sky tree) for *ambaratura* (in the sky), *kes dā miṭa*[4] (hair, relics or giver or having being burnt, fist) for *kesdāmiṭa* (handful of hair-relics) etc. which are products of "scientific" methods, as footnotes in the

1. U. E. P. 34—n 23.
2. U. E. P. 22—n 6.
3. U. E. P. 34—L. 26.
4. U. E. P. 11—L. 19.

present edition. Such variant readings do not render any assistance to determine the original words of the author.

34. I regret to mention here as a well-wisher of our chief seat of learning that it is not to the credit of the University to place in the hands of scholars and students works of this type.

35. Owing to lack of facilities, many teachers in pirivens are greatly handicapped in regard to research work in ancient culture. To meet this handicap, I added a glossary at the end of this book.

36. Lastly I must state here that my sincere thanks are due to the Venerable Welivita Sri Saraṇankara Anunāyaka Thēra of Malwatu Vihāra, Kandy; Pandit Hālyāle Sumanatissa Thēra, Principal, Dhammadīpa Pirivena, Wattegama; Dr. S. Paranavitana, O.B.E., Archaeological Commissioner; Mr. H. Gunatillake, retired Inspector of Schools, Kegalla and Mr. A. W. Kaluaratchi, Inspector of Schools, who helped me in many ways in editing this book and commenting on the same. My thanks are also due to Messrs M. D. Gunasena & Co. Ltd. for having invited me to edit this book.

WELIVITIYE SORATA
NĀYAKA THERA.

Vidyodaya Pirivena,
Colombo.
December 20, 1949.

# සංඥාපනය

සිංහලසාහිත්‍යාභිවර්ධනය සඳහා අපගේ ඉතා සුලු මෙහෙයක් වූ මේ පොත අපේ පැරණි සාහිත්‍යයට හා ශිෂ්ටාචාරයට ද රුචි කරන්නවුන් ඉදිරියෙහි ප්‍රීතිපූර්වක ව තබමු. මේ පොතට ලියූ ප්‍රස්තාවනාව හා ‘දළදාපනත’ නම් ගැටපදවිවරණය ද ශිෂ්‍යයන්ට ප්‍රයෝජනවත් විය හැකි බව කියමු.

2. මේ පොත මුද්‍රණය කිරීම සඳහා ඉක්මනින් පිළියෙල කර දෙන්ට සිදු වූ හෙයින් පැරණිපිටපත් හා සංසන්දනය කරන්ට කාලයක් නැති වී ය. ඒ නො සැසඳීම අපේ මේ කෘතියෙහි ප්‍රයෝජනපක්ෂය අඩු වීමට හේතුවකැයි නො සැලකිය යුතු යි. මේ පොතෙහි ප්‍රථමසංස්කරණය වනාහි ජී. ඇස්. රාජශේඛර නොතාරිස්මහතා විසින් පැරණි පුස්කොළපිටපත් පරීක්ෂාපූර්වක ව සංසන්දනය කොට කරණලද්දකි. එහි අධෝලිපිවලින් පැරණිපිටපත්හි පෙණෙන විසදෘශපාඨ මහත්රාශියක් බලා ගතහැකි ය. තවත් පැරණිපිටපත් පිළිබඳ තොරතුරු මෑත දී ප්‍රකාශයට පැමිණි සංස්කරණයකින් දත හැකි ය.

3 අපගේ බලාපොරොත්තුව වූයේ කතීහු විසින් යෙදූ වචන ම ඇතුළත් වන සේ මේ පොත සකස් කිරීම යි. මෙය පැරණිපොත් සංශෝධනය කරණ කා තුළත් තිබිය යුතු බව අපේ හැඟීම යි

4. රාජශේඛරසංස්කරණයෙහි පිටු අටක් පමණක් කටුගෙහි පොත්ගුලෙහි තිබෙන පැරණි දළදාසිරිත් පිටපත් තුණ සමග සංසන්දනය කෙළෙමු. එයින් අපට පෙණුනේ මේ පොත සකස් කිරීම සඳහා පැරණිපුස්කොළපිටපත්වලින් එතරම් වහලක් නො ලැබෙනබව යි. ඉතා කාර්‍ය්‍යා

සංස්කරණයක් මේ අවස්ථාවෙහි දී අප අතට පැමිණියේ ය. ඒ වනාහි ලඞ්කාවිශ්වවිද්‍යාලයෙහි සිංහලාචාර්යවරියන විසින් කරණ ලද්දකි. තුදුස්වන ශතවර්ෂයට අයත් මේ පොත සකස් කිරීමට ඉදිරිපත් වූ ඒ ශොධිකාවගේ නිර්භයභාවය ප්‍රශංසාර්හ ය. මේ කුඩා පොත සකස් කිරීම සඳහා ඒ උගත් ශොධිකාව බොහෝ කාලයක් හා මහත් ශක්තියක් ද යෙදූ බව නිසැක ය.

5. ව්‍යවහාර පහසුව පිණිස මිට අපි 'විශ්වවිද්‍යාලයසංස්කරණය' යි නම් කරමු.

6 මේ පොත පළමුවරට ( 1920 දී ) සකස් කිරීමේ ගෞරවයට හිමි වූ රාජශෙඛර නොතාරිස්මහතා පිරිවෙන් ශිෂ්‍යයෙකි. ඒ සංස්කරණය පළමුවැන්න හෙයින් එහි අශුද්ධස්ථාන ඉතිරි ව තිබිය හැකි ය. එය ඒ මහතාට නින්දාවට කරුණක් නො වේ.

7. මේ අභිනවසංස්කරණය විශ්වවිද්‍යාලයාචාර්යවරියන ගේ අතින් වූවක් හෙයින් ද, ප්‍රථමශොධකයාගේ පරීක්ෂණයන්හි ප්‍රයෝජනය නො අඩු ව ලැබූවක් හෙයින් ද, ඒ ප්‍රථමසංස්කරණයට වඩා මෙහි බෙහෙවින් උසස් වූ ශුද්ධියක් අපෙක්ෂා කළ යුතු වෙයි. එහෙත් මේ විශ්වවිද්‍යාලයසංස්කරණය අපගේ දැනීමට කිසි ම අමුතු දෙයක් එකතු නො කරණබවත්, රාජශෙඛරසංස්කරණයට වඩා උසස් තත්ත්වයක් කවර ලෙසකින් වත් නො දරණබවත් කියන්ට විම සැබැවින් ම ශොකජනක ය.

8. අප මේ විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි නිවෙදනාදිය කියවූයේ පොත කියවීමෙන් පසු ව ය. මේ සංස්කරණය පරීක්ෂාවෙන් කියවන්නෙකුට අශුද්ධස්ථාන මහත් රාශියක් හමු වෙයි. විශ්වවිද්‍යාලයාධ්‍යාපනය කෙරෙහි අප තුළ පවත්නා ගෞරවය නිසා මේ විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි නොයෙක් තැන තිබෙන ඒ වැරදි පිළිබඳ ව මුල දී අපි වැරදිනිගමනය කට බැස ගත්තෙමු. සමහර විට සිංහලභාෂාශාස්ත්‍ර ප්‍රධාන

ස්ථානයෙහි තබා සලකතැයි සිතිය හැකි අපේ විශ්වවිද්‍යාලය යෙහි කථිකාචාර්යවරයක් දරණ ශුද්ධසංස්කාරත්‍රයකට එම දෙස් ආරෝපණය කරන්ට අපි මැළි වීමු

9. මේ නවීනසංස්කරණය හා රාජ්‍යසභාමන්ත්‍රණයේ ප්‍රථමසංස්කරණයත් සසඳා බැලීමේ දී වැදගත් ප්‍රශ්නයක් දෙකට අප සිත් යොමු වෙයි. මේ ප්‍රශ්නය වනාහි, පිරිවෙන්හි අධ්‍යාපනය පරීක්ෂණබුද්ධියෙන් දියුණු නො කරන්නැයි ද, විශ්වවිද්‍යාලයඅධ්‍යාපනයට වඩා ඉතා පහත් ය යි ද සභා වේදිකාවන්හි දී ද පුවත්පත්මඟින් ද ප්‍රකාශ කරණ ඇතැම් විශ්වවිද්‍යාලයගුරුශිෂ්‍යයන්ගේ කථා නිසා නැඟෙන්නකි. ඒ ප්‍රකාශයන්ට නිසි පිළිතුරු යෝග්‍යඅවස්ථාවන්හි දී නො ලැබීම නිසා පිරිවෙන්අධ්‍යාපනයට එක්තරා ප්‍රමාණයක පාඩුවක් වූ බව කිය හැකි ය. එහෙයින්, ප්‍රස්තුතයට වඩා මත් අදාළ නුවූවත්, යථෝක්ත සංස්කරණ දෙක සසඳා එයින් පිරිවෙන්හි හා විශ්වවිද්‍යාලයයේත් අධ්‍යාපනතත්ත්වය මැන බලන්ට මෙය කියවන පරීක්ෂාකාරීන්ට මතක් කරමු. විශ්වවිද්‍යාලයයට හා පිරිවෙණකටත් ඉගෙණීම සඳහා බැඳෙන ශිෂ්‍යයන්ගේ උගත්කම් හා විශ්වවිද්‍යාලයයෙහි ආචාර්යවරයන්ට හා ශිෂ්‍යයන්ටත් ලැබෙන නන්වැදෑරුම් පහසුකමුත්, අධික වූ වැටුප්, අඞ්ගසම්පූර්ණපුස්තකාලය, විශාලශාලා, ශිෂ්‍යනිවාස, සුදුසු වූ උපකරණ, නොමසුරු ව දෙන නිදහස් ශිෂ්‍යාපකාරධන (ශිෂ්‍යත්ව) යන ආදිය සඳහා පොදුමුදලෙන් වියදම් කරණුලබන ඉතා මහත් ප්‍රමාණය හා පිරිවෙන්වලට රජයෙන් ද මහාජනයාගෙන් ද ලැබෙන ඉතාමත් සුළු උපකාරයත් සසඳා බලනවිට විශ්වවිද්‍යාලයයෙහි අධ්‍යාපනය පිරිවෙන්හි අධ්‍යාපනයට වඩා ඉතා උසස් විය යුතු ය යි කාට වුවත් වැටහීම පුදුමයට කරුණක් නො වේ.

10. විශ්වවිද්‍යාලයඅධ්‍යාපනය විමර්ශනාත්මකය යනු සාමාන්‍යයෙන් පිළිගත් කරුණකි. මේ කරුණු නිසා මේ විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි පෙනෙන නොයෙක් දෙස්

ගැණ අප පළමු කොට කල්පනා කෙළේ විශ්වවිද්‍යාලයෙහි පිළිගත් අළුත් අධ්‍යාපනක්‍රමයක් අනුව එහි උගන්නා නුවණ මේරූ ශිෂ්‍යයන්ගේ පරීක්ෂණබුද්ධිය දියුණු කිරීම සඳහා ඔවුන් ලවා ම පරීක්ෂා කරවා ශුද්ධපාඨය කුමක් දැ යි නිශ්චය කරවන අදහසින් අපේක්ෂාපූර්වක ව ම ඒ දෙස් ඉතිරි කර තබන්ට ඇත කියා යි එහෙත් ඒ උගත් ශොධිකාවගේ නිවේදනයෙහි පෙණෙන

> "ශාස්ත්‍රීයරීති උල්ලඞ්ඝනය නොකොට මෙය සම්පාදනය කරන්ට සිදුවූ බැවින්, ග්‍රන්ථය කුඩා වුව ද ගත් වෙහෙස මඳ නොවේ. අපට ලැබුණු පුස්කොළ පිටපත් සියල්ලනම් එකිනෙකට ඇති ඉතා සුලු වෙනස්කම් පවා විමසා බැලීමට අපි මෙහිදී ප්‍රමාද නොවීමු. දැනට අප බැසගත් නිගමනවලට අනුව මේ සංස්කරණය කතෘහුගේ යෙදුමට – සම්පූර්ණයෙන් නොසෙස් වෙතත් – බොහෝ දුරට කිට්ටු වෙතැයි යනු අපේ හැඟීමයි"

යන කොටස කියවූ විට අපගේ ඒ කල්පනාව වඩා ම තැති වී ය. යථෝක්ත ප්‍රකාශය ඒ උගත් ශොධිකාවගේ අදහස ම නම්, එය ඉටු නොවූබවට ස්වල්ප වූ ද සැකයක් නො මැති යි. ඒ ශොධිකාව විසින් ඒ සඳහා මහත් වෙහෙසක් ගත් නමුත් කතෘහුගේ යෙදුම්වලට බොහෝ ඇත් වූ දොෂස්ථාන මහත් රශියක් ඉතිරි කර තැබූහෙයිනි.

11. යුරෝපයේ පඬිවරයන් විසින් පිළිගෙණ ක්‍රියාවෙහි යොදනු ලබන ග්‍රන්ථශොධනක්‍රම සුප්‍රසිද්ධ ය. එහෙයින් ඒ පිළිබඳ විස්තර කිරීම අනවශ්‍ය ය. පුරාණග්‍රන්ථ ශොධනයෙහි දී ඒ ක්‍රම අනුගමනය කිරීමෙන් උසස් ප්‍රතිඵල ලැබූ බව ද නියත ය. එහෙත් ඒ ක්‍රම කොතරම් "ශාස්ත්‍රීය" වුවත් ශොධ්‍යග්‍රන්ථයෙහි තත්ත්වය නො සලකා හැම විට ම අවිකල්පයෙන් ම අනුගමනය කළ හොත් මුළුමනින් ම ඉෂ්ටප්‍රතිඵල නිපදවීමෙහි අසමර්ථ වෙයි. යම් කිසි රෝගයකට ප්‍රත්‍යක්ෂ ගුණ ඇති ශාස්ත්‍රානුකූල සේ සම්පාදිත ඖෂධයක් නමුත් එබඳු රෝගයක දී එහි පවත්නා විශෙෂතත්ත්ව නො සලකා,

කලින් එබඳ රෝගයක දී අත්දුටුවා පමණක් සලකා, යෙදීමෙන් කිසි ම ප්‍රතිඵලයක් ඇති නො කරන්නාක් මෙනි.

12. විමර්ශනවූ ග්‍රන්ථශෝධකයන් විසින් සාමාන්‍යයෙන් පිළිගත් ක්‍රමය නම් පැරණිපිටපත්හි නැති කිසිම පාඨයක් පොතට එකතු නො කිරීම යි. ඒ වනාහි අතිප්‍රශංසාර්හ යි. ලියූදා පටන් උගතුන් අතේ ම පවතිතැ යි විශ්වාස කට හැකි, එක් පිටපතක හෝ කීපයක පෙනෙන දෝෂ ශුද්ධ කර ගැනීමට ඉවහල් වන්නා වූ බොහෝ පැරණි තවත් නොයෙක් පිටපත් ඇති, ග්‍රන්ථයන් ශෝධනයෙහි දී නම් ඒ ක්‍රමය ඉතා මත් යෝග්‍ය ය. පිටපත් බොහෝගණනක් නැති විට ද, ඇතත් ඒ සියල්ල ම වැරදිසහිත එක ම මුල්පිට පතකින් එනැ යි පැහැදිලි ව ම පෙනෙන විට ද, ඒ ක්‍රමය කිසි සේත් යෝග්‍ය නො වේ.

13. යථොක්ත ක්‍රමය ස්ථිර ලෙස ම අනුගමනය කරණ ග්‍රන්ථශෝධකයෙකු විසින් අශුද්ධස්ථාන ශුද්ධ කිරීමට ඉව-හල් වන එක් පිටපතක් වත් නැති පොත් සකස් කිරීමේ දී කට යුත්තේ අශුද්ධපාඨයන්ගේ ශුද්ධි අධොලිපිවශයෙන් හෝ වෙන යම් ලෙසකින් දක්වීම යි. පුරාණග්‍රන්ථයක එබඳු සංස්-කරණයක් ප්‍රයෝජනවත් වන්නේ වචනයක හෝ පාඨයක නොහොත් වාක්‍යයක අර්ථය පිළිබඳ තීරණයට වහා බැස නො ගන්නා පරීක්ෂාකාරි පරිණතබුද්ධිමතුන්ට යි. එහෙත් එබඳු පොතක් පරිණතබුද්ධිය නැති විමර්ශනයට මැලි වූ තරුණ ශිෂ්‍යයන්ට මූලිකතත්වයක් දරණ පාඨපරීක්ෂණ සඳහා හැදෑ-රීමට දුන්විට ඉතා මහත් හානියක් වීමට ඉඩ තිබේ. අර්ථයක් නැති හිස් දෙය සේ පෙනෙන සියල්ලට ම පිළිකුල් කිරීම එබඳු බොහෝ ශිෂ්‍යයන්ගේ සිරිතක් වෙයි. උගතුන් සේ පෙණී සිටින්නන් විසින් කළ, සන්දෙහපාඨ ඇතැයි ප්‍රකාශයක් නැති, "ශාස්ත්‍රීය" ක්‍රම අනුව ම කරණලදැයි යනතිකයකුත් එකතු කළ, සංස්කරණයන්හි එබඳු අශුද්ධපාඨ ඇති වීම අති-ශයහානිකර ය. ශිෂ්‍යයන් හා ගුරුවරුන් පාඨපරීක්ෂකයෝත්

ස්වශක්ති අනු ව ඒ පාඨවල අර්ථ තෝරුම් ගන්නා අතර ග්‍රන්ථකර්තෘහු සිතෙන් වත් නො සිතූ අදහස් ඔහුගේ ලෙස පිළිගණිති. පාඨපරීක්ෂණයකින් සම්පූර්ණ වීම සම්බන්ධයෙන් ම නම් එය එතරම් සැලකිය යුතු කරුණක් නො වේ. ශිෂ්‍ය ආචාර්‍ය්‍ය පරීක්ෂක යන තුන් පක්ෂය ම 'කොස්' යන්නෙන් වාච්‍ය වන්නේ 'පොල්' ය යි පිළිගණිතොත් කාරණය එසින් අවසන් වන බැවිනි. ග්‍රන්ථකර්තෘවරයා විසින් ප්‍රකාශ කළ අදහස් පාඨකයන්ට දෙන්ට සිතතොත් ඒ ක්‍රමය කිසිසේත් සුදුසු නො වේ. එබඳු අවස්ථාවේ දී ග්‍රන්ථශෝධකයා විසින් අවශ්‍යයෙන් ම කළ යුත්තේ පරම්පරාගණනක් මුළුල්ලෙහි අපරීක්ෂාකාරී අව්‍යක්තලේඛකයන් විසින් වැරදුනු පිටපත්හි පෙනෙන අශුද්ධපාඨයන්ගෙන් ශුද්ධපාඨය කුමක් ද යි නිර්ණය කිරීම සඳහා තමා දන්නා තාක් හැම ශාස්ත්‍රීයක්‍රමයන්ගේ ම උපකාරය සෙවීම යි.

14. මේ කරුණු නිසා, අපේ දැනීමේ පරිදි, මෙහි 30 වන ඡේදයෙහි දක්වනුලබන රීතීන් අනුගමනය කරමින්, ප්‍රකාශිත සංස්කරණ දෙක සඳහා සැසඳූ සියලු ම පිටපත්හි වැරදි තිබෙතැයි පෙනෙන පාඨ සකස් කොටලමු. "එ සිවදූ, සෝමනස්බරිනිතිර" යනාදිය සඳහා "වෙසී වැදූ[1], සෝමනසින් බරිනිතිර[2]" යනාදිය ලියූ අව්‍යක්තලේඛකයන් විසින් හෝ, "සසරසපුරට, විරම් දත්" යනාදිය සඳහා "සපුරට[3], විරත් දම්[4]" යනාදිය යොදන, උසස් ලෙස උගත් විශ්වවිද්‍යාලයශෝධකයන් විසින් හෝ, කළ වැරදි නිසා ඇති වන අර්ථශූන්‍යත්වය හෝ අව්‍යක්තිය ඇති තන්හි දී පවා එබඳු සංශෝධන ඉතා මත් අවශ්‍ය ම ය. "ශාස්ත්‍රීය" ක්‍රම අනු ව නිගමනය කළ පාඨයන්ගේ නිරවද්‍යභාවය රැකගණු පිණිස (මෙහි 28 වැනි ඡේදයෙහි දක්වන පරිදි) සංගීතය පිළිබඳ අළුත් පුදුම-මතයන් ප්‍රකාශ කරන්ට ද, අතිශය නිශ්චිත ඓතිහාසිකසත්‍ය-ආදිය (22 වැනි ඡේදයෙහි දක්වන පරිදි) විපර්‍යාස කරන්ට ද පෙළෙඹුනු ශෝධකයන්ගෙන් ඉතිරි වූ දොෂ වනාහි අවශ්‍යයෙන් ශුද්ධ කළ යුතු ම ය යනු කිය යුත්තක් නො වේ.

1 වි. සං. 1–14. 2 වි සං. 2–19. 37–14 ද සසඳනු. 3. වි. සං. P. 27–17. 4. වි. සං. 48 – 26

15. අතිශයදක්ෂයන් සේ අවිවාදයෙන් ම පිළිගත් සුප්‍රසිද්ධ පඬිවරයන් විසින් ද පැරණිපිටපත්හි පිටිවහලක් නො ලැබ එබඳු අශුද්ධපාඨයන් සකස් කළබව අපි දනිමු. මහාචාර්ය ඊ. බී. කවල්තුමා විසින් බුද්ධචරිතයෙහි ප්‍රථමසංස්කරණය ප්‍රකාශයට පැමිණවූ අවස්ථාවෙහි අසාමාන්‍යප්‍රතිභාශක්තියක් ඇති පුරාතනශ්‍රේෂ්ඨමහාකවිවරයෙකුගේ කෘතියක් දකිමේ භාග්‍යය ලෝකයෙහි සංස්කෘතඋගතුන්ට ලැබිණ. කවල් මහතාට ලැබුනු පිටපත් අනුව කළ ඒ ප්‍රථමසංස්කරණයෙන් මහාකවි අශ්වඝෝෂස්ථවිරයන්වහන්සේගේ අද්භූත වූ ප්‍රතිභානශක්තියට සම්පූර්ණ ගෞරවය නො ලැබෙන බව ද ඒ සමග ම ඒ උගත්තු තේරුම් ගත්හ. ඒ පොත කියවූ යුරෝපයේ හා ඉන්දියාවේ ද සුප්‍රසිද්ධ පඬිවරයෝ මේ දළදාසිරිත සකස් කිරීමේ දී අප අනුගමනය කළ රීතීන් ම අනුගමනය කරමින් නොයෙක් අශුද්ධපාඨයන්ගේ ශුද්ධි දක්වූහ. ඒ පොත ඉතා මෑත දී ශුද්ධ කළ ආචාර්ය ඊ. එච්. ජොන්ස්ටන් මහතා ඒ උගතුන් දක්වූ බොහෝ ශුද්ධීත් තමාගේ ම අදහස් අනුව කළ ශුද්ධීත් ස්වකීය සංස්කරණයෙහි හා තත්පරිවර්තනයෙහිත් දක්වී ය. ශ්‍රීමත් ඩී. බී. ජයතිලකමැතිතුමා ධම්පියාඅටුවාගැටපදයෙහි ස්වකීයසංස්කරණය පිළිබඳ ප්‍රථමභාගය ප්‍රසිද්ධ කළ අවස්ථාවෙහි එය කියවූවෙක් එහි පෙණෙන, එතුමාගෙන් අත්හැරුණු, අශුද්ධපාඨයන් හා විය යුතු ශුද්ධපාඨත් එතුමාට පෙන්වා දුන්නේ ය. ශ්‍රේෂ්ඨ පඬිවරයෙක් වූ එතුමා පසු බට නො වී එ ඒ ශුද්ධි පිළිගෙණ ඒ පොතෙහි ශුද්ධිපත්‍රයක් මෙන් යෙදී ය. (එහි ප්‍රස්තාවනාවෙහි xix පිටුව බැලිය යුතු.)

16. දැන් අපි දළදාසිරිතෙහි මේ විශ්වවිද්‍යාලයසංස්කරණය දෙසට හැරෙමු. මෙහි දී උගත් ශෝධිකාව කවර නම් "ශාස්ත්‍රීය රීති" උල්ලඞ්ඝනය නො කළා ද ? මේ විශ්වවිද්‍යාලයසංස්කරණය "සැතීහුගේ ගෙදුමට" කොතරම් කිට්ටු වේ ද ? යනු පරීක්ෂා කර බලමු. අපේ සංස්කරණයෙහි අධොලිපිවශයෙන් පෙණෙන්නේ ප්‍රථමසංස්කරණයන්හි පිළිගත්. අප විසින්

වෙනස් කළ, පාඨ ය. අප විසින් ඌනපූරණවශයෙන් අලුතෙන් එකතු කළ පාඨ [ ] මේ ලකුණු දෙක අතර යොදන ලදී.

17. මේ විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි පෙණෙන සියලු අශුද්ධපාඨ විමර්ශනයට භාජන කිරීම අවශ්‍ය ය යි අපි නො සිතමු. කාටත් පැහැදිලි ව පෙණෙන තැන් කීපයක් පමණක් මෙහි දක්වමු. ඒ පොතෙහි 16³ හි පෙණෙන "සෑකොත්හි...ශ්‍රීව.ධාතූන්වහන්සේ පිහිටුවා" යන්න පළමු කොට පිරික්සමු. චෛත්‍යයන්හි ධාතුගර්භයන්හි මිස කොත් වල ධාතු පිහිටුවීමක් නො මැතිසි. මෙහි සඳහන් වන කාලයෙහි සෑපයන්හි කොත් ද නො වී ය. ඒ වෙනුවට ඒ කාලයෙහි වූයේ ඡත්‍රය සි. (The Stupa in Ceylon, 32-39 පිටු). එහෙයින් දළදාසිරිතේ කතුතුමා "සෑකොත්හි" යන්න නො යෙදූබව නිසැක සේ ම කිය හැකි ය. එතුමා යොදන්ට ඇත්තේ "සෑකුස්හි (=චෛත්‍ය තුළ)" යන වචනය යි.

18 විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි 17 පිටුවෙහි 21 වැනි පේළෙහි පෙණෙන "තුඟුකෙලෙස්අයුරුවන්" යන්න ද පරීක්ෂා කරමු. මෙහි "අයුරු, වැනි" යන දෙක ම එකාර්ථ ය. 'සමාන' යනු එහි තේරුම යි එහෙයින් එහි අර්ථය වන්නේ "උස් වූ කෛලාසය වැනි වැනි" යනු යි. මේ අර්ථ පුනරුක්තිය සඵානොවිත ද යොග්‍ය ද නො වේ. එහෙයින් මේ වචන දෙකින් එකක් වැරදි ය යි තීරණය කිරීම භාෂාව තරමක් වත් දන්නා කාට වුවත් අපහසු නො වේ. මෙහි "කෙලෙස්" යන්නෙන් කෛලාසපර්වතය ගැණේ. එහෙයින් 'කෙලෙස්' සදින් පර ව පර්වතවාචිශබ්දයක් යෙදෙන්ට ඇතැයි සැලකිය හැකි ය පර්වතවාචිශබ්ද රාශියක් සිංහලභාෂාවෙහි තිබේ. ඒ ශබ්දයන්ගෙන් මෙහි යෙදෙන්ට ඇත්තේ 'රූ' යන්නෙන් අවසන් වන ශබ්දයකි. ඊළඟට අනුප්‍රාසවශයෙන් යෙදූනු "......යතුරුවන්" යන්න හා ගැළපෙන්නේ ද එබන්දකි. සංස්කෘත 'අද්‍රි' ශබ්දයෙන්

බිඳී ආ 'ඇදුරු' යන්න උචිතවාචී ය. ඒ ශබ්දය ම දළදාසිරිත්කතුතුමා මෙහි යෙදුව සි සැලකිම තර්කානුකූල ය. එහෙයින් ඒ පාඨය "තුඟුකෙලෙස්ඇදුරුවන් ..........යතුරුවන්" සි ශුද්ධ විය යුතු ය.

19. විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි තවත් පුදුම තැනක් නම් 221[8] හි පෙනෙන "සනාතීය වූ දෙවියන්" යන්න යි. මෙහි තේරුම නම් "(ජලය මෙන්) සනාතය කට යුතු දෙවියන්" යනු යි. දළදාසිරිත්කතුතුමා සිටියේ නම් මේ කථාවට හුස්ම හිර වී මැරෙණ තරමට සිනා සෙනු නො අනුමාන යි. මෙහි නිවැරදි සුදුසුවචනය අනෙකක් විය යුතු ය. "සනාතන" ශබ්දය වනාහි 'සදාකාලික, නිත්‍ය' යන අර්ථයන්හි නොයෙක් තැන පෙණේ. එය බ්‍රහ්මවිෂ්ණුආදි දෙවවාචක ද, දෙවනාමවිශෙෂණ ද, වෙයි. (මේ පොතෙහි 78 වන පිටුව බලනු). එහෙයින් එය "සනාතන දෙවියන්" යි සකස් කෙළෙමු.

20. විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි 371[8] හි පෙනෙන "සුහුව ගොස් නුවර විසිතුරු උතුරුවාසල්දෙරින් ගොස් මහමෙවුනාසිරිවෙහෙර වැද" යන්න ද විමසමු. මහමෙවුනාඋයන අනුරාධපුරයෙන් බැහැර දකුණුදෙස පිහිටියකි. (මේ පොතෙහි 89 පිටුව බලනු). සුහු ව යන්නෙන් දික් වූ මඟක් නො ගණී යි. දකුණුදෙස පිහිටි මහමෙවුනාඋයනට උතුරුදෙරින් නික්ම යතොත් මාර්ගය බොහෝ දික් වෙයි. එහෙයින් රජතුමා මහමෙවුනාඋයනට පිවිසියේ උතුරුදෙරින් නො ව දකුණුදෙරින් ය යන බව නිසැක ය. මේ වාක්‍ය ප්‍රදෙශය කියවන විට "පරංගියා කෝට්ටේ ගියා වගෙයි" යන්න සිහියට එයි. දළදාසිරිත්කතුතුමා මෙහි මුලින් යෙදූ "විසිතුරු" යන්නට අනුප්‍රාස වන, 'තුරු' යන්නෙන් අවසන් වන, 'දකුණ' යන අරුත් ඇති, ශබ්දයක් යෙදූවා නිසැක ය. ශ්‍රීරාහුලමහාස්වාමි ආදි ශ්‍රෙෂ්ඨකවීන් දක්ෂිණාර්ථයෙහි (සැල. 13) යෙදූ 'අනුතුරු' යන්න ම දළදාසිරිත්

කතුතුමා මෙහි යෙදුවයි සැලකිය හැකි ය. එය 'අනුත්තරා' යන්නෙන් සිංහලයට එයි.

21. එම සංස්කරණයෙහි $40^{5}$,හි "දුඹුළුසුඹුළින්"යන්න ද සැලකිය යුතු තැනකි. 'දුඹුළු' යන්නෙහි අර්ථය ප්‍රකට ය. 'සුඹුළු' යනු ගස්වල ඇතුල්පතුරු හෝ දරණුව ය. දුඹුළුවලට හෝ සුඹුළුවලට කට්ටකුම්සැල්ආදිය දමන සිරිතක් නැත. එසින් සුවඳදුම් නැගීමක් හෝ නො මැති හි. කට්ට–කුම්සැල් ආදිය දමන්නේ අඟුරුකබල්වලට ය. සුවඳදුම් නගින්නේත් එසිනි එහෙයින් මේ පාඨයෙහි යෙදෙන්ට ඇත්තේ 'අඟුරුකබල' යන අර්ථ ඇති අනෙක් වචනයකි. ඒ වචනය නම් "දුම්ලොසු" යන්නයි. එහෙයින් ඒ පාඨය "දුම්ලොසුපෙළින්" යි ශුද්ධ විය යුතුයි (මේ පොතෙහි 93 පිටුව බලනු).

22. මහාවිජයබාහුරජතුමා අරමණයෙන් මහසෙනග ගෙන්වූබව මේ සංස්කරණයෙහි $43^{3}$ හි සඳහන් වේ. එහෙත් මහාවංශ, පූජාවලි ආදියෙහි පෙනෙන්නේ ඒ රජතුමා ඒ රටින් මහසඟන (=උපසම්පන්න භික්ෂූන්) ගෙන්වූ බව යි. දෝෂය ඉතා පැහැදිලි ය

23. මෙබඳු වැරදි ඒ ප්‍රථමසංස්කරණ දෙක්හි ම දුලභ නො වේ

24. ග්‍රන්ථයක් ශෝධනය කරන්නෙකු නිරතුරු ව ම ව්‍යාකරණරීතීන් පිළිබඳ ව පරීක්ෂාකාරි විය යුතු හි. මේ සංස්කරණයෙහි අවසානක්‍රියාපදයක් හා සම්බන්ධ නො වන ($5^{5}$ හි) "සමහරෙක්", ($12^{31}$ හි) "භගවත් තෙම", ($18^{15}$ හි) "රජතුමෙක්" ($38^{19}$ හි) "රජ්ජුරුවෝ" යනාදි ප්‍රථමාවිභක්ත්‍යන්තපද නොයෙක් තැන තිබේ. 19 වැනි පිටුවෙහි 11 වැනි පේළෙන් පටන් ගෙණ 18 වන පේළෙන් අවසන් වන "ඒ රජ.........නැඟූහ" යන වාක්‍යය ද, $30^{15}$ හි "මා...... යෙමි" යන වාක්‍යය ද වැනි වැරදි පාඨශාලාශිෂ්‍යයෙකුගේ වාක්‍යයන්හි ඇතුළත් වුවත් කමා කළ නො හැකි ය. එබඳු වැරදි විශ්වවිද්‍යාලයසංස්කරණයක ඇතුළත් වීම ඉතා කනගාටුදායක ය.

25. ශුද්ධ කරණු ලබන ග්‍රන්ථයට සම්බන්ධ වූ අන්‍ය ග්‍රන්ථ ද අවශ්‍ය තැන්වල දී සසඳ බැලීම ග්‍රන්ථශෝධක යෙකුගේ යුතුකමකි. දළදාසිරිත වනාහි දාඨාවංශයෙහි විස්තෘතපරිවර්තනයකි. විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි 3[18] හි පෙණෙන "පියවිගමතින්" යන්න දාඨාවංශය හා නො සැසඳීම නිසා ඉතිරි වූ දෝෂයකි. දාඨාවංශයෙහි පරිදි රජතුමා මහමෙව්නාඋයනට ගියේ පයිනි. එහෙයින් මේ "පියවි ගමතින්" යන්න "පියගමතින්" යි සකස් විය යුතු ය.

26. දළදාසිරිතෙහි යෙදුනු සිංහලරාජනාමාවලිය මහාවංශ, පූජාවලිආදිය සමග සංසන්දනය කර බලන්ට දළදා සිරිත ශුද්ධ කල එක් කෙනෙක් වත් නො සිතූහ. එහෙයින් සිංහලරජවරුන් නවදෙනෙකුන්ගේ නම් දළදාසිරිතෙන් බැහැර වී ය. සමහර නම් වැරදි ය. 42[10] හි "සෙනෙවි මහ රජ" යන්න "සෙනෙවි මානාරජ" යි විය යුතු ය.

27. "ලොම්තුරු" යන්න සඳහා එම සංස්කරණයෙහි 41[8] හි යෙදුනු 'ලොවුතුරු' යන වචනය ද බුද්ධධර්මය පිළිබඳ ව සාමාන්‍ය දැනීමක් වත් ඇතියෙකුගෙන් නො වන වරදකි. (මේ වචනය පිළිබඳ ව අප ලියූ දෙය 62 වැනි පිටුවෙහි පෙණේ). රාජශේඛරසංස්කරණයෙහි අබොලිපියන ද කවුගෙයි පොත්ගුලෙහි 0: 5, A A ·2 යන අඞ්ක දරණ පොත්හි ද මේ "ලොම්තුරු" යන්න පෙණේ. එහෙත් විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි අබොලිපියක වත් මෙය සඳහන් නො වේ

28. 48[26] හි "බතිස් රා" යන්න ද සංස්කෘතසංගීත ශාස්ත්‍රය හා නො සැසඳීමෙන් ඉතිරි වූ දෝෂයකි. සංගීත ශාස්ත්‍රය අනුව මේ "බතිස්රා" යන්න "සතිස්රා" යි විය යුතු ය. (මේ සඳහා අප ලියූ දෙය මේ පොතේ 109 වැනි පිටුවෙහි පෙණේ). සංගීතයෙහි රාග සතිසක් ඇති බව පුරාතනයෙහි ලක්දිව ඇතුළු දඹදිව බොහෝ දෙනා දනසිටි සාමාන්‍යකාරණයෙකි. එහෙයින් ම විෂ්ණුශර්මින් පඬිතුමා

එය තිරිසන්සෙකු පවා දනසිටිබව පඤ්චතන්ත්‍ර V – 53 හි දී දක්වී ය. දළදාසිරිත් කතුතුමා එබඳු දැනීම පවා නැත්තෙකැයි ශිෂ්‍යයන්ට අනුමාන කරන්ට මේ උගත් සොබිනාවී මිග පාද තැබීම සංවේගයට කාරණයකි.

29. $45^{19}$ න් පටන් ගත් වාක්‍යය දෝෂයන්ගෙන් පිරුණකි. ''නිරතුරු ව පූදාවිසෙස් කරණ ලෙස සක්පසඳුව වඩ්ඩාරු ...... .. දණ්ඩි මේ ආදි වූ පුදවෙසෙස් ද ... ........ සලස්වා'' යන්නෙහි ''පුදවෙසෙස්'' යන්න දෙ තැනක යෙදින. අපගේ සංස්කරණයෙහි එයින් දෙවෙනි ''පුද වෙසෙස්'' යන්න ''වැදවෙසෙස්'' (= වාද්‍යවිශෙෂ) යි සකස් කරණ ලදි. ඒ වාක්‍යයෙහි ම තූර්යභාණ්ඩනාමයන් අතර ''මනාදළිත්''. ''ලුගෙත කැර'', ''කම්බිලි වීරුදු බැඳ'' යන වචන පෙණේ. එහි ඒ වචන නිරර්ථක ය. ''සක්පසඳුව වඩ්ඩාරු'' යන්න ''සක්, පසඳුව වඩ්ඩාරු'' යන විශයෙන් ගෙණ සූචිපත්‍රයෙහි යොදන්ට ඇත්තේ "The Temple of The Tooth in Kandy" නමැති පොතෙහි 34 වන පිටුවෙහි ආචාර්ය සෙනරත් පරණවිතානමහතා විසින් අඩොලිපියක් සේ දක්වූ "The සක්පසඳුව is enumerated by Thup S - P. 150 among kinds of drums along with the උඩැක්කි" යන පාඨය නො කියවීම නිසා යි. ''සක්පසඳුව'' යනු බෙර විශෙෂයකි. ඒ වචනය දෙකට කඩා 'පසඳුව' යන්න ''වඩ්ඩාරු'' යන අනික් තූර්යභාණ්ඩනාමයක් හා ඈඳා යෙදීම කමා නො කළ හැකි වරදකි.

30. පුරාණ ග්‍රන්ථයක් ශුද්ධ කරන්නෙකු (1) පැරණි පිටපත් හා සැසඳීම, (2) අවශ්‍ය තැන්වල දී ඒ ග්‍රන්ථයට සම්බන්ධ අනික් ග්‍රන්ථ හා සැසඳීම, (3) අර්ථය සැලකීම (4) අර්ථයාගේ සම්භාවිතභාවය සැලකීම, (5) ව්‍යාකරණ රීතීන් අනුගමනය කිරීම, (6) අවශ්‍ය තැන්හි දී අන්‍යශාස්ත්‍රාන්තරයන් හා සැසඳීම, (7) ග්‍රන්ථය කළ කාලයෙහි භාෂා විලාසය සැලකීම, (8) බලවත් හෙතුවක් නැති ව ආචාර්ය සම්ප්‍රදාය උල්ලඞ්ඝනය නො කිරීම යන මේ කරුණු පිළිබඳ ව සාවධානතරයන් ම කල්පනාකාරි විය යුතුයි

31. අපේ විශ්වවිද්‍යාලය අනුගමනය කරන්නේ එසින පළමුවැන්න පමණක් ය යන බව හා එය ද ඉතා මත් නො සැලකිල්ලෙන් ය යන බවත් මේ විශ්වවිද්‍යාලයසංස්කරණයෙන පැහැදිලි ව පෙනේ. උගත් ශෝධකයා විසින් ස්වකීය නිවේදනයේ දී කළ ප්‍රතිඥාවට විරුද්ධ ව දික් වූ පාඨභේද ද වචන ද සමහර තැන්හි දී අත්හැර තිබෙනබව කිය හැකි ය. අපගේ සංස්කරණයෙහි $41^{13}$, $44^{17}$, $43^{4}$, $50^{16}$ යනාදි පිටු හා පේළි විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි $42^{5}$, $44^{9}$, $48^{14}$, $49^{17}$ යනාදි තැන් හා සසඳා බැලූවිට එය ඔප්පු වේ.

32. මේ සංස්කරණයෙහි අගට යෙදූ වචනසූචිය ද ශිෂ්‍යයන්ට එතරම් ප්‍රයෝජනවත් නො වේ. එහි 'විද්‍රවනය' යන වචනය පෙණෙතත් එය කිසි ම පිටපතක නැතියකි. $4^{16}$ හි පෙණෙන "ලොවුතුරු" යන වචනය වැනි සමහර වචන එයින් බැහැර වී තිබේ. "ආස්තෘත, ඒකතින්නාද," "සතාතපවරණ" (= ශ්වේතච්ඡත්‍රය) යනාදි වචන එහි යෙදුනේ "අස්තෘත, එකතින්නාද, සීතාතපවාරණ" (=සීතාවගේ කුඩය) යන ලෙසිනි.

33. විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි අධොලිපිවශයෙන් පෙණෙන විෂමපාඨයන් පිළිබඳ ව ද වචනයක් දෙකක් කීම අවශ්‍ය ම ය. "හයානක, ධවලාතපත්‍ර" යනාදි වචන සඳහා සමහරපුස්කොළපිටපත්හි පෙණෙන "හයානබ[1], ධවලාදපත්‍ර, ධවලාධපත්‍ර[2]" යනාදි විෂමපාඨයන් පුරවා පොත මහත් කිරීම අතිශයනිරර්ථකය යනු අපේ හැඟීම යි. "කාසත්‍රිය ඊති" උල්ලඞ්ඝනය නො කොට කළැ යි වැටෙණන විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි "අඹරතුර, (= අහසෙහි), "කොස්දමිට[4]" යනාදිය සඳහා "අඹර තුර[3]" (= අහස ගස), "කොස් දා මිට" යනාදිය තිබෙතැ යි අපේ මේ සංස්කරණයෙහි අධොලිපි වශයෙන් දක්වා පොතෙහි පිටුගණන වැඩි වන්ට සැලැස්

---

1. වි සං 34 පි – 23 අධො. 2. වි. සං. 22 පි – 6 අධො. 3. වි. සං. 34 පි – 26 පෙළ. 4. වි. සං. 11 පි – 19 පෙළ.

එය තිරිසන්සෙකු පවා දනසිටිබව පඤ්චතන්ත්‍ර V – 53 හි දී දක්වී ය. දළදාසිරිත් කතුතුමා එබඳු දනීම පවා නැත්තෙකැයි ශිෂ්‍යයන්ට අනුමාන කරන්ට මේ උගත් ශොධිතාවී මග පාද තැබීම සංවේගයට කාරණයකි.

29. 45¹⁹ න් පටන් ගත් වාක්‍යය දෙෂයන්ගෙන් පිරුණකි. "නිරතුරු ව පූදාවිශෙෂ කරණ ලෙස සක්පසඬුව වඩාරු ...... .. දණ්ඩ මේ ආදි වූ පුදවෙශෙෂ ද ... ....... සලස්වා" යන්නෙහි "පුදශෙවසෙස්" යන්න සෙද තැනක යෙදින. අපගේ සංස්කරණයෙහි එයින් දෙවෙනි "පුද වෙසෙස්" යන්න "වැදවෙසෙස්" ( = වාද්‍යවිශෙෂ ) යි සකස් කරණ ලදි. ඒ වාක්‍යයෙහි ම තූර්‍ය්‍යභාණ්ඩනාමයන් අතර "මිනාදෙළින්". "ඛුගෙත කැර", "තම්බිලි විරුදු බැඳ" යන වචන පෙනෙ. එහි ඒ වචන නිරර්ථක ය. "සක්පසඬුව වඩාරු" යන්න "සක්, පසඬුව වඩාරු" යන වශයෙන් ගෙණ සූචිපත්‍රයෙහි යොදන්ට ඇත්තේ "The Temple of The Tooth in Kandy" නමැති පොතෙහි 34 වන පිටුවෙහි ආචාර්‍ය්‍ය සෙනරත් පරණවිතානමහතා විසින් අශොධාලිපියක් සේ දක්වූ "The සක්පසඬුව is enumerated by Thup S - P. 150 among kinds of drums along with the උඩැක්කි" යන පාඨය නො කියවීම නිසා යි. "සක්පසඬුව" යනු බෙර වෙසෙසකි. ඒ වචනය දෙකට කඩා 'පසඬුව' යන්න "වඩාරු" යන අනික් තූර්‍ය්‍යභාණ්ඩනාමයක් හා ඇඳ යෙදීම කමා නො කළ හැකි වරදකි.

30. පුරාණ ග්‍රන්ථයක් ශුද්ධ කරන්නෙකු (1) පැරණි පිටපත් හා සැසඳීම, (2) අවශ්‍ය තැන්වල දී ඒ ග්‍රන්ථයට සම්බන්ධ අනික් ග්‍රන්ථ හා සැසඳීම, (3) අර්ථය සැලකීම (4) අර්ථයාගේ සප්‍රමාණිකභාවය සැලකීම, (5) ව්‍යාකරණ රීතීන් අනුගමනය කිරීම, (6) අවශ්‍ය තැන්හි දී අන්‍යභාෂාන්තරයන් හා සැසඳීම, (7) ග්‍රන්ථය කළ කාලයෙහි භාෂා විලාසය සැලකීම, (8) බලවත් හෙතුවක් නැති ව ආචාර්‍ය්‍ය සම්ප්‍රදාය උල්ලඞ්ඝනය නො කිරීම යන මේ කරුණු පිළිබඳ ව නිරන්තරයෙන් ම කල්පනාකාරී විය යුතුයි

31. අපේ විශ්වවිද්‍යාලය අනුගමනය කරන්නේ එයින පළමුවැන්න පමණක් ය යන බව හා එය ද ශුනා මත් නො සැලකිල්ලෙන් ය යන බවත් මේ විශ්වවිද්‍යාලයසංස්කරණ යෙන පැහැදිලි ව පෙණේ. උගත් ශෝධිකාව විසින් ස්වකීය නිවේදනයේ දී කළ ප්‍රතිඥාවට විරුද්ධ ව දික්වූ ව්‍යාකරණ ද වචන ද සමහර තැන්හි දී අත්හැර තිබෙනබව කිය හැකි ය. අපගේ සංස්කරණයෙහි 41[13], 44[17], 49[4], 50[16] යනාදි පිටු හා පේළි විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි 42[5], 44[9], 48[14], 49[17] යනාදි තැන් හා සසඳ බැලූවිට එය ඔප්පු වේ.

32. මේ සංස්කරණයෙහි අගට යෙදූ වචනසූචිය ද ශිෂ්‍යයන්ට එතරම් ප්‍රයෝජනවත් නො වේ. එහි 'විද්‍රවනය' යන වචනය පෙණෙතත් එය කිසි ම පිටපතක නැතියකි. 4[16] හි පෙණෙන "ලොවුතුරු" යන වචනය වැනි සමහර වචන එයින් බැහැර වී තිබේ. "ආස්තෘත, ඒකාන්තනාද, "සතාතපවරණ" (= ශ්වෙතච්ඡත්‍රය) යනාදි වචන එහි යෙදුනේ "අස්තෘත, එකන්ත්නාද, සීතාතපවාරණ" (=සීතාව ගේ කුඩය) යන ලෙසිනි.

33. විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි අධෝලිපිවශයෙන් පෙණෙන විෂමපාඨයන් පිළිබඳ ව ද වචනයක් දෙකක් කීම අවශ්‍ය ම ය. "හයානක, ධවලාතපත්‍ර" යනාදි වචන සඳහා සමහරපුසකොළපිටපත්හි පෙණෙන "හයානබ[1], ධවලාදපත්‍ර, ධවලාධපත්‍ර[2]" යනාදි විෂමපාඨයන් පූරවා පොත මහත් කිරීම අතිශයනිරර්ථකය යනු අපේ හැඟීම යි. "ශාස්ත්‍රීය රීති" උල්ලඞ්ඝනය නො කොට කළ යි වැණෙන විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි "අඹරතුර, (= අහසෙහි), "කොස්දමිට[4]" යනාදිය සඳහා "අඹර තුර[3]" (= අහස ගස), "කොස් දා මිට" යනාදිය තිබෙතැ යි අපේ මේ සංස්කරණයෙහි අධෝලිපිවශයෙන් දක්වා පොතෙහි පිටුගණන වැඩි වන්ට සැලැස්

---

1. වි සං 34 පි – 23 අධෝ. 2. වි. සං. 22 පි – 6 අධෝ. 3. වි. සං. 34 පි – 26 පේළ. 4. වි. සං. 11 පි – 19 පේළ.

වුවොත් එය හා යට කී අන්දමේ අධෝලිපි දැක්වීමත් හැම ලෙසින් ම සමාන ය. කතෘහු යෙදූ පාඨය කුමක් දැ යි තීරණය කිරීම සඳහා එයින් කිසි ම වනලක් නො ලැබේ.

34. දෙස්වලින් පිරුණු මෙබඳු පොත් ප්‍රකාශයට පැමිණවීම විශ්වවිද්‍යාලයේ ගෞරවයට කිසිසේත් හේතු නොවන බව කියන්නට වීම අපේ ප්‍රධානවිද්‍යාස්ථානයේ අභිවෘද්ධිය පතන්නා වූ අපගේ කනගාටුවට කරුණකි.

35. පිරිවෙන්වල බොහෝ ආචාර්යවරයන්ට පුරාතන සාහිත්‍යය හා සංස්කෘතිය ද පිළිබඳ පරීක්ෂණයන්හි යෙදීමට ඉඩකඩ නම් ඉතා ස්වල්ප ය. එහෙයින් ඔවුන්ගේ පහසුව සඳහා මෙහි අගට ගැටපදවිවරණයක් ද යෙදීමු.

36. මහනුවර මල්වතු විහාරයේ වැලිවිට ශ්‍රී සරණංකරාභිධාන ස්‍යාමොපාලිමහානිකායේ ගරුතර අනුනායක මහා ස්ථවිර ස්වාමීන්ද්‍රයන්වහන්සේගෙන් හා වත්තේගම ධම්මදීප පරිවෙණාධිපති විද්‍යාවිශාරද පණ්ඩිත හාල්යාලේ සුමනතිස්ස ස්ථවිරනමගෙන් ද, පුරාවිද්‍යාකාර්යමණ්ඩලයේ අධ්‍යක්ෂ ධුරන්ධර ආචාර්ය සෙනරත් පරණවිතාන O. B. E., කෑගල්ලේ හෙට්ටිමුල්ලේ පදිංචි විශ්‍රාම ලත් පාඨශාලාපරීක්ෂක එච්. ගුණතිලක, පාඨශාලාපරීක්ෂක ජේ. ඩබ්ලිව්. කළුආරච්චි යන මහතුන්ගෙන් ද මෙහි ශුද්ධියට හා ගැටපදවිවරණය ලිවීමටත් නොයෙක් උපකාර ලැබුනුබව ස්තුතිපූර්වක ව සඳහන් කරමු. මේ පොත සම්පාදනය කිරීමට අපට ආරාධනා කළ සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගමේ මහතුන්ට ද අපේ ස්තුත්‍යාශීර්වාදය මෙයින් පිරිනමමු.

වැලිවිටියේ සෝරත
නායක ස්ථවිර

1949 දෙසැම්බර් මස 20 දින
විද්‍යෝදය පිරිවෙණේ දී ය.

# ප්‍රස්තාවනාව

මේ පොතට කතෘහු විසින් තැබූ නාමය 'දළදාසිරිත' යනු යි. එය පොතෙහි ඇතුළත් කරුණු අනුව තැබිය හැකි සාමාන්‍යනාමය යි. එයින් අන්‍ය වූ විශෙෂසංඥාවක් සංඥා. මීට නො මැති යි. 'දළදාසිරිත' යන නාමය 'දළ' + 'දා' + 'සිරිත්' යන වචන තුණ සමාසවිධියෙන් එක්ව සිද්ධ ය. දළ සක් වූ දාව = 'දළදා' යි. මෙයින් ගැණෙන්නේ බුදුරජාණන් වහන්සේගේ දන්තධාතූන් සතරනම අතුරෙන් ලඞ්කාවට ලැබුනු ධාතුන්වහන්සේ ය. 'සිරිත්' සද 'චරිත' යන්නෙහි බිඳුනකි. "චරිත්ත, චාරිත්ත, චරිත්‍ර, චාරිත්‍ර" යන පාලිසංස්කෘතශබ්ද 'චරිත' යන්නට සමානාර්ථ ඇත්තේ ය. 'චරිත' යන්නෙහි අර්ථරාශියක් තිබේ. එයින් බිඳුනු 'සිරිත්' යන්න ද සිංහලයෙහි දී අර්ථ කීපයක ම යෙදුනේ ය. එයින් මෙහි 'ඉතිහාසය, ව්‍යවස්ථා' යන අර්ථ ගත හැකි ය. දළදාවහන්සේ පිළිබඳ චරිතය හෙවත් ඉතිහාසය 'දළදා සිරිත' යි කිය හැකි යි. මේ අර්ථය කියන විට එක් අමාරුවකට මුහුණ පාන්ට සිදු වේ. 'චරිත'ශබ්දයෙහි අවයවාර්ථ සලකනවිට ලැබෙන්නේ හැසිරීම මුල් කොට ඇති අර්ථයකි. 'ඉතිහාස' යන අර්ථය ද ඒ හැසිරීම්අර්ථය ප්‍රධාන කොට ගෙණ වූයේ යි. දළදාවෙහි හැසිරීමක් නැත එහෙයින් හැසිරීම් අර්ථය ප්‍රධාන කොට ඇති ඉතිහාසපර්‍ය්‍යාය වූ 'සිරිත්' යන්න 'දළදා' යන්න හා යෙදීම නුසුදුසු ය යි කිය හැකි ය. ඉතිහාසය හෝ ජීවිතකථාව යන අර්ථ ඇති 'සිරිත්' සද අප්‍රාණවාචකශබ්දයක් හා යෙදුනු තැනක් ද අපි නො දන්මු. දළදාවහන්සේගේ ඉතිහාසය පැවසූ පාලිග්‍රන්ථය 'දාඨාවංස' යන නමින් මිස 'දාඨාධාතුචරිත' යන නමින් නො හැඳින්වීම ද, ථූපවංස, බොධිවංස යනාදිය ද ඊට සාධක ය. එහෙයින් 'දළදාසිරිත' යන්න "දළදාවහන්සේගේ ඉතිහාසය" යන අර්ථය අපෙක්ෂා නො කොට යෙදුනකැයි නො කිය හැකි ය.

'හැසිරිය යුතු පිළිවෙළ' යනු ද 'සිරිත්' සඳෙහි අර්ථයකි. එහෙයින් දළදාව පිළිබඳ ව අන්‍යයන් විසින් හැසිරිය යුතු

පිළිවෙල 'දළදාසිරිත' ය යි ද, එය ඇතුළත් වන ග්‍රන්ථයත් අභෙදොපචාරවශයෙන් එනම් වන්නේ ය යි ද, සලකන විට යට කී අමාරුව විය නො හැකි ය.

නිමිත්ත. මේ ග්‍රන්ථකරණයෙහි නිමිත්ත වූයේ ද දළදාවහන්සේට හැසිරිය (= පැවතිය) යුතු පිළිවෙල ලියා තැබීමට කුරුණෑගල වෙසෙමින් ලඞ්කාරාජ්‍යානුශාසනා කළ සතර වැනි පරාක්‍රමබාහු නරෙන්ද්‍රයන්ගේ නියමය යි. එහෙයින් මෙහි ප්‍රධානවශයෙන් සැලකිය යුත්තේ මේ පොතෙහි අග යෙදුනු ව්‍යවස්ථාපඞ්ක්තිය යි. මූල යෙදුනු ඉතිහාසය අප්‍රධාන ය එය ව්‍යවස්ථාපඞ්ක්තියෙහි නිදානකථාව ලෙස සැලකිය යුතු ය.

කර්තෘ. මේ ග්‍රන්ථයෙහි කර්තෘ 'දෙව්රදදම්පසඟිනා' නම් කෙනෙකුන් බව අවසන්හි දක්වන ලදී. ඒ නාමය 'දෙව්රද' ය, 'දම්පසඟිනා' ය යි ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි ය. එයින් 'දෙව්රද' යන්න මහරජු උදෙසා යෙදූවක් විය හැක්කැ යි ඇතැම්හු කියති. නර රජයාට 'දේවයන් වහන්සේ' ය යි යෙදුවත් 'දෙව්රද' ය යි ව්‍යවහාර කළ තැනක් අපි නො දනිමු. පැරකුම්බාරජු උදෙසා මේ පොතේ කර්තෘ යෙදූයේ "රාජචන්ද්‍රකෙනෙක්" $(47^{37})$, "පැරකුම්බා නිරිඳුසඳු" $(54^{5, 15})$ යන වචන ය. එහෙයින් එය එතුමා උදෙසා යෙදූවක් නො ව "දෙවපතිරජ,* දෙවෙන්ද්‍ර" යනාදි නම් වැනි සාමාන්‍යසංඥවකැ යි අපි කියමු. "දෙව්රද නම් වූ දම්පසඟිනා" යනු එහි තේරුම යි.

'දම්පසඟිනා' යන්න ද 'දම්' ය, 'පසඟි' ය, 'නා' ය යි කොටස් තුණකින් යුක්ත ය. එයින් මුල් අවයවය වූ 'දම්' යන්න 'ධම්ම' ශබ්දයෙන් නිදූනකි 'ධම්ම' ශබ්දය —

---

* 'ප්‍රතිරූප' යි බොහෝදෙනා සොදතත් එය 'පතිරජ' යි විය යුතු ය යනු ආචාර්ය සෙනරත් පරණවිතානමහතා E. Z iv. 108 පිටුවෙහි අභිලිපියකින් දක්ව යි.

"ධම්මො සභාවෙ පරියත්තිපඤ්ඤා-
ඤායෙසු සච්චප්පකතීසු පුඤ්ඤෙ,
ඤෙය්‍යෙ ගුණාචාරසමාධිසූපි
නිස්සත්තතාපත්තිසු කාරණාදෙ"

යනුවෙන් ස්වභාවය, ප්‍රගුණ කළ යුතු (ත්‍රිපිටක)පාළිය, ඥානය, න්‍යායය හෝ යුක්තිය, සත්‍යය, ප්‍රකෘතිය, පුණ්‍යය, ඥෙයය හෙවත් දත යුතු දෙය, ගුණය, ආචාරය, සමාධිය, නිස්සත්ත්වභාවය, ආපත්තිය, හේතුව යන ආදියෙහි වැටෙන බව අභිධානප්පදීපිකාවෙහි දක්වන ලදී. 'දහම්' යනු ද 'දම්' යන්නට සමාන ශබ්දයකි.

'දම්පසගි' යන්න පෙණෙන්නේ මේ දළදාසිරිතෙහි පමණකි. කඳවුරුසිරිත, දළදාපූජාවලී, නිකායසංග්‍රහ, සද්ධර්මරත්නාකර යන පොත්හි හා ගඩලාදෙණිශිලාලිපි-යෙහිත් 'දහම්පසක්' යි පෙණේ. ඒ 'පසක්' යන්න මෙන් ම මේ 'පසගි' යන්න ද සැකයට භාජන වූවකි එහෙයින් ඒ පිළිබඳ විස්තරයක් කිරීම ශිෂ්‍යයන්හට ප්‍රයෝජනවත් විය හැකි ය.

'දහම්පසක්නා' යනු අධ්‍යාපනය භාර ව සිටි අමාත්‍ය-යාට යෙදුනු තනතුරු නාමය යි ඇතැම්හු කියති. ඒ සම්බන්ධ ව අප අදහස් පසු ව දක්වනු ලැබේ.

'දහම්පසක්නා' යන්න 'ධර්ම + ප්‍රත්‍යක්ෂ + නායක' යන්-නෙන් බිඳී එතැ යි ද, 'පසක්' යන්නෙන් පර ව අනුනාසිකා-ක්ෂරය වූ 'නා' යන්න වීම නිසා 'ක්' යන්නට 'ග්' වෙතැයි ද, 'ප්‍රත්‍යක්ෂින්' යන වචනයේ ආශ්‍රය නිසා ඉකාරය වී 'පස-ගිනා' යි වෙතැ යි ද, එය නීතිය සම්බන්ධ ව සිටි අමාත්‍යයාට යෙදුනු නමකැයි ද විශ්වවිද්‍යාලයාචාර්යමුඛයකින් බිහි වූ මතයකි [1]

1. වි. සං. ප්‍රස්තාවනා XV පි – අබෝ.

එය ශබ්දවිද්‍යාව (Philology) උගන්වන එකම සථානය යි ප්‍රසිද්ධ තැනින් ප්‍රකාශ වූ අදහසක් වුවත් නො විමසා පිළිගැනීමට අපි කැමැති නො වෙමු. එහෙයින් එය මදක් විමසා බලමු

'ධර්ම, ප්‍රත්‍යක්ෂ' යන ශබ්දයන්ගෙන් 'දහම්, පසක්' යන ශබ්ද බිඳුනැ යි කීම ශබ්දවිද්‍යාවට විරුද්ධ ය. ඒ ශබ්ද බිඳෙන්නේ 'ධම්ම, පච්චක්ඛ, යන පාලිවචනවලිනි. 'පච්චක්ඛ' ශබ්දයෙන් එන 'පසක්' යන්න සිංහලයෙහි නොයෙක් තැන පෙනේ. එහෙයින් 'දහම්පසක්' යන තැන යෙදුනු 'පසක්' යන්න ද එය ම යැයි සැලකීම නම් ඉතා පහසු ය. අමාරුව වන්නේ ව්‍යාකරණයටත් ධර්මයටත් ගැලපෙන සේ අර්ථයක් ගන්නට ගිය විට ය.

'නා' යන්න පර නිමිත්තෙන් පූර්ව වූ 'ක්' යන්නට අනුනාසිකය වී පසු ව 'ග්' යන්න වෙතැයි කීම ද ශබ්ද ධර්මයට පටහැනි වේ. 'කචටතප' යන අකුරුවලට මුලින් කිසිවිටක අනුනාසිකය නො වේ. වන්නේ 'ගජඩදබ' යන අකුරුවලට මුලිනි. අනුනාසිකාක්ෂරයක් පර ව නැතත් 'ක, ඛ' යන අකුරුවලට 'ග' හෝ 'හ' යන්න සිංහලයෙහි සමහර තැන දී වෙයි 'ඵලක > පලග, ඵලිකා > පළිඟු, වෛසාඛ > වෙසඟ, සිඛා > සිහා' යනු ඊට නිදර්ශන යි. එහෙත් වචනාන්ත වූ සංස්කෘත 'ක්ෂ' යන්නට සමාන පාලි 'ක්ඛ' යන්නට එය වූ තැනක් අපි නො දනිමු. ('උගු' (ඉඟු) හෝ 'උග්' යන්න 'ඉක්ෂු' ශබ්දයෙන් එතැයි දක්වන්ට ඉක්මන් නො විය යුතු යි). එසේ වේ නම් 'අක්මල් (< අක්ඛමාලා), අරක්මේ (ආරක්ඛා > අරක්), යක් නුවර (< යක්ඛනගර), රුක් මුල් (< රුක්ඛමූල)' යනාදිය 'අග්මල්, අරග්මේ, යග්නුවර, රුග්මුල්' යනාදිලෙසින් විය යුතු ය. නැවත 'අක්ෂින්, ආරක්ෂින්, යක්ෂින්' යනාදි ශබ්දයන්ගේ "ආශ්‍රය" යෙන් 'අගිමල්, අරගිමේ, යගිනුවර, රුගිමුල්' යනාදි ලෙසින් ද සිද්ධ විය යුතු ය. එබඳු තැනක් අප දන්නා සිංහලයෙහි නම් නො මැති යි.

'ධර්මප්‍රත්‍යක්ෂ (=ධම්මපච්චක්ඛ)' යන්නෙන් අදහස් කරණ ලද්දේ 'ධර්මය ප්‍රත්‍යක්ෂ කළ' නොහොත් 'උගත්' යන අර්ථය යි හඟිමු. එසේ නම් ඒ ශබ්දය ම වැරදි ය. 'ප්‍රත්‍යක්ෂධර්මා (පච්චක්ඛධම්ම)' යන්නෙන් නම් 'ප්‍රත්‍යක්ෂ වූ ධර්මය ඇති හෙවත් ධර්මය ප්‍රත්‍යක්ෂ කළ' යන අර්ථය ගත හැකි ය. එය 'ධර්මප්‍රත්‍යක්ෂ'යි විපර්යාස කර යෙදීමට කරුණක් නො මැති යි.

'ධර්මප්‍රත්‍යක්ෂ' යන්න ව්‍යාකරණානුකූල නිවැරදි වචනයක් ම වුවද, ධර්මය උගත් පමණින් කෙනෙකුන්ට ඒ නම යෙදිය නො හැකි ය. පෘථග්ජන වූ ත්‍රිපිටකධාරී මහාප්‍රාඥයෙකුට වත් 'ප්‍රත්‍යක්ෂධර්ම' යි කිය නො හැකි ය. එය සුදුසු වන්නේ රහතුන් වහන්සේ කෙනෙකුන්ට ය.

'දහම් පසක්නා' යන්න යෙදුනු නිකාය සංග්‍රහාදි පාඨයන්හි 'සිරිත් ලේනා' යන්න ද යෙදුනේ ය. 'සිරිත්ලේනා' යනු නීතිලේඛම්තුමා ය. කඳවුරු සිරිතෙහි එන-

"සේනානායක, එතනායක, භාණ්ඩාරනායක, දිසානායක, අධිකරණනායක, සාමන්තනායක, අර්ථනායක, ගජනායක, රටනායක, මුදල්නායක, බදුනායක, දහම් පසක්නා, මහවියත්නා, මහනැකැතිනා, මහවෙදනා, සිඟානා, මහවෙදනා, දහම්ගෙයිනා, මහවෙළඳනා, සිටුනා, මූලගිනා, අරක්මෙනා, මහදොරනා, කිලිංනා, කපුනා මේ ආදීන් පිරිවරා"

යන පාඨයෙහි 'අධිකරණනායක, අර්ථනායක' යන නම් වලින් දක්වූයේ නීතිය සම්බන්ධ අමාත්‍යයෝ යි.

විශ්වවිද්‍යාලයාචාර්යමතය පරිදි 'දහම්පසක්නා' යන්නෙන් ද නීතිය සම්බන්ධ අමාත්‍යයෙක් හැඟේ නම් ඒ අධිකරණනායකාමාත්‍යයා විය යුතු ය. නීතිසම්පාදකාමාත්‍යයා 'සිරිත්ලේනා' යන්නෙන් නිකායසංග්‍රහාදියෙහි දක්වූ හෙයිනි. 'දහම්පසක්නා' යන්නෙන් එසේ අධිකරණනායකාමාත්‍යයා ද නො හැඟෙනබව කඳවුරුසිරිතෙහි 'අධිකරණනායක, දහම්පසක්නා' යි දෙදෙනෙකුන් වෙන් වශයෙන් දැක්වීමෙන් ඔප්පු වේ. මේ කරුණු නිසා ඒ විශ්වවිද්‍යාලයාචාර්යමතය පිළිගැනීම අපහසු ය.

බොහෝ කලක් ම පිරිවෙන් ශ්‍රේණීන්හි අභියුක්ත ව සිටි එය 'මොලය මොට කරන්නකැ' යි පුවත්පත් මගින් පවා කියා පාන්ට තරම් කෑහැඬ වූ, පසු ව විශ්වවිද්‍යාලයයෙහි ද අභියුක්ත ව "ෂාස්ත්‍රීයක්‍රම" යන්නේ අනුහසින් ද්‍රෝ නොබෝ කලකින් ම ඉතා හොඳින් මොලය උල් කර ගන්නෙකු සේ අගවන්නෙක් ප්‍රසිද්ධ ප්‍රවෘත්ති පත්‍රයක් මගින් දළදඹිපියෙනි විශ්වවිද්‍යාලයසංස්කරණය පිළිගැණීමින් යථොක්තමතයට විරුද්ධ අදහසක් දක්වී ය.

සවකීය ගුරුවරයාගේ වැරදි අප්‍රසිද්ධයේ පෙන්වා දීම හෝල්ලයාගේ පුහුකමකි. දහස් ගණන් මහාජනයා කියවන ප්‍රවෘත්තිපත්‍රමාර්ගයෙන් ගුරුවරයාගේ කෑතිවල දෙස් දක්වීම ගුරුවරයන් සමග තරඟ කිරීමක් වැනි ය. එය සිංහල – බෞද්ධ සංස්කෘතියට පටහැනි බව ගුත්තිලයෙන් ඔප්පු වේ.

ඒ කෙසේ වුවත් ඒ දෙවෙනි මතය වත් පිළිගත හැකි දැ යි පරීක්‍ෂා කර බලමු. 'දහම්පසක්නා, දහම්පසගිනා' යන දෙක එකිනෙකට වෙනස් ශබ්ද ය යි ද, 'මූළගෙහිනා' යන්න 'මූලගිනා'යි වන්නාක් මෙන් 'දම්පසගෙහිනා' යන්න 'දම්පසගිනා'යි වන්නේ ය යි ද, එය රාජකීයපුස්තකාලය භාරකාරයාට කියූ නම ය යි ද ඒ පිරිවෙන් – විශ්වවිද්‍යාලය ශිෂ්‍යයා කිය යි.

'දහම්ගේ' යනුවෙන් 'ධර්මපුස්තකයන් තැන්පත් කළ ගෘහය' යන අර්ථය ලැබෙනබව ප්‍රකට ය. එය කඳවුරු සිරිතෙන් ගෙණ යට දක්වූ පාඨයෙහි ඒ නමින් ම දක්විත.

"ගණසඩගණිකාපෙතො පචවනං ධමම සඩගණිං,
පරිවතෙතසි සො පාතො සුන්දරෙ ධමමමන්දිරෙ"

(මහාවංශ 60-17)

"පරකකමනරින්දසස සබබභූපාලකෙතුනො,
ධමමාගාරෙ තියුතෙතා, සො පිටකතතයපාරගො"

(පාලි ථූපවංශ)

යන තන්හි 'ධම්මමන්දිර, ධම්මාගාර' යන නම්වලින් දක්වෙන් ද එය මැ යි. මේ එක තැනක වත් 'දම්, ධම්ම' ශබ්දයන්ගෙන් පර ව 'පස' යන්න හෝ ඊට ආසන්න 'පච්චය' යන වචනය හෝ නො යෙදෙන් ය. මේ පිරිවෙන්-විශ්වවිද්‍යාලය ශිෂ්‍යයා දක්වන 'දම්පසගේ' යන්නෙන්

(1) ධර්මපාර්ශ්වයෙහි ගෙය,
(2) ධර්මපක්ෂකයෙහි ගෙය,
(3) ධර්මපාංශුවෙහි ගෙය
(4) දූවුනු පාර්ශ්වයෙහි නොහොත් (5) පක්ෂකයෙහි නොහොත් (6) පසෙහි ගෙය

යන අර්ථ ගත හැකි ය. එසින් කිනම් අර්ථයක් 'දම්පසගිනා' යන තැන තිබේ ද යි ප්‍රකාශ නො විම පාඩුවකි. මේ කරුණු වලින් පෙණෙන්නේ 'දහම්පසගෙයි' යන්නෙන් 'දහම් පසගි' යන්න සිද්ධ නොවනබව යි. 'මූළ්ගෙයි' යන්නෙන් 'මූලගි' යි සිද්ධ වෙතැයි කීම ද මුළාවකි. 'මුළුගි' යන්න සිද්ධ වන්නේ 'මූළු, අග්' යන වචන දෙකිනි. 'දානග්ග, උපොසථග්ග' යනාදි තන්හි පෙණෙන 'අග්ග' ශබ්දය 'අග්' යි සිංහලයට එයි. එය රුවන්මලෙහි (181) 'අන' යි ද, සිඛවලඳ,-විනිසෙහි (869) 'අග්' යි ද පෙණේ. ගෘහවාචක ය. මුළු (= බොජුන්) පිසන හෝ වළඳන අන = 'මුළුග' නමි. 'මග්ග' ශබ්දය 'මග්' යි වන්නාක් මෙන් අර්ධානුනාසිකය වීමෙන් 'මුළුඟ' යි ද විය හැකි ය. මුළුගෙහි යෙදුනේ 'මුළුගි' යි. 'මුළුඟ' සදින් නියුක්තාර්ථයෙහි ඉ ප්‍රත්‍යය යි. 'දම්පසගි' යන්න නො ව 'දමගි' හෝ 'දහම්ගි' යන්න නම් 'දහම්ගෙයි නියුක්ත' යන අර්ථ දෙයි. 'දහම්පසගිනා' යන්නෙහි මැදට වැටුනු 'පස' යන්න මේ සද අනික් අර්ථයක ම බැඳ තබයි.

මේ කරුණු නිසා ඒ මතයත් කුමතයක් බව කිය යුතු වේ.

'පසක්නා, පසගිනා' යන දෙක ම එක ම මූලකින් ඇති වූ එකාර්ථවත් ශබ්දය යනු අප අදහස යි. 'පසක්' යන්නෙහි අර්ථය පහදා ගත්විට 'පසගි' යන්න ද ඒ මගින්

විසඳ ගත හැකි ය. එහෙයින් 'පසක්' යන්න හා ඊට ඉතා ආසන්න 'පස්' යන්න ද යෙදුනු තැන් පලමු කොට සොයා බැලිය යුතු ය. 'පච්චක්ඛ' ශබ්දයෙන් බිඳී එන 'පසක්' යන්න සිංහලයෙහි නොයෙක් තැන යෙදුනු ප්‍රසිද්ධ වචනයක් වුවත් එයින් මෙතැන අර්‍ථයක් නො ලැබෙනබව මුල දී දක්වීමු.

ශිලාලෙඛනසංග්‍රහ E. Z) I. යෙහි 87 පිටුවෙහි 54, 55 වැනි පේළිවල "ආ සැලු තුවාක පස්පොත්හි ලියැවියැ යුතු," "දවස් පතා විය වූ තුවාක් පස්පොතහි ලියවා" යන තන්හි 'පස් පොත' යනතෙහි 'පස්' යන්න පෙණේ. එය 'පඤ්චිකා' යන්නෙන් එනබවත් අයවැයගණන් ලියන පොත් 'පස්පොත්' ය යන බවත් වික්‍රමසිංහමහතා කිය යි. (E. Z. I. 106 හි 14 අධෝලිපිය බලනු) එහි ම 4 වන පිටුවෙහි පෙණෙන ජේතවනාරාම(සංස්කෘත)ශිලාලිපියෙහි 28 වන පෙළෙහි 'පඤ්ජිකාපුස්තක'ය යි යෙදිත. 'පඤ්චිකා' යි ව්‍යවහාර වූයේ ද ඒ 'පඤ්ජිකා' යන්න ම ය. එය 'පඤ්ජී' යි ද ව්‍යවහාරයෙහි පැවතිබව ආප්තේගේ සංස්කෘතඉංග්‍රීසිශබ්දකොෂයෙහි සඳහන් වේ. ඒ 'පඤ්ජී' යන්නට සමාන 'පඤ්චි' යන්නෙන් 'පස්' යන්න ආබව සිතිය හැකි ය.

ශිලාලෙඛනසංග්‍රහයෙහි IV. 256 පිටුවෙහි 15 වන පේළියෙහි "විහාරරක්‍ෂාවේ සිටි ලියන්නවුන් සම්දරුවන් වණ්ණකුවරුන් බමුණන් පසකුන් සිත්තරුන්" යනාදි පාඨයෙහි 'පසකුන්' යි හුදු 'පසක්' සද පෙණේ. එය 'පාවක' ශබ්දයෙන් එතැයි ද, 'අරක්කැමියන්' යනු එහි අර්‍ථය ය යි ද, ගුණශේඛරමුදලිතුමා කිය යි. (E. Z. IV. 260 n 2). 'පාවක' ශබ්දයෙන් 'පසක්' යි එන හැකි වුවත් ඒ ශබ්දය 'අරක්කැමි' අර්‍ථයෙහි යෙදුනු තැනක් නො පෙණේ. 'අරක්කැමි' අර්‍ථය දෙන ප්‍රසිද්ධශබ්ද තිබිය දී ඒ අර්‍ථයෙහි අප්‍රසිද්ධ මේ 'පසක්' සද යෙදුව යි ද කිය නො හැකි ය.

යට දක්වූ 'දස්සිකා' යන්නෙහි අවයවාර්ථය නම් 'විස්තර කරන්නී' යනු යි. එය 'දස්සක' ශබ්දයෙහි ස්ත්‍රීලිඞ්ගරූපය යි. 'විස්තර කරන්නී' යන අර්ථ ඇති 'දස්සිකා' ශබ්දය අයදියගණන් ලියන පොත්වලට ව්‍යවහාර වූයේ නම්, අයවැයගණන් ලියන්නාට හෝ ඒ සම්බන්ධ කටයුතුවල නියුක්තයාට 'දස්සක' ය යි හෝ 'දස්සිකාකාර' ය යි කිය හැකි ය. ඒ 'දස්සක' යනුවෙන් 'පසක්' යි සිංහලයට එයි. යට දක්වූ ශිලාලේඛනපාඨයෙහි 'පසකුන්' යන්න සිද්ධ වූයේ මේ 'පසක්' සදිනි. එහි ම 'ලියන්නන්' යන්න තිබිය දී 'අයවැයගණන් ලියන්නන්' යන අර්ථ ඇති 'පසකුන්' යන්න කුමට ද? යි ප්‍රශ්න කළ හැකි ය. ඒ ලියන්නන්ගේ කාර්යය අනෙකක් වී ය. එනම් පොත් පිටපත් කිරීම යි. මේ පසකුන්ගේ කාර්යය අයවැයගණන් ලිවීම හා පාලනය යි. එහෙයින් ඒ දෙපක්ෂය ම අවශ්‍ය ය.

E Z I 85 හි 31 වන පේළියෙහි ද, 88 හි 4 වන පේළියෙහි ද "පසක්කැමියා" යි විහාර පිළිබඳ උපස්ථිලයක් දුරුවෙක දක්වේ ඒ 'පසක්කැමි' යන්න 'දච්චයකම්මික' යන්නෙන් බිඳී එකැයි ද, විවරුදිප්‍රත්‍යය සම්පාදනය පිළිබඳ තනතුර දරුවහුට ඒ නමකැයි ද, ශිලාලේඛන සංග්‍රහයේ සම්පාදකයෙක් වූ වික්‍රමසිංහමහතා කිය යි. එසේ නම් ඒ වචනය 'පසකැමි' යි විය යුතු ය. යට දක්වූ ගාථාවි 'අග්ග' ශබ්දය 'දච්චය' ශබ්දය හා යොදා සිද්ධ කළ 'පච්චයග්ග' යන්නෙන් එය බිඳුනකැයි ද, භාණ්ඩාගාරිකයාට නමකැයි ද කිය නො හැකි ය. 'පච්චයග්ග' ශබ්දයෙන් 'පසග්' සදක් වෙයි නම්, එය [E Z. I. $85^{13}$ ආදි තන්හි යෙදුනු 'කොටස' යන අර්ථ ඇති 'වසග්' සද ධම්පියාඅටුවා ගැටපද($167^{10}$)යෙහි 'වසක්' යි ද, 'බග්, වෙසග්' යනාදිය 'බක්, වෙසක්' යි ද, යෙදුනාක් මෙන් 'පසක්' යි ද විය හැකි ය. එහෙත් එය විභක්ත්‍යන්ත වන විට ["එක් කෙනකුන්ට දෙන වසගින් භාගයක් පමණ" (කුදුසිඛ 311 සන්නය) යන තන්හි 'වසගින්' යි ද 'බග, වෙසග' යි ද වන්නාක් මෙන්]

'පසහිත්, 'පසගුත්' යි විය යුතු ය. එහෙයින් 'පසකුන්' යන්න 'පසක්කැමි' යන්නෙහි පූර්වභාගය වූ 'පසක්' යන්නෙන් ම සිද්ධ වන්නකැ යි සලකන විට එය 'පච්චයග්ග' යන්නෙන් බිඳුනකැ යි කිය නො හැකි ය.

'පසක්කැමි' යන තැන 'පසක්' සදත් 'පක්ඛක' යන්නෙන් ම එන්නකැ යි ද පසකුන්ගේ ප්‍රධානයා 'පසක් කැමියා' ය යි ද සිතමු.

අයවැය පිළිබඳ කට යුතු කළවුන් 'පසක්' සඳින් ව්‍යවහාර කළ බව අපි දුන් දක්නෙමු 'දහම්පසක්නා' යන තන්හි 'පසක්'සදෙහි ප්‍රභවය හා අර්ථය ද ඒ අනුව නිර්ණය කළ හැකි ය. ධර්ම සම්බන්ධ අයවැය කට යුතු කරන්නා 'දහම්පසක්' යි නිශ්චය කිරිම දුන් අපහසු නො වේ.

ශබ්දයන්ගේ අර්ථ කල් යත විට අඩු වැඩි වනබවත් වෙනස් වන බවත් ශාබ්දිකයෝ දනිති. 'මැළිබව' යන අර්ථ ඇති 'ආලස්‍ය' ශබ්දයෙන් දෙමළට ගිය 'ආලස්‍යම්' යන්න 'ආලිස්සම්, ආලෙස්සම්' යන රූප දෙකකින් සිංහලයට පැමිණ "1. කම්මැළි (සර $849^{38}$), 2. කම්මැළිබව, 3. අගෞරව, පමත් (සලී $266^{18}$, $398^{14}$, ජා $640^{4}$), 4. උපේක්ෂක, මධ්‍යස්ථ (ජා $508^{8}$), 5 ආඩම්බර සහිත (ජා $428^{23}$)" යනාදි අර්ථයන්හි ද කථාව්‍යවහාරයෙහි 'විහිළු තහළු' යන අර්ථයෙහි ද යෙදුනුබව දනිමු. තවත් එබඳු තැන් සුලභ ය. එලෙසින් ම මේ 'පසක්' යන්න ද විපර්යාසයන්ට භාජන විය හැකි ය. කථාව්‍යවහාරයෙහි පවත්නා 'කටයුතු, වැඩපල' යන අර්ථ ඇති "අහෙක් පහෙක" යන්නෙහි 'පහෙක්' යන්න ද මේ 'පසක්' යන්නෙහි විකෘතියකැ යි සිතේ. 'අහෙක්' යන්න 'අකට විකට, ආවරමේවර, ආලෝපාලු' යනාදීන්හි පූර්වාවයවය මෙන් වාක් ශ්ලිෂ්ටත්වය සඳහා යෙදුනකි. මේ හෙයින් බලනවිට 'පසක්' යන්නෙන් 'කටයුතු' යන අර්ථය ද ගත හැකි ය.

දහම් පිළිබඳ පසක් (= කටයුතු) ඇත්තා 'දහම්පසක්' නම් වේ. අප නො දන්නා යම් කිසි හෙතුවක් නිසා පුරාතන සිංහලයන් බොහෝ ශබ්දයන්ගේ අගට ඉකාරයක් එකතු

කළබව පැරණිශිලාලේඛනයන්හි පෙනෙන 'අකිරි (= අකුරු), අරිති (= අරුත්) අගි (= අඟ), ඇමැති (= ඇමැත්), පසගි (= පසඟ), ඉතිරි (=උතුරු)' යනාදි බොහෝ ශබ්දයන්ගෙන් ඔප්පු වේ. ඒ අනුව 'දම්පසක්' සදින් 'ඉ'යන්න වූ විට 'පල්ලඞ්ක, එලක' ශබ්දයන්ගෙන් බිඳුනු 'පලක්' යන්න ස්වරාන්ත වන විට 'පලඟ' යි ද, 'එළිඟ' යන්නෙන් 'පළිඟු' යි ද වන්නාක් මෙන්, 'ක්' යන්නට 'ග්' යන්න වීමෙන් 'දම්පසගි' යි සිද්ධ විය හැකි ය.

මේ දක්වූයේ 'පසගි' යන්න සිද්ධ විය හැකි එක් ක්‍රමයකි. 'පසක්කැම්, පසකුන්, පස්පොත්' යන වචන නො සලකතොත් හෙවත් 'දහම්පසක්' යන තැන 'පසක්' යන්න එයින් අන්‍යයකැ යි ගණිතොත් 'ධර්මපාර්ශ්වයෙහි (= ධර්මය පිළිබඳ කාර්‍යමණ්ඩලයෙහි) අග්‍රයා' යන අර්ථයෙහි 'දම් + පස් + අග්' යන වචන තුණ එක් වීමෙන් 'දම්පසග් (ක්)' ය යි ද ඉකාරාන්ත වීමෙන් 'දම්පසගි' යි ද සිද්ධ විය හැකි ය. එසේ ම 'යෙදුනු, ඇලුනු, බැඳුනු' යන අර්ථ ඇති සංස්කෘත 'ප්‍රසඞ්ගින්' යන්නට සමාන පාළි 'පසඞ්ගි' ශබ්දය හා සමාස වූ 'ධම්ම-පසඞ්ගි' යන්නෙන් ද ආ සේ සැලකිය හැකි ය.

'නායක'ශබ්දයෙන් සිංහලයට එන 'නා' යන්න අමාත්‍යාර්ථයෙහි ද යෙදුනුබව "සරහා සෙනඟ නා – දනන් දන්වන යතුරට" (සව් 250), "ආබෝනා' (E Z II 222) "බුදල්නා" (E. Z. II. 223) යනාදි තැන්වලින් පෙනේ.

සිංහලරජවරුන්ට නීති සම්පාදනය, නඩු විසඳීම ආදි නීතිය පිළිබඳ කටයුතු සඳහා සිරිත්ලේනා, අධිකරණනායක, අර්ථනායක යන අමාත්‍යවරු සිටියහ. ධර්මපුස්තකාලය පාලනයට 'දහම්ගෙයිනා' නමැති ඇමැතියෙක් වී ය. එහෙයින් දහම්පසක්( = පසගි )නාවන්ට නීතිය සම්බන්ධ වූ හෝ ධර්මාගාරසම්බන්ධ වූ කාර්‍යයක් නො වී ය. ඔහුට පැවරී තුබුනු කාර්‍යය කුමක් දැ යි දැන් සෙවිය යුතු ය.

පුරාතනයෙහි රජවරුන්ට 'ධර්මාධිකාරි, ධර්මස්ථ, ධර්මමහාමාත්‍ර' යන නම්වලින් හඳුන්වනු ලැබූ අමාත්‍යයන් සිටිබව පැරණි ලේඛනයන්ගෙන් ඔප්පු වේ. ධර්මමහාමාත්‍රයන් පළමුවරට ඇති කිරීමේ ගෞරවය ධර්මාශෝක මහරජතුමාට අයත් විය යුතුබව එතුමාගේ ශිලාලේඛනයන්ගෙන් පැහැදිලි වේ. ඒ ධර්මමහාමාත්‍රයන්ට අයත් වූ රාජකාර්‍යය ද ඒ ශිලාලේඛනයන්හි දක්වේ 'Inscriptions of Asoka' (By E. Hultzsch, Ph. D) නමැති ග්‍රන්ථයෙහි 88, 130 යන අංක දරණ පිටුවල පෙනෙන ශිලාලේඛනයන්හි ධර්මමහාමාත්‍රයන් කළ රාජකාර්‍යරාශියක් විස්තර කරණ ලදි. 1. සියලු ආගමධර්ම පිළිබඳ කට යුතු, 2 ගිහිපැවිදි දෙපක්ෂයේ යහපත සඳහා කළ යුතු දේ, 3. දනමාන නාදිය, 4. මෙහෙකරුවන් හා ස්වාමීන්ගේ යහපතට අදාළ කටයුතු, 5 බ්‍රාහ්මණගෘහපතීන්ගේ ශුභසිද්ධිය, 6. අනාථයන් හා වෘද්ධයන් ද පෝෂා බලා සංග්‍රහ කිරීම, 7. ගුණධර්මාභිවර්ධනයෙහි නියුක්තයන්ට උපකාර කිරීම, 8 හිරගෙයි වැටුනවුන්ගේ දූදරුවන්ට ආහාරපානාදියෙන් උපකාර කිරීම, 9 හිරගෙයි වැටුනු පිරිසත් හා මහල්ලන් ද එයින් නිදහස් කර සුදුසුතැනවලට යැවීම, 10. ගමන් කරන්නන්ගේ සුවපහසු සඳහා මඟ දෙපස ගස් වැවීම, 11 මඟ යොදුනෙන් යොදුන ළිං පොකුණු කැණවීම, 12 සුදුසු තන්හි පියනැටිපෙළවල් තැනවීම, 13. පින්පැන්මඩු කරවීම, 14 අම්බලම් කරවීම, 15. උයන්වතු ඇති කිරීම යනාදි මහාජනෝපකාර පින්දහම් කටයුතු ඔවුන්ට පැවරී තුබුනු බව එයින් පෙනේ. සිංහලරජවරුන්ගේ දහම්පසක්නාවන් ද මේ ධර්මමහාමාත්‍රයන් ම විය යුතු ය යි හඟිමු. ඔවුන්ට ද යට දක්වූ සියල්ල ම කෙසේ වෙතත් එයින් කොටසක්වත් පැවරී තිබෙන්ට ඇත දෙවෙනි පැරකුම්බාමහරජතුමාගේ අමාත්‍යයෙකු වූ දෙවපතිරජතුමා කරවූ කටයුතු පරීක්ෂා කර බැලූවිට පෙනෙන්නේ ඒ ඇමැතිතුමා ඒ රජතුමාගේ ධර්මමහාමාත්‍රයා හෙවත් දහම්පසක්නැවා වූ බව යි. මේ පොත කළ දහම්පසගිනාවන් ද ආගමධර්ම සම්බන්ධ වූ ද

මහාජන ශුභසිද්ධිය සම්බන්ධ වූ ද කටයුතුවල යෙදී සිටින්ට ඇත. අධ්‍යාපනය ද මහාජනයාගේ ශුභසිද්ධිය පිණිස වන්නක් හෙයින් දහම්පසක්නාවන් අධ්‍යාපනය සම්බන්ධ කටයුතුවල නො යෙදුනැ යි කිය නො හැකි ය. එහෙයින් "............ මහතුන් දෙදෙනා ම දහම්පසක්නා අධ්‍යාපන අමාත්‍යයා හැටියට හඳුන්වා තිබේ. එසේ ද වුවත්" අධ්‍යාපන අමාත්‍ය යන අර්ථය මේ වචනයට දීම දුෂ්කර ය.[1] යන විශ්වවිද්‍යාලයමතය පිළිගැණීම නම් දුෂ්කර ය.

'දහම්' යන්නෙහි 'න්‍යාය, යුක්තිය හෝ නීතිය' යන අර්ථය තුබුනත් 'දහම්පසක්නා' යන්නෙහි 'දහම්' සද ඒ අර්ථය නො ව 'පුණ්‍ය, ගුණ, ආචාර' යන අර්ථ අපෙක්‍ෂා කොට යෙදුනුබවත් මහරජු උදෙසා දහම් හෙවත් පින්, ගුණධර්ම, යහපත් ආචාර යන මේ කරුණු සඳහා අයවැය කටයුතුවල යෙදුනුඅමාත්‍යයා 'දහම්පසක්නා, දහම්පසගිනා' යන නම්වලින් හඳුන්වන ලද බවත් අපි කියමු.

මේ පොතෙහි අවසන්හි පෙණෙන ව්‍යවස්ථාපඬසාතිය ද දෙශපාලනාදියට සම්බන්ධ නො වේ. දළදාසිරිත කිරීමේ පරමාර්ථය වූයේ දළදාවහන්සේට හැසිරිය යුතු පිළිවෙළ දක්වනු පිණිස ව්‍යවස්ථා සම්පාදනය යි. එය සිරිත්ලේඛනාවන්ට හෝ පවරා දම්පසගිනාවන්ට ම භාර කෙළ එතුමාට ආගමධර්මය පිළිබඳ කටයුතුවල ප්‍රධානත්වය පැවරී තුබුනු හෙයින් ම ය.

හතරවැනි පැරකුම්බාරජුගේ කැමැත්ත පරිදි දෙවරද දම්පසගිනාවන් විසින් මේ දළදාසිරිත කළබව මෙහි අවසන්හි දක්වන ලද නමුත් මහාවංශයෙහි 90

**විරුද්ධමත.** වැනි පරිච්ඡේදයෙහි 77, 78, 79 යන ගාථා කියන්නේ හතරවැනි පැරකුම්බාරජතුමා විසින් සවමතියෙන් 'දළදාසිරිත' නම් ග්‍රන්ථයක් සිංහල භාෂාවෙන් කළ බව යි. මේ කථා දෙක කෙසේ ගැළපේ ද?

---

1 වි සං. ප්‍රස්තාවනා xv. පිටුව

රජතුමාගේ විධානයෙන් කළ කාර්‍ය්‍යය රජු කෙරෙහි ම
ආරෝපණය කර දක්වීම සිරිතකි. ඒ සිරිත අනුව මහා-
වංශකතෘ දළදාසිරිත රජතුමාගේ ම කෘතියක් ලෙස දක්වී ය.
එපමණක් නො ව සිංහලජාතකපොත ද එතුමා විසින්
කරණ ලද්දක් සේ ලියා තැබී ය. එය නොයෙක් අන්දමේ
ශක්ති ඇති කතීවරයන් තිපදෙනෙකුන් විසින් ලියන
ලද්දක් බව එහි භාෂාවිලාසයෙන් ම ඔප්පු වේ.

හයිගර්මහතාගේ මහාවංශසංස්කරණයෙහි පෙණෙන
"කාරයිත්වා තතො රජා කත්වා තදනුසාරතො" යන පාඨ
යෙන් ලැබෙන්නේ ඒ රජතුමා **දළදාසිරිත** කරවූ බවයි.

මේ පොත සම්පාදනය කරණලද්දේ හතරවැනි පරාක්‍රම
බාහුරජතුමාගේ කාලයෙහි දී ය. එතුමා රාජ්‍යයට
පැමිණියේ බුද්ධවර්ෂ 1846 දී ය. දළදාසිරිත් අව-
**කාලය.** සන්හි "සතවසිනෙක්දහස්දෙසියසත්සාළිස් වස්
සපිරුණු සඳ" යනුවෙන් 1247 වැනි ශකවර්ෂය
සඳහන් වේ. එය බුද්ධවර්ෂ ප්‍රමාණයෙන් 1868 ය. මහාවංශයට
එය විරුද්ධ වෙයි. ශකවර්ෂ 1232 දී එතුමා සිංහාසනාරූඪ ව
සිටිබව "**සරසෝතිමාලෛ**" නම් ද්‍රවිඩකාව්‍යයෙන් හැඟෙන
බව ශිලාලෙඛනසංග්‍රහයෙහි iii. කාණ්ඩයෙහි පෙද්දූ සිංහල
රජනාමලෙඛනයෙහි සඳහන් වේ. එහෙයින් දළදාසිරිතෙහි
දක්වූයේ එය රචනා කළ අවුරුද්ද ය යි නිශ්චය කට හැකි ය.

හතරවැනි පැරකුම්බාරජුගේ කාලය ලංකාවෙහි පරිහානි
යුගයක ආදිම භාගය යි කිය හැකි ය. පුරාතනසමෘද්ධිය
වැන්තක් එකල්හි නො වී ය. ඊට හෙතුව
**තත්කාලීන** විදෙශීයයන්ගේ ආක්‍රමණය යි සමහරු කියති.
**තත්ත්වය.** එය මුළුමනින් අනුමත කළ නො හැකි ය.
ඉතා පුරාතනයේ දී ද ලංකාව විදෙශිකයන්ගේ
ආක්‍රමණයන්හි කුළුරස වින්දේ ය. දුටුගැමුණු වළගම්බා
ආදිරජවරුන් ලංකාව එක්සත් කෙළේ දකුණු ඉන්දියාවෙන්
පැමිණි බලසම්පන්නද්‍රවිඩාදීන් හා මහයුද කිරීමෙන් පසු ව ය.

ඒ අතිපුරාතනකාලයෙහිත් ශතවර්ෂයක් පමණ දෙතුන්වරක් විදෙශීයයන් හා සටන් කිරීම සඳහා ලක්වැසියන්ගේ ශක්තිය යෙදුණේ ය. විදෙශීයයන් හා කළ යුද්ධයෙකින් පසුව රටේ ශක්තිය දියුණු වූ බව දුටුගැමුණු ආදි රජුන් විසින් කරවූ මහාකර්මාන්තයන්ගෙන් ඔප්පු වේ. මහා පරාක්‍රමබාහුරජතුමාගෙන් පසුව සිටි බොහෝ රජවරු ද විරුද්ධ ව මෙහි ආ සතුරන් සමඟ පලවා හැරීමට සමර්ථ වූ නමුත් රටෙහි පුරාතනසමෘද්ධිය වැන්නක් ඇති කිරීමෙහි අසමර්ථ වූහ. එය ඒ රජුන්ගේ වරදක් නො වේ. රට සතුරන්ගෙන් බේරා ගත් වහා ම ඒ රජුන්ගේ සිත යොමු වූයේ රටෙහි සමෘද්ධිය ඇති කිරීමේ මාර්ග දෙසට ය. රට හැම්ලෙසින් ම සමෘද්ධ කරන්ට ඒ රජවරු වෙහෙස දැරූහ. එහෙත් මහාපැරකුම්බාරජතුමාගෙන් පසුව සිටි එක ද රජෙක් ඊට සමර්ථ නො වී ය.

සදවෙනි පැරකුම්බාරජතුමා රටෙහි ශාස්ත්‍රවර්ධනය සඳහා උපක්‍රම යෙදී ය. එතුමා "ශ්‍රීලඞ්කාද්වීපයෙහි ශාස්ත්‍ර පැවැත්ත මැනැවැ යි සංස්කෘත දන්නා පඬිවරුන්ට ද වෛද්‍යශාස්ත්‍ර එලු මගද දන්නා පඬිවරුන්ට ද වෘත්ති සලස්වා දස දස දෙනා බැගින් පාවා දී ශාස්ත්‍රාභ්‍යාස කරවූ" බව දළදාපූජාවලියෙ කිය යි. ඒ රජතුමාගේ උත්සාහයෙන් රටෙහි අකුරු දන්නන් බෝ වූහ නිසැක ය. එහෙත් එතුමා වැනි නානා ශාස්ත්‍රප්‍රවීණ පඬිවරුන් ඇති වූ බව කියන්ට සාක්ෂ්‍ය හිඟ ය. ඊට හේතුව විදෙශීයාක්‍රමණ ම ය යි කියතොත් මූලා වූවන්ගෙන් අග්‍ර නියා ය.

විදෙශියාක්‍රමණ රටෙහි පිරිහීමට හේතු නො වූව යි අප කියනැ යි මෙයින් නො සිතිය යුතු යි. ඉතා ඈත පුරාතනයෙහි විදෙශියාක්‍රමණයන්ගෙන් වූ පරිහානිය නොබෝ කලකින් ම වළක්වා ගැනීමට ශක්තිය ඒ පුරාතනයන්ට තුබුනු නමුත් මහාපැරකුම්බාකාලයෙන් පසු එය ක්‍රමයෙන් පිරිහී ගිය බව කිය හැකි ය. ඊට හේතුව දීර්ඝකාලයක් ම වගා කිරීම නිසා රටෙහි පොළොව නිසරු වීම යි. ඉතා පුරාතන-

සේ දී සුළුවෙහෙසකින් මහත් අස්වැන්නක් පොළොවෙන් ලැබුණේ ය. එහෙයින් එකල්හි රටෙහි ආහාරපාන සුලභ වී ය. පරසතුරන්ගෙන් හා ලෙඩරෝගයන්ගෙන් ද වැදනු පහරවල් උපුලන්වත් ධර්මශාස්ත්‍ර හැදෑරීමටත් කායශක්තිය හා බුද්ධිබලයත් පුරාතනයන් තුළ තුබුණේ ය. නිසරු පොළොවින් ලැබුණු අස්වැන්න ස්වල්ප වූවාක් මෙන් ම පෝෂණ ගුණයෙන් ද බෙහෙවින් අඩු වී ය. මිනිසුන්ගේ කායඥානබල පිරිහින. මිනිස්සු රෝගාතුර වූහ. එහෙයින් ම පුරාණ ධාන්‍යාගාරය වූ රජරට හා රුහුණේ විශාලප්‍රදේශයකුත් ක්‍රමයෙන් වනගත වී ය. දැරණී වැව්අමුණුආදිය නටබුන් වී ය. ගොවිතැන් කිරීම සඳහා අහස්දිය කෙරෙහි ම බලාපොරොත්තුව තබා සිටිය යුතු ප්‍රදේශයන්හි ම මිනිස්සු රැස් වූහ. වුව මනා විටක ගත හැකි සේ ජලය රැස් නො කළ ප්‍රදේශයන්හි කෘෂිකර්මයෙන් මහත් අස්වැන්නක් ලැබිය නො හැකි ය. එහෙයින් ලඞ්කාව ආහාරසම්පත්තියෙන් දිළිඳු වී ය. විෂමජ්වරය (මැලේරියා උණ) මිනිසුන්ට උරුමයක් වැනි වී ය. වුව මනා පමණ සුදුසු ආහාර නොලබන, ශරීරශක්තියෙන් පිරිහුනු මිනිසුන් ගහන රටක් සමෘද්ධ වන්නේ කෙසේ ද? එබඳු දිළිඳුජනසමාජයක ශ්‍රේෂ්ඨ උගතෙකු හෝ මහාකවියෙකු ඇති වන්නේ ඉතාමත් කලාතුරකිනි. මේ නයින් සලකා බලන කල පෙනෙන්නේ රටේ අසමෘද්ධියට ප්‍රධානහේතුව විදෙශීයාක්‍රමණ නො ව පොළොවෙහි නිසරුකම ය යන බව යි.

පොළොව පෙර මෙන් සරු වූයේ නම්, මැලේරියා උණත් මුල් බැස නො ගත්තේ නම්, රජරටත් රුහුණේ විශාල ප්‍රදේශයකුත් සිංහලරජුන් දුර්වල වූ කාලවල දී ද්‍රවිඩයන් වාසස්ථාන කරගණු එකාන්ත ය. එහෙයින් නිසරුබව හා මැලේරියාවත් සිංහලයන්ට හතුරන් සේ පැමිණි මිතුරන් සේ සැලකිය හැකි යි.

කුරුණෑගල්කාලයෙහි හා තදනන්තර කාලයන්හිත් බොහෝ මහපඬිවරයන් හා මහකිවිවරුන් මේ රටෙහි සිටියහ යි කියන්ට

සාක්ෂ්‍ය නො මැති යි. කිප දෙනෙකුන් නම් සිටිබව කිය යුතු ය. ගම්පලකාලයෙහි වැජඹුනු මයූරසන්දේශකර්තෘ මහාකවියෙකු සේ මෙහි දී නො දැක්වුවොත් වැරදි යි. මහාකවීහු හෝ ශ්‍රේෂ්ඨ පඬිවරයෝ හැම්දාම ඇති නො වෙත් එහෙයින් කුරුණෑගල්කාලය ඔවුන්ගෙන් හිස් ය යි පහත් කර දක්වතොත් යෝග්‍ය නො වේ. ඒ කාලයෙහි සිටි විල්ගම්මුලමහාසථවිරයන් වහන්සේ උසස් උගතෙක් වූහ.

විදේශීයයන් හා යුද කිරීමෙන් කල් ගෙවන්ට වූ හෙයින් සිංහලරජවරුන් ශිල්පශාස්ත්‍රඥයන්ට සංග්‍රහ නො කළහ[1] යි කියතොත් වැරදි ය.

**රජවරු උදාසීන වූවෝ ද?**

දෙවෙනි පැරකුම්බා රජතුමා ක්‍රියා කළ අන්දම කෙබඳු දැ යි යට දැක්වීමු. සෙසු රජවරු ද ඒ ක්‍රියාමාර්ගය අනුගමනය කළහ. උගතුන් විසින් කළ සුලු ශාස්ත්‍රීයකෘති පවා උසස් කොට සලකා ඔවුන්ට ගම්බිම්ආදිය පරිත්‍යාග කිරීමෙන් සංග්‍රහ කළහ. ලඞ්කාව බෙහෙවින් පිරිහී ගිය මහනුවරකාලයේ දී පවා බාරසකාව්‍යය නම් දුෂ්කරබන්ධනයට ලැබුනු පල්ලේබැද්ද නම් මහත්ගම්වරය ඊට එක් සාක්ෂ්‍යයකි.

මේ පොතෙහි කතුතුමා ද ඒ කාලයෙහි සිටි උගතුන් ගෙන් ප්‍රධානයෙකැ යි සැලකිය හැකි ය. විද්‍යාචක්‍රවර්ති

**දළදාසිරිත්කතුතුමාගේ ශක්තිය**

ආදීන්ට මෙන් මහාප්‍රතිභාන ශක්තියක් එතුමාට තුබුනුබවක් මේ පොතෙන් ප්‍රකට නො වතත් එතුමා භාෂාඥනයෙන් උසස්තැනක් ගත්බව නම් නිසැක ලෙස පෙණෙන්නකි. ධර්මප්‍රදීපිකා, අමාවතුර, මුවදෙව්ද, කව්සිළුමිණි ආදි පොත් එතුමාට ඉතා පුහුණුව තුබුනුබව මෙහි නොයෙක් තැනින් ඔප්පු වේ. සංස්කෘතභාෂාවෙහි ද ප්‍රවීණත්වයක් එතුමා තුළ වූ බව මෙහි යෙදුනු "අකල්ක,

---

1. වි. සං. ප්‍රස්තාවනා vi. පිටුව – 31 පෙළ.

ජිද්‍රාපණ, පරරජරුහුබාහු" යනාදි සංස්කෘතප්‍රයෝගයන්ගෙන් පැහැදිලි වේ. එතුමා තතනමින්-අමාරුවෙන්-වචන සොයා යෙදූව යි [1]කීම ඉතා අයුතු ය. ලියන්නන් විසින් වැරදවූ එතුමාගේ වචනයන්හි ඇද ඇරීමට වත් දන් සිටින බොහෝදෙන සමත් නො වෙති. එතුමාගේ ආචාර්‍ය වූයේ පරාක්‍රමබාහුරජතුමාගේ ගෞරවයට පාත්‍ර වූ ශ්‍රීපරාක්‍රමබාහුපරිවෙණාධිපතිත් වහන්සේ ය යන බව පොතෙහි අවසානපාඨයෙන් හැඟේ. මේ දම්පසගිනාතුමා උසස් ග්‍රන්ථකර්තෘවරයකු යි නො කිය හැකි වුවත් තමාට භාර වූ කාර්‍යය සම්පූර්ණ කිරීමට වුව මනා ශක්තිය ඇති ව සිටියෙකු බව නම් කිය හැකි ය.

දෙව්රදදම්පසගිනාවෝ මේ දළදාසිරිත ලිවීමේ දී විද්‍යාචක්‍රවර්ත්ති, ගුරුළුගෝමි ආදි ග්‍රන්ථකර්තෘවරයන් නො ගත් මඟක් ගත්හ. "එ දන හැම සඳන්හල
රචනාක්‍රමය නිදන් කැරැ එ පස්කම් නොකම්පස් එකම්පස් ලෙසින් දනැ"

"තුන්ලොවැසිදනා සතොසිනා සුවදිනා වසතිනා ; බරණිනා පුදමිනා වදිමිනා නිවණිනා පතමිනා සිරිසඳ"

යනාදි වශයෙන් අනුප්‍රාස හා සිංහලපද්‍යයන්හි පමණක් යෙදෙන පදයනුත් අධික වූ පාඨයන්ගෙන් සියඟත සරසන්නට සිතූහ. මෙබඳු ලක්‍ෂණ ඇති ගද්‍යරචනාවන්ට 'උත්කලිකාප්‍රාය' යි ද, 'වෘත්තගන්ධි' යි ද ඡන්දෝම්බුධිපරිකාරයෝ කියති. එහි ලක්‍ෂණ ද

"භවත්‍යුත්කලිකාප්‍රායං
සමාසාඪ්‍යං දෘඪාක්‍ෂරම්,
වෘත්තෛකදේශසම්බන්ධාද්
වෘත්තගන්ධි පුනඃ ස්මෘතම්"

---

1. වි. සං. ප්‍රස්තාවනා xvii පිටුව 11 පෙළ

යනුවෙන් දක්වති. "සමාසපදයන් බහුල කොට ඇති දෘඪ අකුරු යුත් ප්‍රබන්ධය 'උත්කලිකාප්‍රාය' නම් වේ. වෘත්තයන් පිළිබඳ එකදේශයක සම්බන්ධය ඇති හෙයින් 'වෘත්තගන්ධි' ය යි නැවත සලකන ලදී" යනු එහි අදහස යි.

'උත්කලිකා' යනු තරඟයට ද නමි. යම් ගද්‍යවාක්‍යයක තරඟ සේ නැගීම් බැසීම් වේ නම්, එබඳු ගද්‍යවාක්‍ය 'උත්කලිකාප්‍රාය' යි. මේ පොතෙහි එබඳු තැන් බොහෝ යි. සමාසපද ද සුලභ ය. සිංහලයෙහි දෘඪාක්ෂර නො මැති හෙයින් මෙහි හැම තැන ම දෘඪාක්ෂර නැති වුවත් සංස්කෘත වචන යෙදුනු තන්හි ඒ ලක්ෂණය ද පෙණේ. වෘත්තයන්ගේ ආකාරයක් ද නොයෙක් තැන පෙණේ. යථොක්ත ශ්ලෝකයෙහි නො කී නමුත් දීර්ඝවාක්‍ය ඇති වීම ද වෘත්තගන්ධි ගද්‍යයෙහි ලක්ෂණයකි. එය ද මෙහි සුලභ ය. පද්‍යකාව්‍යයන්හි දීර්ඝවාක්‍යයක පූර්වක්‍රියාදික්‍රියාවාචකපද කීපයක ම කර්තෘ එක්කෙනෙකුත් ම වුවත්, කර්තෘවාචකපදයන් කීප පලක ම යෙදීම දෝෂයක් සේ සමහරු නො සලකති. (ගුත්. 244 වැන්නට වර්ණනාවෙහි ලියූ විස්තරය බලනු) මෙහි ගද්‍යවාක්‍යයන්හි ද වෘත්තයන්හි ගන්ධය ඇති හෙයින් කර්තෘපදය වෙනස් වෙනස් රූපවලින් නැවත නැවත යෙදීම නිවරද ය යි දම්පසහිතාවන් සැලකූ බව නොයෙක් තැනින් පෙණේ. දීර්ඝවාක්‍යවල අවසානක්‍රියාපදයෙහි මුල දී දක්වූ කර්තෘවාචකපදය අසන්නාට හෝ කියවන්නාට මැද දී අමතක විය හැකි ය. එහෙයින් ඒ පදයෙහි අර්ථ ඇති අනික් පදයන් දෙතුන්පලක යෙදීම අවබෝධයට පහසුවකැ යි සැලකූ සේ ද සිතිය හැකි ය.

මෙහි දීර්ඝවාක්‍ය අතර ඉතාකුඩා වාක්‍ය ද පෙණේ. 8 10 පටන් පෙණෙන වාක්‍ය එබඳු ය. ඒ වාක්‍ය එසේ යෙදුනේ එහි අදහස් ඉක්මනින් අවබෝධ කරවන අදහසින් නො වේ. ඒ කරුණු ඉක්මනින් අවබෝධ කරවන්නට එතරම් මහත් හේතුවක්ද නො මැති යි [1] ඒ තැන් එසේ යෙදුනේ

---

1. වි. සං. ප්‍රස්තාවනා xvii පි.

ඒ කොටස ලිවීමේ දී අමාවතුර කතෘහු ඉදිරිපිට තුබුනු හෙයින් විය යුතු ය. මෙහි $6^{3}$ හි පෙනෙන "තිසන ව" යන්න නම් ඉක්මිත්බව ඇඟවීමට ම යෙදුනක් විය හැකි ය.

මීට වඩා පැරණි ව්‍යාකරණලක්ෂණ ඇති සිංහල කෘතියක් නැතැයි මතයකි [1]. ඒ නිසා ම "සිංහල සාහිත්‍යයට අමුතු විලාසයක මුහුණු වරක් ලබා දුන් ව්‍යාකරණ ප්‍රථම මේ ග්‍රන්ථය පසුව කරන ලද ඇතැම් සිංහලකෘතීන රචනා වන්ට ආදශී වූයේ ය" යනු විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි[2] කියනලදි. මේ කථාව ද සිංහලසාහිත්‍යඉතිහාසයට සම්පූර්ණයෙන් පට හැනි ය. ව්‍යාකරණප්‍රබන්ධයන්ට සිංහලයන් බොහෝ පෙර සිට ම විශේෂයෙන් ඇලුම් කළබව පැරණි ලේඛන අවුස්සා බලනවිට ස්ඵුට වේ. දෙරකඩඅස්න සුප්‍රසිද්ධ ය. එහි උපකාලිකාප්‍රායපාඨ සුලභ ය. ඒ හා අත්වැල් බඳින අනික් කෘතිය නම් අනුශාසනාඅස්න යි. ඒ දෙක ම එක ම කතෘකෙනෙකුන්ගේ කෘති විය යුතු යි. අනුශාසනාඅස්නෙහි තිබෙන "මධුමදමුදිතලලිතරතිකරමනොහරකරවිකනාදනිර්විශෙෂාෂ්ටාඞ්ගසමුපෙත" යනාදි පාඨ කීපයක් ම පූජාවලි $4^{2}3^{2}5$ ආදියෙහි පෙනෙන නමුත් ඒ දෙකට ම ඒ පාඨ ගත්තේ අනික් තැනකින් නොහොත් අනුශාසනාඅස්නට ගත්තේ පූජාවලියෙනි යි කිය හැකි හෙයින් ද, ඒ අස්න් දෙක්හි ම මෑත දී වැටුනු 'පරංගි, ඕලන්ද' ආදිවචන පෙනෙන හෙයින් ද, ඒ දෙක දළදාසිරිතට වඩා පැරණි වුවත්, ඒ දෙක ම අපි පසෙකින් තබමු.

කිය යුතු අර්ථය හැකි තාක් වචන අඩු කර කීම ශිලාලේඛනකාරයන්ගේ සිරිත ය. එහෙත් සිංහලයන්ගේ ව්‍යාකරණප්‍රබන්ධරුචිකත්වය නිසා සමහර විට ඒ සිරිත ඉක්මවූ තැන් ද පුරාතනලේඛනයන්හි පෙනෙනබව පුරාවිද්‍යා

1. වි. සං. ප්‍රස්තාවනා xvi පි.
2. xuiii පිටුව.

පුරාවිද්‍යාධ්‍යක්ෂ ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් කරුණාපූර්වක ව අපට දෙන ලද මතු දැක්වෙන පාඨයන්ගෙන් ඔප්පු වේ.

1. "කිරුළුමිණි-රැසින් පළ-සෙසක්කිස-නවරමින්"
2. "සිරිකතට උවිඳු වන් විසිතුරු බඹගු වන පළහෙදට ගිරුගු වන් සොම්ලසට සිසිගු වන් මළෙව්කුලතිලකාය-මාන මහපින්සර හාමසෙනාධිරාජයෙන්.........සිංහලශ්‍රයාබලන්ගෙ හසිසංඝට්ටණයෙන් ජනිත වූ ගිනිපුපුරු නිකරයෙන් නිරත වූ නොයෙක්සිතණන් යුද්ධයෙහි ජය ලදින් රුපුනැගින් උරගන් රුහිරයෙන් තඹුරුවන ගගන ඇස් හිමඬුළු සරහමින් තමන්ගේ බාහුබලලීලයෙන් වීරශ්‍රිය සතුවු කොටැ"–

මෙසින් පළමුවැන්න මහාවිජයබාහුරජතුමාගේ මැත දී සොයාගත් තඹසන්නසෙහි ද දෙවැන්න මාඝරජකාලයෙහි කරවන ලද මිණිපේ ශිලාලේඛනයෙහි ද තිබේ.

මෙ තරම් රම්‍යපූර්ණකෘති තිබියදී වෘත්තගන්ධි ප්‍රබන්ධයන්ගේ ප්‍රථමස්ථානය දළදාසිරිතට කෙසේ දෙමු ද? ඉතාශ්‍රේෂ්ඨ වූ වෘත්තගන්ධිග්‍රන්ථයන් පුරාතනයෙහි තුබුනු බවට මෙ පාඨ ම සාක්ෂ්‍ය කියයි. එහෙයින් "දළදාසිරිත සිංහලසාහිත්‍යයට අමුතුවිලාසයක මුහුණුවරක් දුනැ" යි කීම කෙසේ නම් පිළිගත හැකි ද? වෘත්තගන්ධි ප්‍රථමසිංහල ප්‍රබන්ධය කාලය විසින් කන ලදී. ඒ කුමක් දැ යි කියන්ට අපි නො දනිමු.

මෙහි යෙදුනේ මිශ්‍රසිංහලභාෂාව ය. බොහෝ තන්හි ඉතා මටසිලුටු ශුද්ධ සිංහලවචන යෙදුනු නමුත් දුස්සංස්කෘතවචන ද දුර්ලභ නො වේ. සිංහල භාෂාව පොත්වලට ද්‍රවිඩාදිවචන ඇතුලත් වීම කුරුණෑගල කාලයට ම සීමා නොකට හැකි ය. අපේ පැරණි ශ්‍රේෂ්ඨතම මහාකාව්‍යය වූ කව්සිළුමිණෙහි ද 'මේළප්, ඔලි' යන දෙමළවචන පෙණේ.

මේ පොතෙහි පෙනෙන 'ඕලක්කම්' යන වචනය දෙවෙනි පැරකුම්බාමහරජාණන් පිළිබඳ ව ලියනලද කඳවුරුසිරිතෙහි හා තවත් ලිපියක ද ඇතුලත් ය. ඒ ලිපි දෙක ම "සිංහල සාහිත්‍යලිපි" නමැති පොතෙහි පෙනේ. 'සෙණ්ඩුවාළිය" යන වචනය 'සෙණ්ඩුවාළ' යන රූපයෙන් සද්ධර්මරත්නාවලී ආදියෙහි පෙනේ. "අච්චාල" යන්න ද්‍රවිඩවචනයකැ යි සමහරුන් කියතත්[1] එය පිරිසිදු පාලිසංස්කෘතවචනයකි. දෙමළබසට ද ගියේ එයිනි.

'යි' යන නිපාතයෙන් ප්‍රධානවාක්‍යයක් හා සම්බන්ධ වන අප්‍රධානවාක්‍යයක අවසානක්‍රියාපදය, එයින් උක්ත වන පදය ගැණ නො සලකා, ප්‍රථමපුරුෂබහුවචනයෙන් යෙදීමත උක්ත වන පදය කර්තෘවිභක්තියෙන් යෙදීමත් සෙසු බොහෝ ග්‍රන්ථකර්තෘවරයන්ට අභිමත වූ නමුත් දළදාසිරිත් කතුතුමා ඒ රීතිය අනුගමනය නො කළ බව මෙහි බොහෝ තැන්වලින් පෙනේ.

මෙහි අවසානයෙහි යෙදුනු එක් එක් ව්‍යවස්ථාවෙහි අග පෙනෙන 'ඉසා' යන නිපාතය ශිලාලේඛනයන්හි මිස සිංහලපොත්හි දුලබ ය. එය මෙහි හා කඳවුරුසිරිතෙහිත් පමණක් අපි දක්නෙමු.

ශිලාලේඛනයන්හි මෙන් ම මෙහි ද වාක්‍ය ඉතා දීර්ඝ ය.

බෙහෙවින් අනුප්‍රාස යෙදීමෙන් ශබ්දමාධුර්‍ය්‍යය ඇති කරන්ට උත්සාහ කිරීමෙන් සමහර තැන නුසුදුසු උපමා ආදිය ද මෙහි යෙදී තිබේ. මෙහි 3[5] හි "විපුල්වත් උපුල්වත් එ කුල්මත් කිඹුල්වත් ...... පුරවර" යන්න එබන්දකි. මෙහි කියන පරිදි කිඹුල්වත්නුවර විපුලවස්තුන් පා කිරීමෙහි කුල්මත් කිඹුලෙකු වැනි ය. කිඹුලන් විපුලවස්තුන්

---

[1]වි. සං. ප්‍රස්තාවනා xviii පි– 13 පෙළ

උපුල්වනබවක් අප්‍රසිද්ධ ය. මෙයින් හැඟෙන්නේ දළදාසිරිත් කතුතුමා අර්ථගෞරවයට වඩා ශබ්දමාධුර්යයට ප්‍රධාන ස්ථානයක් දුන්බව යි. එතුමා තුළ අදහස් අඩු වූ තැනුත් වුව මනා අදහස් කීමට වචනශක්තිය නම් නො අඩු ව පැවති බව මෙයින් පෙණේ.

**ආශ්‍රය. පොත**

මේ පොතට ආශ්‍රය වූ ප්‍රධානග්‍රන්ථය නම් පාලිදාඨාවංශය යි. දාඨාවංශයෙහි සැකෙවින් කී දෙයට තවත් දෙය එකතු කරමින් එහි පරිවර්තනයක් මෙන් මේ පොත කරණලදී. මෙහි පෙණෙන සිංහලරාජ නාමාවලිය පූජාවලියෙහි සූතිස්වැනි පරිච්ඡේදය බලා ලියූවකි. අග පෙණෙන ව්‍යවස්ථාපද්ධතිය හතරවැනි පැරකුම්බාමහරජුගේ අදහස් ලෙස අමුතුවෙන් ම ලියූබව පොතෙහි අග සඳහන් වේ. කිත්සිරිමෙව්රජතුමා විසින් ලියවූ දළදාසිරිත හෝ අතික් පැරණි දළදාසිරිතක් ඒ සඳහා අනුගමනය නො කළබවට එහි පෙණෙන 'වඩ්ඩාරු, මසිලක් කට්ටු, පුදබිලක්කම්' යනාදි ද්‍රවිඩවචනමිශ්‍රභාෂාව ම සාක්ෂ්‍යයකි.

**පොතෙහි තත්ත්වය හා ප්‍රයෝජන.**

මේ පොත බුත්සරණ, අමාවතුර ආදි ශ්‍රේෂ්ඨකෘති සංඛ්‍යාවෙහි ලා ගිණිය නො හැකි ය. අනුප්‍රාසයන්ට ප්‍රධාන ස්ථානය දීම නිසා අනවශ්‍ය 'එ' ආදිය යෙදීමෙන් වාක්‍යරචනා රීති ඉක්මවූ තැන් ද දුලීන නො වේ. එහෙත් මේ පොත කියවීමෙන් පැරණි වචනරාශියක් හා සිංහලයට එකතු වූ ද්‍රවිඩවචන ස්වල්පයක් ද විශේෂයෙන් ම දළදාමාලිගාවෙහි පැවති පුරාණචාරිත්‍රරාශියක් ද උගත හැකි ය. පැරණි සිංහලයන් ඉහෙන් උඩට ඇඳුමක් නො ඇන්දනයි ඇතැමුන් පවසන දුර්මතයට මේ පොතෙහි අග යෙදුනු 16 වැනි ව්‍යවස්ථාවෙන් පහර වැදේ. දළදාමැඳුරෙහි සේවකපිරිස ද සැට්ට (=කබාය) ඇඳ තලප්පා බැඳ හෝ තොප්පි පැලඳ සිටිය යුතුබව ඒ ව්‍යවස්ථාවෙන් දැක්වේ. පුරාතනලඞ්කාවෙහි සංගීතය කොතරම් දියුණු තත්ත්වයක පැවැත්තේ ද

යනු තේරුම් ගැනීමට මේ පොතෙහි 49 වැනි පිටුවෙහි පෙනෙන වාදූසාණකනාමලේඛනය ද ප්‍රයෝජනවත් වෙයි.

උගතෙක් වූ හතරවැනි පැරකුම්බා රජතුමා උගතුන් හා පොත්පත් බෝ කිරීමට මහත් උත්සාහ දැරී ය. පන්සියපණස් ජාතකපොත කත්සාලින පඬිවරුන් ඒ උත්සාහයේ එක් ප්‍රතිඵල හා ග්‍රන්ථ යකි. ඒ රජතුමා කිත්සිරි මෙවන් කැලණියෙහි වැඩවිසූ විල්ගම්මුල ශ්‍රීපරාක්‍රමනම් මාහිමියන් වහන්සේට ආරාධනා කොට පාලිමහාබෝධිවංශය සවභාෂාවට පරිවර්තනය කරවී ය.

අප්‍රධානකෘතියක් සේ සැලකීමෙන් දෝ විශ්වවිද්‍යාලය සංස්කරණ ප්‍රස්තාවනාවෙහි නම වත් නො දැක්වූ අනාගත—වංශය ද ඒ රජ තුමාගේ ආරාධනාවෙන් ම ඒ විල්ගම්මුල මහතෙරුන් වහන්සේ කළ ප්‍රධානග්‍රන්ථයකි. මයූරශතකසන්නය ද මේ විල්ගම්මුල මාහිමියන්ගේ ම කෘතියකැයි කියනු ලැබේ.

සංස්කෘතකවීන්ගේ බලයට බෙහෙවින් යටත් වූ සිංහලකාව්‍යයක් වූ සඳකිඳුරුදාකව ද විල්ගම්මුල තෙර කෙනෙකුන් විසින් කළබව එහි අවසන්හි සඳහන් වේ. ඒ තෙරුන් වහන්සේ දෙණගමුවෙහෙරෙහි හැම කල්හි විසූ බව එහි කියන ලදී. එයින් හැඟෙන්නේ අනික් තැනක නොවිසූබවයි. සිංහලමහාබෝධිවංශකර්තෘ වූ විල්ගම්මුල තෙරුන් වහන්සේ කැලණියෙහි සිටියහ එහෙයින් ඒ පොත් එක්කෙනෙකුන්ගේ කෘති යයි නිශ්චය කිරීම අපහසු ය

දළදාපූජාවලිය ද භුවනෙකබාහුමහරජාණන්ගේ ඇමැ—තියන් තුන් දෙනෙකුන්ට පින් සඳහා මේ කාලයෙහි කළ පොතකි. එය ද දාඨාවංසයෙහි විස්තෘතපරිවර්තනයකි.

දඹදෙණිඅස්න නම් කුඩා පොත ද මේ කාලයට අයත් ය. එයින් පෙර පැවති වස්ත්‍රවර්ග, වාද්‍යභාණ්ඩ, රාජසේවක ආදීන්ගේ නම් රාශියක් දත හැකි ය. කෘතිය කවරෙක් දැයි කිය නො හැකි ය.

කුවේණිඅස්න හා (විශ්වවිද්‍යාලයසංස්කරණප්‍රස්තාවනාවෙහි [1]'සිංහබාහුඅස්න' යි දැක්වූ) සිංහබාහුඅස්න ද මේ කාලයට ම අයත් සේ එම ප්‍රස්තාවනාවෙහි දැක්වූ නමුත් එය ඔප්පු කිරීමට සාක්ෂ්‍ය හිඟ ය. කුවේණිඅස්න වනාහි ශ්‍රීපරාක්‍රමබාහු නම් රජකුමෙකුගේ කාලයෙහි කළබව එහි අවසානභාගයෙන් පෙනේ. ශ්‍රීපරාක්‍රමබාහු නාමයෙන් රජවරු තිදෙනෙක් ම වූහ. කුරුණෑගල විසූ රජතුමා ශ්‍රීපරාක්‍රමබාහුනාමයෙන් නො ව පණ්ඩිතපරාක්‍රමබාහුනාමයෙන් ප්‍රසිද්ධ වී ය. එහෙයින් එහි සඳහන් වන්නේ කුරුණෑගල විසූ පරාක්‍රමබාහුරජ ය යි කිය නො හැකි ය. කුවේණිඅස්න ශුද්ධ කර මුද්‍රණය කරවූ භවතුන් කියන්නේ ඒ සවැනිපැරකුම්බාරජතුමා ය යන බව යි. කුවේණිඅස්න උතුරුමුලමහතෙරිඳුන් විසින් කළබව කටුගෙයි පොත්ගුලෙහි තිබෙන පොතක සඳහන් වෙයි. කුවේණිඅස්නෙහි පෙනෙන කථාව විශ්වාස නො කට හැකි අමුතු ම ප්‍රබන්ධයකි. නැත හොත් ගැමියන් අතර මුඛපරම්පරාවෙන් ආ කථාවකි. එ බඳු විශ්වාස නො කට හැකි කථාවක් ෂඩ්භාෂාපරමේශ්වර ත්‍රිපිටකවාගීශ්වර මහතෙරුන්වහන්සේ කෙසේකුන් ලියුව යි සිතීම අපහසු ය. ඒ උතුරුමුලමහතෙරුන් වහන්සේ තොටගමුවෙ ශ්‍රීරාහුලමාහිමියන්ගේ මුත්තනු වූ තෙරුන් වහන්සේ ද? නොහොත් අනික් කෙනෙක් ද? යනු කීමට ද නො පොහොසත් වෙමු.

සිංහබාහුඅස්න වනාහි ශ්‍රීවීරපරාක්‍රමනරේන්ද්‍රසිංහ රජ්ජුරුවන්ගේ කාලයෙහි රචිත බව එහි අවසානයෙහි දක්වන

1. xii, xviii පිටු

ලදී. එවිට එය මහනුවර රාජධානිකාලයට අයත් බව නිරායාසයෙන් තේරුම් ගත හැකි ය. එය අලගියවන්නයෙන් පසු ව කලබවට සාක්‍ෂ්‍ය පොතෙහි ඇතුළෙන් ද ලැබිය හැකි ය. එහි පෙනෙන

"එ වන තුරුහිමි වැලඳි ලිය ලියන් ලෙලෙන අතුඅතින් සාමුවසුතන් වැලඳ ගෙණ කියන සුරතල් තෙපුල් බිගුරැවින්"

යන පාඨය අන්‍යකාව්‍යයන්ගෙන් ගත් කිසිවක් නැති මයූර සන්දේශයෙහි තිබෙන

‘තුරුහිමියෝ ලියලිය වලඳිමි ති
සාමූවදරු වඩමින් සාඅති ති
බිඟුසනසුරතල්බස් මල්මූවි ති
කිඅමින් නළවන වැනි ලෙලවමි ති"

යන කවිය බලා අලගියවන්නයන් කුසජාතකයෙහි ලියූ

"එ උයනලියලියන් තුරුහිමි වලඳිමි න
ලෙලදෙන අතුඅතින් සාමුවසුතන් ගෙ න
සුදිලුනු ලියලවන්පුත් කුසුමන් වති න
නළවන වැන්න බිගුසන්සුරතල්බසි න"

යන කවිය අනු ව ලියූවකි. මෙයින් පැහැදිලි ව පෙනෙන්නේ සිහබාඅස්නා කුරුණෑගල්කාලයට අයත් නොවනබව යි.

දම්පසගිතාවන්ට ආචාර්‍ය්‍ය වූ ශ්‍රීපරාක්‍රමබාහුපරිවෙණාධිපතීන් වහන්සේ මහාවංශ 90-86 හි සඳහන් ප්‍රාඥමඬලංකාර ස්ථවිරයන් වහන්සේ ය යි සැලකිය හැකි ය.

මහාවංශ 90-96 හි සඳහන් වන තොටගමුවේ විජයබාහුපරිවෙණාධිපති වූ කායසත්ථ නම් තෙරුන්වහන්සේ ද පඬිවරයෙකු විය යුතු ය.

විදගම ශ්‍රීඝනානන්දපිරිවෙන්හි අධිපති වූ සොළීමහ තෙරුන් වහන්සේ ද රාජගුරු ව වැඩ සිටි මහපඬිවරයෙකි.

සිංහල ථූපවංසය ද බුත්සරණ ලියූ විද්‍යාචක්‍රවර්තීන්ගේ ම කෘතියකැ යි අපි බුත්සරණසංඥපනයෙහි දී දක්වීමු. එහෙත් දැන් අප තුළ පවත්නේ ඊට විරුද්ධ අදහසකි. සිංහල ථූපවංශයෙහි භාෂාව පරීක්‍ෂා කළ විට පෙණෙන්නේ එය කුරුණෑගල්සමයෙහි හෝ ඊට ආසන්න කාලයක කළ පොතක් ය යන බව යි.

දළදාසිරිත 1920 දී ඒ. ඇස්. රාජශෙඛර මහතා විසින් සකස් කර ප්‍රකාශයට පමුණුවන ලදි. ඒ මහතා පැරණි පොත් කීපයක් සසඳා සියලු
අපේ සංස්කරණය. විසදෘශපාඨ අධොලිපිවශයෙන්
යොදා ඒ පොත පිළිවෙල කරණ
ලද්දේ ය. "මෙ ම ග්‍රන්ථය මෙසේ සම්පූර්ණ ශුද්ධියකින් මුද්‍රණයට පමුණුවන ලදැයි අපි කිසිසේත් නො සලකමු" යි ඒ මහතා ම කිය යි.

පසුගිය නොවැම්බර් මස 14 වන දින ඇම්. ඩී. ගුණසේන සහ සමාගමේ මහතුන් විසින් මේ පොත සකස් කර දෙන ලෙස අපට ආරාධනා කරණ ලදී. රාජශෙඛර සංස්කරණයෙහි ශුද්ධ කටයුතු තැන් රාශියක් තිබෙනබව අප දන්නා හෙයින් ද, දැනට අප විසින් සම්පාදනය කරණු ලබන සිංහලශබ්දකොෂයේ වැඩ රාශියක් නති අප පිට පැවරී තුබුනත්, මේ පොත සකස් කිරීම ඊට උපකාර වන හෙයින් ද, ඒ ආරාධනාව ප්‍රීතියෙන් පිළිගතිමු.

ඉතාසුලු කාලයක් තුළ දී පොත ශුද්ධ කර මුද්‍රණයට දීමට හා ගැටපදවිවරණ ලිවීමටත් සිදු වූ හෙයින් අපේ අනවධානතාවයෙන් ඇති වූ දොෂ කීපයක් ගැටපදවිවරණයෙහි දී ශුද්ධ කෙළෙමු. තවත් එබඳු තැන් තිබුණොත් විතීයවාරයක දී සකස් කරන්ට බලා පොරොත්තු වෙමු.

දළදාසිරිත කුඩා වුවත්, ශ්‍රෙෂ්ඨග්‍රන්ථයකැ යි නො කිය හැකි වුවත්, දුර්බොධ වූ ද අප්‍රසිද්ධ වූ ද වචනරාශියකින් යුක්ත ය. රාජශෙඛරසංස්කරණයෙහි පමණක් ගැටපද

විවරණයක් ඇතත් එය අසම්පූර්ණ ය. දුෂ්කරාර්ථවචනරාශියක් එහි විවෘත නො කරණ ලදි. මෑත දී ප්‍රකාශයට පැමිණි විශ්වවිද්‍යාලයසංස්කරණයෙහි එබඳු වූ ද ගැටපදවිවරණයක් නො මැති යි. එහෙයින් මේ පොත උගන්වන උගන්නා ගුරුශිෂ්‍ය දෙ පක්ෂයට ම මහත් කරදරයකට මුහුණ පාන්ට වන බව කිය යුතු නො වේ. ඒ දෙ පක්ෂයෙහි ම පහසුව සඳහා අපේ සංස්කරණයෙහි අගට ගැටපදවිවරණයක් ද එකතු කරණ ලදි. එයින් දළදාසිරිතට මහත් එළියක් ලැබෙන හෙයින් අපි ඊට 'දළදාපහන' යයි නම් කෙළෙමු.

සම්පූර්ණ ග්‍රන්ථය සඳහා ඒ ග්‍රන්ථයාගේ නාමයෙන් කොටසක් පමණක් සංස්කෘතග්‍රන්ථකතෘවරු ව්‍යවහාර කළහ. "කුමාරසම්භව, නෛෂධීයචරිත, දශකුමාරචරිත, මෙඝදූත" යනාදි නම් "කුමාර, නෛෂධීය, දශකුමාර, මෙඝ" යනාදි ලෙසින් සංස්කෘතපොත්හි පෙනේ. මේ ගැටපදවිවරණයට මේ නම තැබීමේ දී සංස්කෘතග්‍රන්ථකතෘවරයන්ගේ ඒ චාරිත්‍රය ප්‍රධාන කර ගත්තෙමු.

දළදාපහන මුළුමනින් ම අපගේ කෘතියකි. එය සුළු කාලයක් තුළ දී ලියන ලද්දකි. ඒ සඳහා මහත් වෙහෙසක් දැරිය යුතු බව වෙසෙසින් අප නො කීවත් එය කියවන අයට අවබෝධ වන්නකි. එහි 110 වන පිටුවෙහි "කොළවන් දම්" යන්නට ලියූ විස්තරයට 'ද්‍රවිඩයන් අතර 'කොළද්දම්' නම් නෘත්‍යවිශේෂයක් දැනුදු පවත්නාබව 1950 පෙබරවාරි මස 5 වන දින පළ කළ සිළුමිණෙහි 9 වන පිටුවෙහි වූ චිත්‍රයකින් ඔප්පු වේ" යන්න ද එකතු කරගත යුතු යි.

මේ පොතෙන් දළදාවහන්සේ පිළිබඳ ඉතිහාසයෙන් කොටසක් සැකෙවින් දත හැකි ය. එතැන් පටන් ඉතිහාසය ඉතා සැකෙවින් මතු දක්වනු ලැබේ.

**දළදා ඉතිහාස.** රාජධානිත් සමග ම දළදාමාලිගාව ද වෙනස් වී ය. දළදාවහන්සේ යම් කෙනෙකුන්ට අයත් වූයේ නම් ඔහු ලංකාවෙහි හිමියා ලෙස පුරාතනයෙහි

ලක්වැසියන් සැලකූබව "A Treatise on The Laws and Customs of the Sinhalese" නැමැති පොතෙහි 369 වැනි පිටුවෙහි සඳහන් වේ. එහෙයින් රජවරු හැමවිට ම දළදා වහන්සේ රැක ගැනීමට සියලු උත්සාහ යෙදූහ. දළදා වහන්සේ භාර ව සිටි ගිහිපැවිදි කවුරුත් සතුරුඋවදුරු පැමිණිවිට සතුරන් මුළා කිරීමට දළදාවහන්සේගේ ආකාරය සිටින සේ ඇත්දතින් සෑදූ කෘත්‍රිමයක් දළදාමාලිගාවෙහි තබා දළදාවහන්සේ රජධානියෙන් දුර වූ ආරක්ෂාස්ථානයකට ගෙණ ගියහ. දළදාව ලෙස සෑදූ දෙයක් ලඟ තබාගෙණ සිටීම පෘතුගීසිකාලයෙහි සිංහලරජවරුන්ගේ සිරිතක් වූ බව 'ද කොයිරොස් (De Queiroz)' නම් පෘතුගීසිජාතිකකතෘහු කියතැයි ආචාර්ය පෝල්. ඊ. පීරිස් මහතාගේ "Ceylon The Portuguese Era" නමැති පොතෙහි 136 වැනි පිටුවෙහි සඳහන් වේ. ඒ සිරිත ද පටන් ගන්ට ඇත්තේ සැබෑ දළදා වහන්සේගේ ආරක්ෂාව සඳහා ම ය.

කුරුණෑගල රජධානියෙන් පසු ගම්පල ද ජයවර්ධන කෝට්ටේ ද පිළිවෙලින් රජධානි වී ය. කෝට්ටේ කාලයෙහි අන්තිමභාගය රටේත් ආගමධර්මයේත් පරිහානිය පිණිස වී ය. රෝමානුකතෝලික වූ පෘතුගීසිහු වෙළෙඳාම සඳහා ය යි ලක්දිවට පැමිණ ක්‍රමයෙන් ලක්දිව මුහුදුබඩපළාත්වලින් කොටසක් අල්ලා ගත්හ. තමන්ගේ නිකායයේ. අදහස්වලට විරුද්ධ වන ක්‍රිස්තුසමය පිළිබඳ අන්‍ය නිකායවලට අයත් ලදරු-වන් පවා මරු දැමීමට තරම් කෲර වූ, පැරණි වස්තූන්ට ස්වල්පමාත්‍ර වූ ද සැලකිල්ලක් නො දැක්වූ, පෘතුගීසිහු තමන්ගේ යටතට පැමිණි ප්‍රදේශයන්හි තුබුනු පැරණි විහාරස්ථාන සියල්ල ම වැනසූහ. විහාරස්ථානයන්හි තුබුනු රන්කරඬු ආදිය පැහැර ගත්හ.

එකල සිංහලරජධානිය වූ ජයවර්ධනකෝට්ටේ ද ක්‍රම-යෙන් දුර්වල වී ය. ඊට පහර දෙන්ට පෘතුගීසිහු සැරසුනහ. ප්‍රහාරය ආරම්භ කිරීමට ප්‍රථමදින රාත්‍රියෙහි දළදාවහන්සේ භාර ව සිටි කිරඇල්ලේ දිවනාරාල නම් දියවඩනනිලමේ

හිනයක් දුටුබවත්, එයින් දලදාවහන්සේ ආරක්ෂාස්ථානයකට ගෙන යෑම සුදුසු යයි සැලකූ ඔහු දලදාකරඬුවෙහි දලදාකෘත්‍රිමයක් තබා සැබෑ දලදාවහන්සේ සීතාවකට ගෙන ගොස් මායාදුන්නේ රජුට දුන් බවත්, ඒ රජු දලදාවහන්සේ සබරගමුවේ දෙල්ගමුවිහාරයෙහි තැන්පත් කරවූබවත් ප්‍රසිද්ධ ය. ඒ පිළිබඳ විස්තරයක් "සබරගමුවේ පැරණි ලියවිලි" නැමැති පොතෙහි 35 වැනි පිටුවෙහි පටන් පෙනේ. සීතාවක රාජධානිකාලයෙහිත් දලදාවහන්සේ දෙල්ගමු විහාරයෙහි ම වැඩ සිටිබව අලගියවන්න මුකවෙටිතුමා විසින් කළ සැවුල්අස්නෙහි 109, 118, 120 යන කව්වලින් ඔප්පු වේ. දෙල්ගමුවිහාරයෙහි දළදාමැදුරක් ද වටිනා කරඬුවක් ද තුබුනු නමුත් සතුරන්ගෙන් විය හැකි උවදුරු වළක්වනු සඳහා දලදාවහන්සේ තැන්පත් කර තුබුනේ කුරහන් අඹරණ ගලක් තුළ ය. එහි සිතියම ද සබරගමුවේ පැරණිලියවිලි නමැති පොතෙහි දක්ක හැකි ය.

ශ්‍රීවර්ධනනගරයෙහි (මහනුවර) රජ වූ විමලධර්මසූර්ය රජතුමා දෙල්ගමුවිහාරයෙන් දළදාවහන්සේ මහනුවරට ගෙනවා දෙමහල් දළදාමැදුරක් තනවා එහි තබා පූජාසත්කාර කළබව මහාවංශ 95 වන පරිච්ඡේදයෙහි 12, 13, 14 ගාථාවල සඳහන් වේ. එද පටන් මේ වන තෙක් දලදාවහන්සේ නුවර දළදාමාලිගාවෙහි වැඩ සිටිති.

යුද්ධකාලවල දී දලදාවහන්සේ හා ඊට අයත් අභ්‍යා· දේවලුත් ආරක්ෂාස්ථානන්හි සඟවා තැබීම සිරිත මෑත දී වූ ලොකමහාසංග්‍රාමය පැවැති කාලයෙහි ද දලදාවහන්සේ හා අගනාපැරණිදෙයත් හතුරුඋවදුරවලට භාජන නොවන සේ සුරක්ෂිත කොට සඟවා තැබූබව අපි දනිමු

දලදාවහන්සේ පෘතුගීසීන්ට අසු වූ බවත්, ඔවුන් එය ගෝවයට ගෙන ගොස් විනාශ කර දැමූ බවත්, ඔවුන්ගේ පොත්හි සඳහන් වේ. ඔවුන්ට අසු වන්ට ඇත්තේ කිරිඇල්ලේ දියවඩනනිලමේ විසින් තැබූ දලදාකෘත්‍රිමය යනු සිතැක ය.

දැන් මහනුවර දළදාමාලිගාවෙහි වැඩ සිටින්නේ සතර වන පරාක්‍රමබාහු රජතුමාගේ කාලයෙහි කුරුණෑගල දළදා මැඳුරෙහි වැඩසිටි දළදාවහන්සේ ම යයි සැලකිය යුතු ය. දැනට පෙන්වනු ලබන දළදාව කෙරෙහි ද බොහෝ දෙන විමති උපදවති.

1821 දී ලන්ඩන්නගරයෙහි ප්‍රසිද්ධ කරනලද ජෝන් ඩේවි මහතාගේ "Account on the Interior of Ceylon" නමැති පොතෙහි 368 වැනි පිටුවෙහි ද මේ දළදාවහන්සේ යයි දක්වනු ලබන වස්තුව කල්ගත වීම නිසා දුඹුරු ද ඇත්දතින කළ කෘත්‍රිමයකැ යි සඳහන් වන බව The Temple of the Tooth in Kandy නමැති පොතෙහි 1 වන පිටුවෙහි සඳහන් වේ. ඒ අදහස ම මෑත දී ත් නොයෙක් දෙනාගෙන ප්‍රකාශ වී ය. සමහරු එය කිඹුල්දතකැ යි ද කිහ

දැනට පෙණෙන්නට තිබෙන්නේ සැබෑ දළදාවහන්සේ නො ව එය වසා දැමූ ඇත්දත්කොපුවකැ යි අපවත් වී වදාළ මඩුගල්ලේ ශ්‍රී සිද්ධාර්ථාභිධාන අනුනායකස්වාමිපාදයන් වහන්සේ වරක් අප ඉදිරියෙහි දී වදාළහ. ඇත්දළින් ඉතා තුනී ලෙස එබඳු කොපු සාදන්නට පැරණියන් දැන සිටිබව පුරාතනයෙහි සුවඳපැන විදීම සඳහා ඇත්දළින් කළ, එබූ වට ද පහතට නැමී යනු මිස නො බිඳෙන, කුළාවන් බැලූ විට ඔප්පු වේ. 1949 පෙබරවාරිමස පැවැත්වූ කලාමණ්ඩලයේ දී එබඳු පැරණි කුළාවක් දක්වන ලදී.

ඉංග්‍රීසීන් ලංකාව අල්ලා ගත් පසු දළදාවහන්සේ ද කලක් ම ඔවුන්ගේ භාරයෙහි වූහ. 1828 දී ලංකාණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් ම මහෝත්සවයෙන් පූජිත ව දළදාවහන්සේ මහාජනයාට දක්වූ නමුත් ක්‍රිස්ත්‍රියානිආණ්ඩුවක් බෞද්ධාගම සම්බන්ධ කටයුතුවලට සහභාගි වීම වැරදි යයි ක්‍රිස්තුභක්තිකයන් උද්ඝෝෂණය කරන්ට වූයෙන් 1846 අංක 2 දරණ ආඥාපණතින් බෞද්ධයන්ට ම දළදාවහන්සේගේ භාරය පවරා දෙන ලදී.

මේ පොත ඉගෙණ ගන්නවුන්ට දළදාව පිළිබඳ මෑත ඉතිහාසය ඉගෙණීම අවශ්‍ය ම කාරණයක් නො වේ. එහෙයින් එය දීර්ඝ ලෙස විස්තර කර පොතෙහි පිටු ගණන මිට වඩා වැඩි කරන්ට අදහස් නො කරමු.

මීට, වැලිවිටියේ සෝරත
නායකස්ථවිර

## සාධකග්‍රන්ථනාම හා තත්සංකේත.

(ගද්‍යග්‍රන්ථයන්ගේ පිටුවල අඞ්ක ලොකු ඉලක්කම්න් ද ඡේදාඞ්කය කුඩා ඉලක්කම්න් ද දක්වන ලදී. පද්‍යග්‍රන්ථයන්ගේ පද්‍යාඞ්කය හෝ සර්ගාඞ්ක හා පද්‍යාඞ්ක ද යොදන ලදි.)

| සංකේතය. | ග්‍රන්ථය. |
|---|---|
| අනා. | අනාගතවංශය (ජිනාලඞ්කාර යන්ත්‍රාලය 1934) |
| | අනුශාසනාඅස්න |
| | අභිධානප්පදීපිකා |
| අමා. | අමාවතුර (සොරත ස්ථවිර, 1948) |
| | උම්මග්ගජාතකය (Govt. Press.) |
| කඞ්ඛා. | කඞ්ඛාවිතරණීපිටපොත. |
| කතිකා | කතිකාවත්සහරා (1922) |
| | කඳවුරුසිරිත (සිංහලසාහිත්‍යලිපි) |
| කව්. | කව්සිළුමිණ (සොරත ස්ථවිර–1946) |
| කා ශෙ | කාව්‍යශෙඛරය |
| කුදු. | කුදුසිඛ සන්නය (1864) |
| | කුෂච්ඡිඅස්න |
| කුස. | කුසජාතක කාව්‍යය |
| ගුත්. | ගුත්තිල කව |
| | ජනේඤමඤ්ජරී |
| ජා. | (පන්සියපණස්) ජාතකපොත (ජිනාලඞ්කාර) |
| ජා. අ. | ජාතකට්ඨකථා (හේවාවිතාරණ) |
| ජා. ගැ. | ජාතකඅටුවාගැටපදය (1943) |
| තිසර. | තිසරසන්දේශය (කුමාරණතුඞ්ග මහතා, 1927) |
| ථූප. | ථූපවංසය (හෙට්ටිආරච්චිමහතා, 1947) |
| දඹ. | දඹදෙණි අස්න (1928) |
| ද. සො. | දහම්සොඬකව (සොරත ස්ථවිර) |
| දහම්. | දහම්සරණ (ශ්‍රීධර්මානන්ද ස්ථවිර –1929) |
| | දළදපූජාවලිය (1893) |

| | |
|---|---|
| දාඨා | දාඨාවංශ |
| | දිව්‍යාවදාන |
| | දෙරකඩඅස්න |
| ධගැ. | ධම්පියාඅටුවාගැටපදය. (1932) |
| ධප්‍ර. | ධර්මප්‍රදීපිකාව (1927) |
| නිකා. | නිකායසංග්‍රහය (Govt. Press, 1890) |
| | පඤ්චතන්ත්‍රය |
| පරෙවි. | පරෙවිසන්දේශය |
| ප්‍රාස. | ප්‍රාතිමෝක්ෂපුරාණසන්නය |
| පැර. | පැරකුම්බාසිරිත |
| පූජා. | පූජාවලිය (සද්ධාතිස්ස ථෙර, 1930) |
| බුත්. | බුත්සරණ (සොරත සථවිර, 1931) |
| බුදු. | බුදුගුණාලඞ්කාරය ( වලානේ ධම්මානන්ද ථෙර,) |
| බෝගැ. | බොධිවංශග්‍රන්ථිපදවිවරණය |
| බෝව. | (සිංහල)බොධිවංශය (ප්‍රඥාශෙඛර සථවිර, 1928) |
| | භාරතීයනාට්‍යශාස්ත්‍රය |
| | මයමත |
| මයූ. | මයූරසන්දේශය |
| මහා. | මහාවංශ |
| මූව. | මූවදෙව්දාවත |
| | රසවාහිනී |
| රාජා. | රාජාවලී (Govt. Press, 1926) |
| රුවන්. | රුවන්මල (1914) |
| රිදී. | රිදීවිහාර අස්න (අමුද්‍රිත) |
| | විශුද්ධිමාර්ගසන්නය |
| | සංගීතදාමොදර |
| | සංගීතරත්නාකර |
| සද්ධ. | සද්ධර්මාලඞ්කාරය (ග්‍රන්ථප්‍රකාශ, 1934) |
| සපැ. | සබරගමුවේ පැරණිලියවිලි |
| සර. | සද්ධර්මරත්නාකරය, (විද්‍යාඪප්‍රකාශ, 1930) |
| සලි. | සද්ධර්මරත්නාවලිය (ලඞ්කාභිනවවිශ්‍රැත, 1925) |
| සස. | සසදාවත (1934) |

| | | |
|---|---|---|
| හැවුල්. | හැවුල්සන්දේශය | |
| හැලි | හැලලිහිණිඅස්න | |
| | සිංහලසාහිත්‍යලිපි | |
| සිඛ. | සිඛවලඳවිනිස. | (1224) |
| | සිදත්සඟරාව | |
| සිය | සියබස්ලකර | |
| | සිහබාඅස්න | |
| සුපු. | සුලු පූජාවලිය. | |
| | සුලුරජාවලිය | |
| ස්තූප | ස්තූපවංශය. | (ජිනාලඞ්කාර,1933) |
| | Apte's Sanskrit English Dictionary | |
| | Ceylon Antiquary | |
| E.Z | Epigraphia Zeylanica | |
| | Inscription of Asoka | |
| T.L. | Temil Lexicon | |
| | The Stupa in Ceylon | |
| T.T. | The Temple of The Tooth in Kandy | |

# දළදා සිරිත

## නමවූ රුවන්තියා

### 1. පිරිසෙය.

දියත සැදි මුදුන් තෙරුවන් මුදුන් කැරැ හොයුම් ගොත් අප මුනිඳු දළදාසිරිත පොරණැපරත් විද්‍යු වදන්මග අරුත් නො විහිද සියබසින් ලුප් පවසම්.

හෙ කෙසේනි? යත් :–

ඒප මුනිඳු තිලෝනා සාරාසැකෙවිකප්පුවනස් මතුයෙහි දඹදිව අමරවති නම් නුවර බමුණු මහසල්කුලයෙක්හි, රූසිරින් මල්සරු[1] තිසරු කළ, පැණසරින් සුරගුරුහු සරි නො කළ, සොම්ගුණෙන් නිසයුරුම තිගා කළ, පින්සරු සුමෙද[2] නම් කුමරු වක් ව[3] ඉපැද වැඩී විය පැමිණ, සව්සිප් ගෙවා දත, ගුරු දෙදෙනා සුරපුරට පත් පැසුළු "සව්සැපත් හව් සැමින් දකුම් කළ රැකුම්[4] කළ සියෝ හැම[5] තිකම් නැසී[6] ගියෝ ය" යි එ දත[7] හැම සඳන්හල තිදත් කැරැ, එ පස්කම් නොකම්පස් එ කම්පස්ලෙසින් දකැ, මෝරුදෙසුන් තෝරු වරු, තිවන්පුර මෙනෙත් දුරු, එපුර හැර කතරමඟ යතා කැරැ, වෙනෙත් ගොස් එ සිවදු[8] හිමවුවනපෙදෙස් වන එ දම්මකා නමින් වන සපිරිසිරි එ ගිරි වෙත සුපිපි සපු නා පතා සල් කිතුල් එල් කෙහෙල් ඉඹුල්[9] පොල් විසල් දෙල් දිඹුල් බෙල් සියල් අඹ දඹ කාංඹ දෙඹ සැලඹ[10] කොලොඹ තිඹ තිඹ[11] රැරඟ පුංගු[12] නාරඟ නුග

---

1. මල්සරුට. 2. සුමෙත් 3. කුමරු [illegible] 4. එ කම්. 5. සියෝනැමි. 6. නැති. 7. දත්. 8. වෙනෙහි වැද [illegible]සිවැද. 9. වල් කොහල ඇඹුල්. 01. සැළොඹ. 11, තිඹ තිඹ. 12. පුවඟ.

සොර ඝොර පර වීර සිඳුවර කර කැර දෙබර[1] සිහිරි හර තුරුවරසිරිනුතුරු වූ, මූවරදරොන්තවර ගෙණ දිවත රවත බමන බමරවැල යුත්,[2] සොම්සිහිල්සිතිඳුපහන් සිලිල්ගගුලැලින් යුත්, රමණී පියෙස්හි අසපුවක් කැරැ නිසරසර[3] ගිහිවෙසැර, එ කලා එකලා වල්කලා වල් කලාවත් තමා වෙරෙහි ලා එ වෙස් ගත් එ මාසන් සමාවත් බෙලෙන්[4] යුත්, තොබෙරකල් විසි කැරැ, ඒ ඉසි විසි සමසිරින් යුත්, ගුවන්කුස ගමන් ගෙණ, එ වෙන් මග කෙමෙන් ගොස් අඹර සිට රඹගම් නුවරවර වොරදනා නෝදනා සතොසිනා[5] මහ තනා යන එනා දකිමිනා ගුවනිනා බසිමිනා, ඒ දනා වෙතට ගොස් "අද දවස් වෙමින් තොස් මහ සතස් කුම් උදෙස් කරණුව"සි[6] එ පිළිවිස් ඒ තවුස්හට එතැන් පත් එ සන් හැම "මෙ වන්[7] යුත් මෙ මාවත් මොහ'දුරු කළ දුරු පැණසරු තවසරු මොකැදුරු පියකරු සෙත් කරු දෙස්වරු මෙත්කරු දිවකුරු ලොවුතුරුමුනිවරු[8] ඉසිවරු පිරිවරු සැරි සරු මෙ නුවරු හව්තරු මන් පුරු පින් පුරණුවස් වඩිනු වස්[9] සරසම්හ"යි යත්, එ තතු දත් ඒ මහත් ඒ වියත් සුමේද ඉසිතුමා සොම්නස්[10] බරිතිනිරැ ගොස්, ඉල්වමින් එහි තැනක්, දදුරු මුසු කදුරැළියක් දුන් සදෙයි, පින් සදෙයි පිණපිණා එ නරනා තනතනා සිටි සදෙයි, මොහඳුරට ලහිරු වන් බවසයුරුපසුරු වන් ගුණගම්ණිසයුරු වන් එ දිවකුරු බිදුරුමන් බුන්සියලුබවමුලන් ඉසිවරු පිරිවරු යා කරු රන්මෙරු එකපුරු තම කරු සපත් වත් "ඉටන් මං උපයත්[11] දූන් අයුත් වෙ" යි සිතා දත් එ මහත්මා සදුල්සම් වල්කලා එහි ලලා පිණ ලොලා පුලපුලා මුනි බලා කිබිසිති වැ මිතලා හෙව[12] තොසින් 'බොරෙහි ලා සහ සමහ මුනිඳුසඳ මා සිරිරැ [මාරු සිරි][13] පතල දී වැඩම කැරැ වැඩම කළ යෙහෙකැ" යි ඉටන් කෙළේ.

1. ඩෙබර. 2. වැලසලායුත්. 3. නිසරසර. 4. පෙලෙන්. 5. තොස පිනා. 6. කරණුවස් 7. වෙන්. 8. මුනිවිරු. 9. වඩනාමඟ. 10 සොම්නසින්. 11. ඉටන් මා උපෙත්. 12. එව. 13. මැරු සිරුරැ.

එසඳ බුදුරජානන්වහන්සේ “අම, මෙතුදුස් මු සතෙක් දෙ හො” යි අනවරණඥානයෙන් බලා “එක්තරා මේ මහාපුරුෂ කොවලක්ෂයෙක් නොවෙයි. මෙයට සාරාසැංඛ්‍යකල්පලක්ෂයකින් මතුයෙහි කිඹුල්වත් නම් පුරවරෙහි සුදොවුන්රජු නිසා මහාමායාදේවි නම් රදුන් කුස පිළිසඳ පිළිලදින් වැඩී මෙත් ප්‍රාණ ඇසතුබෝමුල්හි විදුරසුන් අරා පස්මරුන් මරා දොසුම් ගොත් ලොවුතුරා බුදු වෙ” යි[1] සතුටු කැර ගුණබරණ ඉසිවරණ අතිවරණව්වරණ දී එසඳු සහ සමඟ[2] සමන් මල් දෙසිවුම්ටින් පුද කැර වටා වැඩ නිකුත්සඳ, තුන්ලොවැසිදනා සතොසිනා[3] සුවදිනා වසතිනා බරණිනා පුදමිනා වදිමිනා තිවණිනා පතමිනා සිටිසඳ, එ පෙර්සත් එ බෝසත් එ මල්පිට පලක් බැඳ කලක් ඉඳ, දන් සිල් නෙකම්[4] පැණ විරිය කැත් සත් ඉටන් මෙත් උපෙයි කියනලද සියල් බුදුකුරුදම් සිය සතන්හි ම දූතැ පෙරුම් දම් ඉටන් කැර තමත්[5] පත් නිවන් හැර මුළුලොවට මෙත් කැර ගොර දරුණු බවසයුර වැද කිමිදැ, ඉස් ඇස් මස් ලේ දූරි දරු දුරා ඉදවත් මේ ආදි දිමෙන් සමතිස් පෙරුම් පුරා විසිතුරු වෙසතුරු අත්බැවින් චුත වැ, අසරන් තොසී කැර සුරන්[6] නෙත් විසි කැර බුදු බැව් රිසී කැර තුසිපුර වසනසඳ, දසදහසක් සක්වළ දෙව්බඹුන් වෙතට වුත් “බුදුබවට මෙ කලැ” යි දූනෙන ලෙස එ පින්වතුන් දන්වතුදු පස්බැලුම් බලා, විපුල්වත් උපුල්වත් එ කුල්මත් කිඹුල්වත් කිඹුල්වත් නමින් යුත් සපිරිසිරි එපුරවර බහාවස් පරපුරෙහා රිවිකුලනා රුසිරින් වොරදනා සුදොනා එ නරනා රදු නිසා අමායා එ මාහාරදුසඳ මිණිකුස පිළිසඳ කැර පිළිමිණිකුස් සුදිස් රත්ලස්හු විලස් පරයමින් වොරදමින් දසඑකඩමස් පිරුණු[7] වෙසහ මස පුණුපොහෝ ලද දිනෙහි, චම්පකාශොකවකුල

1. වෙනිසී. 2. සමග මුනිඳු. 3. තොස පිනා. 4. නිකැම්. 5. තමත්. 6. සුර. 7. සිපිරුණු.

සරල දූහ පුන්නාග නාග තාල හින්තාල ශාල බකුල නිචුල නක්තමාල තමාල පලාශ නාග කුශ වංශ නීප නිම්බ කදම්බාම්‍රාදි තරුවරගණශෝභිත වූ, නවමාලිකා මල්ලිකා යූථිකා වීටිකා[1] ජාතිකා සේඵාලිකා ඵාලිකා ලතිකාකලාපවිලොභනීය වූ, නන් බුවන් විලිබුවන් කොවිල්ලන් විසින් යුත්, උදුළු පුවළු පුලිනතෙලෙ කෙළනා ලද බොළඳ සිදහතුන් මන දහ කල. අමිනැමින් සරසැ[2] සරසැ සරු සරු සරණ රවන බමන බමරනීසරරුවින් සැදුම්[3] ලත්. ඍතුමදවිලම්බිනී විලසිතනිතම්බිනී විවිධරසලම්බිනී විකසිතකදම්බිනී පරිචාතකාදම්බිනී මධුපකුලචුම්බිනී ලුම්බිනිවනොද්‍යානයෙහි මාතෘගර්භයෙන් ප්‍රසූත වැ, බඹසුරනරනතින් ක්‍රමයෙන් බැසැ පින්බෙලෙන් පහළ වූ කොමළ වූ සත්බුමුමහ පියුම්හි ගගනාවතීර්ණසුරෙන්ද්‍රවිලාසයෙන් වැඩ සිට දිශාවිලොකනාවසානයෙහි නිරුත්තරඋත්තරදිශාභිමුඛ වැ අභීතනාද පවත්වා, භුවනත්‍රයවාසීන්ට අනිම්පාම් සිඩිය කරණ හෙයින් යථාර්ථ වූ සිද්ධාර්ථ නමින් ප්‍රසිද්ධ ව, කලාවෙන් කලාවට වඩනා ලසඳ මෙන් වැඩී විය පැමිණ, සව්සිප් ගෙවා දැන, හිමන්ගිමන්වසන් තුන් කලට නිසි වූ තුන්පායෙහි අවිනත්‍ය වූ අවාච්‍ය වූ අතුල්‍ය වූ දිව්‍යශ්‍රීසමානරාජ්‍යශ්‍රී විඳිමින්, උයන්කෙළිය[4] මන දෙළින් එ ලොව්තුරු[5] යතුරු කැරු අතරමඟ ජීර්ණ ව්‍යාධිත මෘතප්‍රව්‍රජිත දෙවදූතයන් දැක සපිරුණු සතරනිසිරි[6] නිසිරි මෙන් කලකිරී, පැසුළු දුටු මහණවෙස සතුට[7] කැර තිලොවැඩ පසස්නා එ ලොවැඩ උයන් වැඩ එහි කෙළිය දවස් යවා සවස් වත් මහගුම්හුල්සල[8] වටෙහි වැඩ හිඳ, සක්දෙව්මහරජහු නියොවින් වෙතට පත් පස්කම්ගුණෙතුදුළු විශ්වකර්මදෙවිහු[9] විසින් දිවදුහුලෙන් දසදහසක් නරුවල්ලෙන් සළු හඳවා දිව බරණින් පුරඳුරු මෙන් සරහනලද තිරිඳුසඳ නුවර වැද

1. විපිකා. 2. කළ සරස. 3. තිසර සරරළුරුවින් අමින් මින් සැදුම්. 4. එකළිය. 5. ලොවුතුරු. 6. සසර සිරි. 7. සතුටු. 8. සල්. 9. දෙවි.

මහාවේයැ[1] ගමින් ගෙණ කිසාගෞතමීහට සිත්හාර පුරවමින් දිමුත් මුත්හර දී, සිරිනිවෙස් ගොස් පිවිස, දිව යහන්එකපුරා සිරියහන්මැද අරා ලෝ සියල් කප්තුරා පින්සරා තවසරාබව්දුරා මෙනෙ සරා නරවරා මෙන් සරා උන් සඳෙහි, නේදකස් නළඟනන් මුළු මුළු ව තුටු පහටු සඳ නොපටු ඉටු ඇවිටු නන්විලස් ලස් නො වි දක්වමින්, කොවුල්[2] සර නිසරු[3] කැරැ, සරසර ද නිසරු කැරැ, සරසඟී නිතොර[4] කැරැ, විසිතුරු පසහතුරු ගොසින් සමුදුරුගොස් පරයමින් සිත් හසුරුවමින් සිටිසඳ, එ සිදුහත්රජතුමා කෙළිතළුවෙ සිත් නො ලා නෙත් නො ලා යහන්හි ලා සැතපිසඳ, එ නළුමුළු තැන තැන ම බෙරකඳෙහි එ ම සඳෙහි වැතිර ගෙණ සමහරකු[5] නතනමින් කුණුකෙළ ද පරහමින් ඩහවොටින්[6] දත් කමින් ගිලිහුනුවසන් වෙමින් නැහැ හඬවමින් මෙ ඈ ලෙසින් නන්විකර දක්වමින් හොත් කල්හි, එ මහත් මහබෝසතානන්[7] යහන්තෙලෙහි නැගී හිඳ ඒ සියල් ස්ත්‍රීවකෘතවිකෘතකපටනාටකවිකට බීභත්සසොපහාසභයානකවෙශයන් දුනැ සියල් ලෝකුස් කෙලෙස්ගින්නෙන් දිලිහුනාක් මෙන් ද මරුට ගොදුරක් මෙන් ද දුක වෙලෙව්ව නැගී සිට “රහල්කුමරුවා[8] දකිමි” යන සිතින් මතුමහල්තලයට ගොස් ශ්‍රීයහන්ගබ්හෙහි දෙර කඩුපතින් අඩවළ කැරැ, චන්‍ද්‍රබිම්බියට බඳු වූ මුඛබිම්බ ඇති බිම්බාධරයෙන් විරාජමාන වූ බිම්බාදේවින් ලඟ යහන මැද කිරණාවුසුදිස්නා ලොඳුළුවන් පබළුදළු එකළුවන් සිතුරුවන්සොඳුරුවන් රහල්කුමරුවන් නොසින් දුනැ, එසින් බැස නිරිඳුසඳ එසඳ එකසඳ සනැමැතියා විසින් අළු, සුදුසිඳුතරඟ වන් වෙන්මඟ[9] සුළඟ වන් රඟ රඟ රඟා වන් ළඟා වන් තුරඟවර අරා මැතිවරා සමඟ කැරැ මැදුම් රෑ නරවරා පුරවරා දෙර කරා පැමිණිසඳ පැණසරා

1. වේ. 2. කොවුල්. 3. නිසරු. 4. සසර ගිණී තොර. 5. සමහරෙක්. 6. ඩැහැවොටින්. 7. බෝසතාණෝ. 8. කුමරුවන් 9. මෙන් මහ.

පෙම්බර මිනහර සුරවර අලදෙරින් පුර ඉක්මී[1] ඉක්මින් නිනික්මින් නිකුත් වන වෙත සපත එ වසවත "තිසක ව. න මෙ සකඳත මෙ සත දින රඳත හොත න හන පත වත" කියත එ සිදුහත එ නෙපලන තමකණත වෙත නො ලා මිනකලා දෙව්කැලා එක් වැ ලා පුලපුලා සිත් ලොලා නම් බලා කරණලද පුද බලා, නුපමා අනෝමා එ නාමා එ ගඟ මා නහමා:[2] නො ව පමා අසුයොමා කිරිසඳුරුවෙරළ දුල දලරලවිලස්නෙන් තෙරපැමිණ සඳරුස් පහ කල[3] දිමුතුමුතුසිරි වතල පලහෙල දුලිනතල පතල[4] පැහැයෙන් සරු මිණිකිරණසැදි කිරුළු නන්බරණ එ සනහැති[5] ඇමැතිහට දෙමින් පෙමින් නමන පත සිළත ගෙණ [6]දියනසෙනකර කැපූකෙස් අහස්කුස් විහිදූ මහබඹු අතින්[7] ගත් තෙසිවුරෙන් තුනු සරු ඉසිවරු මුළුලෝ එ පාද එ පාද අතින් ගෙණ ගමන් ගත් කසුන්මෙර විලස් ගත් එ මාසන් එපින් ගොස් රුසිරුමහරුසහසුරුතුරුවෙනෙහි සතියක් කල් යවා තිස්යොදුන් මහ ගෙවා රජගහානුවර වැද ගෙපිළිවෙළින් පිඬු සිහා පඬුපවුසෙය ඉඳ පස්විනා මුසුඅහර වළඳ කැරු, ඉසිපවර බිම්සරනරපවර දුන දහම්සර පිළිනහර දෙමිනෙවර දෙතුණක් වස් අතුරු මහවිරිය කැරු නිතොර, එ මඳදිවුතිසර දුන දහැ ගොසින්, සුජාතා[8] වූ සුජාතා නම් කෙලෙඹි[9] දුව විසින් රන්තලියෙන් එළවනලද කිරිපිඬු පිළිගෙණ, නිල්වලානිල්දලා නිල්නරුගංනොටින් සහතුටින් පැන් සනා, එ ඔදඅහර ගෙණ උනුපණස් පිඬු කොටින් වළඳ කැරු ගෙණ තලිය සුරනතින් ඇර දියට කුල්මතින්, කුළුමනින් කුල්කොවුල්[10] සන්සනේ පුල් විසල්සල්වෙනේ කල් යවා හිඳිමිනේ[11] ඒ දවස් වත සවස් නේසහස් බඹපිරිස්සදෙව්නාගුරුළුරුස් ගෙණ අතින් පුදවෙසෙස් මුළු මුළු ව සිටිසඳ, අපගේ සවාමි

1. නික්ම. 2. නහාමි. 3 පහල. 4. පතල. 5. සිනාහැති. 6. සෙනසෙනකර. 7. මහබඹුනතින් 8. සුජාත. 9. කෙළිඹි. 10. කොවුල්. 11. එළිඳිාත්.

දරුවානන් වහන්සේ එසිත් තික්ම බෝමඩට වඩිමින් අතරමග යතර කැරූ පැමිණි පුණ්‍යපැරුම් සොත්[1] බමුණු විසින් එළවනලද මිණිමෙවන්[2] කුසතණ අටමිටක් පිළිගෙණැ බෝමඩට පිවිස අපරාජිතාවලා සනස්ථාන වූ පූර්විදිශාභාගයෙහි සුප්‍රතිෂ්ඨිත වැ වැඩ සිට තණ අගින් ගෙණ සලා එතැන්හි තිපත් තුදුසත්විදුරසුන් අරා චතුරඞ්ගසමන්විතවීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් ගැටවටු සන්වා පලක් බැඳ වැඩහිඳ, දසදහසක් සක්වළින් මෙ සක්වළට රැස් වූ දිව්‍යබ්‍රහ්මනාගයක්‍ෂරාක්‍ෂසසිඬවිද්‍යාධරකින්නරගරුඬගන්‍ධර්‍වාදීන් අතුරු නො දී විසිතුරු වූ පූජා පවත්වමින් සිටි සඳ, කොපයෙන් ආ වශවර්ති වූ වශවර්තිමාරතෙම දසකිම්බරක් ඝොර දරුණුයියසෙන් පිරිවරා, ඉරු අත් නො යතුරු බොධිමණ්ඩාසන්න වැ සරොසින් දිලී නො වැ මැලී[3] වාතවෘෂ්ටිශිලායුධාදි වූ නවවිධවර්‍ෂා වස්වමින් රැස් වූ බුදුපිරිය් බිඹෙයන් පර සක්වළට පලවමින් "සිදුහත් අසිදුහත් කරවමි"යි සෙද අවුත් වැද නන්විකර පවත්වන්නට පටන් ගත්තේ යැ.

එකෙණෙහි ඒ අනාථනාථ වූ ත්‍රෛලොක්‍යනාථයා [නන්වහන්සේ තමා] විසින්[4] අනෙකකල්පකොටිශත සහස්‍රයෙහි පුරුදු කැරූ සගන්නාලද දසපැරුම්යෝබලන් පෙරටු කැරූ නො රසවත් සරොසපත් එ මරසෙන් පරදවා, පෙරයමැ පූර්‍වෙනිවාසානුස්මෘතිඥානය ලදින්, මැදුම්යමැ දිව්‍යංචක්‍ෂුරභිඥානය ලදින්, අලුයමැ වාදශාඞ්ගසමුපෙතප්‍රතීත්‍යසමුත්පාදය අනුලොමප්‍රතිලොම සම්මර්ශනයෙන් සූර්‍ය්‍යොද්ගමනය හා සමග සවාසන සකලක්ලෙශාන්‍ධකාර විධ්වංසනය කෙරෙමින් දුරි කරණය කොට, දසදහසක් සක්වළ ඒකනින්නාද කෙරෙමින් සර්‍වඥතාඥානය සම්ධිගමය කොට උදර වූ

1. සෙත්. 2. මිණිවන්. 3. නො ව ඇවිළී. 4. නාථයා විසින්

උදානවාක්‍යයන් පවත්වා යුගඳුරුමුදුනෙහි දිලියෙන ලහිරු මඬලක් සේ ෂවණක්සත බුදුරසින් සියල්ලෝ ධාතුස් එකලු කෙරෙමින් වැඩහුන්සේක.

එකල්හි දෙලක්‍ෂසතළිස්දහසක් යොදුන් ඝන කඩ බොල් මහපොළොව දසදහසක් සක්වළ අවසන් කොට මහපවනින් සොලවනලද පවන්පතක් පරිද්දෙන් ද යළිගුරෙකින් පහරණලද ලෝතලියක් පරිද්දෙන් ද ඒ ත්‍රෛලොක්‍යස්වාමීහු විසින් කරණලද මරා[1] පැරදුම් දුටු සතුටින් සෙන්තියක පරිද්දෙන් එකහඬින් ගුගුරා පැන නැංගේ යැ. මහමුහුදු ශීතලාමල මිදුරුසිලිලැති වී යැ. දසදහසක් සක්වළ එකලු වී යැ. ජාතියෙන් අන්ධහු ඇස් ලද්දාහු ය. බිහිරැහු ශබ්ද ශ්‍රවණය කොළෝ යැ. ගොළුහු මිහුරු වූ තෙපුල් පැවැත්වූහ. පිළුහු ලීලොපෙත වැ ගමන් ගත්තාහ. කුදුහු ඉදිගත්[2] වූහ. එක්සියසතිස් නිරැහි[3] ගිනි නිවිනි. දහගෙයි බන්ධනගත සත්හු මිදුනාහ. ප්‍රෙතයන්ගේ සාපිපාසාදුක් නිවිනි. සව්සත්හු රෝදුකින් මිදුනාහ. තිරිසනුන්ගේ බිය හැරිණ. සව්සත්හු ඔවුනොවුන් හා ප්‍රිය තෙපුල් කීහ. ඇතුන්ගේ කුඤ්චනාදය, අසුන්ගේ හෙෂාරවය, තූර්‍ය්‍යභාණ්ඩයන්ගේ අවාදිතනාදය, දෙව්මිනිසුන් පළන් ආභරණයන්[4] අඝශ්‍රිනාද පැවැත්වීම ය, දශදිග්විරොචනය, සිහිල් සුවඳමඳනල හැමීම යැ, නොකල්වැසි යැ, පසමින් ගේ ගුවන්ගමින් වැළකීම යැ, මීමඬල දුදුරු නැරැ දියඋනල් නැගීම යැ, ගංහෝ ආදීන්ගේ නො වැගිම යැ, අහස්කුස්හි තරුකැන් දිලිහීම යැ, බවග පටන් අවීචිය දක්වා නාත්පසින් එකාඬගණ වීම යැ, සත්වයන්ගේ උදුවිය නො වීම ය, සත්ත්වයන්ගේ දෘෂ්ටිපථයට පර්වතාදීන් ආවරණ නො වීම යැ, සියලු සක්වළගබ නාක් නන්සුවඳ පැතිරීම යැ, සියලු ගස්

1. මරු. 2. ඉදිකැන්. 3. නිරැ, 4. ආභරණයෙන්.

තුරුලිය පලුපලමලින් සැදීම යැ, මහමුහුද පස්පිසුමෙන් සැදීම යැ, දියෙහි ගොඩෙහි පිපිය මහා තාක් මල් පුල් වීම යැ, සකලචක්‍රවාලගර්භය පුෂ්පවර්ෂායෙන් හා සුවඳසුණුවර්ෂායෙන් නිරන්තර වීම යැ යනාදි දෙතිස් මහාපූර්වනිමිත්ත පහළ වී යැ.

ඉක්බිති සමවත්සුව විඳිමින් සතියක් කල් යවා වැඩහිඳ විදුරස්නෙන් නැගී ශ්‍රීමහාබෝධීන්වහන්සේට ඊසානදිග වැඩසිට ජයමහාබොධීන්වහන්සේට ද අපරාජිතාසනයට ද අනිමිෂලොචනයෙන් පුද වදරා, එසින් නැඟී වැඩසිටිතැන් අසුන් දෙඅතුරෙහි දෙවියන් විසින් මවනලද රුවන්සක්මණ සක්මණින් සතියක් යවා, සතරවැනි ව බෝමඩට පැළදිග රුවන්ගෙයි වැඩහිඳ අනන්තනයසමන්තපට්ඨානය සම්මර්ශනය කොට, පස්වැනි ව අජපාලනිග්‍රොධමූලයෙහි වැඩහිඳ භාවභාවලීලා කටාක්ෂනිරීක්ෂණාපෙක්ෂණ හාසාවභාස මාරාඞ්ගනාවන් මානමර්දනය කොට ඵලසමාපත්තින් සත් දවසක් යවා, සවැනි ව මිදෙල්විල සමීපයෙහි මුචලින්ද භොගිභොගාවලිය සරහමින් සතියක් ඉක්මවා, සත්වනසතිය සිරිනුතුරු කිරිපළුතුරුමුල සමවත් සුවෙන් දවස් යවා, එකුන්පණස්වන දවස් සක්දෙව් මහරජහු විසින් එළවනලද දෑවටුදිය පිරිබෝ කැරැ සිවුවරමුන් ගෙණා සලපායෙන් තවුසුබලු නම් වෙළෙඳුන් විසින් එළවනලද මීපිඬු පිළිගෙණ, වළඳා වදරා ඔවුන් සරණසිලැ[1] පිහිටුවා පුද කරණුව එ ද කෙස්ද මිටක් දී තික්මවා, අජපාලමූලයෙහි දී දස දහසක් සක්වළ දෙවිබඹුන් පිරිවරා සහම්පතිමහා බ්‍රහ්මයාගේ ධර්මාරාධනාව පිළිගෙණ බරණැස ඉසිපතනාරාමයෙහි ඇසළමසැ පුණුපොහෝදවස්හි පස්වග මහණුන්වහන්සේ ප්‍රධාන ව රැස් වූ බ්‍රහ්මාමරනරොරග

---

1. සිල්.

ලඹගිරිගොඩුම් සිඛ විද්‍යාධරාදි වූ පඤ්දට සත්වයන්ගේ දුඃඛාතපපරිණාමයෙන් වූ කාතරගමිහාමෙමසයක් නැගී වස්නා කලක් පරිද්දෙන් සද්ධර්මාමෘතවර්ෂයෙන් සත්ව සන්තානවර්ති වූ රාගද්වෙෂමොහමානමිථ්‍යාමදමානසංරම්භාදි දෙෂකලුෂයන් සෝධා පිරිසුදු කොරෙමින් අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහතෙරුන්වහන්සේ ප්‍රධාන කොට ඇති අටළොස්කෙළක් බ්‍රහ්මයන් අමෘතමහානිර්වාණය සාක්ෂාත් කරවා වදාළ සේක.

දළදාසිරිත පළමුවන පරිච්ඡේදයි.

---

## 2. පරිච්ඡේදය

ඉක්බිති තිලෝගුරුබුදුරජානන්වහන්සේ තමන් වහන්සේගේ සද්ධර්මරශ්මීන් සර්වසත්වසන්තානවර්ති වූ සවාසනසකලක්ලෙශාන්ධකාර විධ්වංසනය කොරෙමින් සත්වවිනයනය කරණසේක් බුදු වූ[1] නවවැනි දුරුතුමස මැදිපොහෝදවස් සර්වරත්නාලඞ්කාරයෙන් අලඞ්කෘත වූ ලඞ්කාවීපයට වැඩ, නන්මිණිබෙයින් වොරදනා මිණිබෙනම් දනව්වෙහි මහවැලිගංතෙරෙහි වූ, අයමින් තුන් යොත්නක් ඇති විතරින් යොත්නක් ඇති, සපු දුනුකේනා පනා සිනගෙන්ද එරහැන්ද සිතිද්ද බෝලිද්ද දුසමින් සෙව්වනදි සව්ගෙන්ද[2] ඕකෝ කරකෝ වැටකෝ මේ ඈ ගස්තුරුලියෙන් වොරදනා මහානාගවනයෙහි රැස් වැ සැණකෙළි කෙළනා යක්කැලන්ගේ මුදුන් අහස්හි වැඩසිට වාඅඳුරුවැස්සෙන් යකුන් බවා, ලබනලද අභය ඇති ඔවුන් විසින් දෙන ලද බිම්කඩෙහි සම්කඩ එලා වැඩහිඳ තෙජොකිසුණුසමවත් සම වැද, වැඩහුන් සම්කඩින් ගිනිදැල්[3] හාත්පසින් වෙලාන්තය දක්වා විහිදුවා, එකල්හි බියෙනැලැළු සමුදුරුතෙර පත් බූගණ ගිරිදිවයින පිහිටුවා, රැස් වූ දෙවියන් දහමොද වළඳවා සමන්දෙව්රජානන්ට

---

1. ව. 2. සෞගන්ධි. 3. සාඛින් නැගෙනලද ගිනිදූල්.

කෙස්දළමිටක් දී සොඳුරු වූ උරුවෙල්දනවු වැඩි පසු සමන්දෙව්රජානෝ එ කෙස්දළ මිට එ දා ගෙණ, යොදු මන් පුද කැරැ මිණිතිල් එ දගබ සැද පුද කොළේ යැ.

ඉක්බිති ඒ අනාථනාථ වූ ත්‍රෛලෝක්‍යනාථතුමා[1] බුදු වූ පස්වැනිවස බක්මස කළුවර දෙපොහෝ[2] දවස් නවමිණිරස්ගිහිති මණිනාගදිවයින සුළුදර මහුදර[3] නම් දෙමයිල්නාරජුන්ගේ මහකොලහල[4] වළහම් දසබලා දිවැස් ලා බලා "එතැන්හි ලා ම ගිය හොත් මහත්සෙත් සමත්සත් සපත්[5] වේ"යි සිතින් යුත් සුගත් එ සුගත් ගුවන්පත් එ තැන්පත් නාකැලන් එ කෝසිති දහම්වැසිදියෙන් නිවා ලොවග මිණිපලග පිළිගෙණ දෙසූ බණින් අසූකෙළක් එ නාකැලන් මිනා කැර සරණ සිල[6] පිහිටුවා තොසින් උන් එ දන් දුන් බොජුන් බිදු[7] එයින් ගොස් දෙව්රම් වැඩ, ලෝවැඩෙහි හැසිරෙමින් බුදු වූ අටවැනිවස වෙසහපුණුපොහෝදින කෙලෙසුන් පසුන් ඉසින්[8] පන්සියක් පිරිවරා මුනිවරා නුබ අරා දිනකර ලෙසිනවුත්, මිණිකිරණගණගිහිති කලණ ගුණයිරි පැමිණි කැලණිපුර පැමිණිසද, එ මිණිඇසි නාරද නාකැලන් පිරිවරා මුනිවරා වැද පුරා තැන් මඩු සරා දන්[9] පුරා සහ සමග වලදවා බණ අසා සියසමග සරණසිලැ පිහිටි සද, ත්‍රෛලෝක්‍යමිත්‍ර වූ විචිත්‍ර වූ ගාත්‍ර ඇති මෛත්‍රියට පාත්‍ර වූ ගෞතමගෝත්‍ර ඇති අප බුදුරජානන්[10] සමන්දෙව්රජානන් අයැදමෙන් ලකගන කිරුළුකුළුමිණිමිළිනුදුළු සියලු සමන්ගිරිකුළු පදලසින් බබුළුවා එ හිම වෙත සුභග වූ කීර්ති ඇති භගවත්තුමා[11] භගවා නම් ලෙණෙක්හි වැඩහිඳ දිවාවිහාර කොට, එයින් නික්ම දිඝැමහසැතැන සහ සමග වැඩහිඳ, එයින් නික්ම අනුරපුර වැඩ මහබෝදුමිදු පිහිටිතැන්හි ද රුවන්මැලිමහසැතැන්හි ද

1. නාථතෙම. 2. කළුවරපොහෝ. 3. මහදර. 4. කොලහල්. 5. සැපත්. 6. සිල්. 7. බිදූ. 8. ඉසුන්. 9. දනරස. 10. රජාණෝ 11 තෙම.

තුඹරුද්[1] සැතැන්හි ද භික්ෂූන් පිරිවරා වැඩහිඳ සම්වත්සුව වළඳා, එයින් වැඩ වතළසළගලතලැති මින්තලෙහි නිසල වූ විසලසලසැ පිහිටි තැන වැඩ සිට මහාගුණනිවෙස් වූ බුදුසිරි සන්තාස් වූ[2] රැස් වූ දෙව්බඹුන් දහම්අමාරසෙන් පිණවා දෙව්රම්වෙහෙර වැඩ, ඉක්බිති සතරැම්රලොකයෙහි සැරි සරා වඩිමින් සත්ත්වාභිවෘද්ධි පිණිස සද්ධර්මදෙශනා කරණ කල්හි තමන්වහන්සේගේ සුරකතාධරපල්ලවානතර නමැති සඳවලාගැබින් නිකුත් චන්ද්‍රරේඛාවක් පරිද්දෙන් විරාජමාන වූ සතර දළදාවහන්සේගෙන් නිකුත් හිමකර කරහාර වූ රස්පහරින් නෝවිනෝකුමුදුවන පුබුදුවමින් සද්ධර්මභෙරිනාදයෙන් සියලු සත්ත්වයන් සවාසන සකල ක්ලේශසම්මොහනිද්‍රා මුද්‍රාජිද්‍රාපණය කෙරෙමින් පන්සාළිස් අවුරුද්දක් මුළුල්ලෙහි පරාර්ථචර්‍ය්‍යාව කෙරෙමින් සුවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් සංසාර සාගරයෙන් ගොඩ ලා, කල මහා බුද්ධකෘත්‍යය නාක් නිමවා කුසිනාරානුවර සැපතින් අතුල්‍ය වූ ගුණයෙන් අනල්ප[3] වූ අප්‍රතිමල්ල වූ මල්ලරජුන්ගේ පාරිජාත කර්ණිකාරකොවිදාර සහකාර සින්ධුවාර ජම්බීර ආදි තරුවරනිකරාකීර්ණ සරල වකුල නිචුල විදුල විශාල ශාල වනොද්‍යානයෙහි සුරත්පලුදෙළෙන් හා සුපුල්මල්කැතින් හා විපුල්කුරු[4] පෙළින් හා බිඟුන් මත්සතින් හා කොවුල්[5] කුල්රැවින් හා සුවඳමල්රෙණින් හා අමනම්දපවතින් හා පුත්[6] විසල් ඒ දෙසල්තුරතුරැ[7] පණවනලද සුව පහස් සොඳුරු විසිතුරුවතුරුසැදුම් ලත් තුඟුමහඟුයහනෙහි වෙසහපුණුපොහෝ ලද විසාතකත් ලත් අහසරුවා දින සවස්කල්හි අභීතසිංහනාද ඇති වාදීභසිංහ වූ සිංහ වික්‍රම ඇති ශාක්‍යසිංහ වූ ගෞතමගොත්‍ර වූ මාගේ ස්වාමි දරුවාණන්වහන්සේ උතුරුදිගට ඉස ලා දකුණුදිගට පය ලා දකුණැළයෙන් සිංහශය්‍යායෙන් සැප සේ සැතපී

1 තුඹරුක්. 2 බුදුපිරිස් තොස් වූ. 3. අකල්ප. අකල්පාය. 4. තුරු. 5. කොවිල්. 6. පළන්පුන්· 7. තුරු තුරැ.

වදරා පෙරයමැ මල්ලරජුන්ට දහම්වැසි වස්වා මැදුම්යමැ සුභද්‍ර වූ සුභද්‍රයු සඳ විනයනය කොට වදරා, අලුයමැ භික්ෂුසඞ්ඝයාවහන්සේට අප්‍රමාද පදයෙන් ඔවා දී වදරා, දසදහසක් සක්වළින් රැස් වූ දිව්‍ය බ්‍රහ්ම ගරුඬ ගන්ධර්ව සිද්ධ විද්‍යාධර යක්ෂ රාක්ෂස නර නාගාදීන් විසින් අනෙකප්‍රකාර වූ අතුල්‍ය වූ අචින්ත්‍ය වූ නෘත්‍යගීතවාදිතාදි වූ පූජා පවත්වමින් සිරිකල්හි ධ්‍යානසමාපත්තීන්[1] නැගී පොළෝගිගිරිම් ආදි වූ පූර්ව නිමිත්ත පහළ කරවමින් නිරුපධිශෙෂනිර්වාණධාතුවෙන් පිරිනිවන් පෑ වදාළසේක.

එපවත් අසා සැටදහසක් මල්ලරජදරුවෝ පවන 'ඔළ ලපලුපත් වන්[2] සුරත් දෙහොත් මුදුන් දී නොමඳ මඳපවනඔළ තඹිලුලියකලබ ලෙස විසල් ඒ සුනිල්කෙස් එකා හෙලා පිට හෙලා සෝදුකින් තැවිතැවි මහ හඬින් හඬහඬා මියුඹුහුරුනැල ලලා මුසපත් ව බමබමා එක් වැ ලා සියලියන් සමඟ ගොස් උයන්කුස් වැද දෙම්නසින් මුනිඳු කෙරෙ සෙනෙහසින් පහළ සැඩ පවනඔළ පළපළෙහි පෙළ වගුළ මූලිනුපුළ රඹවනෙව් එ සෝපත් එ සව්සත් එකහි පෙළෙව[3] හී හඬමින් වලපමින් මහතැතින් සිහි ලදින් නැඟීසිට නොයෙක් පූජාසත්කාර පවත්වමින්, බුදුන්ගේ ශ්‍රීශරීරය පළමු කොට නවසිහින්සුවපහස් ඇති ඹටසිලුටු වූ වස්ත්‍රයෙන් වෙළා, දෙවැනි ව සියක් වර පොළනලද කපුපුලුනෙන් වෙළා මෙසෙයින් දහසක් වර වෙළා, සුවඳ තෙල් පුරණලද රන්දෙණට වඩා එ රන්දෙණ එක්සිය විසිරියන් උස ඇති සඳුන්දරසෑයට වඩා, එකල්හි දසදහසක් සක්වළ දෙව්බඹුන් ආදීන් හා සමඟ නෘත්‍යගීතවාද්‍යගන්ධපුෂ්පදීපධූපාදීන් විසින් නොයෙක් පූජායෙන් සතියක් පුද කැරැ මහකසුප්මහතෙරුන්

1. සමාපත්තීන්. ;2. මෙන්. 3, පොළෝ

වහන්සේ එතැනට වැඩ ඒ කාශ්‍යපයාණන් වහන්සේගේ චක්‍රලක්ෂණයෙන්[1] සමලඞ්කෘත වූ ශ්‍රීපාදයුගලය දැක වැද ධර්මසංවේගයට පැමිණි පසු දරසැයෙහි ගිනි දල්වා තොස යොද එද ආදහන පූජාකළාහු යැ.

ඉක්බිති දිව්‍යබ්‍රහ්මාදීන් විසින් වස්වනලද වාරිධාරායෙන් චිතකාග්නි නිවීසඳ, බුද්ධරාජානන්වහන්සේගේ අධිෂ්ඨාන වූ පරිද්දෙන් ලලාට යැ, දෙඅකු යැ, සතර දළද යැ යි නො විසුරුණු සත්දෙනාවහන්සේ ඇර මගධනැළියෙන් සොළොස් නැළියක් පමණ ධාතූන් වහන්සේ ශ්‍රීශරීරයෙන් විසිරී වදළසේක.

එහි මේ පිළිවෙළ කථායි :–

ධර්මසේනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේගේ අතැවැසි වූ සරභූ නම් රහත්මහතෙරකෙනකුන් වහන්සේ තමන්වහන්සේගේ අනුභාවයෙන් චිතක යෙහි දී ම ගිනිදල් පලා ග්‍රීවාධාතූන්වහන්සේ ඇරගෙණ ලක්දිවට ගෙණවුත් මියුගුණ සාමීන් ඉඳුම්ණිනිල් මූවා සැකුස්හි[2] මහමිහිගුබෙරක් සා ඒ ග්‍රීවාධාතූන් වහන්සේ පිහිටුවා ඒ වසා මේවන්පහණින් කසුසැයක් කොට පූජා කළසේක.

ඉක්බිති සිඟලු කෙලෙසුන් නසා ඛෙම ප්‍රාප්ත වූ ඛෙම නම් මහතෙර කෙනකුන්වහන්සේ සතවන්දනාචිත[3] වූ චිතකයෙහි දී ම පහළ වූ වම් ඇති වම් දළද වහන්සේ ස්වාධ්‍යනුභාවයෙන් ඇර ගත්සේක.

එකල්හි බුද්ධරාජානන්වහන්සේගේ ආදහනපූජාවට රැස් වූ ඒ ඒ රජුන් ධාතුවරුන්වහන්සේ නිසා අට ඇරගූකල්හි ඒ රජුන් ගුරු වූ ද්‍රෝණ නම් බමුණු ඇදුරෙක් ඔවුන්ගේ කලහ සන්සිඳුවා මැදට වැ සිට

1. චක්‍රරත්නයෙන් 2. සැකොත්හි. 3. චන්‍දනාර්චිත.

අවකොටසක් කොට අටරට රජුන්ට දී සමිහ කෙළෙ යැ.

ඉක්බිති සක්දෙව්මහරජ දකුණුදළදාවහන්සේ සුරපුරට ගෙණගොස් පුවළුම්ණිරසිනුදුළ කිරුළුකුළු ලකුළු කළ ඵ සිළුමිණිසෑය තුළ ලොදුළු වන රත් දළුව ඵකළු වූ දළදා වඩා තොස වඩා ඔද වඩා පුද වඩා තො ව විඩා වඩවඩා වැඩ වඩා වැඩී යැ.

ඉක්බිති[1] එක් දළදාකෙනකුන්වහන්සේ විපුල සම්පදාධාර පුණ්‍යජනාධාර ගන්ධාරදේශයෙහි රජතුමන් විසින් මණිගණකිරණාකීර්ණ[2] සුවර්ණවර්ණවර්ණිත වූ අසඞ්ඛ තුඞ්ගශෘඞ්ගසඞ්ගත පවිත්‍රවිචිත්‍රප්‍රවරතරප්‍රාසාදයෙක්හි නානා රාගවිරාගවර්ණාස්තරණාස්තෘත වූ නඟන ලද ධවලාතපත්‍රයෙන් විරාජමාන වූ සිංහාසනමස්තකයෙක්හි වඩා හිඳුවා පුද කරණු ලදුසේක.

තවද, එක් කෙනකුන්වහන්සේ නාගභවනයෙහි[1] මණිගණකිරණ විසිතුරු වූ රුවන්භවනයෙක්හි රුවන් රැසක් මත්තෙහි රුවන්කරඬුවෙක්හි වඩා හිඳුවා නාරදුන් විසින් කරණලද පුදවෙසෙස් ඇතිසේක.

ඉක්බිති මාගේ ස්වාමිදරු වූ ඛෙම නම් මහතෙරුන්වහන්සේ තමන්වහන්සේ විසින් ගන්නාලද දළදාවහන්සේ වඩා ගෙණ ගොස් මහගුණකලිඟුරට ගුණවනත ධනවනතජනවනත දනත නම් පුරයෙහි රජ පැමිණී රජගම්ණී-නේසත් ගෙවා දත් කන්වත් දෙවත් වත් සව්සත් සිත් සගත් බඹදත් නම් නරනිඳුහුගේ සතන් පත් අවිදුඅඳුර සදහම්රිවිරැසින් බිඳුවා සරණසිලැ පිහිටුවා බුදුසස්නේ පහදවා ඵ දළදාවහන්සේ ඔහට දී[4] වදළුසේක. ඵරජ ඵ තැන් පටන් පවිටු කිලුටු නොපටු

1. වැඩ වඩා; වැඩි පසු ඉක්බිති. 2. ජිකාර්ණකීර්ණ. 3. [illegible]වනයෙහි නාගින් විසින්. 4. දෙවා.

මිසදිටු හැර, දසදහමින් යුත් රජදහම පිහිටා, ලොක විපත්තිය දුරු කරන්නා වූ සම්පත්තිකරමහාමෙඝයක් පරිද්දෙන් නානාවිධරත්නාදිවස්තුපරිත්‍යාගයෙන් ශ්‍රමණ බ්‍රාහ්මණ දුගී මගී වණිබ්බක[1]යාචකාදි සකලසත්ත්වයන්ගේ දරිද්‍ර නමැති සමී අපහරණය[2] කෙරෙමින්, රන්කොත්කැරැල්ලෙන් රන්රසුමිණිකිකිණිදැලින් නෙලෙනඹලදදපෙළින් යුතු දිමුතුමුතුලැලින් උදුලකුළුකුළුගේසියෙන් සැදි බැලූවන් නුවන් වන් පුවළුරස් ලතිරු වන් තුගුකෙලෙස්ඇදුරු[3] වන් සගමොකට යතුරු වන් සොඳුරුවන් පහකුසැ දිවයහන් වැනි යහන් කැරැ එද එ දළද එහි සද වැද පුද සව්සතුන් පිණ[4] යොද සම්ලෙසින් සැව ගොසින් සහතොසින් සුරපුරට සැපත් වි. ඉක්බිති බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ අනුජාතපුත්‍ර වූ තොසී වත කසි නම් රජකුමර රජය ලැබ ඇමැතිගණ පිරිවරා පියරජහු අයති රට අයපඹුරු කරවුවරින් ලද ඉසුරු නො ම නසා බුදුසස්නේ ඇර පුරා නේදහස්මිණිවැටෙයි වැටුප් ලා සියලියන් සමහ කැරැ නොයෙක්ලෙස පුදපෙවසෙස් නිරතුරු ව කරවමින්[5] දළපෙමින් පිණ[6]පිණා එ දියනා සොඳුරු පුරඳුරු පුර සපත් වී. ඉක්බිති ඒ කසිරජු පුත්‍ර වූ ජනානන්ද සුනන්ද නම් රජෙක් බුඩඝොසසාමමක වැ රැදෙවෙහි නො පමා ව සුවඳින් මලින් බතින් වතින් සිතින් ගතින් එ දළදසාමින්ට පුද කෙරෙමින් තුණුරුවන් විසයෙහි දනමානනාදිය[7] පවත්වමින් චිරකාලනිරන්තර සමුපචිතසුචරිතානුභාවයෙන් සුරන් හා එක්බවට ගියේ යැ.

මෙ ම ලෙසින් නොයෙක් රජදරුවෝ දළද සාමින්ට පූජා පවත්වා අගණ්‍යපුණ්‍යසම්භාරයන් රැස් කොට සුරගතන් මින් පුරවමින් සවගීපදප්‍රාප්ත වූහ.

---

1. වනීක. 2 සමීපකරණය. 3. අශුරු 4. හිත: 5. කැරැවමින්. 6. සිත. 7. මානාදිය.

අනතුරු ව මුළුලෙව්හි පතළ නිම්ලයශතදෙනෙදති ගුහසීව නම් රජතුමකු[1] රජසිරි ලදින් ජනරඤ්ජනය කරමින්[2] ස්වාමිපරාර්ථ දෙක නො දන්නා ලාභ සත්කාරයෙහි ලොල් වූ වඤ්චාප්‍රවෘත්තීන් යුක්ත අඥානාන්ධකාරයෙන් මුස වූ දුටුදුටුවන්ට අරිටුනුණයෙන් රිටුතිවට වූ තිවටුවන්ට උවටුවම් කෙරෙමින්, වලාපටලයෙන් වසනලද චන්ද්‍රලේඛාවක් පරිද්දෙන් අවිද්‍යාන්ධකාරයෙන්[3] පිහිත වැ ප්‍රඥාප්‍රකාශරහිත වැ අධර්මසමාදානමිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත වැ වසන කල්හි, ඒ දුලද නො ගත් ඒ නුවරවැසි සියලු සත්වයෝ මුළු මුළු වැ ගෙණ රන්රිදීමිණිතොරණ පුන්කලසින්[4] හා රන්රිදීධජපතාකාහල්ලෙන් [හා] රන්රිදීමල්පහන්ඇගෑයෙන් [හා] තැන තැනෙහි සරහනලද රඟමඬලෙහි මුළු මුළු වැ කරණ ලද නෘත්‍යගීතවාද්‍යයෙන් හා ඒ ඒ තැන පවත්වනලද[5] තිසුගීන්[6] හා ගන්ධපුෂ්ප[7] දීපධූපාදියෙන් සියලු[8] නුවර සුරපුර මෙන් සරහා සැණකෙළියෙන් යුක්ත වැ ධාතුපූජා කරණ කල්හි චන්ද්‍රයාගේ උදාවීමෙන් උදම් වූ සමුද්‍ර [යෙහි] ඝොෂාවක්[9] පරිද්දෙන් එකකොලාහල කළහ.

එ කොලහල ඇසූ රජතෙම රජමැඳුර සොඳුරු වූ සිවුමැදුරුකවුළුව ඇරැ[10] සරහන ලද සිරිනුදුළ නුවර බලා විස්මය පත් වැ "මෙ සියලු නුවර වැසියෝ කවර ආශ්චර්යයක් නිසා සැණකෙළි කෙළිද්දැ?" යි ඇමැතියන් විචාළේ යැ. ඉක්බිති නුවණැති අචලශ්‍රද්ධා ඇති බුද්ධමාමක අමාත්‍යයෙක් "දෙවයන් වහන්ස, ඛෙම නම් මහතෙරකෙනකුන්වහන්සේ විසින් වඩා ගෙණෙනලද නුඹවහන්සේගේ වංශයෙහි රජපරපුරෙන් පුදනලද කෙලෙසුන් පසුන් සව්නෝ ගෙවා දත් සොයුම්ගොත් තිලෝගුරු බුදුරජානන්වහන්සේ

1. තුමෙක්. 2. කරන්නේ. 3. කාරයෙහි. 4. කලස. 5. පවත්වන. 6. ගී. 7. හා පුෂ්ප. 8. සිය. 9. සමුද්‍ර ඝොෂාවක්. 10. හැරැ.

යේ දළදාවහන්සේට සංසාරසාගරයෙන් ගොඩ නැගී අමාමහනිවන්පුර පැමිණෙනු පිණිසැ නුවර වැස්සෝ පූජා කෙරෙති" යි කී. එ කල්හි එ රජ අමාත්‍යයා විසින් කියනලද බුදුගුණෙන් යුක්ත වූ සුභාෂිතවචනයෙන් අසා දුර්ලබ්ධිය හැරැ බුදුසස්නෙහි පැහැද පෙර රජුන් පරිද්දෙන් දන්තධාතූන්වහන්සේ විෂයෙහි අවිෂය වූ පූජාසත්කාර කරවමින් "මේ නිගණ්ඨයෝ නම් හිරි ඔතප් දෙක නැත්තාහැ. මෙලෝපරලෝ නො දත් තාහැ. තද මිත් ඇත්තාහැ. වඤ්චා ඇත්තාහැ. නුවණ නැත්තාහැ. සගමොක් දෙකට බාධකයහැ" යි යනාදීන් ඇති නුගුණ කලකා සියලු නිවටුවන් සිඃරවින් නැගී යැ.[1]

එකල පාලලුප්නුවර අපමණතෙදකින් ඇති දඹදිවට එකනායක වූ නොයෙක් සේනාවාහන ඇති හිසලද ගත් පඬු නම් රජෙක් රජය කරන්නේ යැ. එකල ඒ නිගණ්ඨයෝ කෝපිත්තෙන්[2] දිලිහී කේලාම්[3] මසුරුමල පෙරටු කැරැ පැලලුප්නුවරට ගොස් පඬු රජු[4] දැකැ "දෙවයිනි, නුඹට සාමන්තරජ වූ ගුහසීව නම් රජතෙම නුඹ විසින් පුදනලද බ්‍රහ්ම විෂ්ණු මහේශ්වරාදි දෙවියන්ට නිඳා කොට මිනිඇටයක් තබා පූජාසත්කාර කරන්නේ ය" යි කිවු යැ. එබස් ඇසූ රජ දණ්ඩාභිඝාතවිෂඝෝරසර්පයකු පරිද්දෙන් කෝපාග්නීන් දිලිහී තමා වෙත සිටි ශෞර වීර්‍ය ඇති විචිත්‍ර වූ චරිත්‍ර ඇති චිත්‍රයාන නම් සාමන්තරජක්හු බලා "කාලිඟුරට දන්තපුරනුවරට ගොස් ගුහසීව රජු හා ඔහු විසින් පුදනලද සැවඇටය හා වහා ගෙණෙව" යි නියොග කෙළේ යැ. ඒ නියොග ලත් සිතුරුයහන්රජතෙම සිවුරඟසෙනඟ සමඟ කැරැ යතරින් කතර[5] ගෙවා ගොස් දන්තපුරය වෙත සපත් වී. එපවත් ඇසූ කාලිඟුරජ

1. නැඟුන. 2. නිඵ්‍රයෑ ගින්නෙන්. 3. කේලාම් 4. රජුන්. 5. අතර.

තෙම ඇත'ස්වූතුමිණිවිසිතුරුවතුරු ඇ නත් පඩුරෙන් ඔහු පිණවී යැ. ඉක්බිති එ රජතෙම ගුහසිව රජහුගේ පිළිසන්පැවැතුම් නැසීබව දැන සිංසෙනග පිරිවරා විසල්වාසල් පවුරුපදනම්අටලුවිටවෙව්ටිමින් තුගුමහගුපාපෙළින් නෙදත්හල්[1]කොළගලින් වොර දනා පුරවර වැද සතුටුසිතින් පිණපිණා රජමැදුරට පිවිසැ ගුහසිවතිරිදු දැක "පඩුරජ තිරොවින් තොප හා තොප විසින් පුදනලද දෙවියන් ගෙණ යන්නට ආමි"කි යැ. නො ඉක්මිය හැකි අපමණ අණසක් ඇති පඩුරජුගෙන් එවනලද දරුණු අසුන් ඇසූ කලිහුරජ තුමා[2] ඒ විත්‍රයාන නම් රජුනට බුදුගුණ වණනු කැමැති වැ "යම් බුදුරජානා[3]කෙනකුන් වහන්සේ සව් සත්සෙත් තිසා ඉස් ඇස් මස් ඇ නත්වත් දන් දී සමතිස් පැරුම් පුරා දසබිම්බර ගොරමරසෙනග බිඳැ අනවරණ[4] නැණනුවණින් සව්නෙ ගෙවා දැන සසර සයුරෙන් සව්සතුන් එතෙර කැරැ නිවන්පුරවරට පමුණුවා වදාළසේක් ද, ඒ සර්වඥයන්වහන්සේගේ ගුණ විශෙෂයන් නො දන්නා වූ සත්ත්වතෙම ලොවිලොවුතුරා සැපතට එකානතයෙන් දුරු වන්නේ ම යැ." යනාදීන් සුබැසිගුණ ඇසූ සිතුරුයහන් රජතෙම[5] බුදුසස්නෙහි පහන්බව තුටුවදනින් පහළ කෙළේ ය.

එසඳ ගුහසිව රජතෙම පහන් සිතුරුයහන් රජහු ගෙණ රත්සඳුන්හෙලසඳුන්ගෝසීසඳුන්මුවා දෙරලි දෙරබා කවුළුබා[6] පෙළින් උදුළු, පුවලපබළුදලමය[7] වාල රූ පෙළින් නුමුතු දිමුතු මුතුලැලින් ඉඳුමිණිතිල්රුසින් වොරදනා, රන්රසුමිණිකිකිණිදලිනුදුළු, කනසැතින් වෙරළුමිණිසෙවෙතියෙන් මිණිකැලුම්දිදුලෙන් එකලු වූ එ දලදාමැඳුර නගනලද විචිත්‍රාතපත්‍ර ඇති නානාමණි ගණකිරණ නිකරභාසුරවිචිත්‍රවස්ත්‍රවිත්‍රාස්තරණයෙන්

1. එ දත්හල්. 2. තෙම. 3. රජාණන්. 4. අනිවරණ. 5. තුමා. 6. කවුළුපා. 7. දළමය.

විරාජමාන සිංහරූපයෙන් සුසංගත සිංහාසනයෙහි දාශමාත කාන්ත (දන්තධාතූන්වහන්සේගේ පියකරු වූ කරඬුව [දූනි ය. එ] දුනු[1] තුටු පහටු එ රජුහට කාලිඟු රජතෙම දළදාවහන්සේ දක්වා[2] තමාගේ දකුණු දණ මඬල බිම පිහිටුවා දසනඛසමවධාන[3] සමුජ්ජවලාඤ්ජලි ඇති දෙනොත් මුදුනෙහි සඳ වැද පුද පෙළහරක් කරණ ලෙස අයැදුමක් කෙළේ ය "ලෝකස්වාමි වූ මාගේ ස්වාමිදරුවානන්වහන්ස, නුඹවහන්සේ විසින් බෝමැඩ රුවන්සක්මන්හි ද, ගණ්ඩම්බවෘක්ෂමූලයෙහි තිථයන් මන් මැඩීමෙහි ද, කිඹුල්වත්පුරයෙහි ශාක්‍ය රජුන් මාන මර්දනස්ථානයෙහි ද, ශක්‍රභවනයෙන් සංකස් පුර දොරටු බස්නා මණිසෝපානමස්තකයෙහි ද යන මේ නොයෙක් තැන්හි ලෝවැඩ පිණිස විසිතුරු අසිරිමත් සසිරිපෙළහර දක්වන ලද්දේ ය. නුඹවහන්සේ විසින් අද දවස් බලන්නවුන්ගේ නෙත් සිත් සතුටු කරවා සගමොක්සුව සාධන්නා වූ පෙළහරක් දක්වුව හොත් යෙහෙකැ" යි යනාදීන් අනේකප්‍රකාරයෙන් බුදුගුණ කියා තිසුවදන් කෙළේ ය. එකල මනකල් වූ පරහිත කරණ[4] පරායණ වූ දළදාවහන්සේ ගගනතලයට පැන නැගී අභිනව චන්ද්‍රලේඛාවක් පරිද්දෙන් ධවල වූ රස්කිඳු විහිදුවමින් දක්වනලද ආශ්චර්‍ය්‍යකර වූ පෙළහර දුටු ඒ විත්‍රඥාන නම් රජතෙම සියසෙනඟ හා සමඟ බොහෝ කලක් පුරුදු කරණලද දුලද හැර බුදු සස්නෙහි පිහිටා ධාතුපූජා පැවැත්වී.

දළදා සිරිතැ පෙළහර නිදෙස් නම් දෙවන පිරිසෙද වී.

---

1. කරඬුව දුන. 2. දුන. 3. සමොධාන. 4. කරුණා.

# 3 පරිච්ඡේදය

ඉක්බිති කාලිඞ්ගරාජතෙම සිතුරුයනන් රජහු හා සමඟ ගම් නියම්ගම්නුවරවැසියන් පිරිවරා අතැති ඒ දතරඹුව සිරමුදුනෙනුසුලා නඟනලද ධවලාතපත්‍ර ඇති කිරිසයුරුදළරළපෙළවිලස් පළ කළ තුහුම්හඟු තුරඟයුත් විසිතුරු තිරි අතුරණලද ලහිරුමඬලක් සේ විරාජමාන වූ රථයානාවකට පැනනැගී සුදුවැලි[1] මලා මැල්ලෙන් තවරණලද පුන්කලසතොරණදදපෙළින් සරසනලද පලඹැඳඹුනුපැල්විලොලබුවෙන් හොබවන[2]ලද කතරමඟ පිළිපන් වැ ඒ මාර්ගයෙහි වනදෙවතාවන් හා සමඟ දවසැ දවසැ අතැති පූජාසත්කාර පවත්වමින් දුරුකතරමඟ ගෙවා පැළලුප්නුවරට පැමිණ (කලිඟු රජනමෙණ) ඇමැතිගණ පිරිවරා පිරිස්මැද උන් පඬු රජ්ජුරුවන් දුටුයේ යැ. එකල එරජ ගුහසිවරජු දුසා රොසීව සහසීව "සනාතන[4] වූ දෙවියන් තබා මොහු විසින් පුදනලද මිනීඇටය ගෙණ ගොස් ගිනි[5] ගෙණ දිලියෙන්නා වූ සහලහුරුවළෙක්හි බහා වහා දවා හසම කරව"යි නිවටුවන්ට නියොග කෙළේ යැ.

එබස් ඇසූ සැටදහසක් නිවටුවෝ නොපටු වූ තුටු පහටු සිත් ඇති වැ රාජාඞ්ගණයෙහි ගැඹුරුවළක් කිඳ දිලියෙන්නා වූ සහලහුරුරැසින් පුරා දරුණු තිහිසුණු සුහිරු ගැඹුරු රොරුවනිරයපුරු අඟුරුවළට ධාතුන් වහන්සේ දමූ යැ. එකෙණෙහි එ දළදාවහන්සේගේ අනුභාවයෙන් සුවඳමූවරඳරෙන් ගැවැසි රියසකක් පමණ මහපියුමෙක් ගිනිඅඟුරුරැස පිහිරා පැන නැංගේ යැ. එකල්හි මානේ සවාමිදරුවානන්වහන්සේ පියුම්කෙමියෙහි විරාජමාන හංසරාජයකු මෙන් වැඩ හිඳ චන්ද්‍රමරීචි සේ ඉතා පිරිසුදු පැහැවතුරෙන් සියලු

1 වැලිතලා. 2 හොබනා. 3. සනාතිස. ස්නානිය 4. ඇටය ගිනි.

නන්දොපනන්දාදි නාරජුන් ද, නාලාගිරි ආදි ඇතුන් ද, සක්දෙවිඳු ආදි දෙවියන් ද, බකාදි බඹුන් ද, රාහුඅසුරිඳු යැ යන මේ ආදීන සෘද්ධිධර්ම දෙශනාදින් දමා අමාමහනිවන්පුරයට පමුණුවා වදාළ සේක් ද, [මේ] ඒ සද්ධර්මවරචක්‍රවර්ති වූ තථාගත අප්‍රති පුද්ගල අසමසම දශබලධාරී මහාකාරුණික වූ[1] සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේගේ දළදා වහන්සේ ම යැ. මෙ මා කී ගුණකථනය සබා වී නම්, ඒ සත්‍යක්‍රියාව හෙතු කොට ගෙණ, මේ දළදාවහන්සේ කිණිහිරින් නැගී[2] මෙතනට රැස් වූ සියලු සත්ත්වයන් සතුටු කර වමින් පෙළහරක් පානාසේක්වා" යි සත්‍යක්‍රියා කොට ආරාධනා කෙළේ යැ

එකෙණෙහි ඒ දළදාවහන්සේ අහස්කුසට පැන නැගී සරදසෙමෙනි වොරදනා නවසඳකලා සෙයින් සියලු සත්ත්වයන් සතුටු කරවා ගුවන්කුස බබුළුවමින් පෙළහර දක්වා එයින් බැස ඒ සිටුපුත්‍රයාගේ පවිත්‍ර වූ මස්තකයෙහි අමෘතධාරයෙන් අභිෂේක කරණ කලක් මෙන් පිහිටිසේක.

ඒ ආශ්චර්‍ය්‍ය දකත් හිරිඔතප් නැත්තා වූ අහිරිකයෝ "මේ විස්මය වනාහි සටුපුත්‍රයාගේ මන්ත්‍රානුභාව යෙක. මේ ධාතුහුගේ අනුභාවයෙක්[3] නො වන්නේ යැ" යි ඒ පඬුරජ්හට කිවුහු යැ. තවද, ඒ රජ්ජුරුවෝ "යම් පෙළහරක් දුක මේ නිඨයෝ අදහා ගණිත් නම්, එබඳු වූ විශෙෂයක් දක්වා ලව" යි දෙවැනි වැ නියොග[4] කොළෝ යැ. ඒ රජු නියොග ලත් සිටුපුත්‍රතෙම සුවඳ පැනින් පුරණලද රන්පාත්‍රයකට වැඩි යැ. එවිගස ධාතූන්වහන්සේ රන්හංසවිලාසයෙන් එ ජලතල යෙහි පැදකුණු කොට වඩිමින් කුමුදුමින් නැගෙමින් සරාජිකපර්ෂදට අපමණ වූ සන්තොෂ ඉපැදවූසේක.

1. වූ ජ්. 2. මැත් කොට නැගි. 3. අනුභාවයෙන්. 4. ලවයි නියොග.

තවද, ගුණමකු වූ ඇවිටු ඇති තිවිටුවෝ එපුර වේමැද මහත් වූ ගැඹුරුවළක් කිඳ දළදුවහන්සේ වල තුළ ලා පසියම් කොට ඇතුන් ලවා මැඩවූහ. ඉක්බිති විගසකින් රථසකක් පමණ ඇති මිණිමය කෙමි ඇති රජතමයකෙසුරුසළාඇති ගතරත්මය වූ පෙතිපතර ඇති මඳමඳතෙලෙන් සෑලොවතලද නොමිඳ[1] සුවඳ බුවරඳසළාඇති පියුමෙක් පොළොව පළාගෙණ පැන නැංගේ යැ. එකල්හි දළදුවහන්සේ පියුම්කෙමිය මත්තෝ වැඩහිඳ සියලු ජනයා සතුටු කරවමින් නොයෙක් ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා වදළසේක. ඒ ආශ්චර්‍ය්‍ය දුටු සියලු සත්ත්වයෝ ගන්ධමාලාවස්ත්‍රාභරණ දීපධූපනෘත්‍ය ගීතවාද්‍යාදීන් පූජා පැවැත්වූහ. එකල්හි ඒ ආශ්චර්‍ය්‍යය දුටු තීර්ථයෝ 'මෙයිද්‍ද විද්‍යාප්‍රයොගයෙකැ'යි එ රජ කුමා උගන්වා[2] නොයෙක් කුණින් පිළිකුල් වූ දණු කුලතට අවස්[3] වූ ගවරවළක් මෙන් වගළ අගළට දැමූ යැ. එකෙණෙහි එ පිරි පස්පියුමෙන් සැදි පිරි හංස සාරස චක්‍රවාකකාරණ්ඩවාදිජලචරපක්ෂීන් හා මද මත් බමන බමරගණමුමුනෙනන්[4] සුකූජිත වූ නඳුනුයනැ මන නඳන නඳා නම් පොකුණ පරිද්දෙන් සැරහුනේ යැ. එකෙණෙහි එපුරවර වරණගණ කුඤ්චනාද පැවැත් වූහ. තුරඟගණ කුල්නා කළහ. එ පුරවරවැසි නෝදන[5] සොම්නසින් පිණපිණා ඔල්වරහඬ පැවැත් වූහ. සියලු පසගතුරු රුවුපිළිරුවු[6] කෙළෙ යැ. තුටු පහටු ඇව්සත්හු තියුගී කළහ. සඳුන්කස්තුරුකපුරු කළුවැල්තුවරලායෙන් තිපන් සුවඳදුමින් නුබතෙලෙ ඒ කල් මේකල් මෙන් වී යැ.

මෙලෙස පහළ වූ නොයෙක් ඒ ආශ්චර්‍ය්‍ය දුටු ඇමැතිවරහු එ තරවරු කරු ගොස් "දේවයන්වහන්ස,

---

1. නොමද මඳ. 2. සගත්වා. 3. ඔමස්. 4. මූ. නොණ්. 5. දනා. 6. පියරුවු.

මේ දළදාවහන්සේගේ මෙබඳු පෙළහරක් දුටත් යමෙක්හුගේ සිත උන්වහන්සේ කෙරෙහි නො පහදී ද, ඒ තෙම නුවණ නැත්තේ නම් වන්නේ යැ. පුන්සඳ පහළ සඳ කුමුදුවනවිකාශයක් මෙන් සන්තොෂයට නිසි විෂයට වූ ගුණ දුටු සතුටු වීම උත්තම්සත්පුරුෂ[1]යන්ගේ ස්වභාවධර්මයෙකි.[2] ඇස් නැතියක්හුගෙන් මහ මිණ ඇවිදින්නාක්හු සෙයින් නුවණ නැති ඒ තීර්ථයන්ගේ බිස් ගෙණ සගමොක්මග නො තසා වදළ මැනැව. පුරාතනයෙහි කප්පින, බිම්සර, සුදොවුන් මහරජ ආදි වූ රජදරුවෝ ද, ශක්‍ර බ්‍රහ්මාදි දෙවියෝ ද ඒ බුදු රජාණන්වහන්සේ කරා එළඹ සදහම්අමාරස බොදා සගමොක්මග සැධූහ. එබැවින් නුඹවහන්සේ පස් මරුන් පැරැදූ දෙවාතිදෙව වූ ශක්‍රාතිශක්‍ර වූ සධර්ම රාජ[3] වූ සධර්මවරචක්‍රවර්ති වූ ඒ බුදුරජාණන්වහන්සේ විෂයෙහි සගමොක්සැප සාධන පිණිස සිත පහදවා වදළ මැනැවැ"යි කිවු යැ.

එසඳ ඔවුන්ගේ බස් ඇසූ පහන්සඳැති ඒ පඬුරජ තෙම "ශීතපීඩායෙන් පෙළී ගිනි තබා නුනුවණින් කණ්දපැණියන් පිඹින්නාක්හු සෙයින් ද, පැන් පවස් ඇති වැ ගඟ පැන් තබා මිරිඟුපැන් බොන්නක්හු සෙයින් ද, සාකුස් පෙළී අමා තබා වස බුදින්නක්හු සෙයින් ද, සැරහීම් කැමැති වැ සමන්මල්දම් තබා දරුණු විසඝොර සර්පහර[4] පළඳනාක්හු මෙන් ද, සසර සයුරට[5] තරපසුරු වන් සගමොකට යතුරු වන් රජසුරඹ සිතුරුවන් [එන්] තුණුරුවන්හි ගුණ නො දැනැ මොහඳුරෙන් විසතු ලදු මි තිර්ථලද ගෙණ අපථයෙහි පවතිමින් මෙ තෙක් කල් පමා වැ විසීමි" යනාදීන් දූළදයෙහි තුගුණ [හා] තුණුරුවන්හි ගුණ හා කියා බුදුසස්නේ පහන්බව පහළ කැරැ මෙතැන් පටන් වන්දනමානනාදි

1. උත්තම පුරුෂ. 2. ස්වභාවයෙකි, 3. ධර්මරාජන්. 4. සප් සර, 5. මෙන් ද සයුරට.

පූජාසත්කාර කෙරෙමින් අගණ්‍යපුණ්‍යසම්භාරයන් සම්භරණය කරණ ලෙස ඒ දළදාවහන්සේ වඩා ගෙණ වා' යි අගැමැතියාහට නියෝග කෙළේ යැ. ඒ අගැමැති සපිරුණු මහදෙඳුන් අගලතරට ගොස් දෙරණතල සපත් වූ සුරගෙදික්නි[1] විලසින් පස් පියුමෙන් සැදුනා වූ එ අගලෙහි රන්හංස එකලෙසින් පියුමෙන් පියුමට සක්මන් කොට විඩිමින් පානා වූ පෙළහර දැකැ දළ තොසින් වැද පුද "පඬුරජ්ජුරුවන්වහන්සේ බොහෝ කලක් පුරුදු කරණලද තිඵලද හැර බුදුසස්නෙහි පහන් වූසේක. උන්වහන්සේ කෙරෙහි මෙත්සිත් පතුරුවා රජගෙට වැඩ දෙලෝවැඩ සාදා වදාළ මැනැවැ"යි ආරාධනා කෙළේ යැ. එකෙණෙහි දළදා වහන්සේ එයින් වැඩ අගැමැතියාගේ පබළුපැහැඋදුළ කරතලට වැඩම කැර වඩ වඩා සොම්නසින් ඔහු පිණවා වදාළසේක.

එපවත් ඇසූ පඬුරජ විස්මය පත් ව සොම්නසින් පිණ පිණා පියවි ගමනින් එතනට ගොස් බඩාඤ්ජලි වැ "භාග්‍යවතුන්වහන්ස, 'වෙළෙඳමෙහි දක්ෂ වූ වෙළෙඳහු ජාතිරත්රණුත් නාස්තාපනණෙහි දී නැසැ පියා ම ඇණතියම දැනැ අගය කෙරෙති' යනු ද, 'නුවණැත්තෝ උතුම් ආකරභූමියෙහි පහළ වූ ජාතිරඞග මාණික්‍යය ද ගා යොදා ගිනිවර කොට කිරිටාභරණාදියට යොග්‍ය කෙරෙති' යනු ද යන මේ තෙම ලොකවාසීන්ගේ සවභාවධර්මයෙක. එසේහෙයින් පොළොව හා සමාන නුවණැති උත්තමයානන්වහන්ස, නුඹවහන්සේ කෙරෙහි මා විසින් නො දැනැ කරණ ලද අපරාධය ක්ෂමා කොට වදාරා මාගේ උත්තමාඞගය සරහා වදාළ මැනැවැ"යි ආරාධනා කෙළේ යැ.

1. සුරශැදික්නි, සුරගදිකානි.

එසඳ මේඝකූටෙක්හි උදුල විදුලිය විලසින් ඒ රජහු කෙරෙහි සෙනෙහස පහළ කරන්නාක් මෙන් පළු හෙළ පුවල රස් විහිදුවමින් උතුමහ පිහිටා වදාළසේක. එසඳ සොඳ නිරිඳුසඳ සිය මුදුනැ පිහිටි දළදාවහන්සේ වඩා ගෙණ නුවර පැදකුණු කොට රජගෙට ගොස් මොනවට සරහනලද මාලිගාවෙහි නඟන ලද සිතාතප[1] වාරණයෙන් විරාජමාන විසිතුරුයහන්හි වඩා රන් රුවන්මුතුමැණික්ආදි නොයෙක් වස්තුවෙන් පුදමින් බොහෝකලක් පුරුදු කරණලද දුලද හැර බුදුසස්නෙහි පිහිටා උතුම් වූ ප්‍රාසාදයක් කරවා එහි වඩා නොයෙක් පූජාවිධාන සලස්වා සියලුරජයෙන් පුදා ගුහසිවරජු ද මහත්ඉසුරට පමුණුවා අපමණ කුසල් රැස් කෙළේ යැ.

දළදා සිරිතැ ධාතුවිවසිම් නම් තුන්වන පිරිසේ වි.

---

## 4. පිරිසෙය

මෙසෙයින් පඬුනරනිඳුහු දසරජදහමින් යෙදී රජ කරණකල්හි යුධයෝග්‍ය ඔළුමොළුබලමුලැති ධීරසාර වූ ඛීරධාර නම් නිරිඳෙක් සිවුරඟසෙනඟ පිරිවරා යුද කෙළිය ලොලින් සියරටින් නික්මැ පැළලුප්නුවර වෙතට සම්ප්‍රාප්ත වී. එකෙණෙහි පඬුනිරිඳු රණ පැමිණැ රුපුනතුණු උණු කෙරෙමින් අසුරසෙන් මැදට වන් තිසක් සක්දෙවිඳු මෙන්, රුපුසෙනඟ මන් බිඳ, විරිසිරි[2]කත ඇද වැළැඳ දිය ලැබ, නිරිඳුසඳ සිය පුරවරට වැද සතොස දළදාවහන්සේට අපමණ පූජා පවත්වා ගුහසිවරජුහට නොයෙක් පඬුරු දීමෙන් සතුටු කැරැ දළදාවහන්සේත් පාවා දී සියරටින් නිකම

---

1. සිතාතප. 2. විරු

වූයේ ය. ඉක්බිති කාලිඟුරජ දළදාවහන්සේ වඩාගෙණ දුරුකතරමග ගෙවා සියනුවරට පැමිණ, සව්සතුන් සගමොක්මග යොදමින් වාසය කෙළේ ය.

එකල්හි උදේනිරට උදේනි රජහුගේ පුත්‍ර වූ සුචරිත්‍ර[1] මිත්‍ර වූ දන්තාක්‍ෂයන් ඇති සුදන්ත දන්ත නම් රජ කුමාරයෙක් දළදාවහන්සේට පූජා කිරීමෙන් සගමොක් සුව සාධා ගන්නා කැමැති වැ කාලිඟුරටට[2] අවුත් ගුහසීව රජහු දැක, සරිත්වරිත්ගුණෙන් ඒ රජහු පහදවා රැඳෙවෙහි පූජාසත්කාරයෙහි නො පමා වැ විසී ය. පැසුළු කල් යාමෙන් කාලිඟුරජු[3] දන්තකුමාරයන්ගේ ගුණගොත් විමසා තමන්ගේ හෙමමාලාභරණවිභූෂිත වූ හෙමමාලා නම් දියනියන් රූසිරුමහරුසිරිසරඹුසුරු සා සමග හිමට පාවා දී යුවරජතනතුරු[4] පමුණුවා දළදා ගෙට දිවිහිමියෙන් හිමි කරවා රජඉසුරු විඳිමින් සිටිසඳ, පළමු රණදෙරණ තිසරණ වැ සැතැපුනු නිරාධාර වූ කීර්ධාර නම් රජහුගේ අයාමෙන් කීදි ගොස් විසල් වාසල්තුල්ගල්මුල් තෙ[5]ගල්වල්මලම්බුලුපත් මෙකු බැන[6] කුමරුවෝ බළඇණී සමග කැරළි දළදාවහන්සේ ගණුම් හ'යි සැහැසී ව සැහැස'වුත් කාලිඟුරට දන්තපුරනුවර වෙත[7] පැමිණ, කඳවුරු බැඳ ඉඳ "දළදාවහන්සේ හෝ පාවා දෙව. යුධ හෝ කරව"යි පියසුන් අසුන් යැවූහ. එසෙණෙහි ධරණීපාලතෙම නොකන්කලු අසුන් අසා දෙම්නසිනා ඉදිඹුදී සෝදුකින් තැවිතැවී ල කඳුළෙන්[8] තෙමතෙමා මුසුදුහුරුනල ලලා කානන වූ දන්තකුමාරයන් කැඳවා "කුමාරයෙනි, 'මාගේ දිවි පවත්නා තෙක් අන්කෙනකුන්ට අප මුනිඳු දළදාවහන්සේ නො දෙමැ"යි කියා 'එතෙකුදු වුවත් යුදෙහි මොවුන් දිනන්නට මට නො පිළිවන. තෙපි වනාහි දදලෙසක් ගෙණ නොපසිදු

1. සුර චරිත්‍ර. 2. රට. 3. රජ. 4. තනතුරට. 5. එ. 6. පත් බැන
7. වෙතට 8. තැවිතැවී කඳුළෙන්.

ලෙසින් දළදාවහන්සේ වඩාගෙණ මෙහි නො සිට ලක්දිවට ගෙණ යා යුතුය"යි ඔවාවදන් දින.

එතෙපුල් කන්හි ඇසූ රජකුමර ද "රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේට මට කිසි ඇදිත්මක් නැති පිරිසුදුබුදුසසුන් නො පවත්නා රුදු මුහුදු එතෙර පත් තුන්බුදුන්ගේ විසේසතිවෙස් වූ ලක්දිවට පළ හෙළ ලෙල දළදාවහන්සේ මම[1] කුමි සේ වඩාගෙණ යෙමි?"යි පුළුවුත. එකල්හි රජතුමා දන්තකුමාරයාහට "පින්වත් වූ කුමාරයෙනි, ලක්දිව මෙවකට බුදුසස්නෙහි පහන් තිරිදුතුමින් හා බුදුරජාණන්වහන්සේගේ සාරිරික ධාතුන්වහන්සේ හා අපමණ ගුණගණැති අතිවරණ මුනිවරණන්[3] [හා] විසින් සැදූනේ යැ. තවද, මට මිත්‍ර වූ දිඹුදු දන සත්‍ර වූ සැදහැයෙන් පවිත්‍ර වූ දහමට අමිත්‍ර වූ ගුණගණට පාත්‍ර වූ [රණකරණ] රණරණක මහසෙන් ඇති මහසෙන් නම් රජෙක් ලක්දිව එක්සත් කොට රාජ්‍යය කරන්නේ යැ. එ රජගමෙණ අප දළදාවහන්සේට නොමඳනොඳපබිදපුද කරන්නට ද, අසරණව පැමිණ ගිය තොපට තුටුපහටුසිතින් රුසිරුසිරිබරභූසුරු දෙන්නට ද වනැ"යි මෙලෙසින් බෑනකුමරුහට නියොග කැරැ ගුණනුවණ අපමණැති ඇමැතිගණ පිරිවරා ඇත්‘ස් රිය පාබල සිවුරඟසෙනඟ සමඟ කැරැ රණදෙරණ වන් රජගමෙණ සුරපුරසිරි අත් සෙළේ යැ.

එකල කුරිරු දරුණු බිහිසුණු එ වදන් වදන්මඟ සැදූ ඒ රජකුමරු ගන්නාලද මනාදදවෙසින් වෙස් වළා එ පුරවේ වළවළා එ දළදාවහන්සේ වඩාගෙණ එපුරෙන් නික්ම ගොස්, දෙවියන් විසින් ගන්නාලද අරක් ඇති වෘ වහවනා ලස් නො ව තොලස් ව ම එකලා උදකලා ගමන් ගත් මිග මිහා දකුණුදිගැ මඟ

1. ම. මා. 2. වරන්. 3. ඇත්තේ.

ගෙවා ගඟ[1] නම් ගඟ ලඟ[2] තුහුතරහවැලද්ලා මඤ[3]අමින් මින්ජෙලා ගැඹුරුමනදියසලා ගහදිය ගෙවා තෙර පැමිණෑ සරාවලාවිලසුදුල[4] සොම්පහස්කලා වැලිතලා කොල වඩා ඇය බැඳ, යළි නුවර ගොස් සියලියද වෙස් වළා යතුරැ ගෙණ තොමටමා මහ ගෙවා ගගිතතෙර වී ඔවුන් දෙදෙනා[5] ධාතුනවහන්සේ පුද මින් ගතවනලැහැබෙක[6] වැද කලක් එහි කල් යවා වසන[7]සඳ, ගුවන්තෙලෙ ගමන් ගත් තෙරකෙනකුන් වහන්සේ ඒ වැලිතැලෙන් විහිදුනා සවණක් රස් දිදුල දැකැ අහස්කුසින් බිමට බැසැ දළදාවහන්සේ වැඩ උන් තැනට වැඩිසේකැ එපවත් ඇසූ තෙරුන් වහන්සේ 'කිසි සැකයක් නො සිතා බිය නො ගෙණ සැප සේ යවු අතරමග ඉදින් තොපට බියක් වියවුලෙක් වී නම්, මා සිහි කරව'' යි වදාරා සුදුසු ලෙස දම් දෙසා දෙදෙනා මෙතෙහි බඳ සෝදුක් මුදා සොස යොදා එදා ගුවන්මඟ[8] වැඩම කළසේකැ. ඉක්බිති එගඟ නාගභවනයෙහි වසන පණ්ඩුහාර නම් නා රජෙක් තමා නාගභවනයෙන් පිටත් වැ නාකැලන් පිරිවරා කෙළිදෙළින් ඇවිදිනේ ඒ වැලිතලාවෙහි සිසිරස් වතුරැ පුරැ පිවිතුරැරස්දිදුල දැකැ මහත් විසමය පත් වැ තෙ පැණී වෙනට ගොස් එපවත් දැකැ දළදාවහන්සේ රුවන්කරඬුව හා සමග ගැලැ ජල කිමිද සයුරැ වැද මහතුදුළ[9]දරණවැල මවා සුමෙරගිරි වට වෙළා සග තොසින් පිණපිණා වැද හොත්තේ යැ.

එකල දනනකුමාරයන් හා හෙමමාලාවෝ ගමන 'දසින් වැලිතලා බලා දළදාවහන්සේ නො දැක දල සොවින් තැවිතැවී මහහඬින් හඬනඬා නො සැතැහි ඒ වෙනෙහි දෙවියන්[10] අයදමින් "මෙ දුකට අත් සරණෙක් මෙහි නැතැ'යි මෙනෙහි කැරැ එතෙර

1. ගඞ්හා. 2 ගයම ගඟ හෙබ ළහා. 3, සළා එයි. 4. විලසදුල. 5. වැ ඔහු දෙදෙනා. 6. ලැහැබ. 7. කල් යවා. 8. ගුවන් ගුවින්. 9. මහගු දල. 10. දෙවියන්ට.

සවර සිහි කළහ. එසඳ ඔවුන්ගේ සිත් දිවැසින් දත් තෙරුන්වහන්සේ ඇසිල්ලෙකින් වැඩ එපවත් අසා ඔවුන් අස්වසා දිවැසින් විමසා නාරදුන් දකැ දරුණු කිහිපුණු රළුකරළුගුරුළුවෙසක් මවා ගෙණ මහපවතින් ගැඹුරුසමුදුරැ දිය දෙබෑ කැරැ තවසරු මෙර තරුපත්සඳ උරගරද කියෙතැලැළි මූසපත් වැ සිහි එළවා නාවෙස් හැරැ තුරුණුමණෙවු[1] වෙසක් මවා ගෙණ ගරුඩරාජයාහට නමස්කාර කොට ප්‍රිය වූ වචනයෙන් "ස්වාමීනි, බුදුරජානන්වහන්සේ ලෝවැඩ පිණිස මැ පහළ වැ සියලු සත්ත්වයන් සසරසයුරෙන් ගොඩ ලා වදාළසේකැ. එහෙයින් උන්වහන්සේගේ ධාතූන්වහන්සේ විෂයෙහි පූජාසත්කාර කොට විසල් කුසල් රැස් කෙරෙම්යි සිතා ගෙණාමි" කීයේ යැ. එ තෙපලසා තෙරුන්වහන්සේ "නාරජ, දළදාවහන්සේ පන්දහසක් හවුරුදු බුදුසසුන් පවත්නා ලක්දිවට අරක් පිණිස වඩනාසේකැ. තොප විසින් රඳවාගැන්ම කාරණ නො වේ"යි වදාළහ. එකෙණෙහි නාරජ තෙරුන්වහන්සේට දළදාවහන්සේ හා රුවන්කරඬුව පාවා[2] දුන්නේ යැ. ඉක්බිති තෙරුන්වහන්සේ ගුරුළුවෙස හැරැ සයුරෙන් නැඟී දළදාවහන්සේ ඔවුන් දෙදෙනාහට පාවා දී නික්මුනුසේකැ.

ඉක්බිති ඒ දෙදෙන සොම්නසින් පිණ පිණා එවනයෙහි වනදෙවියන් විසින් කටුපහණ දුරු කැරැ වලු ගොඩ නතා මලාමැල්ලෙන් සැදහලද එ මහ දළදාවහන්සේ වඩා[3] නො විඩා වැ ගම්නියම්ගම් රාජධානි පෙදෙසි[4]වැසියන් විසින් පුදනුලදු වැ අනූන වූ සිරි විඳිමින් ගල්මුල් වල් විල්;පල් විසල් සෙල් බැවිල්[5] යුත් දුරුකතර මහ ගෙවා යෙහෙන් ගොස් තාම්‍රලිත්ති[6] නම් තොටට පැමිණැ එදවස් ම ලක්දිවට ගමනට[7]

---

1. මැණවි. මෙණෙවි. 2, කරඬුව. 3. වඩාගෙණ. 4. නිවෙස. 5. බැවිල්. 6. තම්මවත්ති. 7. ගමනලි.

සිටි නැවක් ඇතැ'යි යනු අසා නැවියා ලහව ගොස් එපවත් කියා තුටුපහටුසිතින් ඔහු විසින් දෙනලද ඔවස් ඇති වැ නො ලස් වැ එදවස් ම නැව් නැංගාහ.

එකල උදුළදළරළපෙළැති ගැඹුරු මහසයුරු නිවිරළ වී යැ. දසදික් එකලු වි යැ. සුවඳමුවරදිනඳ පවන් හමුලේ යැ. මෙසෙසින් ඒ නැව් විමල් විසල් සුළඟින් ගුවන්තෙලෙහි හමින් ගත් මහත් තුරුළුරද විලස්නෙන් ගමින් තැරැ මහමුහුදුමැදට වන්සඳ, පුගත් තෙලෙන් මූළිනුපුවා දවටනලද කුලගිරිපරම්පරාවක් මෙන් පුවළ ගුගුළු දළරළපෙළින් ද, කුරිරු කිහිසුණු ගොසින් ද, කියෙනැලළුනු සතන්ගේ මහහඬින් ද, එවට නොසතුට පත් සත්ත්වයෝ දුක සේ [රාත්‍රිය ගෙවූහ.] රාත්‍රියගේ[1] ඇමෑමෙන් පහද උදගිරිමුදුනැ සඳ දිනිඳු පහළ වූ සඳ, පෙර පරිද්දෙන් මුහුදු ඉඳුනිල් මිණින් පිරියම් කරණලද බිමක් පරිද්දෙන් තිඹී සැනහි නිශ්ශබ්ද වි යැ. එකල වතළ පුළුල් මහත්පෙණගඩින් යුත් බියකර සමහර නයි[2] නොමඳ සුවඳ මුවරදනඳ මද[3] මත් බමරගණමුමුනෙන් සැදුනු මදුරුවලින් යුත් අත් ඇති වැ, [සමහරු] සිරිසරපැහැසර සුරවරවිලස් ගෙණ[4] ළියදඹුවැටපහන් හා[4] සුපුල්උපුල්කඩුපුල්මල් හා රන් රිදී කලස හා පවනඹළ පළු හෙල පුවළ දදපෙළ රන්රිදී මැණික් සුවඳසුණු පිරුණු මහගුසුමුගු [හා] ගත් අත් ඇති වැ, ලීළෙලාපෙත වූ ලයාන්විතගීතිකා ගායනා කැරැ නටමින්, විසිතුරු පසහතුරු නොඅතුරු ව නද කෙරෙමින්, නේදහස් ගණන් උරග මූළු පුද අදහසින් නාලොවින් නැංගාහ. එකෙණෙහි දළදාවහන්සේ රාජකන්‍යාවගේ සුනිල්පැහැපළ උදුළ මූහුලසින් වෙන්වහට නැගී සියලු ආකාශකුහරය බබුළුවා රිදී රසධාරාවක් මෙන් නිමල්තරරස්පතර පතුරුවමින් දුක් නිවා දක්වනලද පෙළහර දැකැ සතුටු වූ ඒ නාකැලන්

1. දුක සේ රාත්‍රියගේ. 2. නයින් ද. 3. මුවරද මද. 4. ගත්.

විසින් පවත්වනලද තිසුගීගොසින් හා සාධුවාදනාදයෙන් අහස්කුස් එකකොලාහල කරවමින් මහහර පෙළහර පෑ ගුවනින් බැසැ තමන්වහන්සේ පළමු වැඩ හුන් රදලින මුහුලන සඳ වදාළසේකැ

මෙලෙසින් දිව්‍යනාගසමූහයෝ තමන්ගේ අනුභාවයෙන් නැව රදවාගෙණ සද්දවසක් මුළුල්ලෙහි පූජා කළාහු යැ.

එකල ඒ ජයම්පති දෙදෙන නභොමධ්‍යගත අවල විමානයක් මෙන් ඒ නයින්ගේ විකාරයෙන් නැව නො ගොස් මැද මුහුදැ සිටි සේ දැකැ බියෙනැලළී දළසෝපත් වැ ඒ තෙරුන්වහන්සේ සඳහන් කළාහු යැ. එකල තෙරුන් වහන්සේ එබව දැනැ වදුරු පස්වණක් වලා මිඹිමින් ආකාශයෙන් වැඩ නයින්ගේ විප්‍රකාර දැකැ භයානක වූ ගුරුළුවෙසක් මවාගෙණ ඒ නාකැලන් පලවා නැවැ සතුන් අස්වසා වැඩ වදාළහැ. ඉක්බිති සුනිලඹර ගමන් ගත් වනරජ හංසරාජවිලාසයෙන් මහපවනින් මෙහෙයනලද සරාසරා[1] වලා කුළුවිලසින් තරළදළුරළපෙළ දෙපෙළ කැරැ පවනඹළ ලකළ ලෙළ උදුළු දදපෙළින් අඹරතුර සරහමින් එනැව තොලස'වුත් මෙ සිරිලක දනවු දිට එකල ඒ ජායාපති දෙදෙන සුරුසෙන්[2] පිරිවැරූ මහසෙන්තිරිඳු පිත් දෙව්තුරු එකතරම්[3] සව්ඹුසුරුවතුරු මේයුරු දියතපත්කිත්සිරිති තිරි කිත්සිරිමෙව්නරනිඳුට තවවැන්තෙහි තුටුපහටු දත තොපටු පව්ටුකිලුටුකුඹුටුඅරිටුතිවටු අදිටු මාවටු පටුන් බටුවාහුසි.

**දළදා සිරිතැ ලඞ්කාවතාර නම් සතරවන පිරිසෙද් වී.**

---

1. ලද සරා, 2. සුරසෙන්, 3. තරමේ.

## 5. පිරිසෙය.

එකල ඒ ජයම්පතිදෙදන දළඳ වඩා එහි සිත්කලු දේවාලයෙක්හි තිවස් ගෙණ සිවුවේදයෙහි නිපුණ කුළුණු [ගුණැති][1] බමුණකු විසින් අන්නපානාදීන් කරණ ලද සම්භාවනා විඳැ, පසුදා උදෑසන ඔහු විසින් කියන ලද මාර්‍ගසංඥාවෙන් කතරමග ගෙවා ගොස් අනුරපුර නුවරට නුදුරැ සොඳුරු ගම්කට පැමිණැ මහසෙන්නිරිඳු සුරිඳුපුර ගිය පවත කණත නෙත අනතසෝ අදවත දවත[2] සාත සමග අතරමග අඩා දෙඩා වඩවඩා විඩා විඳ මූසපත් සඳ, 'කිත්සිරිමෙව්නිරිඳුසඳ එසඳ පබඳ නොමඳරජසිරි පැමිණැ අපමණගුණැති තුණුරුවන් බැතිපෙමින් වැඳ පුදා රජ කෙරෙයි'[3] යතු අසා දළ සෝ මුදා එදා ගොස් තන්විසිතුරුතුරු තෙවුනා මහ මෙවුනාඋයන්මැද නේසිරි සපිරි ඔනත්[4] මෙතිහි මෙවෙහෙර වැද, මුනිවරණ සිරිසරණ සරණ කළ මෝදෙස්රා වරණ කළ සව්[5] සතුන් අරණ කළ පස්මරුන් උරණ කළ මෙත් කුළුණු බරණ කළ මහසඟන පිරිවැරූ එක් තෙරනෙකුන් වහන්සේ දක වැඳ, 'එසඳ සියසඳ සමග විදියම්හ[6]'යි කියා පිළිසඳරකතා කැරැ මඳ විගසක් සැතැපී "තුඹ වහන්සේට දළතොස් වන සේ දළදාවහන්සේ වඩා ගෙණම්හ"යි සැළ කළාහු යැ.

එතර එ පවරමහතෙරුන් වහන්සේ ඔවුන් එ තෙපුල් සවණ සදා වදුරා සොම්නසින් පිණපිණා සිය පිරිවෙණ පිවිතුරු කැරැ විසිතුරුසෙල්වියන් බැඳ දුටුදන මන තුටු කරවන පටපිළී තිර මහරන[7] අක්සුණු ආදීන් සරහා මහරු මහරුක්මලින් යුත් කලසපෙළ සලසා පහන් සිතින් පහන්ගඳදුම්මල්මලොලඹුබුවුතුරුණු ආදීන් සරහා එහි මැද කොඳුපලස් ඇ විසිතුරු ඇතිරිලි අතුරණලද

1. කුළුණු. 2. තවත 3. කෙරෙති. 4. නේසිරිසපිරිමෙන, 5. සරණ කළ සව්. 6. විදියසසි. 7. මහරගෙ.

යහන්හි දළදාවහන්සේ වඩා බැතිපෙමින් වැඳ පුද, එ පවත් කියන ලෙස කිත්සිරිමෙව් නිරිඳු හරු පිළිවෙත් සරු සොඳුරු සඟුරුවනක් යවා විචාළේයැ.

එ තිබී ගොස් අනඟ [රඟ] රඟරනා තන්රුසිරින් සුරඟනන් [වන්] වරඟ නන්පුරඟනන් පිරිවරා පුරඳර විලස්නෙන් වසත්කල සපත් කල වසත්කෙළියැ කළ දෙළින් මනනඳන නඳුනුයන් වන් උයන් වැද කෙළනා එ රජහු දූනැ එපවත් කීසේනැ එකල උන්වහන්සේගේ වදන්මිණිකොඩොලින් සඳනලද වදන් මිග ඇති එ නරපවර විසමයපත් ව සක්විති රජය ලත් කලක් මෙන් සොම්නසින් [වන්] ලොමුදෙහෙන් සන් ව[1] එසඳ බමුණුදූරකු විසින් "දෙමළු කොතෙක් තොබෙ දවසැකින්[2] මුනිඳු දළදා වඩා එති"යි ලකුණකින් දූනැ කියූ වදන් මෙතෙහි කැරැ තුටුපහටු දිදුණු කැරැ, සිවුරඟසෙනඟ සමඟ කැරැ සව්පිරිවර පිරිවරා සක්විති රජවිලස්නෙන් පිය[3]ගමනින් සුහු ව ගොස් නුවර විසිතුරු අනුතුරු[4]වාසල්දෙරින් ගොස් මහමෙවුනා[5] වෙහෙර වැද දළදාවහන්සේ දූනැ වැඳැ සොම්නස් බරිතිතිරු සතුටුකඳුලෙන් ලය තෙමා "ආකාශය සේ අනන්ත වූ මිහපොළොව සේ බොහෝ වූ මහමෙර සේ අචල වූ මහමුහුද සේ ගැඹුරු වූ අකනිටාබඹලොව සේ උස් වූ අපමණගුණගණාඪ්‍යයෙන් යුත් බුදුරජානන් වහන්සේගේ සුවාසූදහසක් [දම්] අමාවතුරෙහි නිලුනා වූ මේ දළදාසාමීන්ට පුවළ මිණිකැල්මෙන් උදුළ කිරුළු කුළෙන් ලකුළු කළ උතුමඟින් ද දිමුතුමුතුරන්රුවන් ආර[6] යුතු මෙලක්දිව්තෙලෙන් [ද] පුද කොළෙම්[7] නම්, ඒ මොනවකැයි තියවතෙක් පසස්සි ද?"යි යනා නොයෙක් පුදවෙසෙස්කුසුල්ලොබැඳින් මුසපත් වැ,

1. ලොමුදූපැ ගන්වමින්. 2. දිනෙකින්. 3. පියළ. 4. උතුරු. 5. මහමෙවුනාගිරි. 6. රුවන් රුවනාර. 7. කොළෙත්.

එසඳ මඳක්[1] කල් යවා සිහි ලදින්, "එතෙකුදු වුව මූළු දෙරණ කොත් තරත් නො සමත් තිරවත් සමත් පමණින්[2] කොත් කැරූ සසුන්හෙන් ලද පෙළෙන් සුව පත් වෙයි.[3] මම ද එපරිද්දෙන් මෙ මා බලවතින් වත්[4] පුද කර සගමොක්සුව අත්පත් කොරමි" යි සිතා සත්සියපණස් ගවු අවට ඇති මෙ ලක්දිව්තල පුද කැරූ, එදා උදා වූ උළිඳු දුකා උදම් වූ කිරිසයුරු මෙන් බැතිපෙමින් පිණපිණා එ තැන්පත් හේදහස් සිවු වණක් රුස්පිරිස් අභියෙස්හි "බුදුනු සුසුකාකදළුයන. එහෙයින්[5] ඉදින් මුන් වහන්සේ බුදුරජාණන්වහන්සේ ගේ දළදා වහන්සේ වී නම්, සහතරවුරු දිමුතුමුතුරස්විලස් පැයූ ඇති වීය යුතු යැ. එසේ නො ව මිළිතවත් පැහැ වදු[වට] කරුණු කිමැ?" යි තිරිදුසඳ කුහුල් වී යැ.

එකෙණෙහි දළදාවහන්සේ ශරදාකාශකුහරයෙහි ගමන් ගත් රජහංසවිලාසයෙන් රජතගිරිකරනිකර ධවල වූ පැහැ විහිදුවමින් අම්බරොදරයට පැන නැගී සව ණක් රසින් සිවුවණක් පිරිස් පහදවා පෙළහර පෑ වදාළසේක. යළි දු ඒ ගහන්හි වඩා සරුවලාකුළු පැහැනද විපුල්සපුල්[6] දසමන්මල්රුසින් වැස්වී යැ. එකෙණෙහි මුනඳුරද[7] එ මල්රුස පිඬුරු මුදුනත සැදී සව්සතුන්ගේ නෙත් සිත් තිසල කොට සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍යය දක්වූසේක. තව ද, විමසනුව ගහන්හි වඩා උදුළු පළුහෙළුසළුපිළීපටයියනයකින් නො ලසා වසා, පුද් කෙළෙ යැ. එ කල්හි ඒ සිංගණන් දුහුල් පට පළාගෙණැ සරුවලාපටල[8] පළා ගෙණැ බිහි වූ චන්ද්‍රරෙඛාවක් පරිද්දෙන් සොඳකුමුදුකිරිමුහුදුසොඳපැහැ විහිදුවමින් පෙළහර පෑ වදාළසේක. එකල සාධුකාරනාද පවත් වන කලක් මෙන් මහපොළෙව් ගිගිරීම් ආදි වූ නොයෙක් අද්භූත පහළ වී යැ.

1. සඳක්. 2. පමණ. 3 වෙයි. 4. මදින්වාමුත්. 5. සුසුක්කාදලෙයා සාතු මෙසින්. 6. විපුල් පැහැ විපුල් සුපුල්. 7. සඳ 8. පෙල.

මෙලෙසින් රජ්ජුරුවන්[1] පූජාසත්කාර කෙරෙමින් දළදාකරඬුව සියමුදුනිහුසුලා මහා ව සරහා පිළියෙල කරණලද සුසිරිමත්[2] සේසතින් වොරදනා රථයානාවකට පැහැනැඟී ගොස් සව්සිරින් සුරපුරෙව් පවර අනුරපුර වැද සියමැඳුරට පත් වැ මොහොවට සරහතලද සුරමැඳුරු එනයුරු රජමැඳුරුමැද ඈදි ගහන්හි දළදාවහන්සේ වඩා, ඉක්බිති ඇතුළු රාජාඞගණයෙහි දළදාවහන්සේට ගෙයක් කරවා සරහා නහතලද ධවලාත පත්‍ර ඇති විචිත්‍රපවිත්‍රභද්‍රභද්‍රාසනයෙක්හි වඩා සගමොක් සුව අත්පත් කෙරෙමින් දවස දවස වඩවඩා පිණපිණා සැදැහැයෙන් කුල්මත් වැ මල්පහන් ආදි පුද වෙසෙස් පවත්වමින් දළදා වඩා ගෙණා ඒ දනානකුමාරයන් හා හෙමමාලාවින් හා දෙදෙනාට දුසි දස් ගමි කෙත්වත් යුත්, නා පනා නෙරළු මූහුලු කෙසෙල් උක් පුවක් ඈ නෙතුරුපතරින් විසිතුරු වූ, ඉරසඳහිමි ගම්බිම් හිමි පමුණුවා, රත්රුවන්මුතුමැණික්සව්බරණවිසිතුරු වතුරුඉසුරු මිසුරු නො වැ දී පිණවා ල ගන්වා සගන්වා වසත සඳ. ගම්නියම්ගම් රජනුවර වැසි බොහෝ දෙන සෙණඬවාලියට රුස් ව දළදාවහන්සේ නො දුක්මෙන් උකටලී වැ "දහම්සුරු අප මුනිඳුසඳ තුන්ලෝවැසි සව්සතුන් කෙරෙහි පතළ කුළුණුනුවණින් සමතිස්පැරුම් පුරා සව්නේ ගෙවා දහැ ලොවුතුරා බුදු වැ සත්සෙත් කැරැ නිවන්පුර වඩිත[3] සේක්, තවද සතර ර සව්සතුන් කෙරෙහි කුළුණු දියුණු කැරැ, දළදා වහන්සේ පන්දසක් අවුරුදු පැවැත සත් සෙත් කරණ ලෙස ලවන් කොට වදාළසේකැ. එබැවින් ඒ දළදාවහන්සේ දුට හොත් යෙහෙකැ" යි අපමණබුදුගුණබඳ පබඳ නොමඳ නිපුගොසින් ඉහිල්කුහුල් කුහුල් වැ කොලහලා කළාහු යැ

1. රජ්ජුරුවෝ. 2. සසිරිමත්. 3. වසත.

ඒ අසා සුසිරිමත් කිත්සිරිමේ නරාවර ඒ නුවර වැසි මහසඟ සමඟ කැරැ එපවත් සැළ කෙළේ ය. එබස් ඇසූ පැණසර පිරිසුදුගුණබරණ කුළුණුනුවණින් යුත් එක් තෙරකෙනකුන්වහන්සේ "මහරජ, ලෝවැස් සත්ට වැඩෙහි හැසිරෙණ මීපලුන් විසින් ඒ කල මනා දෙය ම ය. එහෙයින් අවුරුදු පතා වාරයක් දළදා වහන්සේ බොහෝදෙනාට[1] දක්වීමෙන් සගමොක්සුව සාධා ලව"යි වදාළු සේක. එකල රජපවර එහිමි බස් මුදුනෙන් පිළිගෙණ "කොතැන්හි දී දළදාවහන්සේ බොහෝදෙනාට දක්වා ලිය යුතු ද?" යි පිළිවිසි කල්හි රැස් වූ ඇමිදෙනාවහන්සේ "තම තමන් වහන්සේගේ විකාර තිසි ය" යි වෙන වෙන ම කීසඳ තිරිදුසඳ එතෙපලට අනුතය නො ලා[3] පිළිවෙබව් නො කොට සියසඳින් සලකා එකෙණෙහි එපුරවර සරහන්නට නියොග කෙළේ ය. ඒ නියොග ලද බොහෝදෙන තුටුපහටුසිත් ඇති වැ සොම්නසින් පිණපිණා මහවේ කොංච් එපුර වේ ඇමැද කළුවැලි පියා සුදු පිරිසුදුවැල්ලෙන් ඇසිල්ලෙන් දෙරණතල තවරා රන් කලස රිදීකලස පුන්කලස අලස නො වැ නො ලසා සලසා, විසල සල මුතුලැලින් ලඹ දුන් රුසිරු ගහ තරහ[2] පෙළ [රහ] චොරදනා රන්තොරණ රිදීතොරණ මිණිතොරණ තැන තැන සරකා, පවනඹළ ලෙළ රන්[4] කිකිණිදලිනුදුල රන්රිදීදද අමුතු කළ දිමුතුමුතුලෙළ පබළුදදපෙළින් විසිතුරු කැරැ සරහා, සඳුන් කළු වැල් කස්තුරු[5] කපුරු තුවරලාආදීන් දෙනලද සුවඳ දුමලොසුපෙළින්[6] නැගි පබඳ නොමඳ සුවඳදුම්සළාගෙන් වෙළවෙළා සුදිත දුදිත[7] කෙරෙමින්, රන්රිදී මුතුමැණික් මල්පහන් ඇගැයෙන් බැගැ නො වැ විසිතුරුනත්වතුරු අතුරැ නො වැ සැදුම් ලද ලඹපලඹමුතුලැලින් රුකුළු කුළු කොත්පෙළින් ලකළ කළ දිගාදිගපිළීගෙය සියනු

1. දෙනා. 2. අනුහස. 3. රළ. 4. පවනාඹල රන්. 5. සඳුන් කස්තුරු. 6. දුඹුළු සුඹුළින්. 7. දුදිත සුදිත.

දුල රන්කෙහෙල්ලෙන් ඇතෙන්[1] කෙහෙල් තල් පොල් පුවක්වලුම්ලින් සදනලද තුරුපෙතින් ගහන කැරැ එ නුවර අමරපුර එකපුරු විසිතුරු කැරැ සරහා වහා ගොස් එ නරනිදුට දැන්වූහු.

එසඳ [එ] සොඳ රජගමෙණ පමණ නැති රජසිරින් තොස් වැ ගොස්, ප්‍රස්සරථය කුමුදුවන්පැහැනඳන් සොම් වදන් සොඳනමින් අසුන් යොදා විමල සේ සේසතින් නිමල කැරැ සරහා, ලෝ සියල් දුකු හළ කොමළලෙළපැහැ වතළ උදුලපුවළදළ දළදාවහන්සේ එහි වඩා, නන් පසඟතුරුගොසින්, රඟ රඟන නළඟනන් සුවහසින්, රන්රිදී[මුවා] සුවඳසුණු පුරණලද සුමුඟු ගත් එ මඟ යණනන නෙදනා සමන කැරැ, මදම්ත්මතඟ තුඟු තුරඟ රිය පාබළු[2] සිවුරඟසෙනඟ කොලහලින්, රුදු මුහුදු ගොස් පරයමින් එ රථය පෙරටු කැරැ නරපවර නිකුත්සඳ, එපුරවෙරෙහි දෙපසතුරු තුඟුමහගු සඳලුතෙලෙ රුසිරින් දිවසරන් විලසුදුල පුරඟනන් විසුරුවන රුවන නන බරණ මල්රැසින් පුදනලද රිය නිකුත් එ පුරවර පැදකුණු කැරැ විසිතුරුසැදුම් ලද එ මාවතින් ගොස් මහමෙවුනාඋයන්හි මිහිඳුමාහිමියන් සදහම් දෙසූ වෙහෙරට සපත් වී.

එසඳ නිරිඳුසඳ එතැන් පත් දෙව්බඹනානරකැලන් පිණවමින් සඳවලානබින් නිකුත් සිසිළේ ලෙස්නෙන් දරහම්ණිරසිනුදුළ රුවන්කරඬුගබින් බැහිපෙමින් සෙමෙන් බිහි කැරැ සතන් සිත සතොස යොදා එදා දළදාවහන්සේ දක්වි යැ. එසඳ එ දළදාවහන්සේ නොයෙක් පෙළහර පාමින් දහස්සුවහස්සඳ නැඟි කලක් පරිද්දෙන් ප්‍රාසාද ගොපුර ප්‍රාකාර තොරණ තරුගණපිතාදීන් ධවල කෙරමින් පෙළහර පෑ සත්ඛයන්ගේ මනොනඥනය කොට වදාළසේක.

1. ඇතාත්. 2. මහබළු. 3. සිත්.

ඒ පෙළහර දැක, එතැනට පැමිණි[1] සත්ත්වයෝ ආභරණාදීන් පූජා කොට, ලෞව්හට මිණිරුවන් බවනොර සයුරැතරපසුරැ වන් මොහඳුරට ලහිරු වන් තුණුරුවන් සරණ ගොස් දිවිලබ[2] ලබ[3] ලද්දහුයි. එරජ පවර දෙවනු වැ සුවහස් දන විසඳ එද දළද පුද කැරැ යළි රජගෙට වඩාගෙණ ගොස් දළද ගෙයි වඩා ගම් කිම් ඉම් පමුණුවා වහල්සරක් පුද හවුරුදු පතා දළද වහන්සේ උතුරු වෙහෙරට වඩාගෙණ ගොස් බොහෝ දෙනා දක්වා පුද කරණ ලෙස සිරිත් ලියවා දවස දවස පුද කෙරෙමින් සුරපුර සපත් වී·

දළදසිරිතැ පුදවෙසෙස්නිදෙස්නම් පස්වනපිරිසෙස් වි.

## 6. පිරිසෙය.

ඉක්බිති සිරිලක්දිව පරපුරෙන් රජ පැමිණි ඔහු මල් දෙවුතිස්ස රජ ය, මොනරපාපිරිවෙණ කරවූ බුජස් රජ ය, පලාවතු පිරිවෙණ කරවූ උපතිස්ස රජ ය, [යන මේ රජුන්] ඉක්බිති මහානාම [රජ] රජ පැමිණි සඳ බුඩඝොෂ නම් අටුවාඇදුරන්[4] වහන්සේ දඹදිවින් සසුන් වැඩ සඳහා සිරිලක්දිව් වැඩ බුදුන් වදාළ දෙලක්ෂ පන්සැත්තෑදහස් දෙසියපණස් මත් ගත් ඇති පෙළ දහමට තෙලක්ෂ එක්සැටදහස්සත්සියපණසක් පමණ ගත්[5] ලියා අටුවා නමැති පහතින් බුදුදහම්පෙළ බැබලවූ සේක. ඉක්බිති සිරිලක්දිව සොත්සෙන්[6] රජ යැ, ලමැණිතිස්ස යැ, මිත්සෙන් කරල්සොර යැ, දෙමළ රජු සදෙත යැ, දසෙන්කැලිරජ යැ, සිගිරිකසුබු යැ, මුගලන් රජ යැ, කාලිදස සබඳ කුමාරදස යැ, [කිත්සෙන් යැ, මැදිසිව් යැ, ලමැණිඋපතිස්ස යැ, අඹහෙරණසලමේවන් යැ, දපුළුසෙන් ය, දළමුග

---

1. රැස් වූ 2. ලද 3. ලාභ. 4. ඇදුරුවන්. 5. වදාළ දෙලක්ෂ පන්සැත්තෑදහස් දෙසියපණසක් පමණ ගත්. 6. මහා-සොත්ථිසෙන

ලන් ය, කුඩාකිත්සිරිමෙවන් ය,]* සෙනෙවිමානා[1] රජ ය, ලැමෙණිසිඟානා ය, මානාරත්පිරිවෙණ කරවූ අක්බෝරජ ය, - ඔහු දවස දමි ය. සක්දමල ය, අසක්දමල ය, මාලාබෑබිරිය,[2] දළබිසෝ ය, අනුරුත් කුමරු ය, දළමොගාත්කුමරු ය, දළසල[3] කුමරු ය, කිත් සිරිකුමරු ය, පුරවඩුකුමරු ය, සුයසීබාහු ය, කසුප් කොටඇපා ය යන මේ දෙලොස් මහාකවීහු පහළ වූහ– කුඩාඅක්බෝ රජ ය, සඟතිස්ස ය, ලැමෙණිබෝනා මුගලන් ය, අසිග්ගාහක ය, සිරිසඟබෝ ය, ලැමෙණි කසුර[4] ය, දළුපතිස්ස ය, පැසුළු කසුබු ය, ගිරිගෙල[5] වෙහෙර කරවා උපුල්වන්දෙව්රජාතන් රුව[6] පිහිටුවූ දපුළුසෙන් රජ ය, කපාරු පිරිවෙණ කරවූ ලැමෙණි දළුපතිස්ස ය, පියන්ගල්[7] පිරිවෙණ කරවූ සිරිසඟබෝ ය, වල්පිටි වැසි[8] දතන ය, ගුණන්නරුපියන්දළ ය උතුරළුමුළ වාදුම්මුළ[9] කපුගම් පිරිවෙන් කරවූ මහ ලැපාණෝ ය, අක්බෝරජ ය, හෙළගම්පිරිවෙණ කරවූ කසුබු ය. මිහිඳෙල්[10]රජ ය, කුළුඅක්බෝ රජ ය, කුඩා අක්බෝ රජ ය, සලමෙවන්මිහිඳු ය, උදරජ ය, සොම්මිහිඳු[11] ය, මැදි අක්බෝ ය, දපුළු, ය, පැසුළු අක්බෝ ය, මිණීපාපිරිවෙන් සංසෙන්[12], පිරිවෙන් කරවූ සෙන්මහරජ ය, මුගසින්සෙන් ය උදරජ ය කපාරුමුළු කුඩාකපාර[13]පිරිවෙණ කරවූ කසුප්රජු ය, කුළුකසුබු ය, දපුළුසෙන, කුඩා-දපුළුසෙන, උදරජ ය, සෙන්රජ ය. උදරජ ය, පැසුළුසෙන, මැදි[14]සෙන, කුඩාමිහිඳු[15] ය, සලමෙවන් ය, මිහිඳු ය. විකුම්බාහු ය, මානල් ය, විකුම

---

* වරහන් තුළ තිබෙන කොටස මුද්‍රිත පොත්හි නොමැතියි.

1. සෙනෙවිමහ 2. පූජා-තෙමිල් බෑබිරියෝ නිකා-බෑබිරිය. 3. දලසර. 4. නිකා-කටුසර. 5. පූජා-කිරලි. 6. කරවා. 7. පියහල්. 8 වනු. 9. පූජා-උතුරමුළ වාදුමුළ. 10. මිහින්දලා. මිහිදුල් 11. සෝ මිහිඳු. 12. සෙත් 13 පූජා-කුඩාකපාරු මහකපාරු පිරිවෙණ 14. මැදින්. 15 පූජා-කුඩාමිහිදෙල්.

පාඬි ය, ජගත්පාල ය. පරාක්‍රමපාඬි ය, ලෝකේ [ශ්වර] සෙනෙවි[1] ය, එකලට සයාළු අවුරුද්දක් ද්‍රවිළ් ලෙහි දෙමළුනා හිඹි ව තුබූ ලක්දිව අත් ගෙණ දෙමළුන් පලවා තුන්රජය එක්සත් කොට අරමණයෙන් මහ සඟ[2] ද, තෙවලාදහම් පොත් [ද] නො වලා ගෙන්වා ලෝසසුන් වැඩ කළ මහලුවිජයබාහු ය, ජයබාහු ය, වික්‍රමබාහු ය, [ගජබාහු ය.][8] වලගම්බාරජයෙහි පටන් නානාභේද ඇති වැ පැවැත ආ බුදුසසුන් පිරිසිදු කැරැ සඟමොක්සුව පතා අවුරුදු පතා මාලුකම්ක් දළදා පුදයක් තුලාභාර දීම් ආදි[4] මඟුල් සිවුසැටක් ද [කර], දවස් පතා පෙත්තක් පිළිමයක් පිරිකරක් දෙමින් ලෝසසුන් බබුළුවා පොළොන්නරුවේ රජ කළ මහලුපැරකුම්බා මහරජ ය, පණ්ඩිත විජයබාහු ය, කිලිංගොසද්ද මිහිඳු ය, පොළොන්නරුවේ දළදාගෙයක් එවදනෙයක් කරවා රජ කළ කිර්තිනිශ්ශඞ්ක ය, [වීරබාහු ය.][3] වික්‍රම්බා ය, චොඩගංග ය, ලීලාවතී ය, සාහස[5]මල්ල ය, කල්‍යාණවතී ය, ධර්මාශෝරජ ය, ඈණිඟග[6] රජ ය, ලීලාවතී ය. ලොකෙශ්වර ය, ලීලාවතී ය, පරාක්‍රමපාඬි ය, සිරිලක මිථ්‍යාදෘෂ්ටි ගන්වා ලෝසසුන් නැසූ මාඝරජ ය, මෙලෙසින් සිරිලක්දිව සසුන් නට කල්හි, ජයම්හබෝ වඩා ආ සිරිසඟබෝවංශයෙන් නො නැසී පැවැත ආ විජයබාහු නම් රජතුමකු[7] මාඝරජය අත් ගෙණ ඔළුමොළුබලුවුළුක් ගෙණ දෙමළපිරිස් පොලොන්නරුවෙන් මරා ලූනු බඳවා, මුතුමිණිගිණි සිවුරඟ බළඇණි පැමිණි, ලකහත මුදුන්මිණි, දඹදෙණි පුරවෙහරහි රජ කෙරෙමින් මාඝරජ දෙමළවියවුලෙන් පරදෙස ගිය පවරමහතෙරුන්[8] වහන්සේ ඇතුළු වූ මහ සඟන ගෙන්වා දළදා පාත්‍රධාතූන් වහන්සේ නිධාන ගත වැ කොත්මලයේ වැඩඋන් නිසාව අසා, තෙරුන්

---

1. ලෝකසා සෙනෙවි. 2. මහසෙඟ. 3. වරනත්තුළුනිබෙහා පා ඨ මුද්‍රිත පොත්හි නො පෙණේ. 4 තුලා භාරදීත්. 5 සහ 6. ඈණි අඟ. 7. තුමෙක්. 8. පවරතෙරමහතෙරුන්.

වහන්සේ හා සමඟ මහපුද කෙරෙමින් නො ලස් ව කොත්මල ගොස් දළදා පාත්‍රධාතූන්වහන්සේ බෙලිගලට වඩා ගෙණවුත්, සිරිබරසුරපුරෙන් බට සුරවිමනක් බඳු තන්මාල් දළදාගෙයක් ද සංඝාරාමයක් ද කරවා, මහා පූජාසත්කාරයෙන් දළදා පාත්‍රධාතූන්වහන්සේ ගෙට වඩා තල මිනා සියලු ව්‍යවස්ථා කරවා, අසමඟ සහ සමඟ තැර මාලුතම්පුද කරවා බණපොත් ලියවා සුන්දර වූ විජයසුන්දරාරාම නම් මහපායක් කරවා අපාග ද්‍රව්‍ය නොම දවස දවස දහස්ගණන් සඟනට[1] සිවුපසය පවත්වා ලෝසසුන්වැඩ පිණිස අකුරු කරවා දෑහැමින් රජ කෙරෙමින් [සිට] පරවිවිලි[2] වූ පසු, ඔහු පිත් පැරකුම් විකුම් ඇති පැරකුම්බා නම් රජතුමා[3] දස රජදහමින් රජ පැමිණ දළදා පාත්‍රධාතූන්වහන්සේ දඹදෙණි නුවරට ගෙන්වා ගෙණ ඇතුළු රාජාඞ්ගණයෙහි මා ඇඟි දළදාගෙයක් කරවා එහි වඩා දළදාසාමීන්ට අනැගි රුවන්කරඬුවක් ද, ඒ වසා සිටිනා සේ පත්දහසක් රත්රණින් සතරන්කරඬුවක් ද, ඒ වසා සිටිනා සේ තිස්[4]දහසකින්[5] වඩුදෙරියන් රිදීකරඬුවක් ද කරවා, දඹදෙණිනුවර සිට සශ්‍රීක වූ ශ්‍රීවර්ධන නම් ජාතපුරය දක්වා මහ වල් හැර තනා කළුවැලි පිසා සුදුවැල්ලෙන් තවරා තැන තැන තන්තොරණ[6] පුන්කලස රඹතුරු අතුරු නො වැ දෙපසයෙහි සලසා නොයෙක් පුදපෙරහරින් දළදා පාත්‍රධාතූන්වහන්සේ සියතමින් කරවූ පිරිවෙණට වඩා පුදවෙසෙස් පවත්වමින්, රන්රුවන් මුතු මැණික් ඈ පඬුරු යවා තමලිඞගමු රටින් දසදික්හි පතළ ධර්මකීර්ති ඇති ධර්මකීර්ති නම් මහතෙරණුකනකුන්වහන්සේ හා සමඟ සංඝයාවහන්සේ ගෙන්වා පළවූ දෙමලවියවුල්හි භින්නනිකාය වූ මහසඟ සමඟ කරවා තෙවළාදහම් නො වළා උගන්වා අටවරෙක්හි

1. සඟනව. 2. පරළිවිලිය. 3· තුමෙක්. 4. රුවන්කරඬුවක් ද එහි වසා සිටිනා සේ තිස්. 5. පූජා-පස්විසිදහසකින්. 6. තැන තොරණ

මාලුකම්පුද කරවා තෙරමාතෙරඅයතැන්ආදි පදවි පමුණුවා කතිකා[1]වතක් ලියවා, කපුරුයෙහි පටන් එක්ද කැට වියවා මෙකළින් සිවුරු අසූවක් කරවා පිරිකර හා සමඟ [පුද] එම දම අතුරුවා, මුළුලොව යස පතුරුවා ලෝසසුන බබුළුවා ඉකුත් සඳ, එ රජු පිත් විජයබාහු නම් නරපවර රජ පැමිණ දඹදෙණිනුවරින් මහ පෙරහරින් දළදා පාත්‍රධාතූන්වහන්සේ පොළොන්නරු නම් නුවරට වඩා ගෙණ ගොස් මහපුද කෙරෙමින් තේදහස් දත විසඳ එක්දහස්සසියයක් පමණ සහ රුස් කරවා දහස්තොට මාහැඟි මාලුකම්පූජාවක් කරවා මහා සංඝයාවහන්සේට මහදන් පවත්වා දෙලෝවැඩ සාධා ඉකුත් පසු, ඔහු මිල් ලොකතකබාහු භුවනෙකබාහු නම් රජෙක් සුන්දරගිරි නම් යාපවුනුවර ඇපා මාපා ඇමැතිගණ පිරිවරා තුන්රජය එක්සත් කැර රජසිරි විඳිමින් මාලුකම්පුද කරවා බණපොත් ලියවා දළදා වහන්සේට බොහෝ පූජා පවත්වා විපුල් කුසල් රුස් කෙරෙමින් ලෝසසුන් වැඩ කැර සුරසිරි විඳ වී.

එරජහුගේ රාජ්‍යානන්තරයෙහි පාඬිපස්බැනිරිඳුන් ගෙන් බලපිරිස් දී එවනලද[2] අරිසක්විති නම් ඇමැති යෙක් ලක්දිව් බැස ලෝසසුන් නසා දළදාවහන්සේ ගෙණ ගොස් කුලසේඛර නම් පාඬිනිරිඳුට පාවා දුන්නේ යැ. එකල විජයබාහුනිරිඳු පිත් පැරකුම්බා නම් රජකු[3] ලක්දිව රජ පැමිණෑ රට ගොස් පාඬිනිරිඳුන් පහදවා දළ දාසාමීන් ලදින් වඩා ගෙණවුත් පොළොන්නරු පැමිණ රජ කරණ සඳ, භුවනෙකබාහුනිරිඳු පිත් ශ්‍රීනිවාසබාහු අවිතීය[බාහු විතීය] භුවනෛක[4]බාහු නම් රාජෝත්තම යෙක් රජසිරි පැමිණෑ දළදාවහන්සේ විමසා එපවත් අසා තමින් බෙලෙන් නො බා ගොස් ඒ පැරකුම්බා විකුම්බා[5] ඔබා දිය ලදින් දළදාවහන්සේ වඩාගෙණ

1. කතිකා 2. පිරස් ගෙණ. 3. රජෙක්. 4. අවිතීය භුවනෙක. 5. විකුම්.

සියපුරට අවුත් අපමණ වූ පුද කොරවිත් මහාසංඝයා වහන්සේව සිවුපසයෙන් සතතයෙන් උපස්ථාන කොරෙමින් සසුන්වැඩ පිණිස තම්මහමාලුකමක් කරවා අකුරු කරවා තෙර මාතෙරඅයතැන් මාහිමි කරවා සසුන් වැඩ සාධා සඟමොක් සුව පතා කෙළින්සිවුරු අටපිරිකර දන් දෙමින් තුණුරුවන්විෂයෙහි මහාසත්කාර කෙරෙමින් පින් බෝ වන ලෙස තුන්බෝවෙහෙර කරවා දළද පාත්‍රධාතූන් වහන්සේ ඇතුළු වූ තුණුරුවනට පබඳ නොමඳ සොඳ පුද කොරමින් [සිට] සුරපුරයට පැමිණියේ යැ.

**දළද සිරිතැ රජවැලනිදෙස් නම් සවනපිරිසේ වී.**

---

## 7. පිරිසෙය

ඉක්බිති උදුම්දළුරළුපෙළැති සපිරිපිරිසිරින් යුත් අව්ටාල වට වෙට්ටම් පවුරු පදනම් ඉඬංගණි[1] දොරටු වාසල් ගොපුර සොඳුරු, පළුහළු කොලෙසකුළු එකළු ලකළුතුගු පහපෙළ මිණිරසින් එකලු කළ, රුදිරන් කැරලිඅග මිණිකිකිණිදැලිනුදුළු, රන්රිදීදදකෙහෙල් ලෙන් රුදි, මදමත්සුරඟනන් සරිවිලස් පුරඟනන් අනඟරඟ රහා වන්, නෝදහස් නළඟනන්ගෙන් සැදුම් ලත්, සළු සෝලි පටපිළි දිමුතු මුතු රන්රුවන් සපිරුණු සල්පිළින් වොරදනා, යුවළු දළදළිනුදුළු කොපු ලතින් වගුළු නොමඳ මදසුවදපබඳ කළු දෙළින් බමන මන බමරවැල කන්තළින් දුරු කළු ගුගුළු ඔළුමොළු ගජරළින් හා මහගුගුතරහරහතුරහපෙළින් [හා විරිය දිරිතසිරිතපිරි සැරිතත් ඇරි රිතපෙළින් හා] ඔසළු අසුරබළු පුවළු හළු ඔතුමොළුවළුවුළින් [හා] යුත් සිවුරඟසෙනඟ සමඟ කැරළ සුබැසිගැවැසි පුරවැසියන්

---

1. ඩංගිණි

නිසි[1] පැහැසි සපු නා පනා සල් කිතුල් තල් පොල් අඹ දඹ කරඹ කොළොඹ සැලඹ නිඹ නිඹ[2] කරඹ ඇටඹ උගු පුවගු තුගු පොවගු* මහගු මනකදනකඳුනුයන් එකුවන් උයනුදුලු අසිරිමත්[3] සිරිබරින් සුරිඳුපුරපුවලු හලු, මිණිවැණිපෙළිනුදුලු, මිණි කිරණ [ගණ] ශිඛිණි කුරුණෑගල්පුරවෙරෙහි භුවනෙකබාහු නම් නරෙන්ද්‍රචන්ද්‍රයාගේ අතිජාතපුත්‍ර වූ පවිත්‍රචරිත්‍ර ඇති විචිත්‍රගුණගණැති ඔක්කාවස්පරපුරෙනා රිවිකුල[4]කොත්එකුවනා තෙවුනා තිති දහමිනා මහබෝසත්කුළුණිනා පැණසරින් සුරගුරු රුසිරින් මල්සරා තෙදගුණෙන් දිවයුරා සොම්ගුණෙන් නිසයුරා රුදුගුණෙන් මෙහෙසුරා ගැඹුරුගුණ සමුදුරු නිසලගුණ රන්මෙරා නැත් ගුණෙන් මහදුරු තිළිණගුණ කප්තුරු හව්සිරින් දෙනසුරු[5] සිරිබරින් පුරඳරා [සතතයෙන් කළ දුරු] සමත සමත රද[6] මුදුන් බිසෙස් කළු පලු[7] හෙල සරණ නියරස් වතුරැ ඇති රත්රුවත්දන්[8] වතුරෙන් මුළුදිළිඳුන් සිත් පුරණ මුළුලෙව්හි පතළ තොමඳ යසපබඳ ඇති, සූර්‍ය්‍යවංශාවතංස ලඞ්කාඞ්ගනාවල්ලභ නවරත්නාධිපති, ත්‍රිසිංහලාධීශ්වර, භුජනපතිභොගබාහු, රණධරණීයහස්‍රබාහු, පරරාජරාහුබාහු, ආජානුලම්බබාහු, අනවරතදානධාරාර්ද්‍රබාහු, ධනදදනාපහාසබාහු, ත්‍රිභුවනෙකබාහු, ශ්‍රීලීලාභවනබාහු, රත්නත්‍රයාපාශ්‍රිතසමුචිත[9]බාහු, විශ්වම්භරාසම්භරණොද්‍යත බාහු, ධරාලතාවතීණ්ස්තනානනබාහු, නිඛිලජනසුඛෘදාපරිණාමබාහු, පරාක්‍රමබාහු, ශ්‍රී පරාක්‍රමබාහු නම් ඇති, රාජාධිරාජපරමේශ්වර, රාජකුලකෞස්තුභරාජ, රාජකුලවිතානාරත්න, රාජකුලශෙඛර, රාජකුලකල්පද්‍රැම වූ රාජචන්ද්‍රයානෙක්[10] ශ්‍රී ලඞ්කාවිජය එක් සත් කැරු සහවොටුනුරජබරණින් ඇදී උදනිරිමුදුනැ තුරුණුරිවිව්ලසින් සිංහාසනාරූඪ වැ රජයුවරජ ඇමැති ගණ පිරිවරා දෙසෙවන්ද්‍රවිලාසයෙන් රාජ්‍යධූර විචාරමින්

1. නැසි. 2. නිඹ නිඹ. 3. ගසිරිමත් 4 ඔක්කාවස රිවිකුල. 5. පුරා. 6. රත් 7. බිසෙස් පළු. 8. දන, 9. සමුපචිත 10. රාජචන්ද්‍රයෙක්, *පුවඟු.

දළඳා පාත්‍රධාතූන් වහන්සේට අනැඟි පුද කෙරෙමින් සංඝයාවහන්සේට සතතයෙන් උපස්ථාන කෙරෙමින්, තිරිඳුතුමා තමා නමින්[1] පෙමින් ශ්‍රීපරාක්‍රමබාහු නම් පිරිවෙණක් කරවා ඉර සඳ පවත්නාව ගම්කිම් වටනා පසඟ ගව මී දැසි දස් පිරි[කර]වත්[2] ගුරුබඩු සලස්වා සතතයෙන් උපස්ථාන කෙරෙමින්, බුදුබැව් පතා අවුරුදු පතා කෙළින්සිවුරු අටපිරිකර අමින් පෙමින් දන් දෙමින්, ලක්දිවැ මහාසංඝයාවහන්සේ වරින් වර රැස් කරවා බැතිපෙම් උතුරුවා මෙත්කුළුණු පතුරුවා මාලු කම්පුද කරවමින් මුනිසසුන් බබුළුවා, සුරනිවෙස් එන විලස් මුනිනිවෙස් කරවමින්, [නෙ] සිරිබෝ[3] එ සිරිබෝ පිහිටුවා සඳ සිත්[4] යොදා පිණ පුද[5] ගම් එ දගබ් නැරූ සකසා පෙර දවස් ජරාවස් නො ම සකස් වෙහෙර ඇම කැරූ වෙසෙස් සිත් සතොස් සලසමින් තුණුරුවනට මඩු කුසලාන් දරුකුසලාන් ද සහසතු පුඟුල් [සතු] කොට වටනා පස කෙත් වත් අරම් දැසි දස් ගව මී ඈ සොඳ නොමඳ වත් පුද කෙරෙමින් දවස [දවස] පන්සිල් පොහොය[6] අටසිල් දසසිල් රකිමින් දසපින්කිරිවත් නිරතුරු වැ පුරමින් සතතයෙන් සැදෑහැයෙන් සදහම්හි ඇදහිලි බලී කැරූ බණසමින් පවසමින් ලියවමින් කියවමින් දහම්කෙළි කෙළිමින් මෙත්සිතින් සව්සතුන් දහම් මඟ පිහිටුවමින් ලෝසසුන් බබුළුවා දසරජදහමින් රජ කෙරෙමින්, සවද, තමන්ගේ රාජාඞ්ගණයෙහි හිතනි ස්තම්භසොපානපරම්පරායෙන් විරාජමාන වූ විචිත්‍රචිත්‍ර කර්මාන්ත ඇති හිමගිරිශිඛරනිකර රුචිර[7] කූටාගාර වරොපෙත ගාඛෙගයතුඞ්ගශෘඞ්ගනිර්ගත රුචිර රුචිනිකර සුරපතිචාපසුන්දර වූ, ගවාක්ෂ පක්ෂ නිර්ගත සුරභිධූමසමූහසඞ්ඝෂිත මෙඝමාලාලඞ්කෘත වූ හෙම රෞප්‍යධ්වජමාලාබලාකාකුලාකුල වූ කනකමයකමී

1. තමා සියනමින්. 2. පිරිවත්. 3. සසිරිබෝ. 4. සිජ්. 5 සඳ, 6. පොහොග. 7. නිකර රුචිර රුචිර.

නිර්මිතවාරබාහුසශ්‍රීක සුරපුරවතීර්ණසුරභවන භාසුර වූ ප්‍රාසාදයක් කරවා, සළුපිළි පටපිළිවියන් බඳවා රන්මල් රිදීමල් මිලොලඹු ලඹ දී, නොපටු පටපිළි වටා බැඳ, රන්වැට රිදීවැට ලියවැට වැටුප්[1] ලා, රන්රිදී පුන්කලස නො ලසා සකසා සලසා, විසිතුරු ඇතිරි අතුරණලද මහගුයහන් පණවා සුබමොහොතින් දළඳා සාතු ධාතූන් වහන්සේ එහි වඩා නොස වඩා පිණ වඩා, මන වඩා පොල් පුවක් කෙසෙලුගු නා පනා තාලියෙන් සැදුනු සවිසිරින් සපිරුණු පමුණු ගම්බිම් වහල් සරක් ආදිය ද සලසා, නිරතුරු වැ පුදවෙසෙස් කරණ ලෙස සක්පසඬ, වඩඩාරු, දළහං, මද්දල, මහුම්කුඩම්, පණාබෙර, මිහිඟුබෙර,[2] ඩමරු,[3] ඩැක්කි, උඩැක්කි, තලප්පර[4], වීරන්දම්, වීරමොරසු, කංසුතාලම්, සින්නම්,[5] තම්මැට, තිසාණ, තිඹිලිවු, රොදුබෙර,[6] බොම්බිලි, මාසබෙර, කුඩාබෙර, ගැටපහටු, එකැස්බෙර, රන්රිදිදගර, කාහල, තාලම්,[7] සිරිවිළි, තන්තිරි[පට][8], විජයොධවනි, ගවරහං, වංගි, වස්දඬු, වස්කුලල්, තන්තිරි, දණ්ඩි මේ ආදි වූ වැද[9] වෙසෙස් ද, සතිස් රා විරම් දත්[10] තුරුරස පුරා පත්, භරතයෙහි නිරත වූ විසිතුරුවතුරුනානාබරණින් සැදුනු, සුරසර එකන්දම්, කොලවන්දම් ගොඩලි තියලි පෙවලි[11] බහුරූපාදි රඟවිසෙස් සකස් ව දත, උදුල පුවල තිසකාහොල නළුමුළු ද සලස්වා, තවද නොයෙක් ව්‍යවස්ථා කරවන්නාහු –

(1) "දළදාගෙයි රන්බාතුණින් තුන්වැනි ගඳ කිළියේ[12] රන්බාවෙන් ඇතුළට යාන් අතුරන්නන් විනා අන්කිසිකෙනකුත් නො වදිනාව ඉසා,

1. රිදී වැට වැටුප්. 2 දළහං ද මද්දල ද මිනාදෙළින් පනාබෙර ඉගෙන සැර. 3. ඩමුරු. 4. තලබෙර. 5. සින්තාලම්. 6 සාම්බිලි විරදු බැඳ. 7. තාලම්. 8. තන්තිරි 9. පද. පුද. 10. ද බතිස් රාවී රන්දම්; දූබතිස් වාරා විරම් දත්. 11. පොරණ. පෙරණ. 12. කෙළියේ.

(2) "දෙවැනි රන්බාවෙන් අතුළට මහසඟන රජ දරුවන් පොටුනුගෙට වදිනාන් දළදාගේ බලන්නන් ධම්ධරයන් හිස සෙස්සන් නො වදිනාව ඉසා,

(3) "තුන්වැනි රන්බාවෙන් ඇතුළට මැතිමඬුලු වදිනාව ඉසා,

(4) "තෙපු දකිනා කෙනකුන් රන්බාවෙන් පිටත සිට වදනාව ඉසා,

(5) "මේ වඩා ගෙණෙනකල අහස්වියන් පරතාප පයි මූකවාඩම්[1] සක්පසඳුව වඩාරු දළහං කාහල ඇධූරය හා උත්සවදිනයෙක සේසත් හා මහාධූරය ඇති වැ ගෙණෙනුව ඉසා,

(6) "වඩුන් වඩා ගෙණෙනකල සියල්ලවුන් නැගී සිටිනාව ඉසා,

(7) "මේ වඩනකලැ අරක්කැමියන් මූකවාඩම් බැඳ දූවටු දිය පරහවා[2] විල පැන් එව විල් බහා පාවාඩ අතුට මොරවා තලිපෙළ තනා බත් වඩා අඩපැ[3] ඇතුළත ධූරය ඇති වැ මේ වඩනු කොට ඉසා;

(8) "පා වඩා[4] බත් පරිවාරයට හා විද්දතුන්ට බෙදූ දෙනු කොට ඉසා,

(9) "සිරිලක රජ පැමිණි දූහැමින් යුත් මහරජුන් විසින් දවස විටක් දළදාගෙට ගොස් වඳනා කල සියලු පිරිවර පිටත රඳවා පිරිසුදු වැ ආදර බුහුමන් ඇති වැ ගෙට වැද මුසුන් ගෙණ ගෙය ඇමැදූ අත් දෙව රුවන් හා මල් ආදිය පුදා, නවඅරහාදි බුදු ගුණ මෙනෙහි කැරැ පුදා වැඳ පන්සිල් සමාදන් වනුව ඉසා,

(10) "රජදරුවන්ගෙන් පොහොයක් පාසා නොහොතලියක් පුද කරණුව ඉසා,

(11) "රජමැතියන් තරම් තියාවට මණ්ඩලික

1, මූකාවඩම. 2, පසාරවා. 3, තනා අටපැ. 4, පාවාඩ.

තලිය ඇතුළු ව දවස එක්සෙනකුත් බැගින් බත් පුද කරණුව ඉසා,

(12) "මහසුප්සාමින්වත් ධාතුවරුන්[1] වහන්සේටත් දවස බත්තලියක් පුද කරණුව ඉසා,

(13) "දළදාගෙට තාතුම්බුරයක් සතත් [.........] මහසුප්සාමින්වත් මඟනවි දෙවාරයක්[2] බැගින් පුදඹිලක්කම් කරණුව ඉසා,

(14) "රජදරුවන් මාළිගා ප්‍රවෙශ වන තල පළමු දළදාපාත්‍රධාතුන්වහන්සේ වඩා මහසඟන ලවා පිරිත් කරවා පිරිත්පැන් ඉස්වා අරක් කැරැ තුණුරුවනට පූජා කොට ප්‍රවෙශ වනුව ඉසා,

(15) "දළදාගෙයි රකවල සිටිනා ගණවැස්සන් කපුවන් ගෙබලන්නන් සැව්ම මයිලක්කව්වු[3] ඇති වැ සිටිනාව ඉසා,

(16) "තවද, මනා නකතින් දළදාගෙය පිරිසුදු කැරැ වියන් බැඳ නන්පටපිළියෙන් විසිතුරු කොට සරහා, රජුන් ඇතොරන් ඇමැතිගණා නුවරවැසියන් එක් වැ සද්දවසක් බත් මල් පාන් මහපෙරහරින් පූජා කොට, සත්වන දවස් පෙරවරු මල් පාන් ඇ පුද කොට, පස්වරු සුරපුර මෙන් පුර සරහා උතුරුඑමූළුඅයතැන්සිටිතැන් හා ගණවැසි කිලිං දෙකුලයෙන් තිස්සන් සමග වැඩහුන් කරඬුව ගඳ කිළියෙන්[4] මැත් කොට, විසිතුරු කොට සරහනලද රථයෙහි භද්‍රාසනයට වඩා, ගණවැසිකිලිංදෙකුලයෙන් තිසි දෙන්නකු කරඬුව වඩා යන ලෙස රථයට නැහෙනුව ඉසා,

(17) "සුබලකුණෙන් යුත් මනා ඇතකු රථයෙහි යොදා, එ රථය පළමු කොට, සුපිළිපන් මහසඟන පිළිවෙළින් රථයෙහි බඳ පිරිත්හුය ගෙණ පිරිත් හොරෙමින් වඩනාව ඉසා,

1. ධාතුන්. 2. සාමින්වත් දෙවාරයක් 3. මයිලකව්වු. 4. කෙළියෙන්.

(18) "දෙරනාවැසිකුලයෙන් තිසි එකාකු ලවා පිදිකවාරයෙන් නුවර පිරිත්පැන් ඉස්වනුව ඉසා,

(19) "රථයෙහි දෙපස සිට චාමර හා සේසත් කරණුව ඉසා,

(20) "දළදාගෙයි ධුරය හා විජ්ජතුන් රථය ගාවා ඉදිරියේ යනුව ඉසා,

(21) "ඉක්බිති රජගෙයි ධුරය හා විජ්ජතුන් සේවය කොට යනුව ඉසා,

(22) "ඒව අනතුරු වැ සිවුරඟසෙන් පිරිවරා මැතිගණා රකවල් ගෙණ යනුව ඉසා,

(23) "මෙලෙසින් නුවර පැදකුණු කොට ගෙට වඩා, ඉක්බිති රජදරුවන් උතුරුළු[1] මූළුඅයතැන්පත් තැන් හා ගණවැසි කිලිං දෙන්නා හා ගෙබලගත් තන් සමඟ වැ කරඬුව අස් කඩා දළදාසාමින් එළියට වඩා උතුරුළු[1] මුළුඅයතැන්සිටිතැන් ලවා මහාසංඝයා වහන්සේට දක්වා, ඉක්බිති රජදරුවන් අතට දළදාසාමින් වඩා ගෙණ අදර බුහුමන් ඇති වැ චාමර සේසත් සක් ආදීන් මහත් පෙරහර කරවා, උතුරුළු[1] මූළුඅයතැන්සිටිතැන් හා සංඝයාවහන්සේ හා ගණවැසි කිලිං දෙකුලය හා මැතිමඬුලු පිරිවරා, උස් ව පෙණෙන තෙතෙක සිටැ බොහෝ දෙනාට දක්වනුව ඉසා,

(24) "අමුතු වැ ආවවුවන්ට දුරළ සිටැ සුරුකි වැ දක්වනුව ඉසා,

(25) "ඉක්බිති දළදාගෙට වඩා තිරිඳුත් මැද ව සාමින් කරඬුවට වඩා තටුකස්සෙන් පාමුල්පෙට්ටියෙන් ගණයෙන් [හි] අස්තුණින් අස් බඳනාව ඉසා,

(26) "පඬුරු පැවන්ට ගඳකලලින් ප්‍රසාද දෙනුව ඉසා,

1, උතුංඑ.

(27) "අස පඬුරු රකවලින් දළදා ගෙට අස කරණුව ඉසා,

(28) "සතතයෙන් සඟ සත්නමක් හෝ පස්නමක් ලවා පිරිත් කරවනුව[1] ඉසා,

(29) "මෙලෙසින් අවුරුදු පතා පූජා කරණුව ඉසා,

(30) "වැසි නොවස්නා කල මෙම ලෙසින් දළදා පූජා කරණුව ඉසා,

(31) "මහසුප්සාමීන් දක්වනකල ගොපුර කැරැ තිසි තැනට දක්වනුව ඉසා,

(32) "තිරිළුන් බිහි වූ මඟුල්හි ද වනුවස්මිඟුලෙහි ද දළදා පමුණුවක් දෙනුව ඉසා,

(33) "අවුරුද්දේ කාත්තියේ රජදරුවන්ට පඬුරු පානා නොයෙක් ධුරයෙන් පලමු වැ දළදා පඬුරු පැ පසු වැ රජදරුවන්ට පඬුරු පානාව ඉසා,

(34) "දළදා ගෙට ගහටයක් පැමිණිය රජගෙන් සැලැසුනු ඇමැතියන් හා උතුරුඑමුළුඅයතැන්සිටිතැන් එක් ව පසිදුවනුව හා නොපසිඳෙන දෙය මහසඟන එක් ව පසිදුවනුව ඉසා,

(3 ) "දළදාගෙන් කහවණුවක් වීවරකුත් රජගෙට නො ගන්නාව ඉසා,

(36) "ඉදින් නොසරුවෙක[2] ගත සමසක් ඇතුලතැ දියුණා පෙරලා දෙනුව ඉසා;

(37 "කිසියම් බයෙකින් දළදා ගෙට වන්නවුන්ට ගහටයක් නො කරණුව ඉසා,

1. කරනුව. 2. නොසෙරුවෙක. 3. දියුණු.

(18) "දෙරනාවැසිකුලයෙන් තිසි එකකු ලවා පිදිකවාරයෙන් නුවර පිරිත්දැන් ඉස්වනුව ඉසා,

(19) "රථයෙහි දෙපස සිට චාමර හා සේසත් කරණුව ඉසා,

(20) "දළදාගෙයි ධුරය හා විජ්ජතුන් රථයගාවා ඉදිරියේ යනුව ඉසා,

(21) "ඉක්බිති රජගෙයි ධුරය හා විජ්ජතුන් සේවය කොට යනුව ඉසා,

(22) "ඊට අනතුරු වැ සිවුරඟසෙන් පිරිවරා මැතිගණා රකවල් ගෙණ යනුව ඉසා,

(23) "මෙලෙසින් නුවර පැදකුණු කොට ගෙට වඩා, ඉක්බිති රජදරුවන් උතුරුළු[1]මුළුඅයතැන්පත් තැන් හා ගණවැසි කිලිං දෙන්නා හා ගෙබලන් තන් සමග වැ කරඬුව අස් කඩා දළදාසාමින් එළියට වඩා උතුරුළු[1]මුළුඅයතැන්සිටිතැන් ලවා මහාසංඝයාවහන්සේට දක්වා, ඉක්බිති රජදරුවන් අතට දළදාසාමීන් වඩා ගෙණ අදර බුහුමන් ඇති වැ චාමරසේසත් සක් ආදීන් මහත් පෙරහර කරවා, උතුරුළු[1] මුළුඅයතැන්සිටිතැන් හා සංඝයාවහන්සේ හා ගණවැසි කිලිං දෙකුලය හා මැතිමඬුලු පිරිවරා, උස් වපෙණෙන තෙනෙක සිටැ බොහෝ දෙනාට දක්වනුව ඉසා,

(24) "අමුතු වැ ආවවුවන්ට දුරැ සිටැ සුරැකි වැ දක්වනුව ඉසා,

(25) "ඉක්බිති දළදාගෙට වඩා තිරිදුන් මැද වසාමින් කරඬුවට වඩා තටුකස්සෙන් පාමුල්පෙට්ටියෙන් ගණයෙන් [ශි] අස්තුණින් අස් බඳනාව ඉසා,

(26) "පඬුරු පැමන්ට ගඳකලලින් ප්‍රසාද දෙනුව ඉසා,

---

1. උතුංළු.

(27) "අස පඬුරු රකවලින් දළදා ගෙට අස කරණුව ඉසා,

(28) "සතතයෙන් සඟ සත් නමක් හෝ පස් නමක් ලවා පිරිත් කරවනුව[1] ඉසා,

(29) "මෙලෙසින් අවුරුදු පතා පූජා කරණුව ඉසා,

(30) "වැසි නොවස්නා කල මෙම ලෙසින් දළදා පූජා කරණුව ඉසා,

(31) "මහසුප්සාමීන් දක්වනකල ගොපුර කැරැ නිසි තැනට දක්වනුව ඉසා,

(32) "තිරිඳුන් බිහි වූ මඟුල්හි ද වනුවක්මිඟුලෙහි ද දළදා පමුණුවක් දෙනුව ඉසා,

(33) "අවුරුද්දේ කාත්තියේ රජදරුවන්ට පඬුරු පානා නොයෙක් ධුරයෙන් පළමු වැ දළදා පඬුරු පැ පසු වැ රජදරුවන්ව පඬුරු පානාව ඉසා,

(34) "දළදා ගෙට ගහටයක් පැමිණිය රජගෙන් සැලැසුනු ඇමැතියන් හා උතුරු එමුළු අයතැන්සිටිතැන් එක් ව පසිඳුවනුව හා නොපසිඳෙන දෙය මහසඟන එක් ව පසිඳුවනුව ඉසා,

(3 ) "දළදා ගෙන් සහවණුවක් විවරකුත් රජගෙට නො ගන්නාව ඉසා,

(36) "ඉදින් නොසරුවෙක[2] ගත සමසක් ඇතුළතැ දිපුණා පෙරළා දෙනුව ඉසා,

(37 "කිසියම් බයෙකින් දළදා ගෙට වන්නවුන්ට ගහටයක් නො කරණුව ඉසා,

---

1. කරනුව. 2. නොසෙරුවෙක. 3. දිපුණු.

(38) "ලක්දිවැ පමුණු ඇතියවුන්ගෙන් පඬුරු
හා දිවෙල්ගමින් වැටි[1] තෙල් හා සෙස්සන්ගෙන්
ඉස්රත් මස්රත් දවස්රත් දෙනුව ඉසා"

යනාදීන් දළදාගෙට නොයෙක් ව්‍යවස්ථා කරවූ සැ.[2] මෙ පැරකුම්බාතිරිඳුසඳු විසින් කරවූ සිරිත්[3] මතු ඇති වන රජ යුවරජ ඇමැතියන් විසින් වරදවා පිළිපැදූ අපායභාගී නො වැ, තමහට සිනෙහැති තුණුරුවන් කෙරෙහි අදර බුහුමන් ඇති සත්පුරුෂ වූ රජ යුවරජ මැතිගණා විසින් නො වරදවා පිළිපැදූ සදෙව්ලොවැ සැපත් විඳ අනාගතයෙහි බුදු වන මෛත්‍රීබුදුන් දැකැ බණ අසා සංසාරසාගරයෙන් ගොඩ නැගී අමාමහනිවන් සැපත් අත්පත් කරන්නට සිතියැ යුතු.

---

සකවසිතෙක්දහස්දෙසියසත්සාළිස්වැ සපිරුණු සඳ සසිරිබර මෙ සිරිලක රජසිරි පැමිණි රජගැමිණි පැරකුම්බාතිරිඳුසඳ සදෙකලෙස මෙ සිරිත් කරණලදී.

**දළදා සිරිතැ සිරිත්පුවත්[4] නම් සත්වන පිරිච්ඡේද වි.**

---

සකුමගද හෙළු තළු කිවිසත ගත් උනත්, ඇදුරු[5] තෙරිඳු පැරකුම්බා පිරිවෙණ සොමිගුණ සරණ සි කැරැ[6] තුස්වා[7] සලදකුළුණිති දෙව්රදදම්පසගිනාවන් කළු මේ සිරිතැ.

**දළදාසිරිත නිමි.**

---

1. වැට. 2. කරවා. 3 සිරනව. 4. වවස්. වැවස්. 5. සත ශාන්ත ඇ- 6. සිකැරැ. 7. තොෂ්වා.

# දළදා පූජාව

## රත්නත්‍රය වඳිවූ

### 1. පරිච්ඡේදය

### 1. පිවුව.

**දියත** = ජගත්හු (=ලොකයා) විසින්; **මුදුන් සැදි** = මස්ත කයෙහි සැරහූ; හිස නමා වැන්දවූ. සාමාන්‍යගද්‍යවාක්‍ය යෙක්හි නම් "මුදුන්හි සැදි" යි යෙදෙන මේ පාඨය මෙහි මෙසේ යෙදීමෙන් වෘත්තගන්ධිබන්ධයන්හි ද පද්‍යබන්ධන යෙහි දී ලැබෙන සමහර ලක්ෂණ යෙදිය හැකිබව හැඟේ. ගද්‍යයෙහි දී බෙහෙවින් විශෙෂණය විශෙෂ්‍යය ළඟ ම යෙදේ. පද්‍යයෙහි දී ඒ රීතිය නොයෙක් විට බිඳේ. මෙහි 'සැදි' යන්න 'තෙරුවන්' යන්නට විශෙෂණ ය. එහෙයින් එය 'තෙරුවන්' යන්නට මුලින් ම යෙදිය යුතු ය. එහෙත් ඒ දෙක අතර 'මුදුන්' යන්න යෙදින. මේ බඳු තැන් සිංහල ගද්‍යවාක්‍යයන්හි දුර්ලභ වුවත් පද්‍යයන්හි සුලභ ය. මෙය ද පද්‍ය (වෘත්ත) ගන්ධි හෙයින් මෙ බඳු යෙදුම් නිවරද ය. 'මුදුන්' යන්න ප්‍රකෘතියෙන් සිට ආධාරාර්ථය දෙ යි. "බුහුසු සියලු විබතේ – එ දෙක සියරු නො පියා" යි සිදත්සඟරාවෙහි කියයේ මෙ බඳු තැන් සැලකීමෙනි **මුදුන් කැරැ** = මස්තක යෙහි කර; වැඳ **ගොයුම්ගොත්** = ගෞතමගොත්‍ර ඇති; කපිලවාස්තුපුරනිර්මාණය සඳහා උවදෙස් දුන් කපිලඍෂිවරයා ගෞතම නම් වී ය. ශාක්‍යවංශයෙහි රජකුමරුන්ගේ ආචාර්ය වූ එතුමාගේ නාමය ඒ කුමාරවරු ද ව්‍යවහාර කළහ එහෙයින් ශාක්‍යවංශය 'ගෞතම' නම් වි ය. **පොරණැ ජරන්** = පුරාණ ආචාර්යයන් විසින්; **විසු** = කියූ; **වදන්මඟ** = වචනමාර්ගයෙහි; **නො විහිද** = අත් නො හැර; **ලුජ්** = ස්වල්ප යක්; මෙය 'අලුජ්' යි ධගැ $2^{4}$, $166^{47}$ හි ද 'ඇලුප්' යි ධගැ $180^{14}$, $203^{84}$, $230^{11}$ හි ද පෙණේ. 'අබරණ' යන්න 'බරණ' යි වූවාක් මෙන් එහි පූර්ව අකාරය ලොප් ව 'ලුජ්' යි වී ය.

**සාරසැකෙවි** = චතුරශඞ්ඛ්‍ය; අනික් ගුත්තිලකාව්‍යයෙහි 'සාරසැකි' යි යෙදූහ. 'අසඞ්ඛ්‍ය' යන්නෙන් 'අසෙසකි, අසැකි' යි (ගුත් 45) සිංහලයට පැමිණිය හැකි වුවත් 'සැකෙවි' යි ඊම අපහසු ය. 'සඞ්ඛෙප' ශබ්දයෙන් නම් 'සැකෙවි' යි පැමිණිය හැකි ය. මෙහි 34 හි ද මෙය යෙදුනු හෙයින් වෙනස් නො කරණ ලදි. **සුවහස්** = සතසහස්‍ර; සියක්දහ. **මතුයෙහි** = පූර්වයෙහි; **බමුණුමහසල් කුල** = බ්‍රාහ්මණමහාසාර කුලය; යටත් පිරිසෙයින් අසූ කෙළක් ධනය තැන්පත් ව ඇති, සහවණු අමුණුදහයක් දවස් පතා වියදම් වන, බ්‍රාහ්මණ කුලය බමුණුමහසල්කුල යි (ධප්‍ර 695). **මල්සරු නිසරු කල** = අනඞ්ගයා නිස්සාර (=හරයක් නැත්තෙකු) කළ; පසුම් ආදි මල් පසක් අනඞ්ගයාගේ ඊ ලෙස කවීහු සලකති. එහෙයින් ඔහුට 'මල්සර' යන නම වී ය. 'සර' යනු ඊ ය. අනඞ්ගයා අතිශය රූපශෝභා සම්පන්න ලෙස ද සැලකේ. මේ කුමාරයා රූපශ්‍රියෙන් ඒ අනඞ්ගයා ද පැරදවී ය. 'අනඞ්ග' යනු කවීන් විසින් දෙවියෙකු බවට නැංවූ රූපය යි. **සුරගුරු** = බෘහස්පති යි හේ දෙවියන්ගේ ආචාර්යවරයා යි මහාප්‍රාඥ ය. මේ කුමාරයා ප්‍රඥාවෙන් සුරගුරු හා සරි (= සමාන) නො කට හැකි ය. ඔහුට ද වඩා ප්‍රඥාවත් ය. **නිසයුරු** = චන්ද්‍රයා; හේ නිශාව (=රාත්‍රිය) කරණ හෙයින් 'නිශාකර' නම්. **පින්සරු** = පුණ්‍යයෙන් සාර වූ; ගුරු=මවුපිය. **පත් පැසුළු**=පැමිණි පසු **හව්කැමින්**= සව් කාමයෙන්: සම්පූර්ණ ආශාවෙන්. **හැම සියෝ** = සියලු නෑයෝ; **සදන්හල**=දානශාලා හයෙහි; නුවර දොරටු සතරෙහි සතරෙක, මැද එකෙක, සියගෙය ළඟ එකෙකැ යි මෙසේ දන් හල් හයක් වී ය. **නිදන් කර** =තැන් පත් කර; දන්හල්හි නිදන් කරන්නේ දෙනු පිණිස යි. **නොකම්පස්** = නුසුදුසු (=අයෝග්‍ය) ක්‍රියාවන්ට ප්‍රත්‍යය (=උපකාර) වන; මෙහි 'නො' යන්න 'නුසුදුසු' යන අර්ථය දෙයි. **කම්යක්** (= ක්‍රියාවක්) ය යි කිය හැක්කේ සුදුසු දෙයට ය. එහෙයින් නුසුදුසු ක්‍රියාව 'නොකම්' නම් වේ. පඤ්ච කාම අයෝග්‍යක්‍රියාවන්ට උපකාර වේ. **එ කම්පස්** = ඒ කාමපාශයන්; කාම නමැති මලපුඩු. මෙහි

‘එ’ යන්න අනවශ්‍ය ය. ‘ඒ’ යි යෙදිය යුත්තේ මුලින් ‘යම්’ සද යොදා ඇඳින්වූවක් දක්වීමට ය. ‘ඒ’ ය යි කිවිට ‘කුමක් ද?’ යි ඇසිය හැකි හෙයින් ‘යම්’ සද නැති තැන ‘ඒ’ සද යෙදීම වැරදි ය. මේ පොතෙහි නොයෙක් තැන එබඳු ‘ඒ’ සද යෙදින මෙයින් මෑත සිටි අලගියවන්න ආදීන්ගේ කෘතීන්හි සුලභ වූ මෙබඳු තැන් බලා ඔවුන්ට දෝෂාරෝපණය කරන්ට මත්තෙන් මෙ බඳු තැන් ද සැලකිය යුතු ය. මේ ‘ඒ’ යන්න නිවැරදි වීමට නම් ‘ඒ’ යන්නට ‘ප්‍රසිද්ධ’ යන අර්ථය කිය යුතු ය. එවිට මෙහි “ප්‍රසිද්ධ වූ කාමපාශ” ය යි අර්ථ කිය හැකි ය. (කව් 51 ගීයට කල්පලතාව්‍යාඛ්‍යාවෙහි ලියූ දෙය කියවනු). නැත හොත් ‘ඒ’ යන්න වාක්‍යාලඞ්කාරයෙහි යෙදෙන නිපාතය කැ යි සැලකිය යුතු ය. **මෝරගදසුන්** = මොහරගවෙශ යන්; අගින් යෙදිය යුතු ‘මෞ’ යන්න මුලින් යෙදූයේ අනුප්‍රාසය ඇති කිරීමට ය. **වරා** = වළක්වා; දුරු කර. **මෙගෙනන් දුරු** = සිතෙහි තබා ගෙණ. **කතරමඟ** = කාන්තාර මාර්ගයෙහි; යෑමට අපහසු පාරෙහි. **යතර** = යාත්‍රා; ගමන්. **වෙගෙනන්** = වෙගයෙන්; ‘වේ’ සදින් ‘ගෙන්’ ප්‍රත්‍යය සිද්ධ ‘වේගෙන්’ යන්නෙහි ‘ඒ’ යන්න හ්‍රස්ව කිරීමෙන් සිද්ධ යි. කව් 669 හි ‘වේගෙන්’ යන්න පෙණේ. **සිවද**= ශිවදයකා; ‘නිහිය, සැපය, නිර්වාණය’ යනු ‘ශිව’ යන්නෙහි අර්ථ යි. **පනා** = කොස්. **එල් කෙහෙල්** = කෙහෙල් වෙසෙසකි; නොහොත් ‘එල්’ නම් පලරුක්වෙසෙස හා කෙහෙල්. මෙහි සමහර පැරණිපිටපත්හි යෙදුනු මේ වචනය බුත්‍ස 307[10] හි හා 315[8] හි ද පෙණේ. දහම් 377[14] හි ‘එල්කේල්’ යි යෙදින. **විසල්** = ගස්වෙසෙසකි. **සියල්** = ‘සාතලා’ නම් ගස්වෙසෙස. මෙය ‘පියල්’ යි පෙරළීම යුතු නො වේ. ‘පියල්’ නම් මොර යි. එය මින්නෙහි එයි. **බොල්** = බෙලි. **රෑරග** = රාත්‍රියෙහි බබලන ඖෂධිවෘක්ෂ විශෙයකි. ‘ඔෂධි’ යනු පලගත් පසු නැසෙන කෙසෙල් ආදිය යි. සැල 42 හි ද මෙය පෙණේ. **පුවගු** = ‘රුක් ගස්’ නමින් ප්‍රසිද්ධ යි. **නාරග** = නාරං.

## 8. සිටුව

සිදුවිර = නිත; කෑර = කැල. දෙබර = බදර; මසත්. පුස් කොළ පිටපත්හි පෙණෙන මේ වචනය එක් සංස්කරණයෙක්හි 'දෙබර' යි යෙදිනි. තුරුවරසිරින් උතුරු = තරුවරශ්‍රීයෙන් (= උත්තමවෘක්ෂයන්ගේ ශොභාවෙන්) අධික වූ; මුවරද ගෙන් නවර ගෙණ = මකරන්දරේණු වගුනය ගෙණ; මල්පැණි හා රේණු ගා ගෙණ; රවන = හඩන; බමන = භ්‍රමණය කරණ; හැසිරෙණ. සොමි.........= සෞම්‍ය ශීතල ස්නිග්ධ ප්‍රසන්න (=පැහැදුනු) සලිල (=දිය) ගගුලැලි (=නිර්ඣර) වලින්ද නිහරසර = හරසර (= ගෞරව) – නැති (ගිහිවෙස ඇර); එකලා............ = එකල්හි තනි වනයට කල්‍ය (= මනොඥ) වූ වල්කලවස්ත්‍රය; 'වල්කල' යනු රුක්පතුරු යි. 'වල්කල' ශබ්දය 'වල්කලා' යි සිංහලයට ගන්නා ලදී. 'වත්‍රා, සොභා' යනාදිය මෙනි. වෙසෙරහි = ශරීරයෙහි. සමාවත්බෙලෙන් යුත් = සමාපත්තිබලයෙන් යුත් (ඒ මහාසත්වයන් වහන්සේ;) 'සමාපත්ති' නම් යෝගීන් විසින් පැමිණෙනු ලබන ධ්‍යාන යි මෙහි විශෙෂ්‍යය පෙරටු වත් විශෙෂණය පසු වත් යෙදී තිබේ. ඒ ද පද්‍යගන්ධිලක්ෂණ යකි. විසියමසිරින් යුත් එ ඉසි = (තමාට) වසඟ (=යටත්) වූ සංයමශ්‍රීයෙන් යුක්ත ඒ ඍෂිවරයා; 'සංයමය' නම් ඉන්ද්‍රියයන් හික්මවා ගැණීම යි. වෙන්මග = අහස; 'විෂ්ණුපුගේ මාර්ගය' යනු අර්ථයි. නොහොත් 'වියන්මාර්ග' යන්න වෙන්මග' යි සිංහලයට ගත හොත් 'අහස්මග' යි අර්ථ කිය හැකි ය සංස්කෘතයෙහි 'වියත්' යනු අහසට නම්. 'වෙන්පද' යි රුවන්මලෙහි (50) අකාශපර්‍යාය සේ දක්වන ලදී අහස විෂ්ණුහුගේ පාදයක් ලෙස සැලකේ; කෙමෙන් = ක්‍රමයෙන් (කම් + එන්). අඹර = අම්බරයෙහි අහසෙහි. 'සතොසිනා' යනාදියෙහි අන්වය ආයන්න ද හද්‍යටට නුහුරු ය. මේ ව්‍යන්තනන්ධිවාක්‍යයක් හෙයින් නිවරද ය. යන එනා = යනු එනු; මහ කුම් උදෙස් සතස් කරණු ව යි = මාර්ගය කුමක් උදෙසා සතස් කරන්නහු ද යි. පිළිවිස් = පිළිවිසි; විචාළ. මෙවන් යුත් = මේ ආකාරයෙන්

යුත්; **මොහඳුරැ**.........=මෝහාන්ධකාරය දුරු කළ ප්‍රඥයෙන් සාර වූ තපශ්චාරි වූ මොක්ෂාචාරී වූ ප්‍රියඞ්කර වූ ශාන්ති කර වූ දෝෂ (හෝ දොෂ) වාරක වූ (= දොස් වැළැක්වූ) මෛත්‍රී කරුණා දීපඞ්කර (නම්) ලොවුතුරාමුනීන්ද්‍රයන් වහන්සේ සංඝවරයන් (= භික්ෂූන්) පිරිවරා. **සව් නරු** = සියලු මිනිසුන්ගේ. **යත්** = කියන විට; **සොම්නස්බරින් ඉතිර** = සන්තොෂභාරයෙන් ඉතිරී; **'එකි තැනක් ඉල්වමින්'** – 'ඉල්වමින්' යන මිශ්‍රක්‍රියාව පූර්වක්‍රියාර්ථයෙහි ය. **දුදුරුමුසු කඳුරැළියක්** =ජර්ජර (=කැඩුම් බිඳුම්) මිශ්‍ර කඳුර වූ ඇළියක්; ජලයෙන් හැරීගිය තැන් 'කඳුරු' නම්. **සඳෙසි** = සන්දෙහි; කල්හි **සඳෙසි**= සිත්හි; සිතින්. කරණාර්ථයෙහි ආධාරයි. **නරනා** = මනුෂ්‍යනාථයා; මිනිසුන්ට පිහිට වන්නා. **බව සයුරු පසුරු වන්** = භව නමැති සාගරයට (=සසුරෙන් එතෙර වීමට) පහුරක් වැනි; මෙහි 'පසුරු' යන්න 'නැව' යන අර්ථයෙහි යෙදින (පූව ද බලනු). **ගුණ ග**......= ගුණ නමැති අග්‍ර (= ශ්‍රෙෂ්ඨ මාණික්‍යයන්ට සාගරය වැනි; සාගරයෙහි බොහෝ මාණික්‍ය තිබේ ල. සාගරයට රත්නාකරනාමය වූයේ එ හෙයිනි. **බුදුරුවන්** = බුද්ධරත්නය. **බුන්සියලුබවමුලන්** = බින්දු වූ සියලු භවමූලයන් ඇති; 'බවමූල්' නම් ඉපදීමට හෙතු වන අවිද්‍යා තෘෂ්ණා ආදි ක්ලෙශ යි. **යා** = යාත්‍රා; ගමන්. **සපත් දෙන්** = පැමිණෙන කල්හි **ඉවත් මං** = අඥ්ඤානයෙන් මවනු ලබන මාර්ගය. **සඳුල්සමිවල්කැල** = ශාර්දූලවර්ගය (= දිවිසම) හා වල්කාලා ද; **පිණ ලොලා** = පිණෙහි ලොල් ව. **කිබිසිණි ව** = අධොමුඛ ව; **මිතලා හෙව** = මිහි තලයෙහි (=පෘථිවියෙහි) ශයනය කොට. 'එව' යන්නෙහි අර්ථය නම් 'දමා' යනුයි. **බොරෙහි ලා** = බොර මැඩිහිදී; (රුවන් 142 බලනු). **'ලා'** යන්න ආධාරාර්ථය ප්‍රකට කරණු සඳහා යෙදෙන නිපාතයෙකි.

**මා සිරුරැ** = මාගේ ශරීරයෙහි; **මාරු සිරිපතල දී** = මහාහි ශ්‍රීපාදතලය තබා. **වැඩ ම කල** = අභිවෘද්ධිය මැ කළොත්.

## 3. පිටුව.

**අනවරණනිමසින්** = ආවරණයක් (= වැළැක්මක්) නැති නුවණින්; අනාගතාංශඥානය මෙහි 'අනවරණනි' යනුවෙන් ගන්නා ලදී **කෙවල සත්වයෙක්** = මෙහි 'කෙවල' ශබ්දය 'ලාමක' යන අර්ථය අපේක්ෂා කර යොදන ලදී. ඒ සඳෙහි ඒ අර්ථය ඇති බවක් අප්‍රකට ය. "හුදු, තනි, අමිශ්‍ර" යනු, 'කෙවල' යන්නෙහි අර්ථයි **රදුන්** = රාජදූතයන්. රද දූ= රදූ. **පිළිසඳ පිළිලදින්** = ප්‍රතිසන්ධිය (= උපදීම) ලබා. **විය** = සුදුසු වයසට **අරු** = ආරූඪ ව **පස් මරුන්** = පඤ්ච මාරයන්; රූපාදි ස්කන්ධ, ක්ලේශ, අභිසංස්කාර (= කර්ම), මෘත්‍යු, වශවර්තිමාර යනු පඤ්චමාරයෝ යි. **ගුණ බරණ**= ගුණයන් ආභරණ කොට ඇති; **ඉසිවරණ** = ඍෂිවාරණයන්; (බුදුරජානන්) වහන්සේ; 'වරණ' සද උත්තමාර්ථය දෙයි. **විවරණ** = ව්‍යාකරණය හෝ ප්‍රකට කිරීම. **දෙසිවුම්පින්** = අට මිටකින් **වසණිනා** =වස්ත්‍රයෙන්. **නිවණ්නා පතම්නා**= නිර්වාණයෙන් පතමින්; 'ඔබට නිර්වාණය ලැබේවා' යි පතමින්. **පලක් බැඳ** = පර්‍යඞ්ක බන්ධනය කොට; **අරම්ණිය** ගොතා; **නෙකම්** = නෛෂ්ක්‍රම්‍ය; **කැත්** = ක්ෂාන්ති; **සත්** = සත්‍ය. **උපෙසී**=උපේක්ෂාය යි. **බුදුකුරුදම්**=බුද්ධකාරකධර්ම; පාරමිතා. **සියසතනැති** = තමාගේ සිතෙහි; **තමන් පත්** = තමාගේ අතට පැමිණි. **'දූ'** යනු 'දරු' සඳෙහි ස්ත්‍රීලිඞ්ගරූපයයි. **දූරා** = භාර්‍යා; **ඉදුවත්** =හෘදයවස්තු. **අසරන්** = දෙවහතන්; **තොසි**= සන්තුෂ්ට. **විසි** = විසඟ; **පස්බැලුම්** =පඤ්චමහාවිලෝකනයන් (විස්තර පූජා. 104 හි පෙනේ) **විපුල්වත්**............= විපුල (මහත්) වස්තූන් උත්පලාවනය (= පා කිරීම) කරවත්: හොත් ඒ කුල්මත් (= ප්‍රීතියෙන් මත්) වූ කිඹුලෙකු වැනි; 'සුඹුල්වත්' යි ගතහොත් 'අතිශය' බලසම්පන්නයෙකු වැනි' යි අර්ථ කිය හැකි යි. 'සුඹුල්' යන්න 'සුබල' යන්නෙන් එයි. 'දුබල=දුඹුල්; දසබල = දසඹුල්' යනු මෙනි. **සපිරි සිරි** =සම්පූර්ණ වූ ශ්‍රී ඇති, **සිරිකුලනා** = සූර්‍යවංශයට නායක වූ; **සුදොනා** = ශුද්ධෝදන; **අමායා** = මායාවක් (= කපට බවක්) නැති; **මිණිකුස** = මාණි

න්‍යයක් වැනි ගැබෙහි; **පිළිමිණිකුස්** = පළිඟුවක් ඇතුළත. හූ = සූත්‍ර; නූල. **පරයමින්** = පරදමින්; **දසද්සඩීවස් පිරුණු** = අඛණ්ඩ (නොඅඩු නොවැඩි) වූ දසමසක් සම්පූර්ණ වූ; (විස්තර දහම්සොඩකවෙහි 48 වැන්නට අප ලියූ පරිකථාවෙහි පෙණේ). **චම්පක** = සපු; **අශෝක** = හෝපලු; **වකුල** = මූහුත මල්.

## 4. පිටුව.

**සරල......**= හොර ගස් පුවක් දෙඹ නා තල් කිතුල් සල් බදුවද මිදෙල් කරඳ තමලු (=කොල්ලම්) කැල වැලුක් කුස තණ උණ බක්මී කොහොඹ කොළොම් අඹ ආදි වෘක්ෂ වර්ගයන්ගෙන් හෙබුනා වූ. **නවමාලිකා......**= දෑසමන් ඉද්ද බෝලිද්ද බුලත් සාදික්කා සෙව්ලිකා පාරිෂ නම් ඇසතු. ලතාකලාප (= ලියගොමු) යන මෙයින් විලොකනය කට යුතු වූ; **විලිමුවන්** = වලිමුඛයන්; වඳුරන්. **පුවළ** = මිහත්; **පුලින තොණල** = වැලිතලාවෙහි; **සිදගනන්** = සිද්ධාඞ්ගනාවන්ගේ; **මන දග කල** = හිත බැඳ ගත්; **අමින් මින්** = අප්‍රමාණ මත් සත්ත්වයන් ඇති; **සරසෑ......**=විලෙක්හි විලෙක්හි පිපුමක් පිපු මක් පාසා; **සරණ** = හැසිරෙණ; **බමර කිසර රැවින්** = බමරුන්ගේ හා හංසයන්ගේ රාවයෙන්. **සාතු.........** =සාතු වෙන් වූ මදය (= සුවඳ) එල්බෙන (= සුවඳ ඇති) වැජඹුනු නිතම්බිනීන් (= උතුම් කතුන්) ඇති විවිධ රසයන්ගේ එල්බීම ඇති (= ශෘංගාරාදි රස හෝ නන්වැදෑරුම් ජලය පවත්නා) පිපුනු කොළොම් ගස් ඇති පිරිවැරූ කලහංසයන් ඇති මීමැසිසමූහයාගේ චුම්බනය ඇති ලුම්බිනී වන නම් උයනෙහි; **බඹ.........**= බ්‍රහ්ම දෙව මනුෂ්‍යයන් අතින්; **සත්බුමු** =සප්ත භූමක; තට්ටු හතක් ඇති. **ගගනාවතිණි** = අහසින් බැස්සා වූ; **දිශා .....** =දිශාවන් බැලීම් අවසන්හි නිරුත්තර වූ (= තමාට වඩා උත්තරයක් – උතුම් එකක් නැති) උතුරු දිගට අභිමුඛ ව (= මූණ ලා); **යථාශය** = ආශයානුරූප වූ; ආශයට ගැළපෙන; **කලාවන්** = සඳමඬලින් සොළොසින් කොටස කලාව යි. **හිමත්.........**= හෙමන්ත ගිම්හාන වසන්ත යන;

**අචිනානා**......= සිතිය නොහැකි කිය නොහැකි අසමාන වූ; **ලොවිතුරු** = ලෝකමිත්‍රයා; 'ලොවුතුරු' යි මුද්‍රිත පොත්හි පෙනෙන පාඨය වැරදි ය. 'ලොවුතුරු' යි කිය හැක්කේ ලෝකයෙන් එතෙර වූ කෙනෙකුන්ට ය. සිද්ධාර්ථ කුමාරයෝ තවමත් ලෝකයෙන් එතෙර නුවූහ. '**ලොවිතුරු**' යන්න පැරණි පොත්හි පෙනෙන බව (රාජශෙඛර) දළදාසිරිතෙහි අවධාලිප්‍යයන් පෙනේ. **දිණි**............= දිරූ හටගත් ව්‍යාධි ඇති (=ලෙඩ වූ) මළ ය යි කියන ලද දෙවදූතයන්; මේ ජීර්ණාදිරූප දෙවියන් විසින් මවා දක්වන ලද හෙයින් දෙවියන්ගේ දූතයන් වැනි නු යි 'දෙවදූත' නම් වී ය. **සපිරුණු සතර නිමිති** =සම්පූර්ණ වූ සතරම නාතිධාතයන්හි සමපතනිය; (විස්තර පූජා. 133 හි බලනු). **නිමිති** =අග්‍රයක්. **පසස්නා**= කැමැති වන; 'පසස්' දය ඉච්ඡාර්ථයෙහි ද වැටේ. (ධගැ 151[24], 175[22], ජානැ 314, 1059 බලනු.) **ලොවැඩ** = ලෝකාභිවෘද්ධි ඇත්තහු; **සවස් වත්** = සවස් වන විට; **මහඟු මඟුල් සලවිමෙහි** = මහාර්ඝ වූ මඞ්ගලසිලාපට්ටයෙහි; කෙටෙර් වට්නා, රජු ඉඳගන්නා, ගල් පුවරුවෙහි. **නරුවල්ලෙන්** = රළුපටවලින් යුක්ත කොට.

## 5. සිටුව.

**සිත්හසර පුරවමින්** = චිත්තාචාරය (= සිතෙහි අදහස) සම්පූර්ණ කරමින්; **සියල් ලෙව් කප්තුරා**.........= සකල ලෝක යට කල්පවෘක්ෂයක් වූ පුණ්‍යසාර වූ (බෝසතුන් වහන්සේ) (**තවසරබව**=) තපශ්චාරිභාවය සෘජු ව සිතෙහි සරනා (=සිතේ තබා ගෙණ) රජහු මෙන් (සිරියහන් මැද) සරසා උන් කල්හි; මෙහි 'සරු නරවරු' යන්න "සරු සරු තිසයුරු" යි යෙදූ කොත් "සරහා ශරවමන්දුයා මෙන්" යි අර්ථ කිය හැකි ය. **කුමුපහමු** = තුෂ්ට ප්‍රහෘෂ්ට; ඉතා පිණාගිය; **සඳ නොපමු** = සිතින් කුඩා නුවූ; මහත් අපේක්ෂා ඇති; **ඉමු** = ඉෂ්ට වූ; **ඇවිමු** = පොලඹන; උත්සාහවත් කරණ; නැවත නැවත ඉල්ලන. 'ඇවිටු' **සඳ** 'අවුට' දසින් සිද්ධ යි. 'අවුට' දය පෙලෙඹවීමෙහි හෙවත් යම් කිසිවකට උත්සාවත් කරවීමෙහි

වැටේ. මේ දසින් සිද්ධ 'අවුටන' යනු ධගෑ 81[22] හි 'අවටන' යි වැරදී යෙදී තිබේ. 'ඇවිරි, ඇවිරිලි' යන රූපයෝ ද පෙණෙත්. **ලස්**=පමා. **සරසර**=තන්ත්‍රි (=වීණා) ස්වරය; **නිසර**=හඬ නො වන්නක්. **සරසගී**......=රස සහිත ගීතින් තොර නො කොට (=ගී ද කියමින්). **සිත් හසුරුවමින්** = (බෝධිසත්ත්වයන් වහන්සේගේ) සිත (කාමයෙහි)හසුරුවමින් (පවත්වමින්); නළඟනන් එය කිරීමට උත්සාහ කළ නමුත් බෝසතුන්ගේ සිත එසේ නො හැසුරුණේ ය. **වැතිර** = හාන්සි වී; **'සමනරෙක්'** යන්න ප්‍රථමාවිභක්ත්‍යන්ත ය. ප්‍රථමාන්තය විය යුත්තේ අවසාන ක්‍රියාවකින් උක්ත වන කල්හි ය. මේ හා සම්බන්ධ වන අවසානක්‍රියාවක් නැති හෙයින් 'සමනරෙක්' යනු වැරදි ය. **නනගමින්** = කෙදිරි ගාමින්; **පරහමින්**=පෙරළමින්; වගුරුවමින්. **ධහමොටින්** = දෂ්ට වූ ඔෂ්ඨයෙන් (=විකාගත් තොලින්) යුක්ත ව; (කාව්. 682. කල්පලතාවෙහි මේ පිළිබඳ ව ලියූ දෙය බලනු). **ගිලිහුනු වසන්** = ලිහුනු වස්ත්‍ර ඇති; **මහත්** = පූජ්‍ය වූ; **ස්ඵුටකෘත** = ප්‍රකට කළ; **විකෘත** =විකාර කළ; **කපට** = කපටි වූ; **නාවක** = නළුවන්ගේ; **විකච** = විහිළු; **බීභත්ස** = පිළිකුල්; **සොපහාස** = උපහාස සහිත; නින්දා කට යුතු; **භයානකාවේශයන්** = භය උපදවන විලාසයන්; **වෙලෙවි** = ඉක්මන්; **අඩවළ** = අඩක් විවෘත; **මුඛබිම්බ**= මුවමඬල; **බිම්බාධරයෙන්** = බිඹු (=කෙම්) ගෙඩි වැනි තොල්වලින්; **විරාජමාන** = බබලන; **කිරණවුසුදිස්නා** = කිරි ඹුහුන්දෙහි පෙණෙන; **ලොඳුළුවන්** = සමෘද්ධ වූ වර්ණ ඇති; 'ලොඳුළු' යන්න සිද්ධ වන්නේ 'ලොඳුරු' දයෙනි. එය අංකුරිත වීමෙහි හෙවත් දළු ලෑමෙහි වැටේ. එහෙයින් 'ලොඳුළු' යන්නෙහි ප්‍රධාන අර්ථ 'දළු ලූ' යන්න යි. ඒ අර්ථයෙහි ඒ, සද මුව 66, මියුර 118 (110), බෝගෑ 123[12] යන තන්හි ද යෙදිය. ඒ අර්ථ මෙහි කිවොත් පුනරුක්තියක් වෙයි. 'දළු ලූවාක් වැනි පබළුදළු' යි කිම නො යෙදේ. දළුවල දළු ලෑමක් නැති හෙයිනි. සමහරවිට මෙය යොදද්දී "ලොඳුළුවන් වන ගිස උදුල සැඳෑකැල්මෙන්"

යන පාඨය ද සිහියට නැගෙන්නට ඇත. එසේ වුවත් 'ලොදුරු' දයෙහි අතික් අර්ථයක් වූ සමෘද්ධිය මෙතැන්හි ප්‍රධාන කොට ගැණීම යොග්‍ය ය. E. Z. I. 43[3] හි "කොත් කම් පුලබ් කොට් සිරිලක් ලොන්දුර්වය්" යන පාඨයෙහි 'ලොදුර්වය්' යන්නෙහි අර්ථය "සමෘද්ධ කොට" යනු යි. එහි 'ලොන්දුර්වය්' යයි 'න්' යන්න යෙදුනත් එය උච්චාරණය කරන්ට ඇත්තේ අර්ධ වර්ගාන්තය (සඤ්ඤකය) ලෙසිනි. අර්ධවර්ගාන්තවිශ්නය ඒ කාලයෙහි උපදවාගෙණ නො තුබුනු හෙයින් සම්පූර්ණවර්ගාන්තය ම ඒ සඳහා සමහරු යෙදූහ. 'වැජැම්බැ, කුම්බුර්' යනාදිය පුරාණ ශිලාලෙඛනයන්හි පෙණෙන්නේ එහෙයිනි. සමහරු කිසිවක් නො යොදා අර්ධ වර්ගාන්තය උච්චාරණය කළහ. සීගිරිකව්වල 'අඟන' යන්න සඳහා 'අගන' යි ද, 'අඹු' යන්න සඳහා 'අබු' යි ද පෙණෙන්නේ එහෙයිනි. තවත් එබඳු වචන එහි තිබේ. 'ලොන්දුර්වය්' යන්න ද උච්චාරණය කරන්ට ඇත්තේ 'ලොඳුර්වා' යන ලෙසිනි. එය 'ලොඳුරු' දයින් සිද්ධ වේ. ඒ දය සමෘද්ධියෙහි ද යෙදුනු බව යථොක්ත පාඨයෙන් පැහැදිලි වේ. දළු ලෑම නම් ගස් වැල්හි සමෘද්ධිය යි. එහෙයින් දළු ලෑම් අර්ථ ඇති 'ලොඳුරු' දය ගස්වැල් පිළිබඳ නුවූ ද සමෘද්ධියෙහි යෙදිනි. ගුරුළුගෝමීන්ට මේ දය 'ලුඳුරු' යි වී ය. ධර්‍ම 214[28], [26] බලනු. පබළුදළු එකළු වන් = ප්‍රවාල දළු හා එකාකාර (ලොහිත) වර්‍ණ ඇති; 'පබළු' යනු දැන් 'කොරල්' නමින් ප්‍රසිද්ධ රක්තවර්‍ණද්‍රව්‍යයයි. සමෘද්ධවර්‍ණ ඇති වූ විට කොරල් ඉතා රතු වේ. 'එකළු' යන තන්හි 'අළු' යන්න සලි 762[24], තිසර 49 යන ආදියෙහි 'ආකාරය, හැඩය' යන අර්ථයන්හි යෙදිනි. සිතුරුවන් සොඳුරුවන් = චින්තාමාණික්‍යයක් සේ සුන්දර වූ වර්‍ණ (=ආකාර) ඇති; එක සඳ = එක් සිත් ඇති; ඉතා හිතවත් වූ; සනැමැතිණා = ජනනාමාත්‍යයා. අළ = පමුණුවන ලද. වෙන්මඟ ...... = අහසෙහි සුළඟ වැදුනු (සුදු =) ශෙවත (=ක්ෂීර) සාගරයෙහි තරඞග වැනි; රඟ රඟරඟා වන් = නෘත්‍ය කරමින් මෙන්; ලඟා වන් = සමීපයට වැදුනු (= පැමිණි); පුරවරා = පුරවරයෙහි.

## 6. පිටුව.

**අලඹෙදුරින්** = විවෘත කල වාරයෙන්; **ඉක්ම** = ඉක්මවා. **ඉක්මන් බිනික්මන්** = ශීඝ්‍ර වූ අභිනිෂ්ක්‍රමණය, 'අභිනිෂ්ක්‍රමණය' නම් පැවිද්ද සඳහා නික්ම යෑම යි. **වන** =වන කල්හි; **සපත**=සම්ප්‍රාප්ත. **නිසැක ව......**=නිසැක වෙව. තා මේ සත් දින රඳුසිටිය හොත් මේ(**සැකවත**=)චක්‍රව සතුව(=චක්‍රරත්නය) තාගේ හස්තයට පැමිණීමට (**වත**=) සමර්ථ ය යි; චක්‍රරත්නය පහළ වූ විට චක්‍රවර්ති රජ වෙයි. චක්‍රරත්නය නම් සක්විති රජුන් කැමැති තැනකට යෑමට උපකාර වන රෝදයකි (=රථයකි). **නෙපලන** =වචනය; **දෙව්කැලා** =දෙව සමූහයා; **එක් වැ ලා** = එක් වී; **සිත් ලොලා** = චිත්තලෞල්‍යයෙන්; සිතේ ආශාවෙන්; **නූපමා** = උපමා රහිත; අසමාන. **මා ගඟ** = මහත් නදිය; **නාගමා** = බලා; **දල** = දැඩි; මහත්. **පහ කල** = දුරු කල; පැරදවූ.

**දිමුතු.........**= දීප්තිමත් මුක්තාවන්ගේ ශ්‍රිය පැතුරුණු ප්‍රකට ධවල වැලිතලාව පාදතලප්‍රභාවෙන් සරසා මණි කාන්තියෙන් සජ්ජිත කිරීටය (=ඔටුන්න) ද නානාභරණයන් ද ඒ ස්නෙහවත් අමාත්‍යයාට ප්‍රේමයෙන් දී තමාගේ අතට පත් කඩුපත ගෙණ ජගච්ඡාන්තිකරයා (=බොධිසත්වයන් වහන්සේ).

**තුනු සරා** = ශරීරය සරසා. **එ මුළුලෝ පාදු** = ඒ සමස්ත ලොකය පහදු; **එ පාදු** = ඒ පාත්‍රධාතුව. **සහයුරු** = සහකාර; මී අඹ. **පස්වකා** = ප්‍රත්‍යවෙක්‍ෂා කොට; ආහාර ස්වභාවාදිය නුවණින් සලකා. **මුසු අහර** = මිශ්‍රාහාරය; **දහම්සර.........** = ධර්මස්වරයෙහි (=දහම් දෙසීමෙහි) තර වූ ප්‍රතිඥාව දෙමින් (= දී). **දෙතුණක් වස්** = අවුරුදු හයක්; **මඳදිවුනිසර** = මන්දජීවිකාවෙහි (= ස්වල්ප ආහාර ගැණීමෙහි, දුෂ්කර ක්‍රියාවෙහි) නිස්සාරත්වය; **දුහැ** = (එය) හැර. **සුජාතා** = මනා ව උපන්නියක වූ; **නිල්වලා නිල්දලා** = නීලවලාහක වැනි නීලජලය ඇති; **සනා** = සනහා; ස්නානය කොට.

ඕදනහර = ඕජස් සහිත ආහාරය; උතුපහණ = හතළිස් නවය; "සුරතින් (= දකුණතින්) නළිය ගෙණ කුල්මතින් දියට ඇර" යනු අන්වය යි. කුල්මතින් = ප්‍රීතියෙන් වූ මතින්; කුල් කොමුල් ........= කුජනය කළ (=හැඬූ) කොවු ලන්ගේ සවන (= නාද) යෙන් ජනිත වූ (= හඬ පැතුරුණු) ඒ ප්‍රුල්ල වූ විශාල ශාලවනයෙහි, සවස් වන...... ... = හවස් වන කල්හි නොයෙක් දහස් ගණන් බඹ පිරිස් ද දෙවියන් සහිත නාග ගරුඬ රාශිය ද පූජාවිශෙෂ අතින් ගෙණ සමූහ සමූහ (= කාණ්ඩ කාණ්ඩ) ව සිටි කල්හි.

## 7. පිඩුව.

පුණුපැරුම් = බෝසත්කෙනෙකුන්ට බුදු වන දවසෙහි හිඳ ගැණුමට ආසනයක් දෙනු සඳහා පෙරුම් පිරූ ගෙවත් පින් කළ; සොත් = සොත්ථිය; 'සොත්ථිය' යන්නෙන් බිඳිය යුත්තේ 'සොත්' කියායි. ඒ පාඨය පැරණි පිටපත්හි ද තිබෙනහෙයින් 'සෙත්' යන්න හැර එය ම යෙදීමු. මිණිමෙවන් = මිණි මෙස වණි; මෙහි 'මිණි' යන්නෙන් ඉන්ද්‍රනීල මාණික්‍ය ගැණේ. අපරජිත........=නොපැරදුනු අවර (=නොසැලෙන) ආසනයට = හිඳ ගැණීමට) තැන වූ; චතුරඞග......= අඞග සතරින් යුත් වීර්‍යය ඉටා ගැණීමෙන්, 1. 'සම්, 2. මස්, 3 ඇට පමණක් ඉතිරි ව, 4. ලේ වියලී ගියත් අදහස ඉෂට කර ගෙණ මිස නො නවතිමි' යන දෘඪ අධිෂ්ඨානයෙන්. ගැටවවු ගන්වා = සිවුරෙහි ගණ්ඨිය පාස යෙහි ලා; දෙඋර වසා සිවුර පොරොවා (ධගැ 216³ බලනු). "වැඩහිඳ" යනු 'වැඩ හුන් සඳ" යි සකසනු. වශවර්ති = අනුන් තමා වශයෙහි පවත්වන; බිම්බර = පොළොවෙහි එක පැත්ත කට ගිය විට අනික් පැත්ත උඩ යන තරම් විශාල සමූහය. ඇත් = අසනයට; ම.ළි නො ව = අලස නො වී; වෘෂ්ටි = වැස්ස; ශිලා = ගල්; අසිඳුහත් = අසිද්ධාර්ථ, සිද්ධ නො වූ අදහස් ඇති; සඟ නාලද = සංග්‍රහ කළ; නො රසවත් = (ස්නෙහ) රසයක් නැති; සමරුසපත් = සංරෙෂයට (=කොප යට) පැමිණි; පූර්වේනිවාසානුස්මෘතිඥානය = පෙර විසූ භව යන් සිහි කරණ (= දූතීමට ඉවකල් වන) නුවණ; දිව්‍යාංච ක්‍ෂු

රශ්මිඥානය = දිවැස්නුවණ. ද්වාදශාඞ්ග ........=අවිද්‍යාදි අඞ්ග දොළොසකින් යුක්ත පටිච්චසමුප්පාදය (=හේතුඵල ධර්මය) අනුලෝමප්‍රතිලෝමවශයෙන් සලසනා කිරීමෙන්; මූල සිට අගට සම්මර්ශනය අනුලෝමසම්මර්ශනය යි. අග සිට මූලට සම්මර්ශනය ප්‍රතිලෝම සම්මර්ශනය යි. **සවාසනා** = වාසනා ගුණ සහිත; 'වාසනා' නම් කලින් කෙලෙස් නිසා වූ පුරුදු යි. **විධ්වංසනය** = වැනසීම; **දූරීකරණය** = දුරු කිරීම; **ඒකනිනනාද** = එක ම හඬ ඇත්තක්; හඬින් ම පිරුණක්. **සමධිගමය** = අවබෝධ.

## 8. පිවුව.

**යුගඳුරු** = යුගන්ධරපර්වතය; **ඝනකඩබොල්** = ඝන වූ ද අඛණ්ඩ (=නො කැඩුනු) වූ ද බහල වූ ද; 'ඉතා ඝන වූ' යනු අර්ථ යි. **සෙන්නියක** = හාස (= සිනා) කරන්නියක; **ශීතලාම්ල** = සිහිල් නිම්ල; **එකාලු** = එකාලෝක; **පිළඹ** = හොරු; **ඉඳිගත්** = ඍජු ශරීර ඇති; **නිරැකි** = නිරාසයන්හි; **අවාදිත නාදය** = වාදනය නො කරණ ලද්ද ව නැඟෙන හඬ; **අසක්නාද** = ගැටීමක් නැති ව ඇති වන හඬ. **පිම්බ** = මහීමණ්ඩලය; **උපුල්** = උල්පත්; **නො වෑහීම** = ගලා නො බැසීම; **බවඟ** = භවාග්‍රය; අකනිටා බඹලොව; **එආධුනණ** = එක ම මලුවක් හෝ එලිමහන් තැනක්; **දෑස්පිංඵයට** = දශීනමාගීයට; **උදෑවිය** = උදයව්‍යය; ඉපදීම හා මැරීම.

## 9. සිවුව.

**පස්පියුමෙන්** = පඤ්චවිධ පද්මයෙන්; නීලොත්පල රක්තොත්පල, ශ්වෙතොත්පල, රක්තපද්ම, ශ්වේතපද්ම යන පසයි (බෝ ව 412$^{5}$). නොහොත් උත්පල, පද්ම, පුණ්ඩරීක, රාජීව, ශතපත්‍ර යන පසයි. (බෝව 158$^{34}$). **පුව්නිමිත**= යම් කිසිවක් සිද්ධ වීමට මත්තෙහි ඇති වන ලකුණු (අමා 6 පිටුවෙහි ද මේ පෙරනිමිති පෙණේ). **අපරාජිතාසනය** = නොපැරදුනු ආසනය **අනිමිෂලොචනයෙන්** = ඇස්මැඹ (= පියහෙළුම්) නැති ඇසින්; **අනන්තාකාශ සමාන පඬ**

**තාශ** = අනන්ත (ඉතා බොහෝ) වූ ක්‍රම ඇති 'සමන්තපට්ඨාන' නම් අභිධර්මප්‍රකරණය; **භාව** = රඟයෙන් වන ක්‍රියාවිශේෂ; **හාව** = හිතෙහි අදහස් ප්‍රකාශ වන ඔහ ගැලීම් ආදිය; **ලීලා** = විලාස; රඟය ඉගවන ක්‍රියා; **කටාක්ෂනිරීක්ෂණ** = ඇස් කොණින් හෝ හෙංරඇහින් බැලීම; **අපේක්ෂණ** = බලාපොරොත්තු වීම; **හාස** = සිනාව යන මෙයින්; **අවහාස** = සබලතා; යුක්ත. **භෝගීන්ද්‍රභාගාවලිය** = නාගයාගේ දරණ වැල. **සිරින් උතුරු** = ශ්‍රීයෙන් උතුම් වූ; **පිරිබෝ** = පරිභොග; වැළඳීම; **සිවුවරමුන්** = ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යන ශ්‍රේෂ්ඨදෙවියන් විසින්; **'වරම්'** සද බ්‍රහ්ම, නිර්මාතෘ, ශ්‍රේෂ්ඨදෙව යනාදි අර්ථ ඇති 'වරන්' යන ද්‍රවිඩ ශබ්දයෙන් ආවකි. 'වරම්' සදට 'දෙව්' සද ද එකතු කරන්ට වූයේ 'වරම්' සදෙහි ඇති දෙවාර්ථය විස්මෘත වීමෙන් පසු ව ය. **සලපා** = ශෛලපාත්‍රය; **මිණිබු** = මිණිපැණි ලා සැදූ අග්ගලා. **'ඉක්මවා'**--'ඉකුම්' දසින් සිද්ධ පූර්වක්‍රියා යි. **'නික්මවා'**--'නිකුම්' ධාතු යි. **නරෝරග** = නර උරග; නර නාග.

## 10. පිටුව.

**පුණ්‍යානුපරිණාමයෙන්** = පින් මේරීමෙන්; **කෘතයුගමහාමේඝය** – කෘත යුගයෙහි වූ මහත් වැස්සක්; කෘතයුගයෙහි ලෝකය අතිසමෘද්ධ ය. එකල්හි හැම දෙයම සත්ත්වයන්ගේ ප්‍රීතිප්‍රමෝදයට හේතු වේ. මෙසය අදත් ධාන්‍යසමෘද්ධියට හේතු වේ. කෘතයුගයෙහි වන විට එහි සමෘද්ධිකරභාවය ගැණ කියයුත්තක් නැත. ; **සන්තානවර්ති** = සිත්හි පවත්නා; **අමර්ෂ** = නො ඉවසීම; කොපය; **මාන** = තමා උසස් ය හෝ පහත් ය යනාදි ලෙසින් මැන ගැණීම; **සංරම්භ** = එකට එක කිරීම. **කාලුෂ්‍ය** = කිලුටු; **සාක්ෂාත්** = ප්‍රත්‍යක්ෂ.

දළදා සිරිතෙහි ප්‍රථමපරිච්ඡේදය යි.

## 10. පරිච්ඡේදය

**විනයනය** = හික්මවීම; **මැදිපොහෝ** = පුරපසළොස්වක් පොහෝ; මාසයෙහි මැද යෙදෙන හෙයින් එය එනම් වී ය. **නන්මිණබෙයින්** = නානාවර්ණභේදයන්ගෙන්; මැණික් ජාතිවලින්; **ගස්තුරු** = කුඩා ගස් ‘ගස්’ ය; ලොකු ගස් ‘තුරු’ ය. **බවා** = බිය ‘කර; බා’ දයින් සිද්ධ හෙත්වර්ථපූර්වක්‍රියා යි. **කිමිසාළෙඩයි** = කිමි කැබැල්ලෙහි; **තේජෝ කසුණුසමවත්** = තේජෝකසිණය භාවනා කර උපදවාගත් චතුර්ථධ්‍යානයම; **කැලැළේ** = කැලැඹී; **බූහඹ** = භූතසමූහයා.

## 11. සිවුව

**මන් පුද කැර** = සිත පූජා කොට; ‘නාථනම’ යි මුද්‍රිත පිටපතෙහි යෙදුනු ප්‍රථමාවිභක්ත්‍යන්තය හා සම්බන්ධ වන අවසාන ක්‍රියාපදයක් තිබේ දැ යි සෙවිය යුතු යි. **කළුවර දෙපොහෝදවස්** = කෘෂ්ණපක්ෂයෙහි දෙවෙනි පොහෝ දවස්හි; මාසේපොහෝදවසට ‘දෙපොහෝදවස’ යි ව්‍යවහාරයෙහි එ යි එය ප්‍රධාන පොහෝ දෙකින් දෙවැන්න වන හෙයින් ඒ නම වී ය යි සිතිය හැකි ය. කළුවර පක්ෂය සම්බන්ධ වන විට පලමුවන පෝය වන්නේ අටවක යි. **සදමසිල්** = මාවා හා බැනා වූ (මහා 1 – 41 සිට බලනු). **වලහම්** = උපද්‍රවය; ‘වළහම්’ යන්න සිංහලයට ආයේ ‘මහකම්ම’ යන්නෙනි. බුත් 102[5], සලි 73[1] හි ද මෙය යෙදිත. අර්ථයෙන් නම් වෙනසක් පෙණේ. **දසබලා** = දශබලයන්වහන්සේ; දශබලවිස්තරය ධපු 32 පටන් පෙණේ. **ම** = මා; **සමන් සත්** = සියලු සත්ත්වයන්ට; **සැත්** = සම්ප්‍රාප්ත; **සුගත් එ සුගත්** = මනා ගාත්‍ර(ශරීර)යක් ඇති ඒ බුදුන් වහන්සේ. **ගුවන්පත්(ව)** = අහසින් පැමිණ; **ලොවග** = ලොකයෙහි අග්‍ර වූ; **මිණිපලග** = මැණික් පුටුව. **දන්දුන් බොජුන්** = දාන වශයෙන් දුන් භොජනය, **බිඳ** = අනුභව කර; ‘බිද’ යනු ‘බුද – බිදීමෙහි’ දයින් සිද්ධ පූර්වක්‍රියා පද යි. **ඉසින්** = ඍෂීන්; භික්ෂූන්; ‘ඉසුන්’ යනු දුෂ්ටපාඨ

යකි. අනුප්‍රාස සඳහා ශබ්දධර්මය ඉක්මවීමට ඉඩක් නොමැති සි. **මිණිකිරණගණගිගිනි** = මාණික්‍යරශ්මි සමූහය ගහන වූ, **කලණගුණසිරි** = යහපත් ගුණ නමැති සම්පත්තියට; **පුරතැන්** = නගරයෙහි ස්ථානයන්හි; **සිය** = සවකීය (=තෑ)යන්; **පානු** = භාජන; **කිරුළ්කුළු** = කිරීටකූට (=ඔටුනු මුදුන)දු; **මිණිමිළින් උදුල** = මාණික්‍ය සමූහයෙන් බැබලි; 'මිළි' යනු 'මුළු' සඳින් ස්වාර්ථ ඉප්‍රත්‍යය ව සැධ වේ. 'පෙළින්' සි වුවොත් වඩා සුදුසු ය. **පදලසින්** = පාදලාඤ්ජනයෙන්; පාලකුණෙන්. **හිම** = වනය; 'හිම' යනු මිදුනුදියට නමකි. එය ඇති තැන ද අභෙදෝපචාරයෙන් 'හිම' නම් වේ. හිමාලයකන්දෙහි හිම සුලභ ය. 'හිමාලය වනයක් ලෙස සලකා සෙසුවනයන්ට ද 'හිම' යන නම යෙදිනි. **සුහණ** = මනෝඥ; **දිවාවිහාර** = දහවල්හි විසීම; **දිසෑ** = දිසවාපි.

## 12. පුවුව

**තුඹරුප්** = ථූපාරාම; ධජ 332[4] හි ද මෙය පෙණේ. **වනලඅතලගලතලැති** = පැතුරුණු අතලගල්තලාවක් ඇති; 'අතලගල' නම් පැතැලි ගල්ලැල්ල යි. **නිසල** = නිශ්චල; **විසලසෑසෑ** = විශාලශෛලචෛත්‍යය. **බුදුසිරිසතොස්** = බුද්ධශ්‍රීයෙහි සන්තුෂ්ට; **සුරක්ත**........ = ඉතාරතු වූ තොල්දළ අතර; **සඳවලා** = සන්ධ්‍යාවලාහක; **හිමහරකරසාර** = චන්ද්‍ර රශ්මි සේ සරු වූ; හිම කරණුයේ හිමකරයි. **රසනෙතිනින්** = රශ්මිසමූහයෙන්; **නෙවිනෙකුමුදුවන** = නොයෙක් විනෙය (=හික්මවිය යුතු) ජනයන් නමැති හෙළුපුල්වනය; **සකල** ... = සියලු ක්ලේශ නමැති මුලාතින්දෙහි මුද්‍රා (=Seal) (**ජිද්‍රාසණශ=**) සිදුවීම; **අතුල්‍ය** = අසමාන; **අකල්ප** = කපම නුවූ; අවඩක. 'අකල්ප,' 'අකල්ප්‍ය' යනු මුද්‍රිත පොත්හි යෙදුනු පාඨයි. 'අසමාන' සි අකල්ප ශබ්දයට අර්ථ කියනත් එහි ඒ අර්ථය නැත. ඇත්තේ 'කල්පය නොවන; අයන්තවැනි' යන අර්ථය. 'අකල්ප්‍ය' යන්නෙහි අර්ථය නම් 'කල්පනය නො කට යුතු, නො කළ යුතු' යනුයි. **අනූනිමල්ල** =

ප්‍රතිමල්ල(=විරුද්ධ)යෙකු නැති; **පාරිජාත** = එරබදු; **කර්ණිකාර** = කිණිහිරි; **කෝවිදාර** = කොබෝලීල; **සහකාර** = මීඅඹ; **සින්දුවාර** = නික; **ජම්බීර** = දෙහි; **තරුවර නිකරකිණ්** = උතුම් ගස්සමූහය ගැවසුනු; **සරල** = හොර; **වකුල** = මුහුනමල්; **නිචුල** = මිදෙල්; **විදුල** = හොඹුවගු හෝ වේවැල්; **විශාලශාල** = මහත් සල්ගස් යන මේ ඇති; **පලුදෙමෙලන්** = දළු හා කොළවලින්; **විපුල්කුරු** = මහත් අඞ්කුර; දළු (රුවන් 195). **මත්සනින්** = මත්තස්වනයෙන්; මත් ව කරණ හඬින්; **කූල්** = කූජනය කළ; හැඬූ; **ගමන** = ගමන; **චතුරු** = චතුර; **වාදිභසිංහ** = වාදීන් නමැති ඇතුන්ට සිංහයෙකු වැනි; **සිංහශය්‍යා** = ශ්‍රෙෂ්ඨශයනය නොහොත් සිංහයෙකු මෙන් කරණ ශයනය; විස්තර ධප් 299 හි පෙණේ.

## 13. පිටුව

**සුභද්‍ර** = ඉතා යහපත්; **විනයනය** = හික්මවීම; **අප්‍රමාද පදයෙන්** = අප්‍රමාදය නමැති ප්‍රතිඥාවෙන් හෝ 'අප්‍රමාද වව්' යන වචනයෙන්; **නිරුපධිශෙෂනිර්වාණධාතු** = 'උපාධි' යනු ස්කන්ධයන්ට නම් උපධින්ගේ ශෙෂය (=ඉතිරි වීම) උපධිශෙෂ යි. ජීවත් ව සිටින කෙනකුන් අවබොධ කරණ නිර්වාණය උපධිශෙෂනිර්වාණ නම් වේ රහතුන් වහන්සේ කෙනෙකුන්ගේ මරණයෙන් වන නිවණ 'නිරුපධිශෙෂ' නම් වේ. ස්කන්ධයන්ගේ ඇති වීමක් නැති හෙයිනි.

**පවනාභල** = වාතයෙන් ඇඹරුණු (=කරකැවුනු); **මිසුඹු හුරුනල** = මුඛය උඩුකුරු කර පවත්වන වාතය; සුසුම්. **සියලියන් සමහ එක් වැ ලා** = සවකිය භාර්‍යාවන් හා එක් වී; "දෙමිනසින් උයන්කුස් වැද" යනු අන්වය යි. **පෙල වගල** = පෙළට වැටුනු, **උපුල** = ඉදුරුණු; **එකාහි** = එකවිට; මෙය ජා 276[11], 349[30] යනාදියෙහි ද, 'එකසී' යි ජා 289[8], 384[25] යනාදියෙහි ද පෙණේ. **පෙළලව** = පොළොවෙහි; (ධප් 279[30]). **මහනැතින්** = මහත් උත්සාහයෙන්.

## 14 පිටුව

**චක්‍රලක්ෂණ** — ධප්‍ර 5³ බලනු. **ධර්මසංවේග** = සංස්කාර ධර්මයන්හි කලකිරීම; **වාරි** = ජල; **චිතකාග්නි** = සෑයෙහි ගින්න. **ලලාට** = නළල; **අක්‍ෂ** = අක්ෂකය; ග්‍රීවායෙහි ඉදිරි පස පෙනෙන සිටි ඇට; **මඟධනැළිය** = මගධරටෙහි මැනීමට ගන්නා නැළිය; **මිහුණුසාමින්** = මහියඞ්ගණ සෑයෙහි; 'මිහුගුණු' යි ද මෙය යෙදේ. **සැකුස්හි** = චෛත්‍යය ඇතුළත. **මෙවන්** = මේඝවර්ණ; **කණුසෑය** = කඤ්චුක චෛත්‍යය; කලින් පැවැති චෛත්‍යයක් වසා පිටතින් බඳින සෑය 'කසුසෑ' නම්. **ගබම** = නිවණ; **ඝනවණ්ණනාවිත** = ඝන වූ සඳුන් දරින් රැස් කළ (=බැඳි); **වම්** = වමී හෝ සෞන්දර්‍යය; වමීය නම් සන්නාහය යි එය ලූ විට ආරක්ෂාව සැලසේ. මෙ ධාතූන් වහන්සේට ගින්නෙන් අන්තරාය නො වී ය. එහෙයින් සෑයෙහි දී වමියක් ලූවාක් වැනි වී ය. සෞන්දර්‍යාර්ථ වාමශබ්දයෙන් ද 'වම්' යි කිවිය හැකි ය. 'වාමලොචනා' යනාදියෙහි වාමශබ්දය සෞන්දර්‍යාර්ථ යි. 'පහ වූ උවම් ඇති'යි පාඨය වෙනස් කළොත් "උපමා රහිත, අසමාන" යන අර්ථය කිය හැකි ය. **අට** = සාලහය; යුද්ධය; (රුවන් 642). **ඇරඹූ** = ආරම්භ කළ; 'අරය' ධාතුව ආරම්භාර්ථයෙහි සර 425³³ හි ද යෙදින.

## 15. පිටුව.

**අටරට** = මගධ, වෙසාලි, කපිලවත්‍ථු, අල්ලකප්ප, රාමගාම, වෙඨදීප, පාවා, කුසිනාරා යන රටවල් අටෙහි; **ලොඳුළුවන්** = අර්ථ 63 පිටුවෙහි දී දක්වන ලදී. **වැඩ** = අභිවෘද්ධිය; **වැඩි යැ** = උපස්ථාන කෙළේ ය. **විපුලසම්පදාධාර** = මහත් සම්පත්තියට ආධාරස්ථාන වූ; **පුණ්‍යජනාධාර** = පුණ්‍ය (= පවිත්‍ර)ජනයන්ට වාසස්ථාන වූ; **මණිගණ** ......= මාණික්‍ය සමූහයාගේ කාන්තිය ගැවසුනු රත්වන් වූ වණීනා කටයුතු; **අසඞ්ග**........... =(කිසිවක් හා) ගැටීමක් නැති උස් වූ; **ශෘඞ්ග** = කොත්වලින්; **සඞ්ගත** = යුක්ත; **නානාරාගවිරාග**=

නොයෙක් පැහැයෙන් බබලන; **වර්ණාභරණ** = පාට ඇතිරිලි; **ආස්තෘත** = අතුරණ ලද; **ධවලාතපත්‍රයෙන්** = සේසතින්; **ජනවන්ත** = ජනයා ඇති; **රජගමිණි** = රජුන්ට අග්‍රරත්නයක් වූ; **නන්වන් දෙවන් වන්** = නොයෙක් වස්තු දානය කරවතොත් සමඬි වූ; **සඟන්** = සංග්‍රහ කළ; 'ස' පූර්ව 'ගන්' ධාතු යි. **සතන්පත්** = සිතට පැමිණි; **අවිදුඅඳුර** = අවිද්‍යාන්ධකාරය; **නොපමු** = මහත්.

## 16, පවුව.

**සමපත්තිකර** = සම්පත්තිය ඇති කරණ; **නවවිධ රත්න** = රතුකැට, මුතු, ගෝමේද, වජ්‍ර (= දියමන්ති), වෛරෝඩි, පබළු, ඉන්ද්‍රනීල; පුෂ්පරාග, මරකත යන නවවැදෑරුම් රුවන්. **වණ්බක** = දීමෙහි අනුසස් කියා ඉල්වන අය; **දිළිඳුස** = දිළිඳු බව; **ගිම්** = ග්‍රීෂ්මය; **අපහරණය** = පහ කිරීම; **රන්රසුම්ණ්කිකිණ්දැලින්** = රන්මුවා රහුගෙඩි ද මිණි ගෙඩි ද කිඩකිණි (= ගෙජ්ජි) ද බැඳි දැල්වලින්; **කූඵගේ** = කූටාගාර; **නුවන් වන්** = ඇසට වැදුනු; **පුවළරස්** = ප්‍රෞඪ (=මහත්) රශ්මි ඇති; **තුහුකෙලෙස් ඇඳුරුවන්** = උස් වූ කෛලාසපර්වතය වැනි; 'ඇඳුරු' යනු පර්වතවාචී අද්‍රි ශබ්දයෙන් එයි (රුවන් 188 බලනු). **සගමොකට යතුරු** = ස්වර්ගමොක්ෂයට යාත්‍රාවක්; **සොඳුරුවන්** = සුන්දරවර්ණ ඇති; **අනුජාතපුත්‍ර** = ගුණ නුවණ ආදියෙන් පියාට සමාන ව උපන් පුත්‍ර වූ; **තොසිවන** = සන්තුෂ්ට වන සුලු; **සරවුවරින්**= බදුවලින්; **වැමෙයි** = ප්‍රදීපයෙහි; **වැමුජ්** = පහන් තිර; **දියනා** = ජගන්නායකයා; රජු; **පුරඳුරුපුර** = ශක්‍රපුරයට; **ජනානන්ද** = ජනයා තුටු කරණ; **බුද්ධශාසනමාමක ව** = බුද්ධශාසනය මාගේ ය යි කියන්නෙක් (= බුද්ධශාසනයට අතිශය හිතෛෂී) ව; **වතින්** =වස්ත්‍රයෙන්; **දානමානනාදිය**= දන් දීම බුහුමන් කිරීම ආදිය; **චිරකාල**.........= බොහෝ කාලයක් නිරතුරු ව මනා සේ රැස් කළ සුචරිතයාගේ (=පිණෙහි) ආනුභාවයෙන්; **අගණ්‍ය** =නො ගිණිය හැකි.

## 17. පිටුව.

ජනරඤ්ජනය = ජනයා පිණවීම; චඤ්චාප්‍රවෘත්තීන් = කපටි පැවතුම්වලින්; අයිමු = අරිෂ්ට; අයහපත්; රිවු ණිවමි = කවුඩන් සේ නිවට (= දීන); 'රිටූ' සද කාකවාචී ය. (කව් 5:8 බලනු). ණිඩිමුවන්ට = නිගණ්ඨයන්ට; උවටුවම් = උපස්ථානකම්; විලා = විලාකුළු; පිඟන වැ = වැසී; ප්‍රඥ ප්‍රභාශ = ප්‍රඥව නමැති එළිය; අධර්මසඥාදනමිථ්‍යාදෘෂ්ටියෙන් = අධර්මය දැඩි කොට ගැණීම හා වැරදි කල්පනාව ය යන මෙයින්; කෙහෙල්ලෙන් = කොඩිවලින්; ඇගෑ = තොරණවෙසෙසකි. තිසුගින් = සතුතිගීතින්; දිප = පහන්; ධූප = දුම්; සැණකෙළි = උත්සවක්‍රීඩා; උදම් වූ = උද්දම වූ; ඔද වැඩුනු; මෙහි 'ඔද වැඩීම' නම් වඩදිය ඇති වීම යි.

අචලශ්‍රද්ධා = චඤ්චල නුවූ ඇදහීම; අචලශ්‍රද්ධාව ඇති වන්නේ සෝවාන් වීමෙනි. බුද්ධමාමක = 'බුදුන් වහන්සේ මාගේ ය' යි සලකන; පසුන් = ප්‍රව්‍රජිතා කළ; සිදු ලූ; 'ප' පූර්ව 'සිදු' දැයින් සිද්ධ යි.

## 18. පිටුව.

අවිෂය = බොහෝ; හිරි = පව් හිරිමෙහි ලජ්ජාව; ඔතප් = පවට බිය; 'නැත්තාහැ' - මේ 'හැ' යන්න 'හු + යැ' යන දෙක සන්ධි වීමෙන් සිඩ ය යි හැඟේ. වර්තමානව්‍යවහාර යෙහි 'කළාහ' යනාදියෙහි තිබෙන 'හ' යන්න ද මේ 'හැ' යන්නේ ම විකෘතියෙකි. වාක්‍ය පරිසමාප්තියෙහි යෙදෙන 'යැ' යන්න 'හැ, හ' යන දෙකින් පර ව නො යෙදීම ද එහි සන්ධියෙන් වැසී 'යැ' යන්න තිබෙන බවට සාධක යකි. අමාවතුර, බුත්සරණ, පූජාවලී ආදියෙහි ද මේ 'හැ යන්න පෙණේ. නැඟී ශෑ = බැහැර කෙළේ යැ.

මිසලද = මිථ්‍යාලබ්ධි; කේලාම් මසුරුමල = මල (= දූෂිත) යාගේ කැමිය කේලාම් ය. එනම් ප්‍රියභාවය නැති කරණ බස් කීම ය. 'මසුරු' = නම් ඊෂ්‍යීාව යි. 'මසුරු' සද තමන් සතු දෙය අන්‍යයන් හා ද සාධාරණ කොට නොසැලකීම් අර්ථ ඇති 'මච්ඡර' ශබ්දයෙන් එනත් ඊෂ්‍යීාවාචි ද වන බව රුවන් 116 න් පෙණේ. උතුමන් ඉදිරියට යන විට මල් ද ගෙණ යෑම සිරිතකි. මොවුන් රජු ඉදිරියට ගෙණ ගිය මල නම් කේලාම් හා ඊෂ්‍යීා ද යන මල යි. 'මල' සද මෙහි කිලුට යන අර්ථය ද දෙයි. සාමන්තරජ = ඇම්පදෙශයෙහි රජ නොහොත් කප්පම් ගෙවන රජ; දණ්ඩාභිහත = දඬුකඩ කින් ගැසූ; ශෞර = ශූරභාවය; සෑව = ශව; මිනී. සිතුරු යහන් = චිත්‍රයාන; සමග = එකතු; යතරින් = ගමනින්; කතර = කාන්තාරය; දුර්ගම්මාර්ගය.

## 19. පිටුව.

ඇතස් = ඇත් අස්; වතුරු = වස්ත්‍ර; පිළියනි = ප්‍රත්‍යනීක; විරුඬ. වාසල් = දෙරටු; පදනම් = ප්‍රාකාරය ශක්තිමත් වීමට බදින අනුප්‍රාකාරය; කයිගෙර්රුව. මේ ද්‍රවිඩ ශබ්දයෙකි. අර්ථ විවරණය T.L. 2468 පිටුවෙහි පෙණේ. වට = හාත්පස්හි, වටේට. වෙට්ටම් = මේ ද ද්‍රවිඩ ශබ්දය කැයි හැඟේ. එහෙත් ඊට T L. 3768 හි 'ආලෝකය' යන අර්ථය පමණක් දී තිබේ සිංහලයෙහි දී ඒ අර්ථයෙහි යෙදුනු තැනක් නො දැණේ. "අට්ලු, ගොපුර හෙවත් දෙරටුහලු' යන අර්ථයෙහි සිංහලයෙහි යෙදිනා ජා අ 2-68[5] හි "පාකාරවාරට්ටාලකගොපුරෙසු" යන්න ජා 345[34] හි "අට්ටාලවෙට්ටම් ආදී වූ දෙයෙහි" යි පෙරළනා ලදී. එහි 'වෙට්ටම්' යන්න 'ගොපුර' (= දෙරටුහලු, දෙරටු තොරණ) යන අර්ථය තකා යෙදුනකැ යි හැඟේ ජා අ 3 - 81[27] හි "පාකාරට්ටාලකාදිපරික්ඛරණං" යන්න ජා 580[11] හි "පවුරු පදනම් අට්ටාල වෙට්ටම් ආදී වූ කම්මාන්ත" යි පරිවර්තිත ය. ජා අ 7 - 347[26] හි "අනුපාකාරවාරට්ටාලකෙ

"අනතරච්චාලකෙ" යන්න උමන්දා 85[17] හි "මහ පදනමක් ද වට කොට සියගණන් ද්වාර ගෙවල් හා වට බඳ වෙට්ටම් ද" යයි පෙරළිත. මේ තැන්වලින් පෙණෙන්නේ 'වෙට්ටම්' සඳ 'අවලු, අනතරච්චාල' යන අර්ථ අපේක්ෂා කර යෙදූ බවයි. මෙහි අවලු වෙනම දක්වූ හෙයින් 'වෙට්ටම්' යන්නෙන් 'අනතරච්චාල' ගත යුතු යයි හැඟේ. 'අනතරච්චාල' නම් මහඅවලු අතර තැනූ කුඩා අවලුවෙසෙසකි. උමන්දාවෙහි 96[16] හි පෙණෙන 'වෙට්ටම්' යන්න 'විට්ටම්' යන ද්‍රවිඩශබ්දයේ විකෘතියකි. එහි අර්ථය නම් 'කරස් ලීය' යනුයි 'ඇද විට්ටම්' යන තන්හි ඒ සඳ සව රූපයෙන් ම පෙණේ. තුඹු = උස්; මහඟු = මහාර්ඝ; පා = ප්‍රාසාද. නෙදන් හල් කොලහලින් = නොයෙක් දානශාලාවන්හි කරණ ශබ්දයෙන්; වොරදනා විරාජමාන බබලන. සසුන් = ශාසනය; ප්‍රතිබිම්බය. අනවරණ නැණ ගුණෙණින් = අනාවරණ (ආවරණයක් – බාධාවක් – වැළැක්මක් නැති) ඥානයෙහි ගුණයෙන්. සව්ණෙන් = සර්වඥයා; සියලු දතයුතු දෙය. ලොවි = ලෞකික ලොවුතුරා = ලොකොත්තර; ලොකයෙන් එතෙර ව සිටි. සුබැසි = සුභාෂිත; මනා සේ කී

රන් සඳුන් = රක්තචන්දන; මේ ඉතා අනර්ඝ සඳුන් වෙසෙසකි. මේ සඳුන්දරඹියක් හිසෙහි තබා ගත්තෙකු ගින්නෙන් වෙවුලන්නට වූ බව දිව්‍යාවදානයෙහි එන පූර්ණ කථාවෙහි සඳහන් වෙයි. හෙල = ධවල; සුදු. ගෝෂී සඳුන් = දඹදිව සෘෂභ නම් පර්වතයෙහි හටගන්නා, මිස්නකභාගය ගෙරිහිසක් වැනි, ශ්‍රීඛණ්ඩ නම් සඳුන්; දෙරලී = දොරලෑලි, දෙරබා = ද්වාරබාහා; දොර සවි කරණ උළුවහු. 'බා' යන්න මෙහි 'උළුවහු' යන අර්ථය දෙයි. එය 'බාහා (බාහු)' ශබ්දයෙන් එයි. කවුළුබා = ජනෙල් උළුවහු. ප්‍රාස – භූතගාමවග්ග – 9 සික්ඛාපදයෙහි "ආලොකසන්ධිපරිකම්මාය" යන්නට කී 'කවුළුබා පිරිකම්

පිණිස' යන අ[illegible]යෙහි ද මේ සඳ යෙදිත. ගුහසීව රජුගේ දළදාමැදුරෙහි දෙරලී ආදිය වනැතමය ය. **පූවල** = මිහත **පබළුදලමය** = පබළුවලින් හා ඇත්දළ වලින් කළ; **වියාලරූ** = සිංහාදි වල්සතුන්ගේ රූප **තුමුතු** = නොමිදුනු; **පුත්තකාන සැතින්** = කතකවජ්‍රයෙන්; 'කතක' ශබ්දය 'කන, කනා' යන දෙලෙසකින් සිංහලයට එයි. **වෙරළුමිණි ගසවෙණියෙන්** = වෛඩූර්‍යමණිමය වූ ඡදනයෙන් (වහලින්); **මිණිකැලුම්දිදුලෙන්** = මාණික්‍ය කාන්තිජ්වාලායෙන්; 'දිදුලු' සද ජ්වාලාර්ථයෙහි වැටේ. (කව් 632. ගුත් 23, 424). දළදා 4 – 24 හි 'විවිධකිරණ ජාලං' යන්න දළදාසිරිත්කරුවෝ 'සවණක්රස්දිදුල' යි (31[10]) පෙරළූහ. **එකාලූ** = එකාලෝක; **විචිත්‍රාතපත්‍ර** = විසිතුරු ඡත්‍ර (=කුඩ); **නානාමණිගණ** = නොයෙක් මාණික්‍යසමූහයාගේ; **කිරණනිකර** = කාන්තිරාශියෙන්; **භාසුර** = බබලන; **විචිත්‍රවසන** = විසිතුරු වස්ත්‍රයෙන් හා; **චිත්‍රාස්තරණයෙන්** = විචිත්‍ර වූ ඇතිරිලිවලින්.

## 20. පිටුව.

**සුසංගත** = යුක්ත; **කාන්ත** = සිත්කලු. **දශනඛසමවධාන** = නියදහය එක් තැන් වීමෙන්; **සමුජ්ජ්වල** = බබලන; **අඤ්ජලි** = ඇඳිලි (= එකතු කළ දෝත). **බෝමැඬ.........** = අමා. 18 පිටුවෙහි ද, **'ගණ්ඩාම්‍රවෘක්ෂ'**............බුත් 107 හි ද, **කිඹුල්වත්**.........පූජා 255 හි ද, **ශක්‍රභවන**......බුත්. 113 හි හා පූජා 503 හි ද විස්තර වෙයි. **මණිසෝපාන**=මැණික් තරප්පුව; **අසිරිමත්** = ආශ්චර්‍යමත්; **සසිරි** = සශ්‍රීක; ශෝභාසහිත; **තිහුවදන්** = සතුතිවචන. **පරහිත කරණ පරායණ** = අනුන්ට යහපත කිරීමෙහි ඇලුනු; **ගගනතල**= අහස. **රස්කිඳු** = රශ්මිරාජින්; කැලුම් වැල්.

**දළදා සිරිතෙහි ප්‍රාතිහාර්‍යනිර්දේශ නම් දෙවන පරිච්ඡේදය යි.**

## 11 පිටුව.

### 3. පරිච්ඡේදය

ධවලාතපත්‍ර = සේසත්; සුදුකුඩය. දලරලපෙල = මහත් තරඞ්ගපඞ්ක්තියෙහි; පෙළ = පංක්ති; තුරඟ = අශ්වයන්; තිරි = ඇතිරිලි. රථශාලාව = රථශාලාය; ගමනට උපකාර වන රිය; මලාමැල්ලෙන් = කුඩා මහත් මල්වලින්; නවරණලද = යුක්ත කරණ ලද; (=සුදුවැලි හා මල් ඉසින ලද). = පලඹිලඹ ඉතා එල්බෙන; මෙහි අනුප්‍රාස සඳහා 'ලඹ' යන්න යෙදුනු නමුත් අනවශ්‍ය ය. මලොලඹු = මල්දම්. පිළිපන් ව = ප්‍රතිපන්න ව; පැමිණ. රජගෙමෙණ = අග්‍රමාණික්‍යය වැනි රාජයා; රාජශ්‍රේෂ්ඨයා. රොෂි ව = කුපිත ව, සහසි ව = සාහසික ව; ඉක්මන් ව; දරුණු ව; සනාතන = සදාකාලික; පාලියෙහි "එස ධම්මො සනන්තනො" යනාදියෙහි 'සනන්තන' යි එයි සංස්කෘතයෙහි 'සනාතන' ශබ්දය බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වර වාචි ද වේ. දයා 3 – 10 හි "දෙවෙ ජහිත්වාන නමිස්සතියෙ" යි "නමිස්සන්තිය" යන්න මේ සඳහා යෙදින. 'වැන්දසුතු' යනු එහි අර්ථයි. ඊට වඩා මෙහි පැරණි පිටපත්හි එන 'සනාතීය' යන්නට ආසන්න හෙයින් ද උචිත අර්ථයක් දෙන හෙයින් ද, 'සනාතන' යන්න යොදන ලදී. සහලගුරුවල් = ගිනි ගෙණ දිලියෙන අඟුරු වල; භස්ම = අළු.

නොසමු = කුඩා නොවූ; මහත්. රජාඞගණ = රජගෙදර මිදුල. බිද = හාරා. රොරැව නිරැ සුරැ = රෞරව නරකය වැනි; අනුභාව = තෙජස. පිඹිය = පීරා; පලාගෙණ; වසඳු මරීචි = සඳරැස්. පැහැවතුරෙන් = ප්‍රභාප්‍රවාහයෙන්; කාන්ති රාශියෙන්.

## 12 පිටුව.

සනාතනවර්ති = සිතෙහි පවත්නා; දුලීබිඩිකලුෂ = මිථ්‍යා දෘෂ්ටි නමැති කිලුටු; උදගිරි = උදයපර්වතය; සඳහිරැ උදවන තැන ඇතැයි කවීන් සැලකූ පර්වතය. හෙල ලෙල =

ධවල වූ ද ලීලෝපේත වූ ද; **දශාවතාර** = විෂ්ණු විසින් වරින් වර ගන්නා ලදැයි වෛෂ්ණවයන් සලකනු ලබන මත්ස්‍ය, කූර්ම (=ඉබි), වරාහ, නරසිංහ, වාමන, පරශුරාම; ශ්‍රී රාම, ශ්‍රීකෘෂ්ණ, ගෞතම බුඩ, කල්කි යන මේවා දසය. **එවුහු** = ඔහුගේ; 'එවු' සදින් 'හු' පස යි පැරණි බසෙහි වූ 'එවු' ශබ්දය හා 'මෙවු' ශබ්දය ද දුන් 'එ, මෙ' යන වනයෙන් ගණිති. 'එවු' යන්නට 'ඔ' ආදෙශ ද වේ (කව් 563, 534 - යන ගී වලට ලියූ විස්තර ද බලනු). **මහතැතින්** = මහත් උත්සාහයෙන්; **කොසගක්** = කොස් ගසක අගක්.

**23 පිටුව.**

**බෙරපිළෙව්** = භෙරිප්‍රයොග; බෙර හැසිරවීම. **ඇදහිලි බලී** = ශ්‍රද්ධාව බලවත්. **බොදු** = බෞද්ධ; **හඳ** = යහපත්; **දලතොසින්** = මහත් සතුටින්; **එනරවරණ** = ඒ රාජෝත්තම මයාගේ; **පියකරණ** = ප්‍රියඞ්කර වූ; **සිරිසරණ** = ශ්‍රීපාදය. **තොස** = සන්තොෂයෙන්; **මිමඬල** = මිහිමණ්ඩලයෙහි; පොළෝවෙහි; **දෝපණ ම** = පාණිව්‍යය ම; දත ම. **මුදුන් මෙණ කර** = මස්තක මාණික්‍ය කොට; දත හිස තබා; **නඳ** = සන්තොෂයෙන්; **වියත්** = ව්‍යක්ත; **රන්මසු** = රණින් කළ 'මසු' නම් කාසි **ඔපින්** = හුලහින්. **අදනන** = නොහික්මුනු. **කුටදන්ත, අජාසත්** ආදීන් පිළිබඳ විස්තර අමාවතුරෙහි එයි. **උරුවෙලකාශ්‍යපදමනය** බුත්සරණෙන් දත හැකි ය.

**24 පිටුව**

**සදහම්දෙසනාදින්** = සාඞ්ග්‍රාහිකායනීය, ධර්මදෙශනාද යනාදීන්. **සදහම්වරචක්‍රවර්ති** = සද්ධර්මය නමැති උතුම් චක්‍රය පවත්වන. **තථාගත** = පූර්ව බුදුවරයන් සේ පැමිණි. **අප්‍රති පුද්ගල** = ප්‍රතිවිරුඩ පුද්ගලයෙකු නැති. **අසමසම** = අසම (= සමානයෙකු නැති) වූ බුදුවරුන් හා සමාන. **දසබල ධාරී** = බල දහයක් දරණ; විස්තර බුත් 216 වැනි පිටුවෙහි පටන් පෙණේ. **කථනය** = කීම. **සබා** = සත්‍ය. **සරද**

**සරමෙහි** = ශරත්කාලයෙහි; **නවසඳකලා** = අළුත් සඳ කලාව; 'කලාව' නම් සොළොසින් කොටසකි. **අමෘතධාරායෙන්**= වැල නො කැඩී වැටෙන අමෘතයෙන්. අමෘතය නම් ඕජෝවර්ධනය කරන්නකි. (කව් 412 ට අප ලියූ විස්තරය බලනු). **අහිරිකායෝ** = අශ්‍රීකයෝ; කාලකණ්ණිහු; 'අහිරික' යන්නෙහි ප්‍රකට අර්ථය නම් 'ලජ්ජා නැති' යනු යි. මුල දී එය කියූ හෙයින් මෙය 'අසිරික' යන්නෙන් ආවක් ලෙස ගෙණ මේ අර්ථය කියන ලදී. **කුමුදුමින්** = ගිලෙමින්.

## 25 පිටුව

**ඇවිටු** =තිර්බන්ධය; නැවත නැවත ඉල්ලීම; **පෙව්** =වීපිය; **පසිඟම් කොට** = පදියම් කර; තට්ටුවක් දමා; පසින් වසා. **කෙසරුසලා** = කෙසරවජ්ටා; කේසරසුළි; **පෙතිපතර**=පෙති සමූහය; **මදමද නෙලෙන්** = මඳමඳමාරුතයෙන්; ඉතා හෙමින් හමන සුළඟින්. **නොමඳ** = බොහෝ වූ; **සුවඳමුවරඳසළා** =සුගන්ධ මකරන්දවජ්ටා (=සුවඳ මල්පැණි සුළි). **අවස්**= ආවාස; වසස්ථාන. **ගවරවළක්** = කුණු දිය ආදිය එකතු ව තිබෙන වළක්. **වගුල** = වැගුරුණු; **එපිරි** = ඒ පරිඛාව; (= දිය අගල). **සාරස** = විල් ලිහිණි; **චක්‍රවාක** = සක්වාලිහිණි; **කාරණ්ඩව** = හංසවිශේෂයකි. **ජලචර** = දියෙහි හැසිරෙණ. **මදමත්**=මදයෙන් මත් වූ; **මුමුනෙන්**= 'මූ, මූ' යන නාදයෙන්. ධප්‍ර 220[30], 281[31], සිඟබා 18[31] යනාදීන්හි ද 'මුමුන' සඳ පෙණේ. **වරණගණ** = හස්තිසමූහයා; **කුල්නා** = කූජනය; නැඬීම. **රැවුපිළිරැවු** = රවප්‍රතිරව; ප්‍රතිරාවය නම් ශබ්දය අනුව පවත්නා ප්‍රේංකාරය යි. **මේකල්** = මේඝ කාලයෙහි.

## 26 පිටුව.

**පහළ** = ප්‍රකට; උදා වූ; **කුමුදවන විකාශය** = හෙළුපුල් වනය පුබුදු වීම. **මිග මගා** = මෑගීය අසා; 'මගා' යනු "මග - මැගීමෙහි" (=සෙවීමෙහි) දයින් සිද්ධ පූර්වක්‍රියා යි. **කප්පින** – සළී 480 හි ද, **බිම්සර** – පූජා 233 හි ද, **සුදෙවුන්** –

පූජා 273 හි ද පෙණේ. **දෙවාතිදෙව** = දෙවියන්ට ද වඩා ශ්‍රෙෂ්ඨ දෙව්.

**පහන්සඳැති** = ප්‍රසන්න වූ සිත් ඇති; **පවස්** = පිපාසාව; **මිරිඟුපැන්** = මරීචියෙන් පෙණෙන පැන්; **තද** සූර්‍ය්‍යරශ්මිය පවතින කල්හි ඇත බැලූවිට දිය මෙන් පෙණේ. ‘මිරිඟුදියා’ යනු එය යි. **සාකුස්පෙළි** = බඩගිනි සහිත කුසින් පීඩිත ව; **සප්හර** = සපි නමැති හාරය (= මුතුපට) හෝ සපියාගේ දරණ; බුදු. 160 හි ද ‘සප්හර’ යන්න යෙදිනා. “අඩාරසිංජතතුසු නාගහාරං” යනු දළා (3–79) පාඨ යි. **සසරසයුරට** = සංසාරය නමැති සාගරයට; **රජිසුරට** = රාජ්‍ය ඓශ්වර්‍ය්‍යයට; **සිතුරුවන්** = සිතූ පැතූ දෙය දෙන මාණික්‍යරත්නය; **තිඑලද** = තීක්ෂ්ණකලබිධිය; **අපථයෙහි** = අමාර්ගයෙහි.

## 27. පිටුව.

**අගණ්‍ය** = ගිණිය නො හැකි; **පුණ්‍යසම්භාර** = කුසල රාශි; **සම්භරණය** = රැස් කිරීම; **දෙරණතල සපත්** = පොළොවට පැමිණී; **සුරගෙදික්නි** = සුරදීර්ඝිකාව; දෙව් ලොව තිබෙන මන්‍දාකිනීනදිය; ‘දික්’ යනු ‘දීඝිකා’ යන්නෙන් ද ‘නී’ යනු ‘නදී’ යන්නෙන් ද එයි. දික් වූ නි = දික්නී යි. සුරගෙවල් අසල වූ දික්නී = සුරගෙදික්නී යි. ‘ගෙදිගුවිල්’ යනු ද ‘ගෙදික්නී’ යන අර්‍ථය දෙසි- බෝගැ $72^{22}$ හි ද මෙය පෙණේ. **කරතල** = අත්ල.

**පියගමනින්** = පාගමනින්; “පදසාව ගනාවා” යනු දළාවංස (3 – 86) යි. ‘පියවි’ යනු ග්‍රාමාදිකපාඨයි. **බඳඹාඤ්ජලි** = බැඳි ඇඳිලි ඇති; **ජාතිරත්රන්** = උතුම් ජාති ඇති (ඉතා හොඳ) සවණ්; **නාස්නාපහණෙහි** = නිකශ පාෂාණයෙහි; උරගලෙහි. ‘නාස්නා’ යනු ‘නාස්’ දසින් සිද්ධ වේ. ‘තහස්නා’ යන්න කාශෙ 10 – 98, 13 – 12 යන තන්හි ද යෙදිනා. එය ‘තහස්’ දසින් සිඩ වේ. සස 273 හි “තැහැසියෙම්” යන්න හා බුත් $265^3$ හි ‘තැහැස්ම’ (තැහැසුම) යන්න ද, කාශෙ 10 – 98 හි ‘තැහැසු’ යන්න ද, ඒ දසින්

සිද්ධ ස. 'නැහැසැ' යන පූර්වක්‍රියාපදය ජාගැ 73[25] හි යෙදින. 'නහස්' දය 'නාස්' සි වේ. එයින් 'නාස්නා, නැස' යන පද සිද්ධ වේ. 'ගැටීම, පරීක්‍ෂා කිරීම, (උර) ගෑම' යනු 'නහස්' දහයෙහි අර්ථ යි. දි = තඹා; ගටා. නෑසපියා = ගා; පරීක්‍ෂා කර. ඇණ නියම = (රත්හි) පිරිසිදුබවෙහි නියමය; මාත්තුවෙහි හෝ වර්නාකමෙහි නිශ්චය; මේ 'ඇණ' සද බුත් 265[1] හි ද, සළි 245[22], 636[7] හි ද පෙණේ. අගය = නක්සේරු; ජාතිරඩගමාණිකා = කැපීම් ආදිය නැති ව බබළන මැණික. ගිනිවර කොට = රත් කොට; "හුතාසකමෙමත හිසඹරිතා" යනු දඨා (3 - 88) පාඨයි. දිප්තිමත් කරණු සඳහා මැණික් රත් කළ බව බුත් 262[26], සළි 617[10], 598[15] යනාදි තැන්වලින් ඔප්පු වේ. කිරීට= ඔටුනු. උත්තමාඩගය = උතුමඟ; හිස.

## 28. පිටුව.

මේ = මෙස. සිතාතපවාරණයෙන් = ශ්වෙතච්ඡත්‍රයෙන්; 'සිත' යනු ශ්වෙතවර්ණයට නම්. මෙය 'සීත' නොවන බව "සමුස්සිතොදරසිතාතපතෙන" යන දඨා (3 - 92) පාඨයෙන් ද ඔප්පු වේ. 'සිතාතපවාරණ' යනු එක් පොතක පෙණේ. 'සිතල වූ තොමනොත් සීතාවගේ කුඩය" යනු එහි තේරුම යි.

දළදසිරිතෙහි ධාතුවිමර්ශන නම් තෘතීයපරිච්ඡේදය යි.

---

## 4. පරිච්ඡේදය.

ඔලමොළ = චණ්ඩප්‍රචණ්ඩ; (පරෙවි 61. තිසර 151). බලමුළු = හටසමූහයා. ධීරසාර = ධෛර්‍ය්‍යවත් වූ ද සාර වූ ද; රණ = යුද්ධයට. රජුන් අතුණු = සතුරන්ගේ බඩවැල්; හිසක් = සැක නැති; විරිසිරි = වීරත්වය නමැති ශ්‍රීය; "තොසෙඹ ය විරුසිරිසඳ ඔලොම්බා", "සදවමින් දිනාවිරුසිරි තොමඳ ගුණනැණ" යනාදි ජේකප්‍රයොගයන්හි 'විරුසිරි' යි පෙණේ.

මෙහි 'විරි' යි යෙදුනේ 'සිරි' යන්න හා සමානශ්‍රැතිය ඇති කිරීම සඳහා යි. **නික්මුයේ** = 'නිකුම්' දයෙහි අගට අයන්තක් ආගම කර උකාරය ලොප් කොට සිඩ කරගත් 'නික්ම' යන දසින් සිඩ කෘදන්ත යි. (ජා $1171^{25}$ බලනු.)

## 29. පවුව.

**සුචරිත්‍රමිත්‍ර** = යහපත් චරිතයට යහළුවූ; **දමිතෙන්ද්‍රිය**= දමනය කළ ඇස්ආදි ඉඳුරන්. **සුදන්ත** = මනා සේ හික්මුනු; **සරිත්වරිත්ගුණෙන්** = චාරිත්‍රවාරිත්‍රගුණයෙන්; '**සරිත්**' නම් හැසිරිය යුතු යහපත් ගුණයි. '**වරිත්**' නම් වැළකිය යුතු දුසිරිතවලින් වැළැක්ම යි. 'සිරිත් විරිත්' යන්න මේ 'සරිත්වරිත්' යන්නෙහි නවීනරූපයයි. **හෙම මාලාභරණභූෂිත** = රන්මාලාවන්ගෙන් හා අබරණවලින් ද සැරසුනු. **රණෙදරණ** = යුද්ධිමෙහි; **නිරාධාර** = ආධාර රහිත. **අයාමෙන්** =ඇවෑමෙන්; මරණයෙන්. **විසල්වාසල් කුල් ගල්මුල්** = විශාල වූ දොරටු දැති ගල්මුල් ඇති; **නෙ ගල්** = නොයෙක් පර්වතය; **වල්** = වනය; **මලමඩුලු** = මලය මණ්ඩලය (=කඳුකර පෙදෙස් ය) යන තැන්වලට. **මෙකු** = මොහුගේ හෙවත් බිරධාර රජුගේ. මේ 'මෙකු' යන්න E Z III 64, 239, IV 204, දළදාපූජාවලී යනාදියෙහි ද පෙණේ. නවීනසංස්කරණය එය හැර දමයි. 'මෙක්' සදින් 'උ' ප්‍රත්‍යය වීමෙන් සිද්ධ යි. 'මෙක්හු' යන්න E Z 39 B[3] හි පෙණේ. **බෑන** = භගිනිය (=සහෝදරිය)ගේ පුත්‍ර; **බලඇණි** = හවසමූහය; සහස '**අවුත්** = වහා පැමිණ. **පියසුන්** = ප්‍රියභාවයෙන් ශූන්‍ය; **ධරණීපාල** = මහිපාල; රජ. **මියුඩුහුරුනල** = මුඛය උඩුකුරු කර පවත්වන වාතය; සුසුම්. **කානන** = කමනීය; සිත්කලු. **දදලසක්** = බ්‍රාහ්මණවංශයක්; 'ආඩිවෙස' යි රාජා $37^{15}$ හි පෙණේ. **නොපසිඳු** = අප්‍රසිද්ධ.

## 30. පිටුව.

**කණත සැදූ** = කණෙහි සජ්ජිත කළ; ඇසූ. **ඇදින්මක්** = ඇදිනුමක්. **පේ** = ප්‍රෙත; **පිසස්** = පිශාච; මස් කන; **නිවෙස** = වාසස්ථාන; **අනිවරණ** = කාමච්ඡන්දාදිනීවරණ රහිත. **මුනිවරණන්** = උත්තමභික්ෂූන්. **සඟු** = දත්හල නොහොත් පිහිට වන තැන. **අඹුනු** =භාජන; [රණ කරණ] **රණරණක** = [යුද්ධ කිරීමෙහි] ආශා ඇති. 'රණරණක' යනු "බලාපොරොත්තුව, ආදරණීය දෙයක් පිළිබඳ කනගාටුව, ආලයෙන් වූ පසුතැවිල්ල, ආශාව, උද්වෙගය" යන අර්ථයන්හි වැටේ. එය හුදු ව සිට 'මහසෙන්' යන්නට විශෙෂණ විය නො හැකි ය. එහෙයින් 'රණකරණ' යන්න එකතු කරණ ලදි. රණකරණයෙහි රණරණක ඇතියේ= 'රණකරණරණරණක' නම්. **පබඳපුද** – ප්‍රබන්ධ (නිරන්තර වූ) පූජා. **වනෑ සී** = සමනී ය යි. **වදන්මග** =කණෙහි. **වලවළා** = වළහමින්. **නොලස්** = ශීඝ්‍ර; **එකලා උදකලා ගමන්** = එකල්හි තනි ව යෑම; මග මගා = මාර්ග සොයා.

## 31. පිටුව.

**ගඟ** = ගඞ්ගා. මේ දඹදිව තිබෙන මහානදියකට නම්. සිංහලයෙහි දී 'ගඞ්ගා, ගං' යන දෙක ම සාමාන්‍යයෙන් සියලු නදීන්ට ම පර්‍යාය සේ යෙදේ. **තුඟු තරඟ වැලඳුලා** = උස් වූ තරඞ්ගාවලියෙන් උජ්ජ්වලිත. **මහඅමින් මිනපෙලා** = මහත් වූ බොහෝ මත්ස්‍යපඞ්ක්ති ඇති; **ගැඹුරුමහදියසැළා** = ගැඹුරු වූ මහත් දියසුළි ඇති. **සරවලා** = ශරත්කාලයෙහි වලාකුළු. **සොම්පහස්කල්...** ......=සෞම්‍යස්පර්ශයෙන් කල්‍ය (= මනෝඥ) වූ වැලිතලා වෙහි. **තෙල** = ඒ ධාතු කරඹුව. 'තෙල' සඳට 'ඒ' ය යි මෙහි අර්ථ කියුවිත් 'අර' යන අර්ථයෙහි වැටෙන්නකි. **විඩා**= තබා. **සියලිය** = සංකීර්‍යසත්‍රිය; **වෙස් වළා** = වෙස් වළහවා; (= මාරු කරවා). 'වළා' යන්න 'වළහවා' යනු සඳහා යෙදුනේ ය. මේබඳු විපර්‍යාස සුදුසු නො වේ. **ගතුරු** = ගමින්. **කලක්.........කල් යඬා** = (සවල්ප) කාලයක් ගෙවා.

එක 'කල්' යන්නක් වැනි ය. කෙළිදෙළින් = ක්‍රීඩාශාවෙන්; සිසිරස්වතුරු = වැදුරශ්මිප්‍රවාහය; ගැලූ = ගිලූ; මහනු දුළ = මහත් වූ ද උජ්ජ්වලිත වූ ද. සුනෙරගිරි = මෙරු පර්වතය. ගමනදහසින් = යන අදහසින්. දලසොවින් = දැඩි ශෝකයෙන්.

## 32. සිටුව

අස්වසා = සනසා. රළුකරළු = ඉතා කර්කශ (රෞද්‍ර) වූ. 'රළු, කරළු' යන දෙසද ම 'කර්කශ' යන අර්ථයෙහි වැටේ. එක ම අර්ථ ඇති විශේෂණශබ්ද දෙකක් එක තැන යෙදුනු විට අතිශයාර්ථයක් ලැබේ. කර්කශාර්ථ 'කරළු' සඳ 'කරල' යි කාව් 683 හි යෙදිත. මෙය 'රළුපරළු' යි ගිරා 103, දසො 102, සඳා 47019 යනාදින්හි යෙදිත. ගුරුළු = ගරුඩ; නයින් මරා කන මහාපක්ෂියෙකි. විෂ්ණු හුගේ වාහනය ලෙස සැලකෙන්නේ ද ගරුඩයෙකි. (කාව් 723, බුත් 895, ජා 1105 ද බලනු). තවසරා = තපශ්වරනා; තෙරුන්වහන්සේ. උරගරද = නාරජු. තුරුණුමණුවු වෙසක් = තරුණමනුෂ්‍යවෙශයක්. කටුපහණ = කටු හා ගල්. පෙදෙසි = ප්‍රදෙශ; පල් = පල්වල; දිය ටිකක් ඇති මඩවගුරු. සෙල්බැවිල් = ශෛලප්‍රාග්භාර; 'ප්‍රාග්භාර' යනු යට ගුහාවක් මෙන් වී මුදුනෙන් ඉදිරියට නෙරා සිටි ගල් ය. 'පබ්භාර' යන්නට 'බැහිල්' යි ධගැ 11485 හි අර්ථ කියන ලදී. සඳා 938 හි 'බැහැවිල්' යි යෙදිත. 'බැහැවිල්' යන්න 'බැවිල්' යි වී ය. 'තාමලිතති' යන්න 'තමලිතති' යි යෙදීම සුදුසු නො වේ. එය "අගමූමතුරිතා තෙ පට්ටනං තාමලිත්තිං" (දළා 4 – 41) යන්නට විරුද්ධ වෙයි. 'තාමු ලිප්ත (ප්ති)' යනු සංස්කෘත යි. එය සුහ්මදෙශයෙහි අග නුවර යි. කපිශා(කොසියා)නදියෙහි දකුණුකුවුරෙහි වී ය. දැන් 'තම්ලුක්' නම්. පුරාතනයෙහි එය සමුද්‍රාසන්නයෙහි පිහිටි නමුත් දැන් මුහුදෙන් ඈත් ය. මුහුද ගොඩ වීම ඊට හේතු ය.

## 33. සිටුව

**බවස්** = අවකාශ; ඉඩ. **නිවිරළ** = සන්හිඳුනු රළ ඇති; **එසාළ** = එකාලොක; **සුවදමුවරදින් අද** = සුගන්ධමකරන්ද යෙන් ආර්ද්‍ර (= තෙත්); සුවඳමල්පැණි සහිත. **හමුළේ ය** = හැමී ය. 'හමුරු' දසින් සිද්ධ අතීතකෘදන්ත යි. මේ ධාතුව ද භාෂාවෙන් අතුරුදන් වූවකි 'හමුළු' යි මුව 128 හි පෙණේ. කව් 266,457 ආදියෙහි පෙණෙන 'හමළ' යන්න 'හමර' 'දසින් සිද්ධ යි **යුගන්තෙහෙලන්** = යුගාන්තවාතයෙන්; ලොකය ඇති වී නැති වන තෙක් පවත්නා කාලපරිච්ඡෙදය යුගවශයෙන් හතරකට බෙදේ. කව් 47 ට ලියූ විස්තරය බලනු. ඒ හතර අවසන්හි ලොකය වැනසිය හැකි ය. එකල්හි හටගන්නා වාතය අතිභයඞ්කරවණ්ඩ ය. **දව්ටනළද** = දූවටූ; එකට ඇඹුරූ. **කුලගිරිපම්පරාවක්** – කුලපර්වතපඞ්ක්තියක්; දඹදිව ඒ ඒ ප්‍රදෙශයෙහි පිහිටි මහෙන්ද්‍ර, මලය, සහ්‍ය, ශුක්තිමත්, ඍක්‍ෂ, විනධ්‍ය, පාරියාත්‍ර යන පර්වත හත නොහොත් මහමෙර අවට පිහිටි සේ සැලකෙන යුගන්ධර, ඊෂධර, කරවීක, සුදර්ශන, නෙමින්ධර, විනතක, අශ්වකර්ණ යන හත කුලගිරි නම් වේ. **දුවල** = ද්‍රොණ; උස් වූ; ගුගුල = ගිගිරූ; **එවට** = ඒ හාත්පස්හි; **පනද** = දෙවෙති දින. **උදගිරි** = උදයපර්වතයාගේ; **සද** = සරතා; **දිනිඳු** = සූර්යයා; **පිරිගම්** = පරිඝමී; (ඉඳුනිල්මිණි) ඇල්ලීම. **වතල** = පැතිරුණු; **මුවරදනඳ මදමත්** = මකරන්දයෙන් ආනන්දිත වූ මදයෙන් මත් වූ; **සිරිසර** ......= ශ්‍රීසාර ප්‍රභාස්වර (බබලන) උතුම් දෙවියන්ගේ විලාසය ගෙණ. **ලියදඬුවැටපහන්** = ලියපහන් හා දඬුවැට පහන්; '**ලිය පහන්**' නම් වැලක් මෙන් සෑදූ කඳ ඇති පහන් ය. '**දඬුවැට පහන්**' නම් පන්දම් ය **සුපුල්** = මනාව පිපුනු; **කඩුපුල්** = නාලොව ඇතැයි සැලකෙන පුෂ්පවර්ගයක් (සලි 409[85], කව් 272 බලනු) **මහගුගුමුහු** = මහාඝොෂමුද්ගහ (= කරඬු, හෙප්පු); **ලයාන්විත** = ලයයෙන් යුක්ත; 'ලය' නම් ගායන වාදන නර්තන යන්හි සම වූ කාලප්‍රමාණසඞ්ඛ්‍යාතතාලය යි **පසගතුරු** = පඤ්චාඞ්ගිකතූර්යයි; ආතත, විතත, ආතතවිතත, ඝන, ශුෂිර යන පස **උරගමුළු** = නාගසමූහයා; **රිදීරසධාරා** = රිදීදිය වැල්; **නිමල් තරරස්පතර** = ඉතා නිර්මල වූ රශ්මිසමූහය

## 34. පිටුව

**රදලිය** = රාජකාන්තාවගේ; **ජයමපති** = අඹුසැමි; **නභොමධ්‍යගත** = අහස්මැදට ගිය; **අචල** = නිශ්චල; **විමාන** = ගගනයාන; ආකාශයාත්‍රා; **දලසෝ** = දුක් ශොකයට; **පස්වණක්වලා** = නීලපීතාදි පස් වැදෑරුම් වර්ණ ඇති වලාකුළු; **විප්‍රකාර** = විකාර; විරුද්ධ හෝ විවිධ ක්‍රියා. **වනරාජ** = ජලයට රජ වූ; **සරාසරාවලාකුළු** = ප්‍රභා සහිත ශරද්වලාහකකූටයන්; **තරල** = චඤ්චල; **ලකල** = අලඞ්කෘත; **ලෙල** = ලීලොපෙත. **අඹරතුර** = අහස අතර; **ජායාපති** = ජයම්පති; **සුරුසෙන්** = ශූර වූ සෙනාව; **දෙව්තුරු එකතරම්** = දිව්‍ය(=කල්ප)වෘක්ෂයක් හා එක් සම වූ; **සව්ඳසුරුව්තුරු මේයුරු** = සියලු ඓශ්වර්‍ය්‍ය කැමැති ප්‍රවාහයට (=ගංවතුරට) මෙසයක් වැනි; **දියත පත් කිත්සිරින් ඉතිරි** = ලොකයෙහි අනන්තයට පැමිණි කීර්තිශ්‍රියෙන් උතුරාගිය; **තුටුපහටු දන** = තුෂ්ට ප්‍රහෘෂ්ට ජනයා ඇති; **නොපමි** = පටු නො වූ; **පව්මු**.. ...= පාපිෂ්ඨ වූ කිලුටෙහි (**කුමුවු** =) ගැලුනු අරිෂ්ට නිගණ්ඨයන් විසින් (**අදිමු** =) අදෘෂ්ට වූ. **මාවටු පවුන්** = මහන්තාරම් වෙරලෙහි පිහිටි නැව් තොටකැ යි කියනු ලැබේ.

**දළදාසිරිතෙහි ලඞ්කාවට ගොඩ බැසීම් නම් සතරවන පරිච්ඡෙදය යි.**

---

## 5. පරිච්ඡෙදය

## 35. පිටුව

**නවස්** = නිවාස; නවාතැන්. **සිවුවෙද** = සෘග්, යජුස්; සාමන්, අථර්වන් යන වෙද සතර; **නිපුණ** = පුහුණු; **අන්න** = ආහාර; **සම්භාවනා** = බුහුමන්; සැලකිලි. **සුරිඳුපුර** = ශක්‍රපුරයට; දෙව්ලොවට. **කණිත ගෙත** = කණෙහි වැටෙන විට; **අදවන දවන** = හෘදයවාසතුව දවන කල්හි (කවි 75 බලනු). **සාත** = කාන්තාව; **මුසපත්** = මූර්ඡාප්‍රාප්ත; **පබඳ නොමඳ රජ සිරි** = ප්‍රබන්ධ වූ (=නො කැඩුනු; අතර නැති) අමන්ද වූ (බොහෝ) රාජ්‍යශ්‍රිය. **තුරු නෙවුනා** = වෘක්ෂයන් වැජඹෙන; **නෝසිරි සපිරි** = නොයෙක් ශ්‍රිය සම්පූර්ණ වූ; **වෙහිරිවෙහෙර**

මෙඝගිරි විහාරය; මහමෙවුනා උයන මැද ද 'මේඝගිරි' නම් විහාරයක් තුබුනු බව මෙයින් හැගේ. මෙය කීර්තිශ්‍රීමෙඝ රජතුමා විසින් කරවූවකැයි සැලකිය හැකි ය. අනුරාධපුරයට උතුරුදෙසින් ද 'මෙඝගිරි' නම් විහාරයක් තුබුනුබව E Z. I 158 හි පෙණෙන "බමුණක්කුම්බරබි බෙහෙද්ගෙට් දුන් උතුර්මෙගිගිවත්තව්" යන්නෙන් හැගේ. දුන් කිරිබත්වෙහෙර ය යි ප්‍රසිද්ධ නටබුන් සෑය පිහිටා තිබෙන්නේ මේ 'මේගිරි' වෙහෙරට අයත් භූමියෙහි ය 'මේගිරි' යන්න 'උතුර්' යන්නෙන් වෙසෙසූ හෙයින් 'දකුණ්'මේගිරියක් ද පැවතිබව ස්ඵුට වේ. දකුණුමේගිරිවෙහෙර වූයේ මහමෙවුනාඋයන මැද ය යි දළදාසිරිතෙහි හැගේ. **මුනිවරණ** = මුනිවරණයන් වහන්සේගේ; උතුම් බුදුරජාණන් වහන්සේගේ; මෙහි 'වරණ' සද උත්තමාර්ථ දෙයි. ඒ සද හුදු ව සිටිවිට හස්ත්‍යර්ථයෙහි වැටේ. **සිරිසරණ** = ශ්‍රීපාදය; **සරණ** = පිහිට; **වරණ** = වැළැක්වීම; **අරණ** = කෙලෙස් නැති හෙයින් නොහොත් යුද්ධරහිත. **බරණ** = ආභරණ. **සමඟ සියසඳ විදියම්හ** = සමග වූ (=සියලු) සවකීයඡන්දය (=තමන්ගේ අදහස) වින්දමු

**සවණ සඳ** = අසා; **පිරිවෙණ** = ආවාසය; 'පිරිවෙන්' සද දුන් 'භික්ෂූන්ගේ විද්‍යාස්ථානය' යන අර්ථයෙහි යෙදෙතත් පුරාතනයෙහි ආරාමයක් තුළ ප්‍රාකාරාදියකින් වට කළ ආවාසය සඳහා යෙදුනේ ය. **කල්** = වෙල; වස්ත්‍ර; **පටපිළිතිර**=පටිරෙදියෙන් කළ තිර; **මහරහ**= මහාර්ඝ; බොහෝවටනා; **අක්සුණු** = අනුශාණී; ඉදිරියෙහි බදින කඩතුරා. මෙය 'අක්සත්' යි රුවන් 301 හි පෙණේ. සිය 349 හි අක්සුණු යන්න ම යෙදින. **මහරුක්** = පොල්; **පහන්සිතින්** = ප්‍රසන්න චිත්තයෙන්; **මලොලදම්** = එල්ලෙන මල්දම්. **බුමුතුරුණු** = භූම්‍යස්තරණ; බිම එලන පලස්; **කොඳුපලස්** = දික්ලොම් ඇති පලස්වෙසෙසකි. 'කොජව' යන්නෙන් 'කොඳු' යි බිඳේ.

## 36. සිවුව

**සඟුරුවනක්** = භික්ෂු නමක්; **අනඟ**[රඟ] **රඟරඟා** = අනඞ්ගරඞ්ග (= කාමෝත්පාදක ක්‍රීඩා) කරමින්; **වරඟ** = උතුම් ශරීර ඇති; **නන්පුරඟනන්** = නොයෙක් පුරාඞ්ගනාවන්; **පුරදුරු** = ශක්‍රයා, **වසත්කල** = වසන්තකාලය; බක් වෙසක් දෙමස වසන්තයයි. **සපත් කල** = සම්ප්‍රාප්ත කල්හි; **වසත් කෙළිය** = වසන්තක්‍රීඩාවෙහි; වසන්තකාලයෙහි කරණ ක්‍රීඩෝත්සවයෙහි; **දෙළින්** = ආශාවෙන්; **වදන් මිණ් කොඬොලින්** = වචන නමැති මණිකුණ්ඩලයෙන්; කුණ්ඩලය නම් කණෙහි පලඳින ආභරණයකි. **වදන්මග**= කණ; වචන ඇතුලට යෑමට උපකාර වන හෙයින් කණ එනම් වේ. **සොම්නසින්** [වන්]= සතුටින් වැදූනු (= ඇති වූ); **ලොමුදහෙන් සන් ව** = රෝමෝද්ගමයෙන් (ලොම් කෙළින් සිටුමෙන්) ජනන ව (= වැසී); **පියගමනින්** = පාගමනින්; "සද්ධා අගඤ්ජි **පදසාව** පසන්නාචිත්තො" යනු දළා (5-13 පාඨයි. 'පදසා' යන්නෙහි අර්ථය 'පයින්' යනුයි. 'පියවිගමන්' නම් ප්‍රකෘතික (= ස්වාභාවික) ගමනයි, සුහු ව ගමන් කරන්නෙක් පියවිගමනක් නො ම කරයි. එහෙයින් 'පියවි' යන පාඨය වැරදියි. **අනුතුරු** = දකුණු; මේ සඳහා මුද්‍රිත පොත්හි යෙදුනේ 'උතුරු' යන්නයි රජතුමා අනුරාධපුරයෙන් ගියේ මහමෙවුනා උයනට ය. මහමෙවුනාඋයන අනුරාධපුරයෙන් දකුණුදෙස පිහිටියකි. අනුරාධපුරයෙහි දකුණුදෙරටුව අසල ම නන්දනවනය වී ය. (මහා 15 - 1 බලනු). නන්දනවනයට දකුණෙන් මහමෙවුනා උයන පිහිටියේ ය. (මහා 15 - 11). ශ්‍රීමහාබෝධිය වැඩම කළ පෙරහර අනුරාධපුරයෙහි දකුණුදෙරින් නික්ම මහමෙවුනා උයනට ගියබව මහා 19 - 40 හි සඳහන් වේ. එහෙයින් මෙහි 'උතුරුවාසල්දෙරින් ගොස්' යනු වැරදි ය. දකුණෙහි පිහිටි මහමෙවුනා උයනට උතුරුවාසල්දෙරින් නික්ම යෑම පරංගියා කෝට්ටේට ගිය ගමන වැන්නකි. 'උතුරු' යන්නෙහි සදෙස්බව ස්ඵුට වීමට මීට වඩා කරුණු අනවශ්‍ය යි. මෙහි කතුතුමා යොදන්ට ඇත්තේ 'අනුතුරු'

යනු දක්වන ලදී. දළදා පි 13 හි ද "තස්සානුරාධනගරස්ස පරුත්තරාය දිසාය" යනු වෙන් 'උතුරෙන් පර (= දකුණු) දිසාවෙහි' පිහිටි මේඝගිරිවිහාරයට ගිය බව කියන ලදී. උතුරු නො වූයේ හෙයින් උතුරට විරුද්ධ වූයේ 'අනුතුරු' යි. දකුණු දකුණයි. මේ 'අනුතුරු' සඳ මේ අර්ථයෙහි සැල 13 සිංහල ලිපියෙහි. මුද්‍රිත දෘඨාවංශයෙහි 'පුරුත්තරාය' යන්න පෙනේ. සන්නයෙහි ඊට 'ඊශානදිගැ'යි ද අර්ථ කියන ලදී. නැගෙනහිරට හා උතුරටත් අතර වූ අනුදිශාව 'ඊශාන' නම්. පූර්විදිශාවාචී 'පුර' ශබ්දයක් නොමැති යි. ඉදිරිපිට යන අර්ථ ඇති 'පුරෙ' යන නිපාතයක් නම් තිබේ. 'නගරස්ස' යි මීට මුලින් යෙදුනු හෙයින් 'පුරයෙන් උතුරෙහි' යි ද අර්ථ කිය නො හැකි ය. එහෙයින් එය 'පරුත්තරා' යන්න සඳහා වරදවා ලියූ වචනයකැයි නිගමනය කළ යුතු ය. 'පුරුත්තරා' යන්නත් නිවැරදි නම්' 'ඊශානදිග' යන අර්ථයත් ගත හැකි නම්, රජතුමා ගියේත් උතුරුමේඝගිරි වෙහෙරට ම නම්, මෙහි අප විසින් යෙදූ 'අනුතුරු' යන්න වැරදි ය. එය 'උතුරු' යි විය යුතු ය. එය 'උතුරු' වන විට $35^{13,14}$ හි "මහමෙවුනාඋයන්මැද" යන්න පොතෙන් බැහැර කළ යුතු ය. මෙහි "මහමෙවුනා වෙහෙර" යන්න "මේඝගිරිවෙහෙර" යි සකස් කළ යුතු ය. "වාසල් දෙරින් හොස්" යන්න "වාසල්දෙරින් නික්ම" යි යෙදුනොත් සුදුසු ය. 'ගොස්' යන්න මුල ද තිබෙන හෙයිනි. 'මහමෙවුනා වෙහෙර' යන්න ප්‍රාමාදිකයෙකි. එය "මහමෙවුනා මේඝගිරිවෙහෙර'යි සකස් කළ යුතු ය. "මහාමෙඝවනයෙහි මෙඝගිරිවිහාරය" යනු අර්ථ යි. **දම්අමාවතුරෙහි** = ධර්මය නමැති අමෘතප්‍රවාහයෙහි; පුවල ........= මහත් වූ මාණික්‍යයන්ගේ කාන්තියෙන් උජ්ජ්වලිත කිරිටකූටයෙන් අලඞ්කෘත කළ උත්තමාඞ්ගයෙන් (= හිසින්) ද දීප්තිමත් වූ භූකාන්තා සුවර්ණ රත්න (යන මොවුන් උපදනා) ආකරයන්ගෙන් යුක්ත; 'ආර' යනු 'ආකර' යන්නෙන් බිඳී එයි (ධ ප්‍ර $313^1$, බලනු). **ඒ මොනවකැයි** = ඒ කුමක් දැයි; මේ 'මොනවක' යන්න කථාව්‍යවහාරයෙහි මිස මෙයින් අන්‍ය පැරණි

පොතක නො දුක්හෙමු. නිශවතෙක් පසස්සි සි = සඳුණ වනාන්තයෙක් ප්‍රශංසා කෙරේ ද යි. 'පසස්සි' යනු 'පසස්' දසින් සිද්ධ යි. 'වස්, බස්, දන්, ගන්' ආදි ධාතූන්ගෙන් වර්තමාන 'ඉ' පස පරකල්හි පූර්වව්‍යඤ්ජනයට ද්විත්ව වී ය. වර්තමානයෙහි 'පසසී' වසී, බසී, දනී, ගණී' යන ලෙසින් යෙදේ. පුදමෙවෙසස්කුහුල්ලොබයදින් = පූජාවිශෙෂයන්හි ආශාව හා ලොභය ද සහිත චිත්තයෙන්; මෙහි 'කුහුල්' නම් තමන් ම කිරීමේ කැමැත්ත යි. 'ලොබ' නම් අනුන්ට නො දීමේ කැමැත්ත යි.

## 37 පිටුව

**දෙරණ** = ධරණිය; පොළොව; **කෙත් කරන්** = කුඹුරු කරතොත්; **නොසමත්** = අසමර්ථ; **සමත්පමණින්** = සමර්ථප්‍රමාණයෙන්; **සසුන්ගෙන** = ශස්‍යයන්ගෙන්; **බලමතින් වත්** = ශක්තිප්‍රමාණයෙන් වත්; **උළිඳු** = සඳ; 'උළු' යනු තරුවලට නම්. ඊට ඉන්ද්‍ර (=ප්‍රධාන) වන හෙයින් සඳ එනම් වී ය. **සුසුකකදළයන** = ඉතා ශුක්ල (=සුදු) වූ දළා ඇතියන **සහතර.........** = ප්‍රභා සහිත තාරකා ය, දීප්තිමත් මුතු ය යන මොවුන්ගේ රශ්මිවිලාස ඇති; **මලිනවන්පැහැ වනුවට** = කිලුටු වර්ණයෙන් යුතු ප්‍රභාව වීමට; **කුහුල්** = සැක සහිත; 'කුහුල්' සද 'සැකය, ආශාව' යන අර්ථයන්හි වැටේ (රුවන් 532). **රජනිකර** = චන්ද්‍රයාගේ; 'රජනි' සද රාත්‍රිපර්යායය යි. **කරනිකර** = රශ්මි සමූහයක් සේ; **ධවල** = සුදු; **අඹරොදරයට** = අහස්කුසට; **පැහැනද** = ප්‍රභායෙන් ආර්ද්‍ර වූ; 'පැහැන්' යනු 'පැහැ' සදින් 'නි' පිබත් ව සිද්ධ යි. කව් 209, සිය 88, 117. ධප්‍ර :$81^{32}$ බලනු **මුනිඳුරද** = මුනීන්ද්‍රදන්තය; **සළුපිළිපට** = සළුරෙදි පටවල්; **නො ලසා** = වහා; **බිඟි** = පිටත්; **කොඳ** = එනම් මල්; මේ මල්වෙසෙස සන්ධ්‍යාකාලයෙහි පිපේ. **කුමුදු** = හෙලුපුල්; **කිරිමුහුදු** = ක්ෂීරසාගරය යන මොවුන්ගේ..

## 38. පිටුව

**සුසිරිමත්** = යහපත් වූ ශ්‍රීයෙන් යුක්ත; මෙහි 'සසිරි මත්' යන පාඨය පෙණේ. ඒ වැරදි ය. 'සසිරි, සිරිමත්' යන දෙකම සමානාර්ථ ය. එහෙයින් 'සසිරි' යන්නෙන් 'ඇති' යන අර්ථ ඇති 'මත්' ප්‍රත්‍යය යෙදීම අනවශ්‍ය ය. 'සසිරිමත්' යන්නෙහි තේරුම නම් 'ශ්‍රී සහිතයක් ඇති' යනු යි. ඒ අර්ථය ගන්නා විට ශ්‍රිය පවත්නේ කුඹයෙහි නො ව ඊට අයත් යම් කිසිවක ය යනු හැඟේ. **රජාඞගණයෙහි** = රජගෙදර මිදුලෙහි; **භද්‍ර** = යහපත්; **භද්‍රාසන** = වේවැලින් තැනූ ආසනය; **මි** = මහිෂ; මීහරක්. **නෙතුරු පතරින්** = නොයෙක් වංශසමූහයෙන්; **ඉරසඳකිම් ගම්බිම් කිම් පමුණුවා** = සූර්යචන්ද්‍රයන් සීමා කොට (= ඉර සඳ පවත්නා තෙක් අයිති වන සේ) ගම්බිම්හි හිමිබව දී; 'කිම්' යන්න මෙහි භාවප්‍රධාන කොට යෙදූ සේ හැඟේ. "**කිම් පමුණුවා**" යන්නට 'මාසිම් ඇති කොට' යි ද අර්ථ කිය හැකි ය. **විසිතුරු** = විචිත්‍ර; **වතුරු** = වස්ත්‍ර; **ඉසුරු** = ඓශ්වර්ය; **ලෙ ගන්වා** = සිත ගන්වා; සිත සතුටු කරවා; **සගන්වා** = සංග්‍රහ කරවා; **රජනුවර** = රාජධානිය; රජු වසන නුවර. **සෙණ්ඩුවාලිසට** = රජගෙදර මිදුලට; රජගෙයට යා ව පිහිටි, අසුන් පුහුණු කිරීම් ආදිය සඳහා යෙදෙන, මහ පිට්ටනියට. මෙය දෙමළෙහි "ශෙණ්ඩුවෙළි" යි පෙණේ. (T.L. 1585). 'සෙණ්ඩුවාලු' යි සැලි $241^{10}$, $436^{25}$ උමන්දා $5^{7}$ හි යෙදින. **උකටලි ව** = උත්කණ්ඨා සහිත වී; කැමැති වූ දෙය ඉක්මනින් නො ලැබීම නො ඉවසන, හිත තවන, ගතිය උත්කණ්ඨාව යි. **දහම්සුරු** = ධර්මයට අධිපති; **ඉගිල්කුහුල්** = බුරුල් වූ සැක ඇති ව, (=සැක නැති ව); **කුහුල් ව** = ආශා සහිත ව.

## 39. පිටුව

**සමග කැරැ** = රැස් කොට. **මිපලුන්** = මහීපාලයන්; රජුන්. **අනුනය** = කැමැත්ත; රුචිය. **පිළිබෙව** = ප්‍රති

**කෙළපය; සියසඳින්** = තමාගේ සිතින්; **මහවෙ කොවෙ ඒපුර වෙ** = මහාවීථි ක්ෂුද්‍රවීථි යන ඒ නගරයෙහි වීථි. **පියා** = හැර; **විසල සල මුතුලැලින්** = විශාල වූ චඤ්චල වූ මුතුවැල් වලින්; **ගඟ තරඟපෙළරඟ** = ගඞ්ගාවෙහි තරඞ්ගපඞ්ක්තිය මෙන්; **රන්රිදීදද අමුතු කල** = සුවර්ණරජතධ්වජයන් අමුණන ලද; රන්රිදීදද සහිත. **දිමුතු**........= දීප්තිමත් මුතුවලින් ලීලොපෙත ප්‍රවාලධ්වජපඞ්ක්තියෙන්; **කළුවැල්** = දවනවිට සුවඳ නික්මෙන 'කාලාගරු' නම් ද්‍රව්‍යය. **තුවරලං** = 'තගර' නම් ලාටු; කච්චකුමඤ්ජල්. **දෙනලද** = දැමූ; **දුමලොසුපෙළින්** = ධූමකටච්ඡුපඞ්ක්තියෙන්; ධූමකටච්ඡු නම් අගුරුකබල් ය. අමා 152[8] හි ද මෙය පෙණේ. ධගැ 135[5] හි 'ධූමලොසු (අභධා–දුමලොසු)' යි ද, කඩා 107[8] හි 'දුමොලොසු' යි ද, සදා 764[84] හි දුඹුලොසු' යි ද පෙණේ. **දුම්සලා** = දුම්සුළි; **සුදින දුදින කෙරමින්** = යහපත්දවස නරකදවසක් කරමින්; 'සුදින' නම් වැහිවලාකුළු නැති, සූර්‍ය්‍යාලොකය ඇති දවස් ය. 'දුදින' නම් වැහිවලාකුළු සහිත අඳුරුදවස් ය. එදා ධාතුපූජාව සඳහා නංවනලද සුවඳදුම්කඳ අහසට ගොස් සූර්‍ය්‍යයා ද වැසී ය. එහෙයින් වැහි නැති වූ එදින වැලලි දිනක් මෙන් වී ය. "දුදින සුදින කෙරෙමින්" යන පාඨය වැරදි යි. දුම්වලින් දුදිනක් සුදිනක් කළ නො හැකි ය. **බැඟෑ** = දීන; විඩාපත්. **අතුරු නොව** = අතරක් නැති ව; **රුකුළුකුළු** = රුකුල් දුන් මුදුන් ඇති; **දිගාදිගපිළිගෙය සියනෑ උදුල** = දික් වූ ද නොදික් වූ ද වසන්ත්‍රගෘහයන්හි (කූඩාරම්වල) ඡදනයන්හි (= වහලවල) උජ්ජ්වලිත.

## 40. පිටුව

**රන්කෙහෙල්ලෙන්** = රන්කොඩියෙන්; **ඈනෙන්** = යන මේ ආදියෙන්; **අමරපුර** = දෙව්ලොව; **රජගමෙණ** = රජුන්ගේ අග්‍රමාණික්‍යය; රාජාධිරාජයා. **ඵුස්සරථය** = රජතුමා උත්සවදිනයන්හි ගමන් කරන රථය; සංස්කෘතයෙහි 'පුෂ්පරථ, පුෂ්‍යරථ' යනුවෙන් දක්වෙන්නේ

මෙය යි. **කුමුදුවන්පැහැනදන්** = කුමුදවණ් (=සුදු) පැහැයෙන් මනොඥ. **සොම්වදන්** = සෞම්‍යමුඛ ඇති; **සොඳගමන්** = යහපත්ගමන් ඇති; **දුකු** = දුඃඛය; 'දුකු' යනු ම ප්‍රකෘති යි. **කොමල**........ = කොමල (=මොළොක්) ලීලොපෙත ප්‍රභාව (වතල =) පැතුරුණු උජ්ජ්වලිත ප්‍රෙමස් දෑස වූ; **බුමුගු** = කරඬු; හෙප්පු. **මදමත්මතඟ** = මදයෙන් මත් වූ මාතඞ්ග (=ඇත්) ය, **තුඟුතුරඟ** = උස් වූ තුරඞ්ග (=අස්)ය; **දෙපස තුරු**= උභයපාර්ශ්වය අතරෙහි; දෙ පැත්තෙහි. **සඳලුතලෙ**= චන්ද්‍රිකාස්ථලයන්හි; **රුවන නනබරණමල්රැසින්** = රත්න නානාභරණපුෂ්පරාශියෙන්; **නිකුත්** = පිටත් වූ.

**සඳවලානතින්** =සන්ධ්‍යාවලාහකයක් තුළින්; **සිසිලේ** = චන්ද්‍රලේඛාව; සඳකඩ. **දුරගමිණි** = ජාතිරඞ්ගමාණික්‍යය; **කොපුර** = නගරවාරයෙහි තැනූ තොරණ; **මනොනඳනය** = සිත සතුටු.

### 41· පිටුව

**මිණිරුවන්** = මාණික්‍යරත්න වූ; **මොහඳුරට** =මොහාන්ධකාරයට; **දිවි ලබලබ**= ජීවිතලාභයෙහි ලාභය; ජීවිතය ලැබීමේ ඵලය; **වහල්සරක්** =වාලුත් හා හරකුත්; **උතුරුවෙහෙරට** = අභයගිරිවිහාරයට; (මහා 37 – 46). එය අනුරාධපුරයට උතුරින් පිහිටියේ ය.

**දළදාසිරිතෙහි පූජාවිශෙෂනිර්දෙශ නම්**
**පඤ්චමපරිච්ඡෙදය යි.**

---

## 6. පරිච්ඡෙදය

**පරපුරෙන් රජ පැමිණි** = පරම්පරාවෙන් රාජ්‍යයට පැමිණි; **බුජස්** = බුද්ධදාස. **ගත්** = ග්‍රන්ථ; මෙහි ග්‍රන්ථයක් ලෙස හැඟෙන්නේ අකුරු දෙතිසක් ඇති පද්‍යයකි. පද්‍ය නුවූ වත් එපමණ අකුරු ඇති වාක්‍යප්‍රදෙශය ද ගත් සේ පැරණියෝ ගත්හ.

## 42, 43. පිටු

**සබඳ** = මිත්‍ර; **උපුල්වන්දෙව්** = උත්පලවර්ණදෙව; මෙ විෂ්ණු නො වේ.

(43) **අත් ගෙණ** = අයිතිය ගෙණ; **අරමණයෙන්** = බුරුමරටින්; බුරුමයට යාව පිහිටි 'පේගු' නම් ප්‍රදෙශය ද 'අරමණ' නාමයෙන් ප්‍රසිද්ධ වී ය. **මහසඟන** = මහාසඞ්ඝයා; මුද්‍රිත පොත්හි 'මහසෙනඟ' යි පෙණේ. එය මහාවංශාදි ඉතිහාසග්‍රන්ථයන්ට විරුද්ධ ය. **නො වළා** = නො වළහා; නො වරද්ද. **නකාහෙද** = නිකායභෙද; **මාලුකමක්** = උපසම්පදකර්මයක්; සාමණෙර භික්ෂූන් උපසපන් කරවීම; **තුලාභාර දිම්** = තරාදියෙහි එක් තටුවකට තමා නැගී තමාගේ බරට සම වන සේ අනික් තටුවෙහි ධනය පුරවා පිණට දීම. **මඟුල් සිවුසැටක්** = උත්සව හැටහතරක්; පූජා 73[34] හි "වෙනක්කෙළියක් දියකෙළියක්" යන දෙක ද එකතු කර "යනාදි වූ සූසැටමඟුල්"යි කියන ලදී. සූසැට ම දක්වූ තැනක් නො දක්කෙමු. **පෙත්සක්** = පෙතිකඩක්; බුද්ධරූප ඇඳි වස්ත්‍රයක්. **බළමුළක්** = භටසමූහයක්; **මරා** = තළා; **මුතුමිණිගිගිණ්** = මුක්තාමාණික්‍ය ගහන වූ.

## 44 පිටුව.

**අපාය** = අභිවෘද්ධිය; මෙහි අනභිවෘද්ධියට හේතු වන අයහපත හෙවත් පාපය ගැණේ. **අකුරු කරවා** = අක්ෂර (= ශාස්ත්‍ර) උගන්වා. **පරවිපිලි වූ පසු** = මැරුණු පසු; 'පරවිපිලි' යනු වියොගයෙහි රුවන් 3[3] හි ද, 'පරබිඹුබ' යන අර්ථයෙහි සිඛ 3[30] හි හා කව් 715 හි ද යොදන ලදී. (කව් 715 හි ලියූ විස්තරය බලනු). **පැරකුම්විකුම්** = පරාක්‍රම (= ශරීර ශක්තිය හෝ බලය) හා වික්‍රම (ශූරභාවය හෝ සාමර්ථ්‍යය) ඇති. **වඩුදෙරියන්** = වඩුරියන් දෙකක්. වඩුර්‍යනකට ඉංග්‍රිසි අඟල් 28 ක් පමණ වනබව මයමතයෙන් හැගේ. **ජාතපුරය** = උපන්නගරය. මෙය මෙහි 'ශ්‍රීවර්ධන පුරය'යි කියන ලද නමුත් 'නැම්බඹර' නමින් ප්‍රසිද්ධ වී ය. දඹ 7[25] හි "තමන්

උපන් තැම්බඹර සිට දඹදෙණිය දක්වා" යන පාඨයෙන් ඒ බව පැහැදිලි වේ. දැන් එනමින් ගමක් නැතත් දඹදෙණියේ සිට හැතපුම් අටකට පමණ දුරින් කලුන්දව නම් ගමට බටහිරින් 'තන්බඹර' නම් කුඹුරක් ද ගලක් හා පොකුණක් ද තිබේ ල. (දඹ 7 - අබොලිපිය බලනු). **තාමලිංගමුරට** = ඉන්දියාවේ පිහිටි තාමලිත්ති පටුන ප්‍රධාන කොට වූ ප්‍රදේශය.

## 45. පිටුව

**තෙර මාතෙර අයතැන් ආදිපදවි** = උපසම්පදාවෙන් දසවස් පිරුණු, ආචාර්යනිශ්‍රයෙන් ධර්මවිනය උගත්, භික්ෂූන්ට සම්මත කරණ ස්ථවිරපදවිය, විසිවස් පිරුණු ස්ථවිරවරුන්ට සම්මත කරණ මහාස්ථවිරපදවිය, ආයතන හෙවත් විහාරස්ථාන සම්බන්ධ ප්‍රධානපදවිය යන ආදි පදවි; **පමුණුවා** = පත් කරවා. **කපුහෙයෙහි පටන්** = කපු කැඩීමේ පටන්; **එක්දා** = එක ම දවසෙහි; කපු කැඩීම, නෙළීම, නූල් කැටීම, වියීම ආදිය එක ම දවසෙහි කරවා සිවුරු පිළි වියවී ය. (පූජා 744[26]) **කෙළින් සිවුරු** = කඨින චීවර; වස් වසා පවාරණය කළ භික්ෂූන්ට පූජා කරණ සිවුරු. **අතුරුවා** = අත්ථරණය කරවා; එය කඨිනචීවරය ලැබූ භික්ෂූන් විසින් කළ යුතු විනයකර්මයකි. ශික්ෂාපද පසකින් කළ තහනම් හේමන්තඍතුව අවසන් වන තෙක් ඒ කඨිනය ඇතිරූ ද විනයානුකූල ලෙස ඊට සම්බන්ධ වූ ද භික්ෂූන්ට වලංගු නො වේ. **ඉකුත් සඳ** = මළකල්හි; දැනුදු 'මළ' යන අර්ථයෙහි මේ සද සමහර පලාත්වල ව්‍යවහාර වේ. සමහරු 'උකුත්' යයි ද කියති. (රාජා 24[12] බලනු). **ලොවෙකබාහු** = ලොවට එක ම බාහුවක් (= අතක්) වැනි වූ; **ඈපා** = ආදිපාද; 'ඈපා' යන්න පුරාතනයෙහි 'අය පා' යි ව්‍යවහාර වී ය. එය 'අය්‍ය + පාද' (= ගෞරවාර්හ ආර්ය) යන ශබ්දයෙන් ආවකි. මහාවංශකර්තෘතුමා ඒබව නො සලකා ඒ 'ඈ' යන්න 'ආදි' යන්නෙන් බිඳුනකැ යි සිතා එය 'ආදිපාද' ය යි පාළියට නැගී ය. (E. Z. III. 82 පිටුව බලනු). **මාපා** =

මහාදිපාද; රාජකුමාරවරු 'ඈපා' නම් ද ඔවුන්ගෙන් රාජ්‍යයට හිමි ප්‍රධානයා 'මාපා' නම් ද වූහ. **රිස්වි** = රුචි ඇති වී ය; නොහොත් රුචි කෙළේ ය.

**රාජ්‍යාන්තරයෙහි** = රාජ්‍යය අතර; රාජ්‍යකාලයෙහි. **රට** = පිටරට; මෙහි 'පඬු'රට ගැණේ. **ශ්‍රීනිවාසබාහු** = ශ්‍රියට (=සම්පතට) වාසස්ථාන වූ බාහු ඇති; **අමිනිසබාහු** = අසමාන බාහු ඇති; **පැරකුම්බා** = පැරකුම්බාහුරජුගේ. **විකුම්බා** = වික්‍රමයෙන් යුක් බාහුව. **ඔබා** = මර්දනය කොට; පරදවා. **දිය** = ජය.

## 46. පිටුව

**මාහිමි** = මහාස්වාමි; පුරාතනයෙහි සංඝරාජයන්වහන්සේට පමණක් මේ වචනය ව්‍යවහාර වී ය. 'මාහිමි කිරීම' නම් සංඝරාජපදවියට සුදුසු මහාස්ථවිරයන්වහන්සේ නමක් පත් කිරීම යි. පුරාතනයෙහි රජුන් විසින් ම ඒ පදවිය පත් කළ බව මෙයින් ද හැඟේ

**දළදාසිරිතෙහි රාජාවලිනිර්දේශ නම්**
**ෂෂ්ඨපරිච්ඡේදය යි.**

---

## 7. පරිච්ඡේදය

**සපිරිපිරිසිරින්** = (ජලයෙන්) සම්පූර්ණ වූ පරිඛාශ්‍රීයෙන්; 'පරිඛා' නම් දිය අගළ යි. **අට්ටාල** = අටලු; ඈත එන සතුරන් ගැණ සොයනු සඳහා නගරප්‍රාකාරාදිය මත්තෙහි තනනු ලබන උස්ගෙවල්විශේෂයක්. ගස්මත්තෙහි තැනූ මැස්සට ද සමහර තැන 'අට්ටාල' යි ව්‍යවහාර වී ය ( ජා 58[14] ). මෙය දෙමළෙන් ආවක් ලෙස සමහරුන් උගන්වතත් පාලි සංස්කෘත භාෂා දෙක්හි ම තිබෙන්නකි. **වට** = නාත්පස්හි; **වෙච්චම්** = 75 වන පිටුවෙහි විස්තර කරණ ලදී. **ඉඩංගණ්** = නගරයට පහර දීමට පැමිණෙන සතුරන් දෙසට ගල් විදීම සඳහා නගරප්‍රාකාර මත්තෙහි සෑ කළ දම්වැල්

සහිත උපකරණයක් ( T L 277 ). සඳා 471[33] හි 'ඉෂිහිති' යි පෙණෙන්නේත් මෙය යි. **ගොපුර ගොපුරු** = ගෝපුරයන් ගෙන් සුන්දර වූ, "කුරුණෑගල්පුර" යන්නෙහි විශෙෂණ යි. **පලසෙල**......= ප්‍රකට වූ ධවල වූ කෛලාසකූටය හා එකාකාර වූ අලඞ්කෘත වූ උස් ප්‍රාසාදපඞ්ක්තියෙහි මාණික්‍යරශ්මියෙන් එකාලොක කළ; (කුරුණෑගල්). **රැදිරන්**...... ..= රන්කොත් අග රැඳුනු මණිකිඞ්කිණිජාලයෙන් (= මිණිකගඩි හා ගෙජ්ජ බැඳි **දැල්වලින්** ) උජ්ජ්වලිත; **රන්පිදී** ....... = සුවර්ණරජත ධවජකෙතූන්ගෙන් රැඳුනු (කුරුණෑගල්); **මදමත්**........= මදයෙන් මත් වූ දෙවඟනන් සමාන විලාස ඇති පුරාඞ්ගනාවන් අනඞ්ගනෘත්‍යය කොට වැදූනු (කුරුණෑගල්); **සෝළි** – වස්ත්‍රවිශෙෂයක්. **යුවල**......... = යුග්ම දැස් දංෂ්ට්‍රාවන්ගෙන් උජ්ජ්වලිත කපොලාන්තයෙන් වැගුරුණු අමඳ මද සුගන්ධ ප්‍රබන්ධයෙහි (= බොහෝ නිරන්තර වූ මදදියසුවඳෙහි) කළ ආශාවෙන් භ්‍රමණය කරණ මත් වූ භ්‍රමරපඞ්ක්තිය කණ්තාඩනයෙන් (= කණින් තැළීමෙන්) දුරු කළ ගිගිරූ චණ්ඩ ප්‍රචණ්ඩ හස්තිසමූහයෙන් ද, **මහගු**........ = මහාර්ඝ උස් වූ රළ වැනි තුරඞ්ග (= අශ්ව) පඞ්ක්තියෙන් ද; [**විපිස**...... .....වීර්‍ය ධෛර්‍ය ශ්‍රීයෙන් පිරුණු සාරථීන් (රථ මෙහෙයන්නන්) ආරූඪ වූ රථපඞ්ක්තියෙන් ද ]; **ඔසළ** = ඔසව (= රැස්) වූ අසුරභටයන්ගේ දර්පය (= එඩිය) දුරු කළ ඔජ්‍ර මොළ බලමුළින් ද; **සිවුරඟ**........= චතුරඞ්ග සේනාව හා එක් ව; **සුවැසි** = මනා වචන ඇති; **ගැවැසි** = ගැවසුනු.

## 47. පිටුව

**නිසි** = නිඃශ්‍රිත වූ; **ඇසුරූ** කළ; **පැහැසි** = පැස්සුනු, එක් වූ; **පොවතු**' යනු ගස් විශෙෂයකි. 'පුවඟු'! නම් රුක් ගස ය. **නඳුනුයන්**......=(දෙව්ලොව තිබෙන) නන්දනොද්‍යානය හා එකාකාර වූ උද්‍යානයන්ගෙන් උජ්ජ්වලිත (කුරුණෑගල්). **අසිරිමත් සිරිබරින්** = ආශ්චර්‍යවත් ශ්‍රීභාරයෙන්; 'සසිරිමත්' යනු වැරදිසි. හෙතු යට දක්විත. **සුරිඳු**... .....= සුරෙන්ද්‍ර පුරයෙහි දර්පය දුරු කළ. **මිණිවැණිපෙළින්** = මාණික්‍ය

මය කොත්පෙළින්; 'මැණි' යනු කොත ය. විස්තර කම්. 177 ට ලියූ කල්පලතාව්‍යාඛ්‍යාවෙහි පෙනේ. මිණි......... = මාණික්‍යකාන්තිසමූහයෙන් ගනන වූ; අතිජාතපුත්‍ර – මවූ පියන්ට ද වඩා උසස් ගතිගුණ ඇති ව උපන් පුත්‍රයා (උමන්ද 94[18] බලනු). ඔකාවස්.........ඉක්ෂ්වාකුවංශපරම්පරවෙන් ආව වූ; පිම් .........= සූර්යකුලයට කොතක් වැනි; නිති දහම්නා........ = ධර්මයෙන් ද මහාබෝධිසත්ත්වයකුගේ වැනි කරුණාවෙන් ද බබලන; පැණසඳින් = සාර වූ ප්‍රඥාවෙන් වාචස්පති ද, තේජෝගුණයෙන් දිවාකරයා ද, සෞම්‍යගුණයෙන් නිශාකරයා ද, රෞද්‍රගුණයෙන් මහේශ්වරයා ද, ගම්භීර ගුණයෙන්, ස්වර්ණමේරුව ද, ක්ෂාන්තිගුණයෙන් මහාධරණිව (මහ පොළොව) ද, (තිළිණ =) ත්‍යාගගුණයෙන් කල්පවෘක්ෂය ද, සම්ශ්‍රියෙන් (සුරදෙන =) සුරභි ධෙනුව ද, ශ්‍රීනාරයෙන් පුරන් දරයා (=ශක්‍රයා)ද [සතතයෙන් = නිරන්තරයෙන් දුරු කළ (= පැරදවූ)]. මෙහෙසුරු = ශිවදෙවියා යි. හේ අතිශය රෞද්‍ර ය. මේ රජ ඔහුට ද වඩා රෞද්‍ර ය. 'මෙර' = මහා පර්වතයක් ලෙස කවීන් විසින් වර්ණනා කළ ධ්‍රැව (Poles) යි. ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයෝ ධ්‍රැවයන්ට 'මෙරු' යි කියති. පොළොවෙහි අනික් තැන් ඇසිල්ලක් පාසා පෙරළී යන නමුත් ධ්‍රැවස්ථාන දෙක හැමවිට ම එක තැන සිටී. එහෙයින් ඊට වඩා නිශ්චල අනික් වස්තුවක් නොමැති යි. 'කැත්ගුණ' නම් ඉවසීම යි. 'මහදූරා' යන්නෙහි ප්‍රකෘතිය 'මහදූරු' යන්නයි. 'දූරු' යනු පෘථිවීවාචකය (රුවන් 164 බලනු). පොළොවට කුමක් දැමූවත් කළත් ඉවසා සිටි යි. 'සුරදෙන' = දෙව්ලොව වසන ධෙනුවකි. "සුරභිධෙනුව"යි කියන්නේත් මැට යි. සුරභි ධෙනුව ද කල්පවෘක්ෂය මෙන් හිතූ පැතූ සම්පත් දෙයි. සමත...... = සමස්ත (=සියලු) සාමන්තරජුන්ගේ මස්තකයෙහි අභිෂේක කළ ප්‍රකට ධවල චරණ (=පාද)නඛරශ්මිප්‍රවාහ ඇති; මුදුන් සරණතිලරුසින් කිසෙස් කරන්නේ පා වෙත හිස තබා වඳින හෙයිනි. යසපබඳ = කීර්තිප්‍රබන්ධ; නොකඩ වූ කීර්ති. සුයඹිවංශාවතංස = සූර්යවංශයට අවතංසයක් (=මුදුන්මල් කඩ ය) වූ; ලඞ්කාඞ්ගනාවල්ලභ = ලක්දිව

නමැති අඟනට සවාමි වූ; නවරත්නාධිපති = නවරත්න යන්ට අධිපති වූ; භුජඟපතිභොගබාහු = 'ශෙෂ' නම් නාග රජයාගේ (භොග =) දරණවැල වැනි බාහු ඇති; රණධරණී සහ ප්‍රබාහු = යුද්ධභූමියෙහි දී දහසක් අත් ඇති; මේ රජ යුධ යෙහි ඉතා දක්ෂ ය. ශීඝ්‍ර ය. අත්දහසකින් කරණ වැඩ කෙරෙයි. පරරාජරාහුබාහු = සතුරු වූ නරෙන්ද්‍රයන්ට රාහු වැනි බාහු ඇති; 'රජ' ශබ්දය 'නරෙන්ද්‍ර, චන්ද්‍ර' යන අර්ථ දෙක ම දෙයි. රාහු චන්ද්‍රයා වසයි. මොහුගේ බාහුව නරෙන්ද්‍රයන් වසා දමයි. එක ම ශබ්දය මෙසේ අර්ථ දෙකක් දෙන සේ යෙදීම මහාකවීන්ට ද අභිමත ය. කව් 400 හි 'දෙරණ' සද 'භාර්‍ය්‍යා, පෘථිවි' යන අර්ථයන්හි ද, ගිරා 54 හි "දහම් විදුරුපාරිතරිය පිළිඇදුරු" යන තැන 'ඇදුරු' යන්න 'අඳුරු, ආචාර්‍ය්‍ය' යන අර්ථයන්හි ද යෙදින. ආජානුලම්බබාහු = දනමඬල තෙක් එල්බෙන බාහු ඇති; අනවරතදානධාරාර්ද්‍රබාහු - නිරන්තරයෙන් දානය නමැති (දිය) දහරින් තෙත් බාහු ඇති ( = නිතර දන් දෙන); ධනදදානාපහාසබාහු = ධනද( = කුවේර)යාගේ දානයට අපහාස කරණ බාහු ඇති; ( = කුවේරයාට ද වඩා දන් දෙන). ත්‍රිභුවනෛකබාහු = තුන්ලොවට එක ම බාහුවක් වැනි; ශ්‍රීලලනාභවනබාහු = ශ්‍රීකාන්තාවගේ ( = සම්පත්තියෙහි) විලාසයන්ට ( = වැජඹීම්වලට) මන්දිරයක් වැනි බාහු ඇති; රත්නත්‍රයාපචිතිසමුචිතබාහු = තුනුරුවන්ට (අපචිති =) ගරුබුහුමන් කිරීමෙහි පුරුදු වූ බාහු ඇති; විශ්වම්භරාසම්භරණෝද්‍යතබාහු = පෘථිවිය (සම්භරණ =) පොෂණයෙහි හෝ රැකීමෙහි උද්‍යත ( = සූදානම්) වූ බාහු ඇති; ධරාලතාවතීර්ණසන්තානබාහු = පොළොව නමැති වැල බටුවා වූ ( = ඇතුරුණා වූ) සන්තානයක් ( = මැස්සක්) වැනි බාහු ඇති; නිඛිලජනසුකෘතපරිණාමබාහු = සියලු ජනයාගේ සුකෘතයෙහි ( = පිණෙහි) පරිණාමයක් ( = විපාකයක්) වැනි බාහු ඇති; පරාක්‍රමබාහු = පරාක්‍රමයෙන් යුතු බාහු ඇති; රාජාධිරාජපරමෙශ්වර = රාජාධිරාජයන්ට ද අතිශයප්‍රධාන වූ, රාජකුලශෙඛරසතුහරාජ = ? රාජකුලයට

තෞසතුහමාණික්‍යරජෙකු වැනි; 'තෞසතුහම' යනු කිරිසපුර කලඹද් දී මතු වූ මහාමාණික්‍යරත්නයකි. එය විශ්ණුහු විසින් පලදිනු ලැබේ. චින්තාරත්න = සිතුමිණි රුවනක් වූ; ශෙඛර = ඔටුන්නක් වූ; රාජ්‍යධුර විචාරමින් = රාජ්‍යය පිළිබඳ බර විචාරණය කරමින්; රාජ්‍යය කරමින්.

## 48. පිටුව

ඉරසඳ පවත්නාව= 'ඉරහඳ පවත්නා තෙක් තිබෙන සේ' යන අර්ථයෙහි පුරාතනයෙහි යෙදූ පදයෙකි. චවනා පස = අගනා වූ ප්‍රත්‍යය, නොහොත් දිවි පැවැත්වීමට උපකාර වන චීවරාදි සිවුපසය. (මේ පිළිබඳ විස්තර E Z iv. 109 හි 9 වැනි අධෝලිපියෙහි පෙණේ). පිරිකරවත් = පරිෂ්කාර වස්තු; කුඩ වහන් ආදිය. 'පිරිවෙන්' සි නොහොත් 'පන්සල්' යන අර්ථය කිය හැකි සි. අමින්පෙමින් = ප්‍රමාණයක් නැති ප්‍රේමයෙන්; බුහිතිවෙස් = බුදුපිළිමගෙවල්; විහාර. නෙසිරිතෝ = නොයෙක් ශ්‍රිය බොහෝ වූ; සඳ = හැම කල්හි; සිත් = චිත්තය; පිණ යොද = පිණෙහි යොද; ගම් පුද = ග්‍රාමයන් පූජා කොට; 'ගම්' යනු ඉඩම් ය. නොම සකස් = සකස් නුවූ; අළුත් වැඩියා නො කළ; ඇම වෙහෙර = සියලු විහාර; වෙසෙස් කැර = විශෙෂ කොට; ජරාවාසභාව යෙන් වෙනස් කර; ප්‍රතිසංස්කරණය කොට.

(48 – 16 පෙළ)

මවුකුසලාන් දරුකුසලාන් = මෙහි 'කුසලාන්' ශබ්දයෙහි අර්ථය පුරාවිද්‍යාඥයන්ගේ විවාදයට භාජන වූවකි. ශිලාලේඛනසංග්‍රහයේ සම්පාදකයෙක් වූ වික්‍රමසිංහමහතා E Z. ii. 106[28] හි යෙදුනු 'කුසලාන්' යන්නට 'පානපාත්‍ර (= කෝප්ප')' යන අර්ථය කිය යි. බෑල්මහතා 'පින් උදෙසා පිදූ ඉඩම්' යන අර්ථය කිය යි. ("The Ceylon Antiquary" නම් සංග්‍රහයෙහි 10 වැනි කාණ්ඩයේ 6 වන පිටුව බලනු). ආචාර්ය පරණවිතානමහතා ද එය අනුමත කරයි. (E Z. iii. 95 පිටුව බලනු). මේ වචනය යෙදුනු තැන්

පරීක්‍ෂා කළ විට පෙණෙන්නේ ඒ අර්ථය පිළි ගත යුතු බව යි. පානපාත්‍ර වාචී 'කුසලාන්' සදක් තිබුනත් ඒ අර්ථය 'මවුකුසලාන්' යනාදි තැන්හි නො මැතියි. "කුසලාන් ගඟාකැළෙව් ද ඒ මෛත්‍රීබුදුන් ........" (පූජා 472[28]) යන තැන්හි ද, E Z. iii 70 හි පෙණෙන "නාගලට කුසලාන් කොට පිදූ සැට මඩලැස්ස" යනාදිතැන්හි ද 'කුසලාන්' සදට 'පානපාත්‍ර' යන අර්ථය නො ගැළපේ. පානපාත්‍රයන් ගඟාකැ මිනිසෙක් නැත. මඩලැසි සැටක් පමණ වන ඉඩමක් පානපාත්‍රයක් කළ නො හැකි ය. මෙහි යෙදුනු "........ දරුකුසලාන් වටනා පස" යන්නට පූජා 742[28], කතිකා 13[24], නිකා 291 සුපූ 518 යනාදීන්හි තිබෙන "දරුගම් විටනාපස" යන්න සමාන ය. එහෙයින් 'කුසලාන්'සද 'ගම්'සද හා සමාන අර්ථ ඇතියකැ යි සිතිය හැකි ය. එවිට 'කුසලාන්'සදෙහි අර්ථය විය යුත්තේ "කුසල් උදෙසා පිදූ ආන් හෙවත් ගම්" යන්න ය. 'ආන්' යන්න 'ස්ථාන' ආදි වාචක 'ආයතන' ශබ්දයෙන් එයි (ධගැ 72[8] බලනු) 'කුසලාන්' යන්න ජලවාචී 'කුශ' ශබ්දය හා 'දීම, ගැණීම' යන අර්ථ ඇති 'ලාන' ශබ්දය ද එක් ව සිද්ධ ශබ්දයකැ යි ද, අත පැන් වක්කර දෙන ඉඩම්වලට එය යෙදෙතැ යි ද 'The Ceylon Antiquary' සංග්‍රහයෙහි දැක්වේ. ඒ නිරුක්තිය පිළිගැණීම අපහසු ය. සමහර පළාත්හි 'කොහොලාන' නම් ඉඩම් තිබේ. කොහිල ආනක් වූ හෙයින් ඒ නම ඊට වූයේ ය යි කියතත් ඒ ඉඩම් පුරාතනයේ දී විහාරයන්ට පිදූ 'පින් ඉඩම්' ය යි සිතිය හැකි ය. විහාරවලට අයත් ඉඩම් අල්ලා ගෙණ කන අයට "කොහොලන් අය" යි ඇතැම්පළාත්වල කියන වචනය ද 'කුසලාන්' සදින් ම සිද්ධ වූවකැ යි හැඟේ. කුසල් උදෙසා පිදූ මහ ගම් මහකුසලාන් ය. වික්‍රමසිංහමහතා 'මහකුසලාන්' යි වරදවා කියවුවත් E Z. ii. 106[23] හි පෙණෙන්නේත් මේ 'මහකුසලාන්' යන්න ය යි The Ceylon Antiquay (Vol X. Part i) සංග්‍රහයෙහි 6 පිටුවෙහි සඳහන් වේ. අඹරණ මහගලට "මවුගල" ය යි ද, පළමු ව ඇති වූ ලොකුගෙඩියට 'මවු,

ගෙඩිය' ය යි ද, කුඩාගලට හා කුඩාගෙඩියට 'දරුගල, දරු (තරු)ගෙඩිය, (දූගල, දූගෙඩිය)' ය යි ද කියන්නාක් මෙන් මහකුසලාන්වලට 'මවුකුසලාන්' ය යි ද, කුඩාකුස ලාන්වලට 'දරුකුසලාන්' ය යි ද කිය හැකි ය. මහකුස ලානකට යා ව පිහිටි, නොහොත් එක් පුද්ගලයෙකුට පින් උදෙසා පිදූ, කුඩා ඉඩම 'දරුකුසලාන්' ය යි සිතිය හැකි ය.

**පුඟුල්සතු** = පුද්ගලයන් සතු; එක් භික්ෂුනමකට කැමැති සේ ප්‍රයෝජන විඳීමට පිදූ දෙන පුඟුල්සතු යි. **පන්සිල්, අටසිල්, දසසිල්** ප්‍රසිද්ධ ය. පන්සිල් හා දසසිල් නිත්‍ය වශයෙන් ද අටසිල් පොහෝදවස්හි ද සමාදන් ව රකිනු ලැබේ. **දහම්සොළි** = ධර්මක්‍රීඩා; පින් කිරීම. **දසරජ දහම්** = තව. 6 ට ලියූ ව්‍යාඛ්‍යාවෙහි පෙනේ. **සනමිත** = සැණූ; **සොපාන** = තරප්පු. **හිමගිරිශිඛරනිකරරුචිර** = හිමාලයපර්වතමස්තකරාශියක් සේ මනොඥ; **කූටාගාර වරොපෙත** = උතුම් කූටාගාරයන්ගෙන් යුත්; **ගාඞ්ගෙය** = සවර්ණයෙන් කළ; ගඞ්ගාවෙහි තිපන් හෙයින් සවර්ණය මෙනම් වී ය. ඉතා ඈත අතීතයෙහි දී දඹදිව මිනිසුන්ට රන් ලැබුණේ ගඞ්ගා නම් ගඟෙහි පතුලෙන් විය යුතු ය. එහෙයින් මේ නම වූයේ ය යි හැඟේ. මේ පිළිබඳ ඇදහිය නො හැකි කථාවක් ද තිබේ. **දනුදු** සමහර රටවල ගඞ්ගාවන්හි වැල්ල ගරා රන් ගණු ලැබේ. **ශෘඞ්ගනිර්ගත** = කොත්වලින් නික්මුත්; **රුචිනිකර** = කාන්තිරාශියෙන්; **සුරපති චාපසුන්දර** = දෙව්දුන්නක් සේ සොඳුරු; **ගවාක්ෂපක්ෂ** = (වටිකුරු) ජනෙල්හි පැතිවලින්; **නිර්ගත** = නික්මුත්; **සුරභිධූමසමූහ** = සුවඳදුම්රැසින්; **සන්ධුක්ෂිත** = උද්දීපත; බැබලුනු; **මෙඝමාලාලඞ්කෘත** = වලාකුළුපෙළක් මෙන් අලඞ්කෘත; **හෙමරෞප්‍ය** = රන්රිදීමුවා; **ධවජමාලාබලාකාකුලාකුල** = දද පෙළ නමැති කොක්රැසින් ආකුල වූ; **කනකකමයකාම්** = රන්මුවා කාමාන්තයන්ගෙන්.

## 49. සිවුව

**නිර්මිත** = නිම කළ; **මාරබාහු** = උළුවහුවලින්; **සශ්‍රීක** = ශෝභමාන. **සුරපුරවනිණි** = දෙව්ලොවින් බට; **සුර භවන** = දෙව්මැදුරක් සේ; **භාසුර** = බබලන; **මලොලඹු** = මාලාවලම්බනත්; එල්විය යුතු මල්දම්; **ලඹ දී** = ලම්බනය දී; එල්ලා. **රන්වැටැ** = රන්මුවාපහනෙහි; **ලියවැටැ** = වැලක ආකාරයට කළ පහනෙහි; **වැමුප්** = පහන්තිර; **තෙමෙහෙළුගු** = තෙමෙහෙල් හා උක්. **නාලියෙන්** = බුලත්වැලින්. **පමුණු** = පරවෙණි; පරම්පරාවට ම අයත් වන ඉඩම්.

**සක්පසනු** = බෙරවෙසෙසකි. ථූප $81^{2}$, $139^{14}$, $171^{2}$, සද්ධ $170^{15}$ හි හා සඳවුරුසිරිතෙහි "සක්පසනුවුරයෙන් යුක්ත රජප්‍රතාපයෙන්" යන තන්හි ද මෙය පෙණේ.

**වඩිඩාරු** = බෙරවෙසෙසක් ය යි හැඟේ. මෙහි ම $50^{9}$ හි ද පෙණේ. අනික් පොතක යෙදුනු තැනක් නො දනිමු. දඹ $5^{27}$ හි 'වඩිනක්කොම්බු' නමැති තූර්යභාණ්ඩයක් සඳහන් වෙයි ඒ නලාවෙසෙසකි

**දළහං** = ඇත් දළින් කළ නලාවෙසෙසකි. මෙහි බෙර අතර යෙදුනේ කෙසේ දැ යි නො හැඟේ. ථූප $41^{16}$, $81^{4}$, $140^{3}$, සද්ධ $311^{28}$, $468^{10}$. කා ශෙ 8 - 32 යන තන්හි ද මෙය පෙණේ ථූප $41^{12}$ හි 'දළහම්' යන්නක් ද පෙණේ.

**මද්දල** = බෙරවෙසෙසකි. 'මර්දල' යි සංස්කෘතයෙහි යෙදේ. මෙය ථූප $41^{6}$, $80^{32}$, දඹ $5^{23}$, සද්ධ $110^{30}$, $468^{6}$, කා ශෙ 8 - 32 යනාදියෙහි ද පෙණේ

**මිහුම්කුඩම්** = මේ වනාහි අනික් පිටපත් දෙකෙහි පෙණෙන 'මිනදෙළින්' යන, මෙ තැනට නො ගැළපෙන, වචනය සඳහා අප විසින් යෙදූවකි. මේ ද බෙරවෙසෙසකි. දඹ $5^{24}$ හි ද මේ යෙදින. 'මඩුම්කුව' යන සංස්කෘතවචනයෙහි ද්‍රවිඩරූපයයි.

**පණාබෙර** - ථූප $41^{5}$, $80^{21}$, දඹ $5^{22}$, සර $83^{31}$ යනාදියෙහි ද පෙණේ.

මිහිඟුබෙර = මෘදඞ්ගභෙදයි; මෙය සුප්‍රසිද්ධ යි. මුව 28, කා ශෙ 8 - 32 යනාදියෙහි යෙදින. මෙය ද මේ තැන වූ 'ඉගෙන කැර' යන ස්ථානොචිත නුවූ නිරර්ථකවචන සඳහා අප විසින් යොදන ලදී.

ඩමරු = බෙරවෙශෙෂයකි. ධූප $41^{18}$ හි ද මෙසේ පෙණේ. 'ඩමුරු' යි ද සමහර තැන පෙණේ. (තිසර 166) 'ඩවුර' යි බුත් $79^{30}$, ධූප $46^{17}$, $81^{1}$, $137^{14}$, සද්ධ $7^{6}$, $470^{15}$ යන තන්හි පෙණේ. 'රුවන්මැලි = රුවන්වැලි' යනු සසඳනු.

ඩැක්කි = උඩැක්කිය වැනි දිග තූර්‍යභාණ්ඩයකි. උඩැක්කියේ වට තුණක් තිබේ උඩැක්කිඇස මැදට වඩා පළල් නමුත් ඩැක්කිඇස එතරම් පළල් නො වේ. මෙය ධූප $41^{10}$, සද්ධ $110^{30}$, කා ශෙ 8 – 32 යන තන්හි පෙණේ.

උඩැක්කි = ප්‍රසිද්ධ ය. ධූප $41^{10}$, $139^{18}$, කා ශෙ 8–32 යන තන්හි ද පෙණේ.

තලප්පර = බෙර වෙශෙෂයකි. ධූප $41^{8}$, $80^{22}$, සද්ධ $103^{18}$, $186^{5}$, $468^{7}$ යන තන්හි ද පෙණේ. 'තලබෙර' යි පෙණෙන පාඨය නො ගත්තෝ එය කිසි ම පොතක සඳහන් නොවන හෙයිනි. 'තලප්පර' යන්න 'තලබෙර' යි වැරදවීම පහසු ය.

වීරන්දම් = බෙරජාතියකි. ධූප $81^{1}$, $139^{18}$, දළ $5^{25}$, සද්ධ $103^{14}$, $186^{5}$, $468^{7}$ යනතන්හි ද යෙදින.

වීරමොරසු = සුදබෙරවෙශෙෂයකි. 'වීරමුරශු' යි T L 3758 පිටුවෙහි පෙණේ. 'මුරශු' යි ද්‍රවිඩයට ගියේ 'මුරජ' යන සංස්කෘතවචනය යි. 'මොරසු' යන්න 'මොරහු' යි ධූප $41^{10}$, සර $142^{31}$ යන තන්හි පෙණේ. කම්මැට්ටමට 'මොරහු' යි ඇතැම්හු කියති.

**කාංසුතාලම්** = කාවිතාලම් යයි ප්‍රසිද්ධ තූර්යභාණ්ඩයයි. ථූප $139^{10}$ හි 'කාංචිතාලම්' යි පෙනෙන නමුත් අභධාලිපි යෙහි 'කන්සුතාලම්' යි පෙණේ. 'රිදීවිහාරඅස්න' නම් අමුද්‍රිත පොතෙහි ද එය ම පෙණේ. 'කයිතාලම්' නම් වාද්‍ය භාණ්ඩය ථූප $41^{13}$ හි යෙදිනා.

**සින්නම්** = 'සින්තාලම්' යි මුද්‍රිත පිටපත්හි පෙනෙන වචනය අනික් පොතක නො දක්නා ලදී. මෙය අගින් තල නළාවෙසෙසෙකැ යි හැඟේ. බුත් $79^{30}$, ථූප $41^{18}$, $46^{17}$, දඹ $6^{28}$, සා ශෙ 8 – 32, සද්ධ $103^{18}$, $468^{9}$ යන තැන්හි ද රිදීවිහාරඅස්නෙහි ද පෙණේ

**තම්මැට** = ප්‍රසිද්ධ යි ථූප $41^{8}$, $81^{1}$, $139^{13}$, සද්ධ $67^{5}$, $76^{30}$ $134^{4}$ $468^{7}$, දඹ $6^{20}$, සර $83^{23}$ යනාදියෙහි මෙය යෙදිනා. 'තම්මැට්ට' යි සමහර තැන පෙණේ. තෙලිඟු බසෙහි 'තම්මට්ට' යනු කුඩාබෙරයට නමකි. දෙමළට එය 'තම්පට්ටම්' යි ගන්නා ලදී. T L 1752 බලනු.

**නිසාන** = ක්ෂුද්‍රබෙරයකි. ථූප $41^{8}$, $139^{13}$, දඹ $6^{20}$, සද්ධ $57^{6}$, $134^{4}$, $468^{7}$, සර $83^{18}$ යන තැන්හි ද රිදීවිහාර අස්නෙහි ද පෙණේ. 'නිසාලම්' යනු ද්‍රවිඩ යි. T L 2244 හා 3758 හි 'වීරමුලවු' යන්න ද බලනු. එක්ඇසක් ඇති බෙරවෙසෙසකැයි T L. කියයි.

**තිඹිලිවු රෙදුබොර** = මෙය 'කම්බිලි විරිදු බැඳ' යි මුද්‍රිත දළදාසිරිත්හි පෙණේ. 'කම්බිලි' යි තූර්යභාණ්ඩයක් සඳහන් තැනක් අපි නො දනිමු. හෙරිවිශෙෂයකට නමක් වූ 'තම්බිතෙ' (T L. 1001) යන ද්‍රවිඩවචනයෙන් එය පැමිණිය හැකි වුවත් ඊලඟට යෙදුනු "විරිදු බැඳ" යන්න මෙහි නිරර්ථක ය. එහෙයින් එය අපි වෙනස් කෙළෙමු 'තිඹිලිවු' යනු ක්ෂුද්‍රබෙරයකි ථූප $41^{9}$, හා රිදීවිහාර අස්නෙහි ද මෙය පෙණේ. ද්‍රවිඩ "තිමිලෛ" (T L. 1880) යන්නෙන් පැමිණි සේ සිතිය හැකි ය. T L 3758 හි 'වීරමුලවු' යන්න ද බලනු.

'රෞද්‍රබෙර' යන්න සද්ධ $134^{3}$, සර $82^{28}$, $239^{28}$ යන තන්හි යෙදිනි. ධූප $41^{7}$ හා $139^{11}$ හි ද 'රෞද්‍රබෙර' යි ද අබොලිපියෙහි 'රුද්‍රබෙර' යි ද පෙණේ.

**බොම්බිලි** = බෙරවිශේෂයකි. වන ගත හෝ මුහුදුබඩ පෙදෙස්හි තිබෙන බෙරවිශේෂයකට ද්‍රවිඩයෝ "පම්බෙප" (T L 2484) යයි කියති. එය තෙලිඟු 'පම්බ' යන වචනයෙන් බිඳුනකි. තෙලිඟු බහුවචනප්‍රත්‍යයයක් වූ 'ලො' යන්න එකතු කළ 'පම්බලො' යන්නෙන් මෙය බිඳුණේ යයි හැඟේ. තිසර $16^{6}$ හි පෙණෙන මිට 'තලා' යි සමහරු ඇණි කියති.

**මාබෙර** – ධූප., දඹ., පිදි., සද්ධ., සර. ආදියෙහි 'මහබෙර' යි යෙදිනි. **කුඩාබෙර** – සුබෝධ යි.

